ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

கிழக்குப் பல்கலைக்கழகம், இலங்கை

EASTERN UNIVERSITY, SRI LANKA

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை - 2022
ANNUAL REPORT



ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
වන්දාරුමූලෙයි,
වෙන්කලඩි.

2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කාර්යය සාධනය අළලා සැකසුණු ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ මහත් සතුටිනි. මෙම වාර්තාව මගින් ඒකාබද්ධ චින්තනය මෙහෙයවීමට, අවිනිශ්චිත කාලවලදී සීමිත සම්පත් කළමනාකරණය කිරීමට සහ අපගේ ප්‍රධාන පාර්ශවකරුවන් සඳහා නිර්මාණය කර ඇති වටිනාකම වැඩිදියුණු කිරීමට විශ්වවිද්‍යාලය තුළ වූ කැපවීම් වාර්තාකරණය නියෝජනය කරනු ලබයි. වාර්තාකරණයේදී අනුගමනය කරන ලද පාර්ශ්වකරුවන් කේන්ද්‍ර කරගත් ප්‍රවේශය විශ්ව විද්‍යාලයේ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් වෙත ලබා දෙන වටිනාකම තක්සේරු කිරීමට අපට හැකියාව ලබා දෙන අතර අපගේ උපායමාර්ගික ප්‍රමුඛතා කෙරෙහි අප අවධානය යොමු කරන බව සහතික කරයි.

2022 වාර්ෂික වාර්තාව, මණ්ඩපය, පීඨයන්, මධ්‍යස්ථාන සහ ඒකක විසින් රැස් කර ගත්තා වූ තොරතුරු උපයෝගී කොටගෙන උපාය මාර්ගික සැලසුම් සහ සංඛ්‍යාන ඒකකය විසින් සම්පාදනය කරන ලදුව විගණන වාර්තාව ද (විගණන කමිටුවේ නිර්දේශය සහිතව) , මූල්‍ය වාර්තාව ද (මූල්‍ය කමිටුවේ නිර්දේශය සහිතව) ඇතුළත් කොට 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සකස් කරන ලද අතර මෙහි අන්තර්ගතය විශ්වවිද්‍යාල පාලක සභාව විසින් සමාලෝචනය කර 2023 ජූලි 29 වන දින පවත්වන ලද 335 වැනි පාලක සභා රැස්වීමේදී අනුමත කරන ලදී.

දැක්ම

ප්‍රජා යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා විශිෂ්ට ඉගැන්වීම්-ඉගෙනීම් සහ පර්යේෂණ සහිත ලෝක මට්ටමේ දැනුම් මධ්‍යස්ථානය.

මෙහෙවර

කලාපීය සම්පත් ප්‍රශස්ත කරමින් දේශීය හා විදේශීය සම්බන්ධතා ඇතිකර ගනිමින් තිරසාර ගෝලීය, ජාතික සහ කලාපීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා සදාචාරාත්මක වටිනාකම් සහිත දක්ෂ උපාධිධාරීන් බිහි කිරීම සහ පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීම.

ඉලක්ක

1. සමාජයේ අවශ්‍යතා සපුරාලීම සඳහා තාක්ෂණය සහ පර්යේෂණ පිළිබඳ දැනුම සහ කුසලතා ඇති දක්ෂ උපාධිධාරීන් නියමිත කාලයට බිහි කිරීම.

2. ප්‍රජා ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා ගෝලීය සහ ජාතික ප්‍රවීණයන් සමඟ සහයෝගීතාවයෙන් බලපෑම්කාරී පර්යේෂණ පිළිබඳව දැනුවත් කිරීම.

3. මානව හා භෞතික සම්පත් හරහා ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම.

4. ප්‍රජාවගේ සමාජ-ආර්ථික හා සංස්කෘතික අවශ්‍යතා සපුරාලීම සඳහා පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.

5. පාර්ශවකරුවන් අතර ධනාත්මක වටිනාකම් පද්ධතියක් පවත්වාගෙන යාම සහ යහපාලනය වැඩි දියුණු කිරීම.

අරමුණු

1.1 ජාතික සහ ගෝලීය අපේක්ෂාවන් ඉටු කිරීම සඳහා පරිවර්තනයක් තුළින් වගකීම් සහගත දක්ෂ උපාධිධාරීන් නියමිත වේලාවට බිහි කිරීම.

2.1 විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ධාරිතාව වැඩි දියුණු කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීම.

3.1 කාර්යක්ෂම, ඵලදායී සහ ආත්මාභිමානය ඇති ශාස්ත්‍රීය, පරිපාලන සහ සහායක ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම.

3.2 විශ්වවිද්‍යාල ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා යටිතල පහසුකම් සහ අනෙකුත් සම්පත් වැඩිදියුණු කිරීම.

4.1 කලාපීය සහ ජාතික ප්‍රජාවගේ සමාජ-ආර්ථික, සංස්කෘතික සහ මානව වටිනාකම් පොහොසත් කිරීමට අවස්ථා නිර්මාණය කිරීම.

5.1 ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරීම.

උපකුලපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ (ශ්‍රී.ල.නැ.වි.වි) 2022 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව මා විසින් ඉදිරිපත් කරනුයේ මහත් සතුටිනි. විශ්වවිද්‍යාලය පීඨ සයකින්, ත්‍රිකුණාමලයේ පිහිටි මණ්ඩපයකින් හා සෞන්දර්ය අධ්‍යයන ආයතනයකින් ද (ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය) සමන්විත වේ. ශ්‍රී.ල.නැ. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් සඳහා ඉතා විශිෂ්ඨ හිතකර ඉගෙනුම් පරිසරයක් ලබා දීම සඳහා අඛණ්ඩ පරිශ්‍රමයක් දරනු ලබන අතර සියළුම උපාධිධාරී අපේක්ෂකයන් සඳහා නේවාසික පහසුකම් ලබාදීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සිටී.

ශ්‍රී.ල.නැ.වි.වි බහු වාර්ගික හා බහු ආගමික ශිෂ්‍ය සහ කායීය මණ්ඩල ප්‍රජාවකින් ඉතා පොහොසත් සුසංයෝගයකින් සමන්විත වන අතර එය සාමය හා සමාජ සහජීවනය පිළිබඳ අත්දැකීම් ලබා දීමටත් ඒවා වර්ධනය කිරීමටත් ඉතා ප්‍රබල අවස්ථාවන් ලබා දේ. කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් බොහෝමයක් අධ්‍යයන ක්‍රියාකාරකම් සීමා වූ අතර සංචරණ සීමා පනවා තිබූ කාල සීමාවන් වලදී ද සිසුන්ගේ අධ්‍යයන ක්‍රියාකරකම් වල නිරත වීම සුරක්ෂිත කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

මාගේ දැක්ම වනුයේ “විශිෂ්ඨ ඉගැන්වීම්, ඉගෙනුම් හා ප්‍රජා සුභ සාධනය ඉහළ නැංවීම සඳහා වන පර්යේෂණ හඳුනා ගැනීම තුළින් ලෝක මට්ටමේ දැනුම මධ්‍යස්ථානයක්” ලෙස ශ්‍රී.ල.නැ. විශ්වවිද්‍යාලය ඔසවා තැබීම වේ.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය ලංකාවේ නැගෙනහිර කොටසේ උපාය මාර්ගික ස්ථානයක පිහිටා තිබේ. ප්‍රධාන ප්‍රජාවන් තුනම මෙම පළාත තුළ ඉතා සහජීවනයෙන් යුතුව ජීවත් වේ. එබැවින් ප්‍රජාවන් තුනෙහිම අවශ්‍යතාවයන් සපුරාලීමේ සමාජ වගකීමක් විශ්වවිද්‍යාලය සතුව ඇති අතර එය බහු වාර්ගික සහ බහු ආගමික ප්‍රජාවන් සමෝධානය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි.

කලාපීය සහ ජාතික සංවර්ධනය මූලික වශයෙන් ශක්තිමත් කරන හා ඊට නායකත්වය දෙන ප්‍රධාන නිමැවුම් වනුයේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කෙරෙන පර්යේෂණ සහ නවෝත්පාදන වේ. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය ඉහළ නමක් දරන විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කරමින් යන ක්‍රියාවලියට සහ කලාපීය, ජාතික හා සමස්තයක් ලෙස මුළු මහත් ජාත්‍යන්තරයේත් සපුරා නොගත් අවශ්‍යතා ඉටු කිරීම සඳහා අපේක්ෂිත ප්‍රතිඵල වලට අනුව ළඟා කර ගත් ප්‍රතිඵල ඇති බවට තහවුරු කිරීම සඳහා අප සමඟ සම්බන්ධ වී ඒ සඳහා සහයෝගය දක්වන ලෙසට උනන්දුවක් දක්වන සියළුම පාර්ශවයන්ගෙන් මම ඉතා කෘතවේදීව ඉල්ලා සිටිමි.

ඉදිරි වසරවලදී උපායමාර්ගික අභිලාෂකාමී ඉලක්ක හඹා යෑම සඳහා විශ්වවිද්‍යාලය මෙහෙයවීමට මම බලාපොරොත්තු වන්නෙමි.

මහාචාර්ය වී. කනගසිංගම්
උප කුලපති.

පටුන

දැක්ම, මෙහෙවර, ඉලකක සහ අටමඩුණඩු ii
උපකුලපතිතුමාගේ පණිවිඩය iii
පටුන iv

1 හැඳින්වීම 1
1.1 විශ්වවිද්‍යාලය පිළිබඳ දළ විශ්ලේෂණය 1
1.2 විශ්වවිද්‍යාල පාලනය 4
1.3 අසාර්ථකත්වයන් සහ සාධාරණීකරණයන් 39
1.4 අනාගත සැලසුම් 40
2 ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල කටයුතු 44
2.1 සිසුන් 44
2.2 කාර්ය මණ්ඩලය 51
2.2.1 කාර්ය මණ්ඩල පැතිකඩ 52
3 විශ්ව විද්‍යාලයේ පීඨයන් 66
3.1 කෘෂිකර්ම පීඨය 66
3.2 කලා හා සංස්කෘත පීඨය 68
3.3 වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය 70
3.4 සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය 72
3.5 විද්‍යා පීඨය 72
3.6 තාක්ෂණික පීඨය 76
3.7 ව්‍යවහාරික විද්‍යා පීඨය, ත්‍රිකුණාමලය මණ්ඩපය 78
3.8 සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය, ත්‍රිකුණාමලය මණ්ඩපය 80
4 පර්යේෂණ, ප්‍රකාශන සහ සම්මාන 82
4.1 පේටන්ට් බලපත්‍ර 82
4.2 අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව 82
4.3 පර්යේෂණ ප්‍රතිපාදන සහ වියදම් 83
4.4 මහජනතාවට දැනුම බෙදා හැරීමේ වැඩසටහන් – 2022 84
4.5 2022 දී ප්‍රකාශිත සඟරා 84
4.6 වාර්ෂික පර්යේෂණ සැසි 85
5 නැඟී ක්‍රියාත්මක කරන ලද තිරසාර සංවර්ධන වැඩසටහන් .ව.ව 86
5.1 ENACT ව්‍යාපෘතිය හරහා තිරසාර සැලසුම් 86
5.2 නැගෙනහිර විශ්වවිද්‍යාලයේ තිරසාර සැලසුම් 89
6 පස් අවුරුදු ප්‍රධාන සංඛ්‍යා ලේඛන 90
7 මූල්‍ය වාර්තාව 91
7.1 මූල්‍ය ප්‍රකාශනය විශ්ලේෂණය 91
7.2 පසුගිය වසර පහ තුළ මුළු ආදායම සහ වියදම් 91
7.3 දස වසරක මූල්‍ය විශේෂ අවස්ථා 92
7.4 විගණන කමිටුවේ සභාපතිවරයාගේ වාර්තාව 93
7.5 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද අරමුදල පිළිබඳ තත්ව වාර්තාව 96
7.6 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 97
7.7 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 97
7.8 ව්‍යාපෘති විස්තර (දේශීය/ විදේශීය අරමුදල්) 98
7.9 ව්‍යාපෘති වියදම් විස්තර (දේශීය/ විදේශීය අරමුදල්) 98
7.10 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම) 99
7.11 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ජනනය කරන ලද ආදායම) 99
7.12 මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය - 2022 100
7.13 යටිතල පහසුකම් පිළිබඳ විස්තර (2022 දී ලද) 100
7.14 මූල්‍ය ප්‍රකාශන – 2022 100
7.15 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තියට අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව. 126
7.16 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තියට අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය. 134

1 හැඳින්වීම

1.1 විශ්වවිද්‍යාලය පිළිබඳ දළ විශ්ලේෂණය

1.1.1 2022 කෙටියෙන්

#9
ශ්‍රී ලංකා විශිෂ්ටතා ශ්‍රේණියේ

8294
ශිෂ්‍යයන් [1]

774
කායී මණ්ඩලය[1]

#11
ශ්‍රී ලංකාවෙබ් අඩවි සංඛ්‍යාන ශ්‍රේණියේ

3477
උපාධිධාරීන් [1,2]


302
අධ්‍යයන කාර්ය මණ්ඩලය[1]

#4621
ලෝක වෙබ් අඩවි සංඛ්‍යාන ශ්‍රේණියේ


13020
ආදී ශිෂ්‍යයන්[1]

14
දෙස් විදෙස් අවබෝධතා ගිවිසුම්[1]

ශිෂ්‍යයන්



කාර්ය මණ්ඩලය



1. නැ.වි.වි. හා ත්‍රිකුණාමල මණ්ඩපයේ සමුච්චිත අගය.
2. 2022 උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි පිරිනමන ලද උපාධි අපේක්ෂකයින්.

1.1.2 ඉතිහාසයේ අවස්ථා

1981

මඩකලපුව විශ්වවිද්‍යාල ශාස්ත්‍රාලය

මඩකලපුව විශ්වවිද්‍යාල ශාස්ත්‍රාලය එවකට ප්‍රසිද්ධව පැවති වන්දාරුමූලෙයි මධ්‍ය මහා විද්‍යාලයේ ගොඩනැගිලි වල විද්‍යා පීඨය හා කෘෂිකර්ම පීඨයෙන් සමන්විතව ස්ථාපිත කරන ලදී.

1986

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය ලෙස උසස් කිරීම

මඩකලපුව විශ්වවිද්‍යාල ශාස්ත්‍රාලය පසුව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය ලෙස උසස් කරන ලද අතර සංස්කෘත අධ්‍යයන පීඨය සහ වාණිජ්‍ය හා කළමනාකරණ පීඨය ලෙස නව පීඨ දෙකකින් යුතුව අංක 50, නව පාර, මඩකලපුව යන ලිපිනයෙහි ස්ථාපනය කරන ලදී.

1989

ශ්‍රී.ලං.නැ.වි.වි. වන්දාරුමූලෙයි.

අළුතින් පිහිටුවන ලද සංස්කෘත අධ්‍යයන පීඨය සහ වාණිජ්‍ය හා කළමනාකරණ පීඨයන් සමඟ වන්දාරුමූලෙයි පරිශ්‍රය තුළ පීඨ සතරකින් යුතුව ස්ථාපනය කරන ලදී.

1990

නැ.වි.වි.ප්‍රධාන මණ්ඩපය සරණාගත කඳවුරක් බවට පත් වීම

නැගෙනහිර ප්‍රදේශයේ පැවති සිවිල් යුද්ධය හේතුවෙන් වන්දාරුමූලෙයි ප්‍රධාන මණ්ඩපය සරණාගත කඳවුරක් බවට පත් වූ අතර පීඨ කටයුතු තාවකාලිකව මඩකලපුවට මාරු කරන ලදී.

1991

අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කිරීම.

කෘෂිකර්ම සහ විද්‍යා පීඨ වල කටයුතු වන්දාරුමූලෙයි පරිශ්‍රයේදී ජූනි මස ආරම්භ කරන ලදී. සංස්කෘත අධ්‍යයන පීඨය, කලා සහ සංස්කෘත පීඨය ලෙස නැවත නම් කරන ලදී.

1995

වාණිජ සහ කලා පීඨ නැවත ගෙන යන ලදී.

1995 මුල් භාගයේදී වාණිජ හා කලා පීඨයන් නැවත වන්දාරුමූලෙයි පරිශ්‍රය වෙත ගෙන යන ලදී.

1997

ප්‍රධාන සනාතන ගොඩනැගිල්ල

ප්‍රධාන සනාතන ගොඩනැගිල්ල වන්දාරුමූලෙයි පරිශ්‍රයේ ස්ථාපනය කරන ලදී.

1997

හෙද ඒකකය

හෙද ඒකකය අංක **50,** නව පාර, මඩකලපුව හිදී ස්ථාපනය කරන ලදී.

2001

ත්‍රිකුණාමල මණ්ඩපය ස්ථාපනය කිරීම

ත්‍රිකුණාමල අනුබද්ධ විශ්වවිද්‍යාල ශාස්ත්‍රාලය පසුව ත්‍රිකුණාමල මණ්ඩපය ලෙස උසස් කරන ලදී. 2001 ජූනි 15 දිනැති ගැසට් නිවේදනය මඟින් ක්‍රියාත්මක වන පරිදි 2001 ජූනි 06 වන දිනැති ගැසට් නිවේදනය මඟින් සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යන පීඨ දෙකකින් යුතුව ස්ථාපිත කරන ලදී.

2001

පළමු වාර්ෂික පර්යේෂණ සැසිය

ශ්‍රී.ලං.නැ.වි.විද්‍යාලයේ පළමු වාර්ෂික පර්යේෂණ සැසිය පවත්වනු ලැබුයේ විද්‍යා පීඨය විසිනි.

2004

සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය ස්ථාපනය කිරීම.

සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය පිහිටුවීමට ගැසට් නිවේදනය නිකුත් කරන ලද අතර පීඨය පිහිටුවන ලදී.

2005

ස්වාමී විපුලානන්ද සංගීත හා නර්තන විදුහල.

ස්වාමී විපුලානන්ද සංගීත හා නර්තන විදුහල නිල වශයෙන් ශ්‍රී.ලං.නැ.වි.වි. ට අනුබද්ධව පවතී. පසුව එය ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය ලෙස නම් කරන ලදී.

2007

සිද්ධ වෛද්‍ය ඒකකය ස්ථාපනය කිරීම

ත්‍රිකුණාමල මණ්ඩපය තුළ සිද්ධ වෛද්‍ය ඒකකය ස්ථාපනය කිරීමට අවසර ලබා දෙන ලදී.

2018

තාක්ෂණික පීඨය ස්ථාපනය කිරීම.


ගැසට් නිවේදනයට අනුව 2018 ජනවාරි 18 දින තාක්ෂණික පීඨය ස්ථාපිත ලදී.

2022

උපාධි අධ්‍යයන පීඨය ස්ථාපනය කිරීම.

2022 නොවැම්බර් 17 දින වි.වි.ප්‍ර.කොෂ. විසින් උපාධි අධ්‍යයන පීඨය ස්ථාපිත කිරීම අනුමත කරන ලදී.

1.1.3 ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය



ස.මූ. - සහකාර මූල්‍යාධිකාරී
ස.ලේ. - සහකාර ලේඛකාධිකාරී
නි.මූ. - නියෝජ්‍ය මූල්‍යාධිකාරී
නි.ලේ. - නියෝජ්‍ය ලේඛකාධිකාරී

ජේ.ස.මූ. - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
ජේ.ස.අ.වි. - ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
ජේ.ස.ලේ. - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ස්.වි.සෞ.අ.ආ. - ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

1.2 විශ්වවිද්‍යාල පාලනය

ආයතනික ව්‍යුහය

විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය සාමාන්‍ය පරිපාලනය සහ අධ්‍යයන පරිපාලනය යන ප්‍රධාන පරිපාලන ක්ෂේත්‍ර දෙකකින් සමන්විත වේ. විශ්වවිද්‍යාල ප්‍රධානියා, විශ්වවිද්‍යාල පනතේ **32** වැනි වගන්තියේ සඳහන් වන පරිදි, බොහෝ දුරට උත්සවාකාරයෙන් ක්‍රියා කරන කුලපති වේ. කුලපතිගේ කාර්‍ය විශ්ව විද්‍යාලයේ පැවැත්වෙන උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරීමට සීමා වී ඇත. උපකුලපති විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන අධ්‍යයන නිලධාරියා වේ.

පාලක සභාව

1985 අංක **07** දරන විශ්වවිද්‍යාල පනතේ (සංශෝධිත) 24 වන වගන්තිය මගින් සංශෝධිත **1978** අංක **16** දරන විශ්ව විද්‍යාල පනතේ **44** වන වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල පාලක සභාව පිහිටුවා ඇත. පාලක සභාව විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන අතර උපකුලපති නිල බලයෙන් එහි සභාපති වශයෙන්ද ලේඛකාධිකාරි එහි ලේකම් වශයෙන්ද කටයුතු කරනු ලබයි.

සනාතන සභාව

1985 අංක 07 දරන විශ්ව විද්‍යාල පනතේ (සංශෝධිත) 24 වන වගන්තිය මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 46 (2) වන වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල සනාතන සභාව පිහිටුවා ඇත. සනාතන සභාව විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පාලනාධිකාරිය වන අතර උපකුලපති එහි සභාපති වශයෙන්ද ලේඛකාධිකාරි එහි ලේකම් වශයෙන්ද කටයුතු කරනු ලබයි. එය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් පිළිබඳ විෂයමාලා, ඉගැන්වීම්, පර්යේෂණ, විභාග සහ අදාළ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් පාලක සභාවට නිර්දේශ ඉදිරිපත් කරයි.

විශ්වවිද්‍යාල මණ්ඩලය- ත්‍රිකුණාමල මණ්ඩපය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව විශ්වවිද්‍යාල මණ්ඩලය පිහිටුවා ඇති අතර, මණ්ඩපාධිපති විශ්වවිද්‍යාල මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, මණ්ඩපය තුළ වෙනත් ඕනෑම රැස්වීමකට කැඳවීමට, පැමිණ සිටීමට සහ කතා කිරීමට හිමිකම් ඇත. මෙම මණ්ඩලය මණ්ඩපයේ අභ්‍යන්තර පරිපාලනය සඳහා වගකිව යුතු අතර කවුන්සිලයේ අනුමැතිය ඇතිව, මණ්ඩපයේ අභ්‍යන්තර පරිපාලනයට අදාළ හෝ ආනුෂංගික හෝ ඊට සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් නීති රීති සකස් කරනු ලබයි.

පීඨ මණ්ඩලය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව පීඨ මණ්ඩලය පිහිටුවා ඇති අතර, එම පීඨයේ පීඨාධිපතිවරයා මණ්ඩලයේ මුලසුන හොබවනු ඇත. පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තුවල ඉගැන්වීම්, විභාග සහ පර්යේෂණ සම්බන්ධ කරුණු නියාමනය කිරීම සහ අධ්‍යයන පාඨමාලා හා විභාග සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් සනාතන සභාවට නිර්දේශ කිරීම සහ සනාතන මණ්ඩලයේ පාලනයට යටත්ව රාජකාරි සහ කාර්යයන් ඉටු කරනු ලබයි.

1.2.1 පාලක සභාව

පාලක සභාව විශ්වවිද්‍යාලයේ විධායක ආයතනය සහ පාලන අධිකාරිය වන අතර උපකුලපති, මණ්ඩපාධිපති, සියලුම පීඨවල පීඨාධිපතිවරුන්, තමන් අතරින් තේරී පත් වූ සෙනෙට් සභිකයින් තිදෙනෙකු සහ **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ (i), (ii), (iii), (iv), (v) සහ (vi) ඡේදය යටතේ ඇති මුළු සාමාජිකයන් සංඛ්‍යාවට සමාන සාමාජිකයන් සංඛ්‍යාවට එකකින් වැඩි අගයකින් සමන්විත වේ. අධ්‍යාපනික, වෘත්තීය, වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රවල කීර්තිමත් සේවයක් ඉටු කළ පුද්ගලයන් අතරින් එවැනි සියලුම සාමාජිකයන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

පාලක මණ්ඩලයේ සාමාජිකයින්

2022 දෙසැම්බර් **31** දිනට

උපකුලපති	මහාචාර්ය එෆ්. සී. රාගල් (21.01.2022 දක්වා) මහාචාර්ය වී. කනගසිංගම් (22.01.2022 සිට)
නියෝජ්‍ය උපකුලපති	මහාචාර්ය කේ. ඊ. කරුණාහරන් (25.04.2022 සිට)
මණ්ඩපාධිපති, ත්‍රිකුණාමල මණ්ඩපය	මහාචාර්ය සී.ජී. දේවදාසන් මහත්මිය (01.02.2022 සිට)
පීඨවල පීඨාධිපතිවරුන්	
කෘෂිකර්ම පීඨය	මහාචාර්ය එම්. භක්තිනාදන්
කලා හා සංස්කෘත පීඨය	මහාචාර්ය ජේ. කෙනඩි.(2022 නොවැම්බර් දක්වා) ආචාර්ය වී. ගුණබාලසිංගම් (2022 දෙසැම්බර් සිට)
වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය	ආචාර්ය එස්. ජෙයරාජා
සෞඛ්‍යය ආරක්ෂණ පීඨය	ආචාර්ය ඒ. එන්. අරුල්ප්‍රගාසම් (2022 අගෝස්තු දක්වා) ආචාර්ය ටී. සදානන්දන් (2022 සැප්තැම්බර් සිට)
විද්‍යා පීඨය	මහාචාර්ය පී. ප්‍රදීපන් (2022 ජනවාරි දක්වා) ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී. විනෝබාබා (2022 මාර්තු සිට)
තාක්ෂණික පීඨය	මහාචාර්ය එම්. භක්තිනාදන් (2022 ජනවාරි දක්වා) ආචාර්ය ටී. මදිවේන්දන් (2022 පෙබරවාරි සිට)
ව්‍යවහාරික විද්‍යා පීඨය (ත්‍රි.ම)	එස්. තව්වනමූර්ති මහතා
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනපීඨය (ත්‍රි.ම)	කේ. සන්දර්කුමාර් මහත්මිය (2022 ජූනි දක්වා) ටී. බාස්කර් මහතා (2022 ජූලි සිට)
සනාතන සභාව විසින් තෝරා ගනු ලැබූ සාමාජිකයන්	
ආචාර්ය කේ. රාජේන්ද්‍රම් (2022 ඔක්තෝම්බර් දක්වා)	
ආචාර්ය කිව්.වයි.සෞන්දරරාජා මිය (2022 නොවැම්බර් සිට)	
ආචාර්ය කේ. අරුලානන්දම්	
වි.විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයන්	
මහාචාර්ය එම්. සෙල්වරාජා මහතා (2022 මැයි දක්වා)	ඉංජිනේරු එස්.තිලකරාජා මහතා
මහාචාර්ය ආර්. සුලයිමා ලෙබ්බේ මහතා	ටී. සිවනාදන් මහතා
ආචාර්ය එච්.ආර්. තම්බවිට මහතා	පී. ප්‍රේමනාත් මහතා
ආචාර්ය එස්. එම්. හුසේන් මහතා	ඒ. එල්. ජවුෆර් සාදික් මහතා
එස්.ෂන්මුගම් මහතා	ඉංජිනේරු එන්. සිවලිංගම් මහතා
ආචාර්ය ජී. සුගුණන් මහතා	එස්.ජේ.එම්.එස්. සමරකෝන් මිය
ඉංජිනේරු එස්.මෝහානරාජා මහතා	කේ. කරුණාහරන් මහතා (2022 ජූනි සිට)
ලේඛකාධිකාරි - පාලක සභාවේ ලේකම්	ඒ. බහිරදන් මහතා

1.2.2 සනාතන සභාව

සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධිකාරිය වන අතර උපකුලපතිතුමාගේ සභාපතිත්වය දරයි. අනෙකුත් සාමාජිකයින් ලෙස මණ්ඩපයේ මණ්ඩපාධිපති, සියලුම පීඨවල පීඨාධිපතිවරුන්, එක් එක් අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානියා මෙන්ම ; විශ්වවිද්‍යාලයේ සෑම ස්ථිර මහාචාර්යවරයෙක්ම; පුස්තකාලයාධිපති; සහ මෙම උපවගන්තියේ පෙර ඡේදවල සඳහන් කර ඇති ගුරුවරුන් හැර, එක් එක් පීඨයේ ස්ථිර ගුරුවරුන් විසින් ඔවුන්ගේ සංඛ්‍යාව අතරින් තේරී පත් වූ ගුරුවරුන් දෙදෙනෙක් ඇතුළත් වේ.

සනාතන සභාවේ සාමාජිකයින්

2022 දෙසැම්බර් 31 දිනට

උපකුලපති	මහාචාර්ය එෆ්. සී. රාගල් (21.01.2022 දක්වා) මහාචාර්ය වී. කනගසිංගම් (22.01.2022 සිට)
නියෝජ්‍ය උපකුලපති	මහාචාර්ය කේ. ඊ. කරුණාහරන් (25.04.2022 සිට)
මණ්ඩපාධිපති, ත්‍රිකුණාමල මණ්ඩපය	මහාචාර්ය සී.ජී. දේවදාසන් මහත්මිය (01.02.2022 සිට)
අධ්‍යක්ෂක/ ස්. වි .සෞ .අ. ආ.	ආචාර්ය එෆ්.බී. කෙනෙඩි මහත්මිය
පීඨවල පීඨාධිපතිවරුන්	
කෘෂිකර්ම පීඨය	මහාචාර්ය එම්. භක්තිනාදන්
කලා හා සංස්කෘත පීඨය	මහාචාර්ය ජේ. කෙනඩි.(2022 නොවැම්බර් දක්වා) ආචාර්ය වී. ගුණබාලසිංගම් (2022 දෙසැම්බර් සිට)
වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය	ආචාර්ය එස්. ජෙයරාජා
සෞඛ්‍යය ආරක්ෂණ පීඨය	ආචාර්ය ඒ. එන්. අරුල්ප්‍රගාසම් මහත්මිය (2022 අගෝස්තු දක්වා) ආචාර්ය ටී. සදානන්දන් (2022 සැප්තැම්බර් සිට)
විද්‍යා පීඨය	මහාචාර්ය සී. ප්‍රදීපන් (2022 ජනවාරි දක්වා) ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සී. විනෝබාබා (2022 මාර්තු සිට)
තාක්ෂණික පීඨය	මහාචාර්ය එම්. භක්තිනාදන් (2022 ජනවාරි දක්වා) ආචාර්ය ටී. මදිවේන්දන් (2022 පෙබරවාරි සිට)
ව්‍යවහාරික විද්‍යා පීඨය (ත්‍රි.ම)	එස්. තව්වනමූර්ති මහතා
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනපීඨය (ත්‍රි.ම)	කේ. සන්දර්කුමාර් මහත්මිය (2022 ජූනි දක්වා) ටී. බාස්කර් මහතා (2022 ජූලි සිට)
පුස්තකාලාධිපති	ආචාර්ය ඩබ්.ජේ.ජෙයරාජ්
අධ්‍යනාංශ ප්‍රධානීන්	
කෘෂි ජීව විද්‍යා අධ්‍යනාංශය, කෘෂි පීඨය	ආචාර්ය එන්.ආර්.ප්‍රනන්දු මහත්මිය
කෘෂි රසායන විද්‍යා අධ්‍යනාංශය, කෘෂි පීඨය	මහාචාර්ය සී. ප්‍රේමානන්දරාජා මහත්මිය
කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, කෘෂි පීඨය	ආචාර්ය ටී. ගිරිදරන් මහත්මිය
කෘෂි ඉංජිනේරු අධ්‍යනාංශය, කෘෂි පීඨය	එම්.රාජේන්ද්‍රන් මහතා (2022අප්‍රේල් දක්වා) ඊ.ඩී.ජේ. ප්‍රින්ස් මහත්මිය (2022 ජූනි සිට)
කෘෂි සත්ව විද්‍යා අධ්‍යනාංශය, කෘෂි පීඨය	ආර්.දිව්‍යදර්ශන් මහතා (2022 ජූනි දක්වා) ආචාර්ය එම්.එම්. මහුසූන් (2022 ජූලි සිට)
භෝග විද්‍යා අධ්‍යනාංශය, කෘෂි පීඨය	ආචාර්ය ටී. ගිරිදරන්
අරාබි අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	ආචාර්ය එම්.එච්. එම්. ජලීල්(2022 අගෝස්තු දක්වා) අයි. එම්. තාලිබ් මහතා(2022 සැප්තැම්බර් සිට)
සංසන්දනාත්මක ආගම් අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	කේ.මදිසීලන් මහතා
අධ්‍යාපනය සහ ළමා ආරක්ෂණය අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	ආචාර්ය සී. අරුල්මොලි (2022 ජනවාරි දක්වා) ආර්. තක්ෂායිනී මහත්මිය (2022 පෙබරවාරි සිට)
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	ආචාර්ය එස්. උමාශන්කර්
ලලිත කලා අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	කේ.රවිචන්ද්‍රන් මහතා
භූගෝල විද්‍යා අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	ආර්. කිරුබරාජා මහතා (2022 ජනවාරි දක්වා) ටී.සවිතානන්දම් මහත්මිය (2022 පෙබරවාරි සිට)

හින්දු ශිෂ්ටාචාර අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	ආචාර්ය වී. ගුණබාලසිංහම්(2022 නොවැම්බර් දක්වා) ආචාර්ය එස්.කේසවන් මහත්මිය (2022 දෙසැම්බර් සිට)
ඉතිහාස අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	එස්. කේ. සිවගනේෂන්
තොරතුරු තාක්ෂණය අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	ටී.සචිතානන්දම් මහතා(2022 සැප්තැම්බර් සිට)
ඉස්ලාමීය අධ්‍යයනය අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	ඒ. එල්. එම්. මුජාහිද් මහතා (2022 අගෝස්තු දක්වා) එම්.බී.ෆවුසුල් මහතා (2022 සැප්තැම්බර් සිට)
භාෂා අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	මහාචාර්‍ය. එස්.චන්ද්‍රසේගරම් (2022 ජූනි දක්වා) ආචාර්ය කේ.ශ්‍රී. කරුණාහරන් (2022 ජූලි සිට)
දර්ශනය සහ වටිනාකම් අධ්‍යයන අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	ආර්. ප්‍රේමකුමාර් මහතා
සමාජ විද්‍යා අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	කේ.සත්‍යසේගර් මහතා
දෙමළ අධ්‍යයනය අධ්‍යනාංශය, කලා හා සංස්කෘත පීඨය	මහාචාර්ය. එස්.චන්ද්‍රසේගරම් (2022 ජූනි සිට)
වාණිජ්‍යය අධ්‍යනාංශය, වාණිජ පීඨය	ආචාර්ය එන්.රාජේශ්වරන්
ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, වාණිජ පීඨය	ආචාර්ය ජේ. සුරේෂ් මහත්මිය
කළමනාකරණ අධ්‍යනාංශය, වාණිජ පීඨය	මහාචාර්ය. ඒ. ඇන්ටන් අරුල්රාජා
සායනික විද්‍යා අධ්‍යනාංශය, සෞඛ්‍යය පීඨය	මහාචාර්ය. එම්. තිරුකුමාර්
මානව ජීව විද්‍යා අධ්‍යනාංශය, සෞඛ්‍යය පීඨය	ආචාර්ය එම්.දයාබරන් මහත්මිය
වෛද්‍ය අධ්‍යාපනය සහ පර්යේෂණ අධ්‍යනාංශය, සෞඛ්‍යය පීඨය	ආචාර්ය එම්. රෝෂිනී මහත්මිය
ව්‍යාධි කායික විද්‍යා අධ්‍යනාංශය, සෞඛ්‍යය පීඨය	ආචාර්ය වී.ආර්.ෆ්‍රැන්සිස්
ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ සේවා අධ්‍යනාංශය, සෞඛ්‍යය පීඨය	ආචාර්ය කේ.අරුලානන්දම්
අතිරේක සෞඛ්‍ය අධ්‍යාපන අධ්‍යනාංශය, සෞඛ්‍යය පීඨය	ආචාර්ය එස්. සුජේන්ද්‍රන්
උද්භිද විද්‍යා අධ්‍යනාංශය, විද්‍යා පීඨය	ආචාර්ය සී. මහේන්ද්‍රනාදන් මහත්මිය
රසායන විද්‍යා අධ්‍යනාංශය, විද්‍යා පීඨය	ආචාර්ය එම්. කෝනේස්වරන්
පරිගණන අධ්‍යනාංශය, විද්‍යා පීඨය	එස්.සෝතීස්වරන් මහතා (2022 දෙසැම්බර් සිට)
ගණිතය අධ්‍යනාංශය, විද්‍යා පීඨය	පී.පරමදේවන් මහතා (2022 පෙබරවාරි සිට) ටී.පියෝ ෂුඩ් නවීන්දන් මහත්මිය (2022 මාර්තු සිට)
භෞතික විද්‍යා අධ්‍යනාංශය, විද්‍යා පීඨය	ආචාර්ය පී. රොඩ්නි ප්‍රනාන්දු (2022 මාර්තු දක්වා) ආචාර්ය කිව්.වයි.සෞන්දරරාජා මිය (2022 අප්‍රේල් සිට)
සත්ත්ව විද්‍යා අධ්‍යනාංශය, විද්‍යා පීඨය	මහාචාර්ය සී.ජී.දේවදාසන් මහත්මිය (2022 ජනවාරි දක්වා) ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී. විනෝබාබා (2022 පෙබරවාරි සිට) ආචාර්ය එම්. විනෝබාබා මහත්මිය (2022 මාර්තු සිට)
ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය, තාක්ෂණ පීඨය	ආචාර්ය ඩී.එම්. හුණුපොලගම මහත්මිය (2022 අගෝස්තු සිට)
බහුවිධ අධ්‍යයන අධ්‍යනාංශය, තාක්ෂණ පීඨය	එම්. සුගිර්දරන් මහතා (2022 පෙබරවාරි සිට)
පරිගණක විද්‍යාව අධ්‍යනාංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය , ත්‍රි.ම	එස්. තව්වනමූර්ති මහතා(2022 අප්‍රේල් දක්වා) එස්. කේදිකා මහත්මිය(2022 ජූනි සිට නොවැම්බර් දක්වා) ආචාර්ය එස්. උෂාකාන්තන්(2022 දෙසැම්බර් සිට)
භෞතික විද්‍යා අධ්‍යනාංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය , ත්‍රි.ම	එස්. ලෝතීස්වරන් මහතා
තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය , ත්‍රි.ම	ආචාර්ය ජේ.එස්.රොහාන් සවරිමුත්තු (2022 ජූලි සිට)
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යනාංශය, සන්නි. හා ව්‍යා. පීඨය , ත්‍රි.ම	ටී. බාස්කර් මහතා (2022 ජූනි දක්වා) වී. ලෙනින්කුමාර් මහත්මිය(2022 ජූලි සිට)
භාෂා සහ සන්නිවේදන අධ්‍යනාංශය, සන්නි. හා ව්‍යා. පීඨය , ත්‍රි.ම	ආචාර්ය වී.ජේ.නවීන්
නැටුම්, නාට්‍ය සහ රංග, අධ්‍යනාංශය,ස්වාමී විපුලානන්ද සෞන්දර්ය ආයතනය	ආචාර්ය ජී.ජෙයරන්ජනී මහත්මිය (2022 ජනවාරි දක්වා) ආචාර්ය පී.තක්ෂායිනී මහත්මිය (2022 පෙබරවාරි සිට)
සංගීත අධ්‍යනාංශය,ස්වාමී විපුලානන්ද සෞන්දර්ය ආයතනය	ආචාර්ය ටී.ප්‍රදීපන් (2022 ජනවාරි දක්වා) ආචාර්ය එන්. ප්‍රශාන්ත් මහත්මිය(2022 පෙබරවාරි සිට)
දෘශ්‍ය තාක්ෂණික කලා අධ්‍යනාංශය,ස්වාමී විපුලානන්ද සෞ.ආයතනය	ආචාර්ය එස්. සිවරත්නම්

මහාචාර්යවරුන්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී. විනෝබාබා	සත්ත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, විද්‍යා පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී. මහේන්ද්‍රන් මහත්මිය	කෘෂි රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂි පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. මුරුගදාස්	දෙමළ පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය(2022 අප්‍රේල් දක්වා),කලා
මහාචාර්ය. එෆ්. සී. රාගල්	භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, විද්‍යා පීඨය
මහාචාර්ය පී. ප්‍රේමානන්දරාජා මහත්මිය	කෘෂි රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කෘෂි පීඨය
මහාචාර්ය එම්. භක්තිනාදන්	කෘෂි සත්ත්ව විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කෘෂි පීඨය
මහාචාර්ය ටී. එච්. සේරන් මහත්මිය	භෝග විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කෘෂි පීඨය
මහාචාර්ය එස්. සුදර්සන්	භෝග විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කෘෂි පීඨය
මහාචාර්ය ජේ. කෙනෙඩි	ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්ය, කලා පීඨය
මහාචාර්ය වී. ඉන්බමෝහන්	ලලිත කලා පිළිබඳ මහාචාර්ය, කලා පීඨය
මහාචාර්ය එස්. චන්ද්‍රසේගරම්	භාෂා පිළිබඳ මහාචාර්ය, කලා පීඨය
මහාචාර්ය වී. ගුණරත්නම්	දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කලා පීඨය
මහාචාර්ය ටී. ක්‍රිෂ්ණමෝහන්	දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කලා පීඨය
මහාචාර්ය ටී. භවන්	ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, වාණිජ පීඨය
මහාචාර්ය වී. කනගසිංහම්	කළමනාකරණය පිළිබඳ මහාචාර්ය, වාණිජ පීඨය
මහාචාර්ය ඒ. ඇන්ඩaa	කළමනාකරණය පිළිබඳ මහාචාර්ය, වාණිජ පීඨය
මහාචාර්ය ඒ. ඇන්ටන් අරුල්රාජා	කළමනාකරණය පිළිබඳ මහාචාර්ය, වාණිජ පීඨය
මහාචාර්ය එම්. උමාකාන්ත්	වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය, සෞඛ්‍ය ආරක්ෂණ පීඨය
මහාචාර්ය කේ.ඊ.කරුණාහරන්	ප්‍රසව හා නාරි විද්‍යාව පිළිබඳ මහාචාර්ය, සෞඛ්‍ය ආරක්ෂණපීඨය
මහාචාර්ය එම්. තිරුකුමාර්	ප්‍රසව හා නාරි විද්‍යාව පිළිබඳ මහාචාර්ය, සෞඛ්‍ය ආරක්ෂණපීඨය
මහාචාර්ය එස්. අරසරත්නම්	රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, විද්‍යා පීඨය
මහාචාර්ය එම්. සිදම්බරේසන්	රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, විද්‍යා පීඨය
මහාචාර්ය ඒ. ජී. ජෝන්පිල්ලයි	ගණිතය පිළිබඳ මහාචාර්ය, විද්‍යා පීඨය
මහාචාර්ය එස්. තිරුගනේෂ්	ගණිතය පිළිබඳ මහාචාර්ය, විද්‍යා පීඨය
මහාචාර්ය පී. ප්‍රදීපන්	භෞතික විද්‍යාව පි පිළිබඳ මහාචාර්ය, විද්‍යා පීඨය

සනාතන සභාවට පීඨ නියෝජිතයන්

කෘෂිකර්ම පීඨය
ආර්. දිව්‍යදර්සන් මහතා
බී. කරුණාරත්න මහත්මිය (2022 සැප්තැම්බර් දක්වා)
ආචාර්ය කේ. ප්‍රසන්නාත් (2022 ඔක්තෝම්බර් සිට)

වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය
ආචාර්ය එස්. බාලේන්ද්‍රන් (2022 පෙබරවාරි සිට)
ආචාර්ය ටී. ප්‍රභාහරන් (2022 පෙබරවාරි සිට)

විද්‍යා පීඨය
ආචාර්ය පී. ඉලංගෝ (2022 ජනවාරි දක්වා)
මහාචාර්ය එස්. අරසරත්නම් (2022 ජනවාරි දක්වා)
ආචාර්ය ටී. ඊලසුහන්දන් (2022 පෙබරවාරි සිට)
කේ.ඒ.එන්.කේ.කරුණාරත්න (2022 පෙබරවාරි සිට මාර්තු දක්වා)

ව්‍යවහාරික විද්‍යා පීඨය, ත්‍රි.ම
එස්. කේදිකා මහත්මිය (2022 අගෝස්තු දක්වා)
එස්. පරන්තාමන් මහතා
ඒ. සුදාහරන් මහතා (2022 සැප්තැම්බර් සිට)

කලා හා සංස්කෘත පීඨය
ආචාර්ය කේ. රාජෙන්ද්‍රම් (2022 ඔක්තෝම්බර් දක්වා)
සී. සිවනායගම් මහතා

සෞඛ්‍යය ආරක්ෂණ විද්‍යා පීඨය
එස්. ෂන්මුගනාදන් මහතා
ආචාර්ය. වී. තවිචනමූර්ති

තාක්ෂණික පීඨය
ටී. එම්. එස්. ඒ. තෙන්නකෝන් මහතා (2022 අගෝස්තු සිට)
ඉංජිනේරු ඒ. ජනාර්ත් (2022 අගෝස්තු සිට)

සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය, ත්‍රි.ම
ඩී. ආර්. ලක්ජීව මහතා
කේ.ජී.එල්.ඒ.එන්.එස්.ජයවර්ධන මහත්මිය

ලේඛකාධිකාරී - සනාතන සභාවේ ලේකම් — ඒ. බහිරදන් මහතා

1.2.3 රැස්වීම්

2022 වර්ෂයේ පැවැත්වූ පාලක සභාවන්, සනාතන සභාවන් හා අනෙකුත් අධිකාරී කමිටු පහත පරිදි වේ.

රැස්වීම්	රැස්වීම් සංඛ්‍යාව
පාලක සභාව	**12**
පාලක සභාවේ අනු කමිටු	
• කළමනාකරණ මණ්ඩලය - ස්. වී .සෞ .අ. ආ.	13
• මූල්‍ය කමිටුව	12
• විගණන කමිටුව	2
• කළමනාකරණ කමිටුව (බාහිර උපාධි හා ව්‍යාප්ති මධ්‍යස්ථානය)	5
• කළමනාකරණ කමිටුව (කායික මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය)	4
• විනය මණ්ඩලය	6
• දුක්ගැනවිලි කමිටුව	3
• උපකුලපති අරමුදල් කළමනාකරණ කමිටුව	0
• නේවාසික මණ්ඩලය	1
• තේරීම් කමිටුව	84
- අධ්‍යයන තේරීම් කමිටුව	42
- පරිපාලන තේරීම් කමිටුව	8
- අනධ්‍යයන තේරීම් කමිටුව	34

සනාතන සභාව	**15**
සනාතන සභාවේ අනු කමිටු	
• විෂයමාලා සමාලෝචන කමිටුව	7
• පර්යේෂණ සභාව	6
• විශ්වවිද්‍යාල උසස් උපාධි කමිටුව	10
• තත්ත්ව ආරක්ෂණය පිළිබඳ සනාතන සභාවේ ස්ථාවර කමිටුව	4
• පුස්තකාල කමිටුව	1
• ගෞරව උපාධි කමිටුව	2
• උපාධි ප්‍රදානෝත්සව කමිටුව	4

ත්‍රිකුණාමල මණ්ඩපයේ මණ්ඩලය	**12**
පීඨ මණ්ඩල	
• කෘෂිකර්ම පීඨය	14
• කලා හා සංස්කෘත පීඨය	20
• වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය	12
• සෞඛ්‍යය ආරක්ෂණ පීඨය	12
• විද්‍යා පීඨය	13
• තාක්ෂණික පීඨය	13

සමස්ත කාර්ය සාධනය

1.3.1 2022 වර්ෂයේ විශේෂ අවස්ථා

ජනවාරි

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 10 වැනි උපකුලපතිවරයා ලෙස මහාචාර්ය වල්ලිපුරම් කනගසිංගම් මහතා වැඩ භාර ගන්නා ලදී.



පෙබරවාරි

- ශිෂ්‍ය සංගමය සහ ශාරීරික අධ්‍යාපන ඒකකය මගින් සහෝදරත්ව කුසලාන තරඟාවලි 2022 ලෙස, සිසුන් සහ කාර්ය මණ්ඩලය අතර 6 පැති ඕවර හය ලීග් සැහැල්ලු පන්දු තරඟාවලියක් සංවිධානය කරන ලදී.

මාර්තු

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂය සඳහා උපාධි ප්‍රදානෝත්සවය.
- ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීම පිළිබඳ නිපුණතා සිතියම්ගත කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීම.

අප්‍රේල්

- සියලුම පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා උත්සව කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

මැයි

- ජාත්‍යන්තර කටයුතු අංශයේ කාර්යාලය ශ්‍රී ලංකාවේ චීන තානාපති අතිගරු Qi Zhenhong මහතා විසින් නිල වශයෙන් විවෘත කරන ලදී.



ජූනි

- මඩකලපුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව ලෝක පරිසර දිනය නිමිත්තෙන් රුක් රෝපණ උත්සවයක් විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨ පරිශ්‍රයේදී පැවැත්විණි.
- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ (SUSA) වාර්ෂික මහා සභා රැස්වීම - ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි. එහි සභාපති ලෙස ආචාර්ය එන්. රාජේෂ්වරන් තේරී පත් විය.
- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය සහ ප්‍රජා සම්පත් බලමුලු ගැන්වීමේ සංගමය (AMCOR) අතර ගිවිසුමක් අත්සන් කරන ලදී.

ජූලි

- කර්මාන්ත හා ප්‍රජා සම්බන්ධතා මධ්‍යස්ථානයේ කාර්යාලය නිල වශයෙන් විවෘත කරන ලදී.
- නැගෙනහිර විශ්වවිද්‍යාලය මගින් 'ඇතුළත් වූ සේවා සැපයීම' පිළිබඳව රජයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් කෙටි පාඨමාලාවක් පැවැත්වීම සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලය සහ ජාතික සාම සභාව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

අගෝස්තු

- හින්දු කලාගාරය සහ කෞතුකාගාරය කලා හා සංස්කෘතික පීඨ පරිශ්‍රයේ දී උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.
- සමාජ හා සංහිඳියාව සඳහා වූ මධ්‍යස්ථානය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

සැප්තැම්බර්

- නැගෙනහිර විශ්වවිද්‍යාලය සහ ශ්‍රී සත්‍ය සායි මානව විශිෂ්ටතා විශ්වවිද්‍යාලය ප්‍රාදේශීය සෞඛ්‍ය, අධ්‍යාපනික සහ පෝෂණ සංවර්ධනය සඳහා කටයුතු කිරීම සඳහා ඉන්දියාවේ දී අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී දිවංගත ආචාර්ය කේ. ඩබ්ලිව් දේවනායගම් මහතාගේ ප්‍රතිමාව උපකුලපතිතුමා අතින් විවෘත කෙරිණි.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් විශ්වවිද්‍යාලය වෙත කොස් පැළ 200ක් පරිත්‍යාග කරන ලදුව ඒවා වාණිජ හා කළමනාකරණ පීඨ පරිශ්‍රයේ රෝපණය කරන ලදී.
- කලා හා සංස්කෘතික පීඨය යටතේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශයක් සඳහා අනුමැතිය ලැබිණි.
- මහජන චීන සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකාවේ තානාපති අතිගරු Qi Zhenhong මහතා විසින් තානාපති ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩ සටහන යටතේ සිසුන් **100** දෙනෙකු සඳහා රු. මිලියන **4.30** කට ආසන්න ප්‍රමාණයක් නැගෙනහිර විශ්වවිද්‍යාලය වෙත ප්‍රදානය කරන ලදී.



ඔක්තෝම්බර්

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ **26** වන උපාධි ප්‍රදානෝත්සවය පැවැත්විණි.
- 2020, 2021 සහ 2022 විශ්‍රාමික කාර්ය මණ්ඩලය සඳහා ප්‍රශංසනීය සේවා සම්මාන සහ උපහාර උත්සවය පැවැත්විණි.
- ශ්‍රී.ල.නැ.වි.වි. සහ සත්‍ය සායි කරුණා පදනම අතර අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලද අතර ඒකාබද්ධ EKG සමඟ බුද්ධිමත් වෙදනලාව පරිත්‍යාග කරන ලදී.
- වාණිජ අධ්‍යයන අංශයේ කාර්මික තාක්ෂණ මධ්‍යස්ථානය විවෘත කරන ලදී.

නොවැම්බර්

- නෝර්වීජියානු ව්‍යවහාරික විද්‍යා විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- 2022 නොවැම්බර් 17 වැනි දින උපාධි අධ්‍යයන පීඨය පිහිටුවීමට වි.වි. ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය ලැබිණ.

දෙසැම්බර්

- බාහිර අධ්‍යයන ආයතනය ඔවුන්ගේ කාර්යාලය වන්දාරුමූලෙයි පරිශ්‍රයේ සිට මඩකලපුව නගරයට ගෙන යන ලදී.
- උසස් පෙළ විභාගයට පෙනී සිටීමට නියමිත විද්‍යා විෂය ධාරාවේ පාසල් සිසුන් සඳහා සූදානම් වීමේ සැසියක් පවත්වන ලදී.
- වාණිජ කර්මාන්ත හා කෘෂිකර්ම මණ්ඩලය හරහා සියලුම ප්‍රදේශවල ගොවි නියෝජිතයන් හමුවීම සඳහා කෘෂිකර්ම පීඨයේ සහ තාක්ෂණ පීඨයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයේ සම්භාවනීය සහභාගිත්වයෙන් සහයෝගීතා සාකච්ඡාවක් පැවැත්විණි.

1.3.2 උපාධි ප්‍රදානය

විශ්වවිද්‍යාලය කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ප්‍රමාද වී තිබුණු සිය 25 වන උපාධි ප්‍රදානෝත්සවය 2022 මාර්තු 12 සහ 13 යන දිනවල සහ 26 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2022 ඔක්තෝබර් 1 සහ 2 යන දිනවල පවත්වන ලදී. 2022 දී විශ්වවිද්‍යාලය විසින් ත්‍රිකුණාමල මණ්ඩපය ඇතුළු පීඨ අටකින් උපාධිධාරීන් 3849ක් බිහි කරන ලදී.

1.3.2.1 උපාධිධාරීන්ගේ සාරාංශ වාර්තාව

2022 උපාධි ප්‍රදානෝත්සවයේ සාරාංශය

		සම්මානිත උපාධිධාරීන්
උපාධි අපේක්ෂක	අභ්‍යන්තර	3477
	බාහිර	116
එකතුව		**3593**
පශ්චාත් උපාධි	දර්ශනසූරී	1
	දර්ශනපති	1
	පශ්චාත් උපාධි	253
	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	1
එකතුව		**256**
මුළු එකතුව		**3849**

උපාධි පන්තිය අනුව **2022** උපාධි ප්‍රදානෝත්සවයේ සාරාංශය

පීඨය	පළමු පන්තිය	දෙවන පෙළ ඉහළ	දෙවන පෙළ පහළ	සාමාන්‍ය සාමාර්ථ	එකතුව
කෘෂි	4	42	42	117	**205**
කලා	10	413	490	640	**1553**
වාණිජ	29	132	98	232	**491**
සෞඛ්‍ය	-	8	37	250	**295**
විද්‍යා	17	82	67	154	**320**
තාක්ෂණ	-	11	26	26	**63**
ව්‍යවහාරික විද්‍යා, ත්‍රි.ම.	22	42	25	62	**151**
සන්නිවේදන, ත්‍රි.ම.	10	94	65	230	**399**
එකතුව	**92**	**824**	**850**	**1711**	**3477**

පස් අවුරුදු උපාධි ප්‍රදානෝත්සව සාරාංශය *

		පීඨය	2022	2019	2018	2017	2016
උපාධි අපේක්ෂක	අභ්‍යන්තර	කෘෂි	205	44	43	4	80
		කලා	1553	114	291	369	87
		වාණිජ	491	169	129	141	112
		සෞඛ්‍ය	295	-	68	71	84
		විද්‍යා	320	50	91	64	111
		තාක්ෂණ	63	-	-	-	-
		ව්‍ය.වි., ත්‍රි.ම.	151	8	12	10	16
		සන්නි, ත්‍රි.ම.	399	130	88	74	60
	බාහිර	කෘෂි	-	-	-	11	2
		කලා	56	-	190	450	132
		වාණිජ	44	11	27	15	19
		සෞඛ්‍ය	-	47	-	-	-
		විද්‍යා	5	-	2	7	12
		සන්නි, ත්‍රි.ම.	11	8	6	8	19
පශ්චාත් උපාධි	දර්ශනසූරී	කලා	-	-	-	2	-
		විද්‍යා	1	-	-	1	-
	දර්ශනපති	කෘෂි	1	-	-	-	-
		කලා	-	3	3	6	2

		විද්‍යා	-	-	1	-	-
	පශ්චාත් උපාධි	කෘෂි	13	11	9	-	-
		කලා	186	3	1	84	-
		වාණිජ	54	4	35	1	-
		විද්‍යා	-	7	1	1	-
	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	වාණිජ	1	1	4	1	-

* මෙම වගුවේ ඇති සියලුම සංඛ්‍යාලේඛන සෑම වසරකම පවත්වනු ලබන උපාධි ප්‍රදානෝත්සව වලින් සම්පාදනය කර ඇත. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 සහ 2021 වසර සඳහා උපාධි ප්‍රදානෝත්සව පැවැත්වූයේ නැත.

1.3.3 රැකියා නියුක්තිය

2022 වසර සඳහා උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය පහත පරිදි වේ:


1.3.3.1 රැකියා අනුපාතිකයේ සාරාංශ වාර්තාව

රැකියා නියුක්තිය පීඨ අනුව

පීඨය	ප්‍රතිශතය		
	රැකියා ලාභී	රැකියා විරහිත	වෙනත්
කෘෂිකර්ම පීඨය	59%	39%	2%
කලා හා සංස්කෘත පීඨය	4%	95%	2%
වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය	60%	38%	2%
සෞඛ්‍යය ආරක්ෂණ පීඨය	71%	18%	11%
විද්‍යා පීඨය	58%	36%	6%
තාක්ෂණික පීඨය	19%	75%	7%
ව්‍යවහාරික විද්‍යා පීඨය(ත්‍රි.ම)	50%	48%	3%
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනපීඨය (ත්‍රි.ම)	44%	54%	2%
එකතුව	**23%**	**65%**	**3%**

රැකියා නියුක්තිය ස්ත්‍රී පුරුෂ භාවය අනුව

පීඨය	ස්ත්‍රී පුරුෂ භාවය	ප්‍රතිශතය		
		රැකියා ලාභී	රැකියා විරහිත	වෙනත්
කෘෂිකර්ම පීඨය	පුරුෂ	67%	29%	5%
	ස්ත්‍රී	53%	47%	0%
කලා හා සංස්කෘත පීඨය	පුරුෂ	4%	94%	2%
	ස්ත්‍රී	4%	95%	1%
වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය	පුරුෂ	69%	25%	7%
	ස්ත්‍රී	55%	45%	0%
සෞඛ්‍යය ආරක්ෂණ පීඨය	පුරුෂ	72%	15%	13%
	ස්ත්‍රී	71%	19%	10%
විද්‍යා පීඨය	පුරුෂ	55%	37%	8%
	ස්ත්‍රී	61%	36%	4%
තාක්ෂණික පීඨය	පුරුෂ	20%	80%	0%
	ස්ත්‍රී	19%	74%	7%
ව්‍යවහාරික විද්‍යා පීඨය(ත්‍රි.ම)	පුරුෂ	53%	45%	3%
	ස්ත්‍රී	48%	49%	3%
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනපීඨය (ත්‍රි.ම)	පුරුෂ	59%	36%	5%
	ස්ත්‍රී	40%	58%	1%
එකතුව	පුරුෂ	**30%**	**65%**	**4%**
	ස්ත්‍රී	**24%**	**74%**	**2%**



* වෙනත් යනු රැකියාවක් නොසොයා සිටීම/උසස් අධ්‍යාපනය දිගටම කරගෙන යාමයි.

1.3.4 ජයග්‍රහණ සහ පිළිගැනීම්

1.3.4.1 නේචර් දර්ශකයේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අතර ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය ප්‍රථම ස්ථානයට පත්ව ඇත.

සෑම වසරකම, නේචර් දර්ශකය විසින් අවසාන දින දර්ශන වර්ෂයේ උසස් තත්ත්වයේ පර්යේෂණ නිමැවුම් ගණනය කිරීම් මත පදනම්ව දත්ත ප්‍රකාශයට පත් කරයි. භෞතික විද්‍යා විෂය ක්ෂේත්‍රයේ ප්‍රබල සහ උසස් තත්ත්වයේ පර්යේෂණ ප්‍රතිදානය හේතුවෙන් 2020 සිට 2022 දක්වා වසර තුනක් අඛණ්ඩව නේචර් දර්ශකයේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අතර ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලය පළමු ස්ථානයට පත්ව ඇත.

නේචර් දර්ශකය **2022** වගුව - භෞතික විද්‍යාව

#	ආයතනය	දායකත්වය 2020	2021	ගණනය 2021
1	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	1.33	0.26	36
2	සබරගමුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	0.08	0.10	2
3	රුහුණු විශ්වවිද්‍යාලය	0.05	0.07	44
4	කොළඹ විශ්වවිද්‍යාලය	0.03	0.06	44

1.3.4.2 ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ විද්වතුන් තිදෙනෙකු ලොව හොඳම පර්යේෂකයින් 40% අතරට ශ්‍රේණිගත කර ඇත.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ විද්වතුන් තිදෙනෙකු ඔවුන්ගේ ප්‍රකාශිත සඟරා ලිපි වලට අනුව ලොව හොඳම පර්යේෂකයින් 40% අතරට ශ්‍රේණිගත කර ඇත. පහත වගුව 2022 අවසානය දක්වා වෘත්තීය-දිගු උපුටා දැක්වීමේ බලපෑම මත පදනම්ව ශ්‍රේණිගත කිරීමක් සපයයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයෙන් ලෝකයේ හොඳම 40% පර්යේෂකයන් අතරට තේරී පත්වූවන් මෙසේය.

විශ්ව විද්‍යාලයේ පර්යේෂකයන් **2022** අවසානය දක්වා ඔවුන්ගේ වෘත්තීය-දිගු උපුටා දැක්වීමේ බලපෑම මත පදනම්ව

පර්යේෂක	ක්ෂේත්‍රය	උප ක්ෂේත්‍රය	සහරා ගණන	ශ්‍රේණිගත කිරීම
මහාචාර්ය එස්. තිරුගනේශ්	ස්වාභාවික විද්‍යාව	ගණිතය	1095	446,961
එස්. තවරේසන් මහත්මිය	ස්වාභාවික විද්‍යාව	ගණිතය	831	488,686
මහාචාර්ය ඒ.ඒ. අරුල්රාජා	ව්‍යාපාර හා කළමනාකරණය	මානව සම්පත් කළමනාකරණය	1571	499,396

1.3.4.3 විද්වතුන්ගේ සම්මාන සහ ජයග්‍රහණ

- කෘෂිකර්ම පීඨයේ ක්‍රිෂ්නාල් තිරුමර්පන් මහත්මිය එක්සත් රාජධානියේ කියවීමේ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම, ප්‍රතිපත්ති සහ සංවර්ධන පාසලේ ආචාර්ය උපාධිධාරිනියකි. ඇය එක්සත් රාජධානියේ කියවීමේ විශ්වවිද්‍යාලයේ පැවති ආචාර්ය උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණය-2022 හි හොඳම පර්යේෂණ රූපය සඳහා "ජනතාවගේ තේරීම් සම්මානය"දිනා ගන්නා ලදී.

- සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා වෛද්‍ය කේ. අරුලානන්දම් මහතා ඉන්දියාවේ පොන්ඩිචෙරි විශ්වවිද්‍යාලයේ පැවති 15 වැනි ලෝක දෙමළ සංස්කෘතික සමුළුවේදී දෙමළ ප්‍රජාවට සහ සංස්කෘතියට කළ සේවය වෙනුවෙන් “උලග තමිල් මාමනි විරුදු” යන ගෞරව සම්මානයෙන් පිදුම් ලැබීය.

- ත්‍රිකුණාමලය, සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨයේ එන්.ඩී. ජයරත්නම් මෙනවිය, ඉන්දියාවේ පැවති කීර්තිමත් ගෝලීය සම්මාන ප්‍රදානෝත්සවයේදී “තරුණ ජීවිත කාලීන ජයග්‍රාහකයා” සම්මානයෙන් පිදුම් ලැබුවාය.

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය විසින් ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල පැසිපන්දු කාන්තා කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු ලෙස ශාරීරික අධ්‍යාපන ඒකකයේ උපදේශක එම්.පරනිදාසන් මහතා පත් කරන ලදී.

- කලා හා සංස්කෘතික පීඨයේ ආචාර්ය කේ.රාජේන්ද්‍රම් සාක්ෂරතාව සඳහා ජනාධිපති සම්මානය ලබා ඇත.

1.3.4.4 ශිෂ්‍යයන්ගේ සම්මාන සහ ජයග්‍රහණ

- කලා හා සංස්කෘතික පීඨයේ භූගෝල විද්‍යා අංශයේ, එස්.සජීවිනි මෙනවිය, එස්.සින්දුජා මෙනවිය හා ආර්. කීර්තනා මෙනවිය 2023 ජනවාරි මාසයේ ජැමෙයිකාවේදී පැවැත්වුණු 2023 තරුණ සාමාජික නායකත්ව සාමාජික සමුළුවට දින **10** ක් සඳහා සහභාගී වීමට තෝරාගෙන ඇත. මෙම සිසුවියන් තිදෙනා අධ්‍යයන ආයතන 49 ක් හරහා රටවල් 26 කින් නියෝජනය කළ සිසුන් 67 දෙනෙකු අතරින් තෝරාගෙන ඇති අතර, ශ්‍රී ලංකාවෙන් එම සමුළුව නියෝජනය කරන එකම විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයයි.

- විවිධ රටවල විවෘත සිතියම්කරණ වැඩසටහන් සම්බන්ධ සැසියේදී විවිධ මාතෘකා යටතේ ආර්.කීර්තනා මෙනවිය, වී. කෞෂියා මෙනවිය සහ එන්.සාරන්‍යා මෙනවිය තම දැනුම බෙදාගත්හ.

නම	දැනුම බෙදා ගත් රටවල්
ආර්.කීර්තනා මෙනවිය	පිලිපීනය, රුවන්ඩාව, නයිජීරියාව
වී. කෞෂියා මෙනවිය	පිලිපීනය
එන්.සාරන්‍යා මෙනවිය	පිලිපීනය

- U23 කනිෂ්ඨ ජාතික පැසිපන්දු ශූරතාවලිය-2022 (VAAJ කනිෂ්ඨ ප්‍රීමියර් ලීග්) සඳහා සහභාගී වීමට ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල පැසිපන්දු කණ්ඩායම නියෝජනය කිරීමට කලා හා සංස්කෘතික පීඨයේ ඒ. දර්සිකා මෙනවිය තෝරාගෙන ඇත.
- 2022 කොළඹ විශ්ව විද්‍යාලයේ පැවති අන්තර් විශ්වවිද්‍යාල ආරාධිත කබඩි ශූරතාවලියේ පිරිමි කබඩි කණ්ඩායමට පළමු අනුශූරතාව හිමි විය.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණලාංකීන්

නම	ක්‍රීඩාව
කේ. රිනෝශ මයා	වෙස් (පිරිමි)
උදාරංසි ජයවර්ධන මෙනෙවිය	වෙස්(කාන්තා)
ඒ. දර්ශිකා මෙනෙවිය	පැසිපන්දු (කාන්තා)
පී. සනූජා මෙනෙවිය	පැසිපන්දු (කාන්තා)
එච්.කේ.දිල්ෂාන් මයා	ක්‍රිකට් (පිරිමි)
ටී. නිලාවන් මයා	පාපන්දු (පිරිමි)
ජේ. දර්ශනන් මයා	පාපන්දු (පිරිමි)
වී.පී.කෝසිකන් මයා	හොකී (පිරිමි)
ආනන්දන් අනෝජා මෙනෙවිය	කරාටේ (කාන්තා)
කේ. ඩිලක්ෂන් මයා	මල්ලව පොර (පිරිමි)
එම්.ප්‍රවීන් මයා	මල්ලව පොර (පිරිමි)

අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලියේ ජයග්‍රහණ- **2022**

	නම	බර පන්තිය	ස්ථානය
මල්ලවපොර	කේ. ඩිලක්ෂන් මයා	කි.ග්‍රෑම් 79	රන් පදක්කම
	එම්.ප්‍රවීන් මයා	කි.ග්‍රෑම් 80	රන් පදක්කම
	ඒ.ඒ.ඒ.සඳකැලුම් මයා	කි.ග්‍රෑම් 65	රිදී පදක්කම
	ටී. දූසාන්තන් මයා	කි.ග්‍රෑම් 61	ලෝකඩ පදක්කම
	වයි. ජෙනනන් මයා	කි.ග්‍රෑම් 70	ලෝකඩ පදක්කම
කරාටේ	ආනන්දන් අනෝජා මෙනෙවිය	කි.ග්‍රෑම් 68	රන් පදක්කම
	එල්. සුජීවනන් මයා	කි.ග්‍රෑම් 75	ලෝකඩ පදක්කම

1.3.4.5 කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා අධ්‍යයන පරිපාලනය සහ විගණනය වැඩි දියුණු කිරීම.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයීය ඉතිහාසයේ ප්‍රථම වතාවට, උපකුලපති, පීඨාධිපතිවරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අධ්‍යයන සැසි සහ විභාග ප්‍රගතිය කළමනාකරණය කර ක්ෂණිකව අධීක්ෂණය කළ හැකි වන පරිදි වෙබ් පාදක කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) , සංවර්ධනය කර ඇත.

1.3.5 තත්ත්ව ආරක්ෂණය

විසි වන සියවස සඳහා උසස් අධ්‍යාපනය (HETC) ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලයේ සම්බන්ධීකරණ ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ තත්ත්ව ආරක්ෂණය සඳහා වූ මධ්‍යස්ථානය (CQA) 2015 දී ස්ථාපිත කරන ලදී. මෙහි මූලික වශයෙන් අධ්‍යයන ප්‍රමිතීන් සහ උසස් අධ්‍යාපන සුදුසුකම්වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සහ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක කළමනාකරණයේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් දැනුවත් කිරීම සහ දිරිගැන්වීම සිදු කෙරේ. නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සියළුම ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලීන්, ශිෂ්‍ය සහාය සහ ආයතනික සංවර්ධනය සඳහා තත්ත්ව ආරක්ෂණය කිරීම අධීක්ෂණය කරනු ලබන අතර නැගෙනහිර විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF) අනුකූලව ක්‍රියාත්මක වන බවට මධ්‍යස්ථානය සහතික කරයි. විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ක්‍රියාවලීන් අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ප්‍රතිපත්ති රාමුව තුළ අනුකූල වේ.

විශ්වවිද්‍යාලය සඳහා ආයතනික සමාලෝචනය ලබන වසරේ (2023) පැවැත්වීමට සැලසුම් කර ඇති අතර උපකුලපතිවරයාගේ මහපෙන්වීම යටතේ මෙම මධ්‍යස්ථානය ඒ සඳහා කටයුතු කරමින් සිටී. ස්වයං ඇගයීම් වාර්තාව ලිවීම සඳහා කණ්ඩායමක් පත් කරන ලද අතර එහි කටයුතු දනටමත් සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පහත සඳහන් උපාධි පාඨමාලා සඳහා වැඩසටහන් සමාලෝචන පවත්වන ලද අතර , අවසාන සමාලෝචන වාර්තා ලබා ගැනීමට නියමිතව පවතී.

අංකය	පීඨය	දිනය	උපාධි පාඨමාලාවේ නම
සැසිය I	ව්‍යවහාරික විද්‍යා පීඨය (ත්‍රි.ම)	2022 සැප්තැම්බර් 21, 22	ව්‍යවහාරික භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
		2022 නොවැම්බර් 1 හා 2	පරිගණක විද්‍යාවේදී උපාධිය
	සිද්ධ වෛද්‍ය විද්‍යා ඒකකය (ත්‍රි.ම)	2022 සැප්තැම්බර් 30	සිද්ධ වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය උපාධිය
	විද්‍යා පීඨය	2022 ඔක්තෝම්බර් 25, 26	විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය උපාධිය)
සැසිය II	විද්‍යා පීඨය	ස්වයං ඇගයීම් වාර්තාව උඩුගත කරන ලදී.	A කාණ්ඩය (3): උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව, රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව, සත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව,
			B කාණ්ඩය (3): ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව, භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව, පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව,

2022 වසරේ විශ්වවිද්‍යාලයේ තත්ත්ව ආරක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

2022 දී පවත්වන ලද වැඩමුළු/ සම්මන්ත්‍රණ/ දැනුවත් කිරීමේ වැඩසටහන්

වැඩමුළුවේ නම	ඉලක්ක කණ්ඩායම	වැඩසටහනේ අරමුණ
පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය	පීඨාධිපතිවරුන්, සම්බන්ධීකාරක / උපාධි අධ්‍යයන පීඨයේ සහභාගීත්වයෙන් කෘෂිකර්ම, කලා හා සංස්කෘතික, වාණිජ හා කළමනාකරණ සහ විද්‍යා පීඨ වල පශ්චාත් උපාධි සම්බන්ධීකාරකවරුන්	ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF 2015) පෙළගැසුණු නම් සහ සම්මාන ගණන පෙළගැස්වීම.
ඉගැන්වීම සහ ඉගෙනීම පිළිබඳ නිර්ණායක පිළිබඳ වැඩමුළුව	තාක්ෂණ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය	ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ගුණාත්මකභාවය පිළිබඳ අදහසක් ලබා දීම.
පීඨ මට්ටමින් ගුණාත්මක සංස්කෘතිය අධීක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය - සැසිය-I	පීඨාධිපති,පීඨ තත්ත්ව ආරක්ෂණය සෛල (FQAC) සම්බන්ධීකාරක, ව්‍යවහාරික විද්‍යා පීඨයේ FQAC සාමාජිකයින් සහ ප්‍රධානී, IQAC සම්බන්ධීකාරක, IQAC සිද්ධ වෛද්‍ය ඒකකයේ / ත්‍රිකුණාමල මණ්ඩපයේ සාමාජිකයින්.	පීඨ මට්ටමින් තත්ත්ව ආරක්ෂණය වැඩි දියුණු කිරීම.
පීඨ මට්ටමින් ගුණාත්මක සංස්කෘතිය අධීක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය - සැසිය-I I	පීඨාධිපති, FQAC සම්බන්ධීකාරක, ව්‍යාපාර හා සන්නිවේදන අධ්‍යයන පීඨයේ FQAC සාමාජිකයින් / ත්‍රිකුණාමල මණ්ඩපය.	පීඨ මට්ටමින් තත්ත්ව ආරක්ෂණය වැඩි දියුණු කිරීම.
ආයතනික සමාලෝචනය (IR) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	ත්‍රිකුණාමල මණ්ඩපයේ පරිපාලන කාර්ය මණ්ඩලය.	ආයතනික සමාලෝචනය පිළිබඳ මූලික අදහසක් ලබා දීම.
ආයතනික සමාලෝචනය සඳහා ස්වයං ඇගයීම් වාර්තාව (SER) ලිවීම - සැසිය I	ත්‍රිකුණාමල මණ්ඩපයේ SER ලේඛන කණ්ඩායම	ආයතනික සමාලෝචනය සඳහා ස්වයං ඇගයීම් වාර්තාව ලිවීම.
ආයතනික සමාලෝචනය සඳහා සඳහා ස්වයං ඇගයීම් වාර්තාව (SER) ලිවීම - සැසිය II	SVIAS හි SER ලිවීමේ කණ්ඩායම	ආයතනික සමාලෝචනය සඳහා ස්වයං ඇගයීම් වාර්තාව ලිවීම.

(ඉදිරියට) 2022 දී පවත්වන ලද වැඩමුළු/ සම්මන්ත්‍රණ/ දැනුවත් කිරීමේ වැඩසටහන්

වැඩමුළුවේ නම	ඉලක්ක කණ්ඩායම	වැඩසටහනේ අරමුණ
පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචන රැස්වීම	පශ්චාත් උපාධි සම්බන්ධීකාරකවරුන්	2015 තත්වරාමු සහ කොමිසම වෙතින් බිලැන්කට් අනුමැතිය ලබා ගැනීම සඳහා සම්පාත වූ නම් සහ සම්මාන ගණන පෙළගැස්වීම.
අභ්‍යන්තර සමාලෝචන මාලාව 2022 පිළිබඳ වැඩමුළුව I	අභ්‍යන්තර විචාරකයින්	අභ්‍යන්තර සමාලෝචන ක්‍රියාවලිය
අභ්‍යන්තර සමාලෝචන මාලාව 2022 පිළිබඳ වැඩමුළුව II	අභ්‍යන්තර විචාරකයින්	අභ්‍යන්තර සමාලෝචන ක්‍රියාවලිය
අභ්‍යන්තර සමාලෝචන මාලාව 2022 පිළිබඳ වැඩමුළුව III	පීඨාධිපති, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, කලා හා සංස්කෘතික පීඨයේ විනය සම්බන්ධීකාරකවරුන්	අභ්‍යන්තර සමාලෝචනය සඳහා අපේක්ෂාවන් සහ සූදානම
සනාතන අනු කමිටුවේ විශේෂ රැස්වීම	තත්ත්ව ආරක්ෂණය මධ්‍යස්ථානය සහ FQAC සම්බන්ධීකාරකවරුන්	අධ්‍යක්ෂක / තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය, වි.වි.ප්‍ර,.කොා.ස. සමඟ සාමාජිකයින් හමුවීම
අධ්‍යක්ෂ / තත්ත්ව සහතික කවුන්සිලය සමඟ FQAC හි විශේෂ රැස්වීම.	තත්ත්ව ආරක්ෂණය මධ්‍යස්ථානය සහ FQAC සම්බන්ධීකාරකවරුන්	අධ්‍යක්ෂක / තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය, වි.වි.ප්‍ර,.කොා.ස. සමඟ සාමාජිකයින් හමුවීම
ආයතනික සමාලෝචන 2022 සඳහා විශේෂ SER ලිවීමේ කණ්ඩායම් රැස්වීම	උපකුලපති, නි. උපකුලපති, ලේඛකාධිකාරි,මූල්‍යාධිකාරි සහ SER ලේඛකයින්	SER ලිවීම සඳහා සාක්ෂි එකතු කිරීම සහ සූදානම් කිරීම ආරම්භ කිරීම.

2022 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ තත්ත්ව ආරක්ෂණ යාන්ත්‍රණයන් පරිපූරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.

ක්‍රියාකාරකම්
තත්ව ආරක්ෂණ ඒකකයෙහි ක්‍රියාකාරකම් පාලනය කරන අතුරු නීති ක්‍රියාත්මක කිරීම.
පුස්තකාලයේ තත්ත්ව ආරක්ෂණ සෛලයක් පිහිටුවීම..
පීඨ තත්ව ආරක්ෂණ සෛල සම්බන්ධීකාරකවරුන් සමඟ රැස්වීම් විධිමත් කිරීම.
තත්ත්ව ආරක්ෂණ පිළිබඳ සෙනෙට් ස්ථාවර කමිටු රැස්වීමේදී පීඨවල තත්ත්ව ආරක්ෂණ ගැටළු ඉදිරිපත් කිරීම.
පීඨ තත්ත්ව ආරක්ෂණ සෛල සම්බන්ධීකාරකවරුන් සමඟ නිරන්තර රැස්වීමේදී පීඨ මට්ටමින් තත්ත්ව ආරක්ෂණ කිරීමේ යාන්ත්‍රණය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම.
තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්වල හා පීඨ තත්ත්ව සහතික කිරීමේ සෛල වල ප්‍රගතිය පිළිබඳ සනාතන සභාවට සහ කවුන්සිලයට මාසිකව වාර්තා කිරීම.
අභ්‍යන්තර සමාලෝචනය ආරම්භ කිරීම.
විභාග ප්‍රශ්න පත්‍ර මධ්‍යස්ථ කිරීම සඳහා උපපරිපාලක වාර්තාව සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම.
උපාධි වැඩසටහන් සමාලෝචනය සම්බන්ධීකරණය කිරීම.
සම වයස් ඇගයීම් වාර්තාව ක්‍රියාත්මක කිරීම.
වැඩසටහන් සමාලෝචන නිර්දේශ සඳහා ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම.
දෙවන පරීක්ෂක වාර්තාව ක්‍රියාත්මක කිරීම,
පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය ක්‍රියාත්මක කිරීම සඳහා පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචන අත්පොත පිළිබඳ පාර්ශවකරුවන්ගේ දැනුවත් කිරීමේ වෙබිනාර් එක සම්බන්ධීකරණය කිරීම.
අතථ්‍ය පන්ති කාමරවල යෙදෙන ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රම දිරිමත් කිරීම.
නව පීඨ/අධ්‍යනාංශ /උපාධි පාඨමාලා සඳහා වන යෝජනා සඳහා පහසුකම් සැලසීම.
ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ තත්ත්ව ආරක්ෂණ කිරීමේ මධ්‍යස්ථානය සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම.
උපාධි නාම සංශෝධනය පිළිබඳ පීඨ මට්ටමේ රැස්වීම් පැවැත්වීම.
ස්වයං ඇගයීම් වාර්තාව ඩිජිටල්කරණය කිරීම පිළිබඳ පීඨ මට්ටමේ රැස්වීම් පැවැත්වීම.

තත්වරාමු මාර්ගෝපදේශයන්ට අනුව පවතින උපාධි පාඨමාලා සහ ස්වාධීන ඉගෙනුම් ඒකක වල නම් වෙනස් කිරීම සඳහා නිර්දේශය.
විෂයමාලා ඇගයීම් කමිටුවට උපාධි පාඨමාලා සඳහා නව විෂය මාලාව සඳහා නිර්දේශ කිරීම.
ශ්‍රී ලංකා තත්ව රාමු අනුව පශ්චාත් උපාධි පාඨමාලා වල නම් වෙනස් කිරීම සඳහා නිර්දේශ කිරීම.
අඛණ්ඩ ඇගයීම් පැවැත්වීම සඳහා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම.
උපාධි / අධ්‍යනාංශ / පීඨ / පසුබැසීමේ සුදුසුකම් යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම.
පසුබැසීමේ සුදුසුකම් සඳහා අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.
අභ්‍යන්තර සමාලෝචකයින් සඳහා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම.
පවත්නා තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව භාවිතා කරමින් පීඨ තත්ත්ව ආරක්ෂණ සඳහා පර්යේෂණ සහකාරවරුන් පත් කිරීම සඳහා සෙනෙට් සභාවේ නිර්දේශය සහ කවුන්සිලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.
උපාධි යෝජනා සඳහා අනුමත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.

1.3.6 අභිනවයෙන් පිහිටුවන ලද පීඨ / අධ්‍යනාංශ / මධ්‍යස්ථාන සහ ඒකක

1.3.6.1 උපාධි අධ්‍යයන පීඨය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 48A වගන්තිය යටතේ 2022 නොවැම්බර් 17 වැනි දින ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ හත්වැනි පීඨය ලෙස උපාධි අධ්‍යයන පීඨය ස්ථාපිත කරන ලදී. පනතට අනුව පර්යේෂණ ප්‍රවර්ධනය සහ සැපයීම, උසස් උපාධි සහ අනෙකුත් ශාස්ත්‍රීය වෙනස්කම් වලට තුඩු දෙන අධ්‍යයන පාඨමාලා සඳහා වන ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වන්නේ පීඨයයි. පශ්චාත් උපාධි පාඨමාලා සහ පර්යේෂණ ක්‍රියාකාරකම් තුළින් තිරසාර සංවර්ධනය සඳහා ධනාත්මක ආකල්ප ඇති දැනුමෙන් හා නිපුණතාවලින් පිරි මානව සම්පත් උත්පාදනය කිරීමට උපාධි අධ්‍යයන පීඨය අපේක්ෂා කරයි.

1.3.6.2 අභිනවයෙන් පිහිටුවන ලද අධ්‍යනාංශ

දමිළ අධ්‍යයන අධ්‍යනාංශය

දෙමළ අධ්‍යයන අධ්‍යනාංශය 2022 දී කලා හා සංස්කෘතික පීඨයේ පිහිටුවන ලදී. මෙම අධ්‍යනාංශය සාමාන්‍ය ශාස්ත්‍රවේදී සහ විශේෂ උපාධි මෙන්ම ශාස්ත්‍රපති, දෙමළ භාෂා දර්ශනපති, සහ දර්ශන ආචාර්ය වැනි පශ්චාත් උපාධි දෙමළ භාෂාවෙන් පිරිනමයි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය 2022 වසරේ කලා හා සංස්කෘතික පීඨයේ ආරම්භ කරන ලදී. කලා උපාධි අපේක්ෂකයින් අතර තොරතුරු හා සන්නිවේදන දැනුම වැඩි දියුණු කිරීම තුළින් ඔවුන්ට වර්තමාන වෙළඳපොළ තුළ සාර්ථක වීමට සහ එනයින් වඩා හොඳ ජීවිතයක් ගත කිරීමට හැකියාව ලබා දීම අධ්‍යනාංශයේ අරමුණයි.

පරිගණක අධ්‍යනාංශය

පරිගණක අධ්‍යනාංශය 2022 දී විද්‍යා පීඨයේ ආරම්භ කරන ලද අතර, රට පුරා සිටින තොරතුරු තාක්ෂණ කර්මාන්ත අංශ සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් පර්යේෂණ සහ ඉගැන්වීමේ ක්‍රියාකාරකම් ව්‍යාප්ත කිරීම එහි අරමුණයි. පරිගණක අධ්‍යනාංශය මෘදුකාංග විසඳුම් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත උපදේශන සේවා ලබා දෙමින් සිය සේවාවන් තවදුරටත් පුළුල් කරයි.

තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය

තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය 2022 දී ත්‍රිකුණාමල මණ්ඩපයේ සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨයේ ආරම්භ කරන ලදී. ත්‍රිකුණාමල මණ්ඩපයේ සියලුම සිසුන් අතර තොරතුරු තාක්ෂණ සාක්ෂරතා මට්ටම ඉහළ නැංවීම මෙම අධ්‍යනාංශයේ අරමුණයි.

1.3.6.3 අභිනවයෙන් පිහිටුවන ලද මධ්‍යස්ථාන

කර්මාන්ත හා ප්‍රජා සම්බන්ධතා මධ්‍යස්ථානය

කර්මාන්ත හා ප්‍රජා සම්බන්ධතා මධ්‍යස්ථානය (CICL) 2022 පෙබරවාරි මස පිහිටුවන ලදී.විශ්ව විද්‍යාලය පසුගිය දශක දෙක තුනක කාලය තුළ තම විද්වතුන් හා උපාධිධාරීන් ඔවුන්ගේ ප්‍රවීණතාවය ඇති සුවිශේෂී විශේෂාංග අනුව තම සමගාමී සමාජය සමඟ සම්බන්ධතා ඇති කරගෙන ඇති අතර මෙහිදී පර්යේෂණ සංවර්ධනයට බලපානුයේ වාණිජකරණයයි. විශ්ව විද්‍යාලයට ප්‍රජාව හා ඒකාබද්ධ වීමට ඇති ප්‍රධාන අවස්ථාව මෙයයි . තම ප්‍රජාවගේ ආර්ථිකයට සහාය වීමට කර්මාන්තය පැමිණෙන්නේ මෙහිදීය. ප්‍රජාවගේ කාර්මීකරණය සඳහා CICL හරහා තාක්ෂණික දැනුම සහ කුසලතා අර්ථකථනය කරනු ලැබේ.

බහුවිධ පර්යේෂණ සඳහා වූ මධ්‍යස්ථානය

විද්‍යාව, කෘෂිකර්මය, මානව ශාස්ත්‍ර, ව්‍යාපාර, ආර්ථික විද්‍යාව සහ වෛද්‍ය විද්‍යාව යන ක්ෂේත්‍රවල තීරණාත්මක අධ්‍යයන සහයෝගයක් මෙන්ම විශ්ව විද්‍යාලයේ පර්යේෂණ ප්‍රමුඛත්වය වෙනුවෙන් පැහැදිලි අනුමැතිය ද ඇති නැගෙනහිර විශ්වවිද්‍යාලයේ බහුවිධ පර්යේෂණ සඳහා වූ මධ්‍යස්ථානය (CMR) 2022 පෙබරවාරි මාසයේදී පිහිටුවන ලදී. මෙහි ප්‍රධාන ඉලක්කය වනුයේ ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික, සමාජීය, සංස්කෘතික යහපැවැත්ම සහ ක්ෂේත්‍රයේ කාර්මික අවශ්‍යතා කාලෝචිත ලෙස වැඩිදියුණු කරන පර්යේෂණ සහ විද්වත් ක්‍රියාකාරකම්වල පූර්ණ හැකියාවන් කරා ළඟා වීමට විශ්ව විද්‍යාලයට මාර්ගෝපදේශකයක් ලෙස ක්‍රියා කිරීම සහ ප්‍රධාන තේමා ක්ෂේත්‍රවලට විවිධ අධ්‍යයනාංශ සඳහා ඇති ප්‍රමුඛතා සලකා බලමින් මුහුම් සංකල්ප ඇති පර්යේෂණ සඳහා මංසන්ධියක් ලෙස ක්‍රියා කිරීමයි.

සමාජ සංහිඳියාව සඳහා වූ මධ්‍යස්ථානය

සමාජ සංහිඳියාව සඳහා වූ මධ්‍යස්ථානය 2022 අගෝස්තු මස 30 වන දින විශ්ව විද්‍යාලයහි සංචාරයක නිරත වෙමින් නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර තුමිය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම මධ්‍යස්ථානය හරහා වි.වි.ප්‍ර.කොා.ස.විසින් ඉදිරි දශක සඳහා සංහිඳියාවේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමටත්, පසුව එය සංහිඳියා ධාරිතාව වර්ධනය කිරීම, සහයෝගීතා පර්යේෂණ, ප්‍රකාශන සහ වෙනත් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම තුළින් එය ඊළඟ පරම්පරාවට ව්‍යාප්ත කිරීමටත් සැලසුම් කර තිබේ.

මධ්‍යස්ථානයේ අරමුණු
විශ්වවිද්‍යාල සහ ප්‍රජා මට්ටමින් අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස සමගිය සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම.
රට තුළ පශ්චාත්-ගැටුම් සමාජ ගතිකත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පුළුල් දැනුමක් සහ පර්යේෂණ සැපයීම සහ දායක වීම.
සංහිඳියාව සහ සාමය ගොඩනැගීමේ ක්‍රියාවලීන්හි නිරත වීමට සහ බහුවිධ සම්මතයන්ගෙන් ඉදිරි පර්යේෂණ වර්ධනය කිරීමට විද්වතුන් සහ සිසුන් දිරිමත් කිරීම.
සංහිඳියාව සඳහා විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ දැනුම භාෂා තුනෙන්ම ප්‍රජාව වෙත බෙදා හැරීම.
විවිධ විශ්වවිද්‍යාල/මණ්ඩල අතර අභ්‍යන්තර සහ බාහිර සහයෝගීතාවය සහ සන්නිවේදනය සඳහා නොබැඳි හෝ මාර්ගගත වේදිකාවක් නිර්මාණය කිරීම.
වෛරය, අගතිය, සැකය සහ අවිශ්වාසය යන අංග ඉවත් කිරීම සඳහා කාර්ය මණ්ඩලය, ශිෂ්‍ය මට්ටම සහ ප්‍රජා මට්ටමින් අධ්‍යාපනය ලබා දීමට ,දැනුවත් කිරීමට සහ ඒකාබද්ධ කිරීමට වැඩසටහන් සංවර්ධනය කිරීම.
විශ්වවිද්‍යාල මට්ටමින් කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර සුහද සබඳතා වැඩි දියුණු කිරීම.
විශ්වවිද්‍යාලයේ සමාජ සංහිඳියාව සමඟ කටයුතු කිරීම සඳහා ක්ෂණික, ඵලදායී, ස්ථාවර සහ සාධාරණ මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි සැපයීම.
විශ්වවිද්‍යාලයේ සමාජ සංහිඳියාවට අදාළ පර්යේෂණ ප්‍රතිඵල සහ නිර්දේශ ප්‍රකාශයට පත් කිරීම දිරිමත් කිරීම.

මධ්‍යස්ථානය සඳහා යෝජිත මූලික ක්‍රියාකාරකම්
භාෂාව, ආගම, සංස්කෘතිය, ඉතිහාසය සහ ආර්ථික විද්‍යාව සම්බන්ධ සංජානනය, අවබෝධය, පිළිගැනීම සහ සහජීවනය තුළින් ගැටුම් අවම කිරීම මගින් සංක්‍රාන්ති යුක්තිය ඇති කිරීම.
පහත සඳහන් ක්ෂේත්‍රවල ප්‍රජාවන් හතරේ (බුද්ධාගම, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි ධර්මය) පොදු තේමාව හඳුනා ගැනීම සහ එම ක්ෂේත්‍රවල එකට වැඩ කිරීමෙන් අවබෝධය සහ ප්‍රජා උනන්දුව උත්තේජනය කිරීම: - නාට්‍ය, නැටුම්, සංගීතය, චිත්‍ර, මූර්ති, සිනමාව, සම්ප්‍රදායික ක්‍රීඩා.
නාට්‍ය, නැටුම්, සංගීතය, චිත්‍ර, මූර්ති, සිනමාව, සම්ප්‍රදායික ක්‍රීඩා ආදියෙහි සෙසු ප්‍රජාවන් අතර තරඟ සහ සම්මන්ත්‍රණ පැවැත්වීම.
උත්සව සම්බන්ධ දින දර්ශනයක් සකස් කිරීම සහ සහෝදර ප්‍රජාවගේ උත්සව අන් අය සමඟ සැමරීම: - උදාහරණයක් ලෙස, තෛපොංගල්, සිංහල දෙමළ අලුත් අවුරුද්ද, වෙසක්, පොසොන්, රාමසාන්, දීපවාලි, නත්තල් ආදිය.
අන්‍යෝන්‍ය පූජනීය ස්ථානවලට ගොස් නමස්කාර පිළිවෙත් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම. උදාහරණයක් ලෙස: - පන්සල, කෝවිල, පල්ලිය සහ මුස්ලිම් පල්ලිය.
කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම.
කණ්ඩායම් ක්‍රියාකාරකම්: නිදසුනක් වශයෙන්, සාමය යනු කුමක්ද? සාමය ගැන ආගම් පවසන්නේ කුමක්ද? සමාජ සංහිඳියාව යනු?
අනිවාර්ය පාඨමාලා හඳුන්වා දීම, උදාහරණයක් ලෙස, පිටතට යන පුහුණුව (OBT) ඇතුළුව නායකත්වය, ආචාර ධර්ම, සමාජ ඒකාබද්ධතාවය සහ සුදුසු සහතිකය, ඩිප්ලෝමා සහ උපාධි වැඩසටහන් සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව (සමාජ විද්‍යාව සහ මානව විද්‍යාව සහ දේශපාලන විද්‍යා) සමඟ ඒකාබද්ධව.
ධාරිතා ගොඩනැගීම, පර්යේෂණ, වැඩමුළු, සම්මන්ත්‍රණ, ප්‍රකාශනය, උපාධි අපේක්ෂකයින්ගේ සාමය ගොඩනැගීම සහ තරුණ සවිබල ගැන්වීමේ ක්‍රියාකාරකම් සඳහා සීමාවාසික පුහුණුව.
තරුණ හුවමාරු වැඩසටහන් යනාදිය ක්‍රියාත්මක කිරීම.
ගැටුම්, සාමය සහ සංහිඳියාව පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පැවැත්වීම.
ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල සාමාජිකයින් විසින් පවත්වනු ලබන සමාජ සංහිඳියාව සහ සාම පර්යේෂණ පිළිබඳ සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීම සඳහා ත්‍රෛභාෂා සඟරාවක් නිර්මාණය කිරීම.
සංහිඳියා සමාජ ආදිය පිහිටුවීම.
සමාජ සංහිඳියාව සහ සාමය ගොඩනැගීම සම්බන්ධ වෙනත් ඕනෑම ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

1.3.6.4 අභිනවයෙන් පිහිටුවන ලද ඒකක

ජාත්‍යන්තර කටයුතු අංශය

විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කිරීමේ සංකල්පය සමඟින්, ජාත්‍යන්තර කටයුතු අංශය 2022 අප්‍රේල් 26 වන දින, අතිගරු චීන මහජන සමූහාණ්ඩුවේ තානාපතිතුමා සහ තානාපති කාර්යාලයේ අනෙකුත් නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් සිය ගමන ආරම්භ කරන ලදී.

ඒකකයේ අරමුණු
ලොව පුරා විවිධ උසස් අධ්‍යාපන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට පහසුකම් සැලසීම.
ජාත්‍යන්තර පර්යේෂණ විද්වතුන් සහ සිසුන් හුවමාරු කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
ජාත්‍යන්තර විද්වතුන් සහ සිසුන් සඳහා කෙටි කාලීන පාඨමාලා සහ ගිම්හාන වැඩසටහන් හඳුන්වා දීමට පහසුකම් සැලසීම.
ලිපි හුවමාරුව පවත්වාගෙන යාම සහ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා නිරීක්ෂණය කිරීම.
විදේශයන්හි විශ්ව විද්‍යාල සහ විශ්ව විද්‍යාල තුළ අන්තර් විනය පර්යේෂණ සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීම සහ උපකාර කිරීම.
ජාත්‍යන්තර සහ දේශීය ප්‍රදාන, පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා උපදේශන ලබා ගැනීමට බලපෑම් කිරීම.
ව්‍යාපෘති සහ ව්‍යාපෘති ලිවීම සඳහා අයදුම් කිරීමට සම භවුල්කරුවන් ලෙස විදේශීය විශ්ව විද්‍යාල සමඟ සම්බන්ධ වීම.
පර්යේෂණ ව්‍යාපෘති සඳහා පරිපාලන සහාය ලබා දීම.
විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර සහ ජාත්‍යන්තර ක්‍රියාකාරකම් සඳහා දත්ත සමුදායන් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වීම.
විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන සියලුම විදේශීය අරමුදල් සහිත ව්‍යාපෘති සඳහා පරිපාලනමය සහාය ලබා දීම.

1.3.7 බාහිර අධ්‍යයන ඒකකය

විශ්ව විද්‍යාලයේ බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා සඳහා වන මධ්‍යස්ථානය (CEDEC), රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඉහළ තරගකාරී අභ්‍යන්තර උපාධි පාඨමාලා වල ස්ථානයක් අහිමි වූවන් සඳහා බාහිර මාදිලිය හරහා පහසුකම් සපයයි. මෙම සිසුන්ට උපාධි පාඨමාලා පමණක් නොව ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා ද පිරිනමමින් සැමට ඉගෙනීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට විශ්වවිද්‍යාලයට හැකි වී තිබේ.

නව වෘත්තීය මාවතක් ආරම්භ කිරීම සඳහා තාක්ෂණික හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කිරීම සඳහා සහතික පත්‍ර පාඨමාලා අටකට පමණ වයස අවුරුදු 16 ට වැඩි සහ වෘත්තීය දැනුම අපේක්ෂා කරන සිසුන් මෙම අධ්‍යයන ඒකකය හරහා විශ්වවිද්‍යාලය විසින් බඳවාගෙන ඇත.

2022 දී, බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා සඳහා වන මධ්‍යස්ථානය විසින් විෂය නිර්දේශ සකස් කර විවිධ පීඨ සමඟ පහත පාඨමාලා ආරම්භ කර ඇත.

බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා සඳහා වන මධ්‍යස්ථානයෙහි නව පාඨමාලා හඳුන්වාදීම.

පාඨමාලාව	පිරිනමන පීඨය
කෘෂිකර්ම ඩිප්ලෝමාව	කෘෂිකර්ම
මූල් ළමාවිය සංවර්ධන සහ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව	කලා හා සංස්කෘත
පරිගණක පාදක ගිණුම්කරණය පිළිබඳ ඩිප්ලෝමාව	සන්නිවේදන හා ව්‍යාපාර (ත්‍රි.ම)
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	සන්නිවේදන හා ව්‍යාපාර (ත්‍රි.ම)

1.3.8 ප්‍රජා සහභාගීත්වය, උපදේශනය සහ ප්‍රවේශය

විශ්වවිද්‍යාලය අධ්‍යාපනික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මධ්‍යස්ථාන සහ ඒකක විශාල සංඛ්‍යාවක් ස්ථාපිත කර ඇත. මෙම මධ්‍යස්ථාන සහ ඒකක වසරකට පුහුණු වැඩසටහන් සහ පාඨමාලා විශාල ප්‍රමාණයක් පවත්වයි. මීට අමතරව, පීඨ සහ අධ්‍යනාංශ ද කෙටි පාඨමාලා සහ ප්‍රජා වැඩසටහන් ඉදිරිපත් කරයි. විවිධ සේවාවන් හරහා ප්‍රජා සංවර්ධනය සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වීමේ වැදගත්කම විශ්වවිද්‍යාලය විසින් හඳුනාගෙන ඇත.

2022 දී කර්මාන්ත සහ ප්‍රජා සම්බන්ධතා මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්.

ක්‍රියාකාරකම	විස්තරය	තත්ත්වය සහ පසු විපරම
සවුක්කඩි ගම්මානයට පෝෂණ වැඩසටහනක් “සුවයාලු සුභමාන”	සවුක්කඩි පෙරපාසල් 05ක සදුමා උරුන්දයි සහ කිරි ලබාදෙමින් සෞඛ්‍යය පීඨය විසින් සම්බන්ධීකරණය කරන ලදී.	1. ප්‍රා.ලේ.කාර්යාලය සමඟ සමීපව කටයුතු කිරීම. 2. කාර්ය මණ්ඩලයෙන් දායකත්වය බලාපොරොත්තු වීම. 3. ළමුන් සඳහා ප්‍රජා දායකත්වය ලබා ගැනීම.
භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) සිතියම්ගත කිරීම	සවුක්කඩි සිතියම සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කරන ලදි. කලා පීඨය විසින් සම්බන්ධීකරණය කරන ලදී.	අනෙකුත් සියලුම තොරතුරු ස්ථර සමඟ යාවත්කාලීන කළ හැක. (උදා- ධීවර තොරතුරු, පස පිළිබඳ තොරතුරු, වැදගත්, පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ තොරතුරු)
ප්‍රජා දිනය	සෞඛ්‍යය පීඨය සහ කෘෂි පීඨය විසින් පෙර පාසල් දරුවන් 270ක් අතර පෝෂණ ඇගයීම. කෘෂි පීඨයෙහි සිදු කරන ලදී.	දරුවන්ගේ තනි පුද්ගල වාර්තාව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයෙන් ලබා ගෙන ඇත.මූල් ළමාවිය රැකවරණ හා සංවර්ධන අංශය සහ සෞඛ්‍යය පීඨය සමඟ සම්බන්ධ කිරීමේ රැස්වීම සැලසුම් කර ඇත.
	කෘෂි පීඨය හා ගොවීන්-ඒකාබද්ධ ගොවිතැන් පුහුණු වැඩසටහන	පීඨය සමඟ පසු විපරම් සැලසුම් කර ඇත.
	කලා පීඨය	ප්‍රජාව සමඟ පසු විපරම් සැලසුම් කර ඇත.

	1. තරුණ විවාහක කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන 2. කාන්තා දේශපාලන නායකයින් පුහුණු කිරීමේ වැඩසටහන	
අධ්‍යාපන අංශ රැස්වීම	මඩකලපුව නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ විදුහල්පතිවරුන් 08 දෙනෙකු හමුවීම කලා පීඨය විසින් සම්බන්ධීකරණය කරන ලදී.	ගුරුවරුන් පුහුණු කිරීමේ සැලසුම් සාකච්ඡා කරන ලදී.
		ගණිත ගුරු හිඟය ස්ථාවර කිරීම සඳහා පළාත් අධ්‍යක්ෂ සහ අදාළ කලාප සහ විදුහල්පති සමඟ රැස්වීම
		ගණිතය සඳහා පුහුණුකරු ලෙස විද්‍යා පීඨයේ ප්‍රජා වැඩසටහන යටතේ හැකි සිසුන් බලමුලු ගැන්වීමට යෝජනා කරන ලදී - කෙටිකාලීන විසඳුම
		කර්මාන්ත හා ප්‍රජා සම්බන්ධතා මධ්‍යස්ථානය මගින් ගණිතය ඉගැන්වීම සඳහා අනෙකුත් සියලුම පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
		ගණිත අධ්‍යාපනවේදී උපාධිය ආරම්භ කිරීම පිළිබඳ සාකච්ඡා ප්‍රගතිය සහ සහතික ලත් ගුරුවරුන් බිහි කිරීම, මෙය දිගුකාලීන තිරසාර විසඳුමක් වනු ඇත.
ප්‍රා.ලේ.කාර්යාලය සමඟ සම්පත් හඳුනා ගැනීම	සවුක්කඩි හි විහව භූමි ප්‍රදේශ හඳුනාගෙන ඇත.	
	1. මත්ස්‍ය වර්ගයක් වන ඇඟිලි මාළු නිෂ්පාදනය	ප්‍රගතියේ පවතී.
	2. මුරුංගා වගාව	ප්‍රගතියේ පවතී.
	3. කජු ප්‍රවර්ධනය	ප්‍රගතියේ පවතී.
	4. පෝෂණීය සෑදුමා නිෂ්පාදනය	ප්‍රගතියේ පවතී.
	5. කොමඩු වගාව	ගොවි සංගමය සහ තාක්ෂණික කණ්ඩායම් සම්බන්ධ කිරීමට සැලසුම් කර ඇත.
	6. මඩකලපුව දිස්ත්‍රික් වාණිජ කර්මාන්ත හා කෘෂිකර්ම මණ්ඩලයේ රැස්වීමට සහභාගී වීම	
ජීවන කුසලතාවයක් ලෙස කෘෂිකර්මය	කෘෂිකර්ම පීඨය විසින් සකස් කරන ලද සහ සාකච්ඡා කරන ලද විෂය මාලාවක් කෘෂි පීඨය විසින් නිර්මාණය කරන ලදී	කෘෂි පීඨයෙහි සිසුන් උපයෝගී කර ගනිමින් මැදිහත්වීම නොවැම්බර් පළමු වන සතියේ ආරම්භ විය.
සාකල්‍ය සත්කාරක මධ්‍යස්ථානය	පෝෂණ වැඩසටහන 1.ඒකාබද්ධ හෘද රෝග නිවාරණ ආකෘතිය 2.සමාජ ආධාරක පද්ධතිය 3.යුනිසෙෆ් සමඟ රැස්වීම	සැලසුම් කිරීම සිදු වෙමින් පවතී. 1. සමාජ ආධාරක පද්ධතිය- ප්‍රජාවේ මනෝ සමාජීය යහපැවැත්ම සඳහා සෞඛ්‍යය සහ කලා පීඨ මගින් (උපදේශන සහ මනෝ සමාජීය යහපැවැත්ම - පාසල පදනම් කරගත්) 2. පාසල් ළමුන් සඳහා සෞඛ්‍යය සහ කෘෂි පීඨ මගින් පෝෂණ පිරික්සුම් (තක්සේරු) වැඩසටහන

තරුණ පර්යේෂකයන්ගේ සංසදය 2022 දී බහුවිධ පර්යේෂණ සඳහා වූ මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද "ප්‍රජා පාදක මැදිහත්වීම 2022"

	පර්යේෂණ මාතෘකාව	විද්වතුන්
1 වන පර්යේෂණ සංසදය	ස්වාභාවික අපද්‍රව්‍ය සහල් පොතු පිසීමේ වායුවක් ලෙස භාවිතා කිරීම සඳහා සිසිලන යන්ත්‍රයක් නිර්මාණය කිරීම.	ආචාර්ය පී. රොඩ්නි ප්‍රනාන්දු භෞතික විද්‍යා අධ්‍යයනාංශය
	මැකැඩමියාවේ මල් අංගමාරය ව්‍යාධිජනක එන්නත් වල මූලාශ්‍ර සහ සුදුසුකම්.	ආචාර්ය කේ.ප්‍රසන්නාත් කෘෂිකාර්මික ජීවවිද්‍යා අධ්‍යයනාංශය
	සායම් සංවේදී සූර්ය කෝෂ සඳහා රිදී තැන්පත් දෘශ්‍ය ආලෝකය ප්‍රතිචාර දක්වන ටයිටේනියම් නැනෝ දඬු.	ඩී.පී.උබේසේකර මහත්මිය භෞතික විද්‍යා අධ්‍යයනාංශය
	මඩකලපුව මහනගර සභාවේ කලපු ප්‍රදේශයේ කඩොලාන සිටුවීමේ ශක්‍යතා අධ්‍යයනය.	එස්.සුදාකරන් මහතා භූගෝල විද්‍යා අධ්‍යයනාංශය
	ප්‍රජා පාදක මත්ස්‍ය වගාව: ආහාර අර්බුදයෙන් මිදීම සඳහා ප්‍රතිකර්ම ප්‍රවේශය	ආචාර්ය ජේ. එම්. හැරිස් සත්ව විද්‍යා අධ්‍යයනාංශය
	ශ්‍රී ලංකාවේ ප්‍රධාන නාගරික ඝන අපද්‍රව්‍ය ගොඩකිරීම් වලින් හරිතාගාර වායු විමෝචනය තක්සේරු කිරීම.	ජී.නිරෝෂ් මහතා කෘෂිකර්ම ඉංජිනේරු අධ්‍යයනාංශය
2 වන පර්යේෂණ සංසදය	කාන්තා ආසියානු අලි ඇතුන්ගේ (*Elephas maximus*) serum 5alfa pregnane-3, 20-dione (5 alfa DHP) සහ ප්‍රොජෙස්ටරෝන් මැනීම	ටී.ඩී.සිරිවර්ධන මහතා සත්ව විද්‍යා අධ්‍යයනාංශය
	ශ්‍රී ලංකාවේ කිරිටක හෘද රෝග ඇති රෝගීන්ගේ ශාරීරික ක්‍රියාකාරකම් මට්ටම, ව්‍යායාම ස්වයං-කාර්යක්ෂමතාව සහ කායික විද්‍යාත්මක පරාමිතීන් වැඩිදියුණු කිරීම සඳහා අභිප්‍රේරිත, ක්‍රියාකාරී-පාදක මැදිහත්වීමේ බලපෑම්: නියමු අහඹු ලෙස පාලනය කළ පරීක්ෂණයක්	කේ. කාර්තිකේයන් මහතා පරිපූරක සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය
	තිරසාර නාගරික ජලාපවහන පද්ධතියක් ලෙස සිදුරු සහිත කොන්ක්‍රීට් සැලසුම් කිරීම	ඉංජිනේරු ඒ. ජනාර්ත්. බහුවිධ අධ්‍යයන අධ්‍යයනාංශය
	පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආධාර සේවාවල ස්වභාවය - කුඩා වතු හිමියන්ගේ හඬ	ආචාර්ය ටී. ගිරිදරන් මහත්මිය කෘෂි ආර්ථික අධ්‍යයනාංශය
3 වන පර්යේෂණ සංසදය	බටු සඳහා ජෛව ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය	ආචාර්ය ආර්.එෆ්.නිරන්ජනා කෘෂිජීව විද්‍යා අධ්‍යයනාංශය
	කඩොලාන වල පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව: කඩොලාන පරිසර පද්ධති දෙකක සංසන්දනය	ආචාර්ය ටී.මදිවේන්දන් උද්භිද විද්‍යා අධ්‍යයනාංශය
	තෘතීයික අධ්‍යාපනයේ යෙදී සිටින ශිෂ්‍යාවන් අතර ප්‍රජනක ඉන්ද්‍රිය පිළිකා පිළිබඳ දැනුවත් කිරීම	මහාචාර්ය කේ. ඊ. කරුණාහරන් ඖෂධීය විද්‍යා අධ්‍යයනාංශය
	ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ජීවන රටා මධ්‍යස්ථාන භාවිතය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රජා පාදක සෞඛ්‍ය ප්‍රවර්ධන මැදිහත්වීමේ බලපෑම	ටී.හේරත් මිය හා ආචාර්ය කේ.අරුලානන්දම් ප්‍රාථමික සෞඛ්‍ය සේවා අධ්‍යයනාංශය
4 වන පර්යේෂණ සංසදය	නැනෝ තාක්ෂණය: ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා උද්යෝගිමත් නවෝත්පාදන	ආචාර්ය එම්.කෝනේස්වරන් රසායන විද්‍යා අධ්‍යයනාංශය
	නැනෝ ව්‍යුහගත සූර්ය කෝෂ වල ප්‍රබලතා සහ අභියෝග	ආචාර්ය කිව්. වයි. සෞන්දරරාජා භෞතික විද්‍යා අධ්‍යයනාංශය

තිරසාර කෘෂිකර්ම හා සම්පත් කළමනාකරණය සඳහා මධ්‍යස්ථානය (CENSARM)

කෘෂිකර්ම පීඨය විසින් ප්‍රජාවට ඔවුන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා සේවා සැපයීම සඳහා 1996 දී තිරසාර කෘෂිකර්ම හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය (CENSARM) පිහිටුවා ඇත.

2022 වර්ෂය තුළ ප්‍රජාව සඳහා මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම්
ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා මඩකලපුව ඌරනි සහ මංචන්තොඩුව ප්‍රදේශයේ ප්‍රජාව වෙත එළවලු පැළ බෙදාදීම සිදු කරන ලදී. මෙම වැඩසටහන විශ්වවිද්‍යාල ගොවිපළ සමඟ එක්ව පවත්වන ලදී. ඉහත පැළ බහු බෑග්වල ඇති කර ප්‍රජාවට බෙදා දෙන ලදී.
කෘෂිකර්මයට අදාළ පර්යේෂණ ගැටලු හඳුනාගැනීම සඳහා තෙවැනි වසර සිසුන් මඩකලපුවෙහි ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සහ මයිලම්බවෙලිහි පොල් වගා කිරීමේ මණ්ඩලය යන ස්ථාන නරඹන ලදි.
කෘෂිකර්ම විද්‍යා පීඨයේ ඩිප්ලෝමා සිසුන් අතර කෘෂිකර්ම ප්‍රශ්න විචාරාත්මක තරගයක් පවත්වන ලදී.
ලෝක ආහාර දිනය සමරනු ලැබූ අතර ලෝක ආහාර දින උත්සවයේ දී ඩිප්ලෝමා සිසුන් සඳහා ප්‍රශ්න විචාරාත්මක තරඟ සම්මාන ප්‍රදානය කරන ලදී.
කෝරළයිපත්තුවේ ජලජීවී වගා කාර්මික උද්‍යානය සඳහා සංකල්පීය නිර්මාණය සකස් කිරීම පිළිබඳ උපදේශන වැඩමුළුව කෝරළයිපත්තුව උතුර-වාකරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA), මඩකලපුව විසින් CENSARM සමඟ එක්ව සංවිධානය කරන ලදී.
මඩකලපුව හරිතකරණ ව්‍යාපෘතිය ව්‍යාපෘති සම්බන්ධීකාරක සහ කණ්ඩායම් සාමාජිකයින් විසින් නිම කරන ලදී.
ලාභදායී අයිස්ක්‍රීම් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහනක් පාසල් සිසුන් සඳහා පවත්වන ලදී.

විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක සෛලය

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සංවර්ධන වැඩසටහනේ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක (UBL) සෛලය ආරම්භ කරන ලදී. මෙම මූලපිරීම ආරම්භ වූයේ විශේෂයෙන් විශ්වවිද්‍යාල පීඨාධිපතිවරුන් සහ ලේඛකාධිකාරිවරයා වෙත යොමු වූ 'තොරතුරු සැසියක්' සමඟිනි. මල්ටි-ටෙක් සොලූශන්ස් පුද්.සමාගම මෙම මූලපිරීම සඳහා සැපයුම් පහසුකම් සපයන්නා විය.

සෛලය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

පීඨය	පර්යේෂණයේ නම	සැලසුම්ගත / වාණිජකරණය කළ නිෂ්පාදනය	වර්ෂය
කෘෂිකර්ම පීඨය	ගම්මිරිස් හා වදකහ වලින් කෘමිනාශක සකස් කිරීම සහ වාණිජකරණය	කෘමිනාශකය	2021
කෘෂිකර්ම පීඨය	එළකිරි හෝ මී කිරි මගින් සුදුළුණු බටර් නිෂ්පාදනය කිරීම	සුදුළුණු බටර්	2021
කලා හා සංස්කෘත පීඨය	දිවයිනේ නැගෙනහිර ප්‍රදේශයට විශේෂ සඳහනක් සහිතව දෙමළ භාෂාවෙන් අත්පිටපත් එකතු කිරීම් පරිගණකගත කිරීම/ ඩිජිටල්කරණය සහ ලේඛනගත කිරීම.	ඩිජිටල්කරණය කළ අත්පිටපත් සහ අත්පිටපත්වලින් ඖෂධ සූත්‍ර පරිවර්තනය කර ඇත DIA DECOC ඖෂධීය නිෂ්පාදනය	2021 (DOR Project)
ව්‍යවහාරික විද්‍යා පීඨය (ත්‍රි.ම)	භාතාවරිය අල මූලයෙන් ක්ෂණික ඔසු කැඳ මිශ්‍රණයක් සැකසීම	ඔසු කැඳ මිශ්‍රණය	2022

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය

ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය ඔවුන්ගේ ප්‍රචාරක කටයුතු මඩකලපුව/සවුක්කඩි භාරතී විදුහලේ සිදු කරන ලදී. මෙම පාසල කර්මාන්ත හා ප්‍රජා සම්බන්ධතා මධ්‍යස්ථානය විසින් ප්‍රජා පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ තෝරාගෙන ඇත. 7 සහ 8 ශ්‍රේණිවල සිසුන් මෙම වැඩසටහනට සම්බන්ධ වේ. කාර්ය මණ්ඩලය විසින් කතා කිරීමේ ඵලදායී කුසලතාව සිසුන් සමඟ පුහුණු කරනු ලැබේ.

1.3.9 කාර්ය මණ්ඩල සංවර්ධනය

අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම විශ්වවිද්‍යාලය විසින් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) වෙත පවරා ඇත. මෙම මධ්‍යස්ථානයට අමතරව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සහ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය කාර්ය මණ්ඩල පුහුණු කටයුතු සඳහා සහාය වේ.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් 2022 වර්ෂය තුළ පහත සඳහන් වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන වැඩසටහන්

වැඩසටහන	ඉලක්ක කණ්ඩායම
නැ.වි.වි. හි පර්යේෂණ උපකරණ සඳහා අතථ්‍ය අත්තිකාරම් වෙන් කිරීමේ පද්ධතිය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	අධ්‍යයන කාර්ය මණ්ඩලය
අධ්‍යයන උපදේශන වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	පීඨාධිපතිවරුන්, අධ්‍යයනාංශය ප්‍රධානීන්, මහාචාර්යවරුන් සහ උනන්දුවක් දක්වන සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්
නැ.වි.වි, ත්‍රි.ම. සහ ස්.වි.සෞ.ආ හි කාර්ය මණ්ඩලය සඳහා ආයතනික සමාලෝචනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	නැ.වි.වි, ත්‍රි.ම. සහ ස්.වි.සෞ.ආ හි සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්
උපදේශන වැඩසටහන සඳහා ආරම්භක සැසිය	ඉන්දියාවේ මනෝන්මනියම් සුන්දරනර් විශ්ව විද්‍යාලයේ "උපදේශනය" පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගී වූ කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය උපදේශකයින්
ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා උත්සව කළමනාකරණය පිළිබඳ පුහුණුව	නැ.වි.වි, ත්‍රි.ම. සහ ස්.වි.සෞ.ආ හි සියලුම පරිපාලන සාමාජිකයින්
කළමනාකරණ සහකාරවරුන් සඳහා වෘත්තීය සංවර්ධනය පිළිබඳ වැඩමුළුව (සැසි 6)	මෙම වසරේ පැවැත්වීමට නියමිත උසස්වීම් විභාගය සඳහා ලියාපදිංචි වී සිටින සියලුම සුදුසුකම් ලත් කළමනාකරණ සහකාරවරුන්
ප්‍රතිපත්ති සම්පාදනය සඳහා විද්වතුන් විසින් පර්යේෂණ සහ ඇගයීම් සොයාගැනීම් භාවිතය පිළිබඳ උපදේශන සැසිය පිළිබඳ වැඩමුළුව	අධ්‍යයනාංශ ප්‍රධානීන්
විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව (සැසි 2)	සියලුම පරිපාලන සාමාජිකයින් සහ තෝරාගත් අනධ්‍යයන කාර්ය මණ්ඩලය
කොල්ලකාරී සඟරා සහ ව්‍යාජ සම්මන්ත්‍රණ වළක්වා ගන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩමුළුව	සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය
වත්මන් තොරතුරු තාක්ෂණ විශේෂාංග වැඩිදියුණු කිරීම පිළිබඳ වැඩමුළුව	සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය
විවෘත හා දුරස්ථ ඉගෙනීම පිළිබඳ වැඩමුළුව	බාහිර අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කරන පීඨයේ පීඨාධිපතිවරුන්, අධ්‍යයන සම්බන්ධීකාරකවරුන්, වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් සහ විද්වතුන්

පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා උත්සව කළමනාකරණය පිළිබඳ පුහුණුව

ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා සිදුවීම් කළමනාකරණය පිළිබඳ පුහුණුව 2022 අප්‍රේල් 08 සහ 09 යන දිනවල ත්‍රිකුණාමලයේ සෝබර් අයිලන්ඩ් රිසෝර්ට්හිදී පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකයා වූයේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ආචාර්ය ඩී.ජී.කේ.ජී.ටී කුමාර මහතාය. මෙම වැඩමුළුවේ ඉලක්ක කණ්ඩායම නැ.වි.වි, ත්‍රි.ම. සහ ස්.වි.සෞ.ආ හි සියලුම පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් වේ.

කළමනාකරණ සහකාර සහ පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි වැඩිදියුණු කිරීමේ වැඩසටහන.

සහභාගිවන්නන්ගේ ඉංග්‍රීසි නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා පරිපාලනයේ ඉල්ලීම මත ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය විසින් මෙම වැඩසටහන පවත්වන ලදී. මෙම වැඩසටහන පැය 03 බැගින් වූ සැසි 15 කින් සමන්විත වූ අතර ප්‍රතිලාභීන් විසින් පරාවර්තක සඟරාවක ස්වරූපයෙන් ලිපි ගොනු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන ලදී.

අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු (ENACT) ව්‍යාපෘතිය යටතේ අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුව

ව්‍යාපෘතියේ සමස්ත ඉලක්කය වන්නේ ආයතනික කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සහ වර්තමාන සහ අනාගත නවීකරණය සහ ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන්ට සහාය වීම සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා වැඩි කිරීම මගින් ශ්‍රී ලංකාවේ හවුල්කාර විශ්වවිද්‍යාලවල පාලනය, කළමනාකරණය සහ උසස් අධ්‍යාපනයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමයි.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල දැනට වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වුවද, සීමිත සම්පත් සහ මූල්‍ය කප්පාදුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල, විශේෂයෙන්ම පාලන හා කළමනාකරණ ප්‍රධාන ක්ෂේත්‍රවල යහපත් භාවිතයන් වැඩිදියුණු කිරීමට අහිතකර ලෙස බලපායි.

මෙම ව්‍යාපෘතියට සහභාගී වන ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල සඳහා පහත ධනාත්මක බලපෑම් ඇති කිරීමට අපේක්ෂා කරයි.

- ධාරිතා වර්ධනය තුළින් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කුසලතා වැඩි දියුණු කිරීම
- විශ්වවිද්‍යාලවල පරිපාලක කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සහ සමස්තයක් ලෙස විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන අධ්‍යාපනික නිෂ්පාදන සහ සේවාවන්හි ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම
- අනධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ වෘත්තීය සංවර්ධනය සඳහා දිගුකාලීන උපාය මාර්ග.

“අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුව / ENACT ව්‍යාපෘතිය හරහා ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලවල පාලනය, කළමනාකරණය සහ ප්‍රතිසංස්කරණ වැඩිදියුණු කිරීම” (යොමු. අංක 619185- EPP-1-2020-1-LK-EPPKA2-CBHE-JP) ව්‍යාපෘතිය සඳහා ආධාර ලබා දී ඇත. යුරෝපීය කොමිසමෙන් සහ යුරෝපා සංගමයේ Erasmus+ වැඩසටහන මගින් සම-අරමුදල් සපයනු ලැබේ. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල හයක්, යුරෝපීය විශ්ව විද්‍යාල හතරක් (පෘතුගාලය, ජර්මනිය, චෙක් ජනරජය සහ බල්ගේරියාව) සහ බල්ගේරියාවේ එක් අනධ්‍යයන හවුල්කරුවෙකු අතර සහයෝගීතාවයකි.

ශ්‍රී ලංකාවේ හවුල්කාර විශ්වවිද්‍යාල.

- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව - සම්බන්ධීකාරක
- ශ්‍රී ලංකා තාක්ෂණ මණ්ඩපය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

සැලසුම් කළ ක්‍රියාකාරකම්
අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු විෂය මාලාව සංවර්ධනය කිරීම: විෂයමාලාව විශ්වවිද්‍යාල පරිපාලනය ඇතුළු ආයතනික කාර්ය සාධනය, උසස් අධ්‍යාපනයේ ජාත්‍යන්තරකරණය, මූල්‍ය කළමනාකරණය සහ විගණනය, මෘදු කුසලතා, මානව සම්පත් කළමනාකරණය, සමානාත්මතාවය සහ විවිධත්වය වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ඇත.
පහත මාතෘකා යටතේ හවුල්කාර විශ්ව විද්‍යාල විසින් අන්තර්ජාතික පුහුණුකරුවන්ගේ වැඩමුළු තුනක් පවත්වනු ලැබේ. • උසස් අධ්‍යාපනයේ ජාත්‍යන්තරකරණය. • මානව සම්පත් කළමනාකරණය, විශ්ව විද්‍යාල පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ නවීන භාවිතයන්. • මෘදු කුසලතා ගොඩනැගීම සහ සමානාත්මතාවය සහ විවිධත්වය.
ජාත්‍යන්තර පුහුණු සැසිවලින් අනතුරුව සහභාගී වන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩලය 180ක් පමණ සඳහා දේශීය ගුණ කිරීමේ පුහුණු කිරීම් සිදු කෙරේ.
සියලුම ශ්‍රී ලංකාවේ හවුල්කාර විශ්ව විද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධන සෛල පිහිටුවනු ඇත. මෙම මධ්‍යස්ථාන ව්‍යාපෘතිය මගින් ලබාගන්නා පරිගණක සහ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ වලින් සමන්විත වේ.
සෑම ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාලයක්ම පොදු සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ආයතනවල දායකත්වයට පහසුකම් සපයන කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධන උපාය මාර්ගය වැඩි දියුණු කිරීමට විස්තීර්ණ අනධ්‍යයන ක්‍රමයක් සංවර්ධනය කිරීම සඳහා යුරෝපා සංගමයේ හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

- **WP2** හි අන්තර්ජාතික පුහුණු වැඩමුළු
  - ජාත්‍යන්තරකරණයට සහය වීමට සහ එයට මුහුණ දීමට කුසලතා සහ ධාරිතාව ගොඩනැගීම පිළිබඳ අන්තර්ජාතික පුහුණු වැඩමුළුව.
  - මානව සම්පත් කළමනාකරණය, විශ්වවිද්‍යාල පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ නවීන භාවිතයන් පිළිබඳ අන්තර්ජාතික පුහුණු වැඩමුළුව.

- වැඩමුළු අතරතුර ලබා දිය යුතු පුහුණු මොඩියුල සහ **WP3** පුහුණු සම්පත් සහ විෂයමාලා වෙත පෝෂණය කිරීම.
  1. උසස් අධ්‍යාපනයේ ජාත්‍යන්තරකරණය සහ විශ්ව විද්‍යාල පරිපාලනයේ ගෝලීය යහපත් භාවිතයන් මාරු කිරීම
  2. උසස් අධ්‍යාපනයේ නවීන මානව සම්පත් කළමනාකරණ පිළිවෙත්
  3. විශ්වවිද්‍යාල පාලනය සහ කළමනාකරණය
  4. උසස් අධ්‍යාපනයේ මූල්‍ය කළමනාකරණය, ගිණුම්කරණය සහ විගණනය
  5. උසස් අධ්‍යාපනයේ ආයතනික කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව
  6. 21 වන සියවස සඳහා මෘදු කුසලතා
  7. සමානාත්මතාවය සහ විවිධත්වය

1.3.10 මධ්‍යම පරිපාලනය

නව උපකුලපතිතුමාගේ මහපෙන්වීම යටතේ, 2022 ආරම්භයේදී ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර, ඉලක්ක සහ අරමුණු සංශෝධනය කිරීමට මුලපිරී ඇත. සංශෝධිත දැක්ම, මෙහෙවර, ඉලක්ක සහ අරමුණු පාලක සභාව විසින් අනුමත කරන ලදී . උපායමාර්ගික සැලසුම් සහ සංඛ්‍යාලේඛන ඒකකය යාවත්කාලීන වූ දැක්ම, මෙහෙවර, ඉලක්ක සහ අරමුණු මත පදනම්ව 2023-2027 සඳහා නව උපාය මාර්ග සැලැස්ම නිර්මාණය කරයි.

2023 සිට 2027 දක්වා නව උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම විශ්වවිද්‍යාල පනත් පිළිබඳ තොරතුරු ඇතුළත් "විශ්වවිද්‍යාල සේවකයින් සඳහා කළමනාකරණ මාර්ගෝපදේශය - පරිපාලන දෙපාර්තමේන්තු සහ අංශ සඳහා කාර්යාල අත්පොත" යන මැයෙන් පුළුල් මාර්ගෝපදේශයක් යාවත්කාලීන කිරීම ආරම්භ කර ඇත. පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් රෙගුලාසි, මාර්ගෝපදේශ, විවිධ කාර්යාලවලට පවරා ඇති බලධාරීන්, පද්ධතිවල සංවිධාන ව්‍යුහය, අංශ සහ ඒකක, සහ අංශ/ඒකක සහ තනි නිලධාරීන්ට පැවරී ඇති රාජකාරි මෙන්ම ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල යෙදෙන මධ්‍යස්ථාන සහ ඒකක විසින් අනුගමනය කළ යුතු පරිපාලන සහ මූල්‍ය කළමනාකරණය සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ද එමඟින් ගෙනහැර දක්වයි.

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ දින දර්ශනය මේ වසරේ යාවත්කාලීන වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ක්‍රියාවලිය සරල කිරීම සහ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා ප්‍රථම විශ්වවිද්‍යාල දින දර්ශනය 2016 දී නිකුත් කරන ලදී. අධ්‍යයන, පරිපාලන, නීතිමය සහ අදාළ ගැටළු පිළිබඳ සියලු තොරතුරු එකම ආවරණයක් යටතට ගෙන ඒම සඳහා එය නිර්මාණය කරන ලද්දේය.

1.3.11 ඉගෙනුම් උපකාරක සේවා, තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි භාෂා කුසලතා, පුස්තකාල සේවා, වෘත්තීය මාර්ගෝපදේශනය.

1.3.11.1 වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ යටතේ 2004 වසරේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) ස්ථාපිත කරන ලද්දේ විශ්වවිද්‍යාලය සහ සේවා ලෝකය අතර මැදිහත්කරුවෙකු ලෙස අද්විතීය කාර්යභාරයක් ඉටු කිරීම සඳහා, වෘත්තීය මාර්ගෝපදේශනය ඒකාබද්ධ කිරීම සඳහා ය. විෂයමාලා සමඟ ක්‍රියාකාරකම් සහ නිසි අවබෝධයකින් යුතුව තම වෘත්තීය මාර්ග පෙළගැස්වීමට උපාධි අපේක්ෂකයින් පෙළඹවීම සඳහා සුදුසු ක්‍රමවේදයන් හඳුනා ගැනීම සඳහා පර්යේෂණ පවත්වයි.

මෙහි ප්‍රධාන කාර්යයන් වනුයේ අභියෝගාත්මක ව්‍යාපාරික ලෝකය ජයගත හැකි ව්‍යවසායකයින් බිහි කිරීමයි. ගෝලීය වෙළෙඳපොළ තුළ රැකියා සුරක්ෂිත කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම ද අපේක්ෂිත ඉලක්කයක් ලෙස සැලකේ. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විශ්ව විද්‍යාලය, පීඨ සහ අධ්‍යයන දෙපාර්තමේන්තු සමඟ සහයෝගයෙන් සහ බාහිර වැඩ ලෝකය සමඟ සම්බන්ධ වීමෙන් මෙම ඉලක්ක කරා ළඟා වීමට හැකි වීමට උත්සාහ කරයි.

නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව (EUSL) සහ ප්‍රජා සම්පත් බලමුලු ගැන්වීමේ සංගමය අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීය. ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ ශිෂ්‍ය කුසලතා වැඩි දියුණු කිරීම පිළිබඳ ඉහත සඳහන් ගිවිසුමේ අරමුණ වන්නේ හෙට දවසේ නායකයින් බවට පත්වන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඉහළ තනතුරු දරන විශ්වවිද්‍යාල උපාධි සඳහා තෝරාගත් තරුණ තරුණියන්ගේ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ කුසලතා, දැනුම සහ ආකල්ප වර්ධනය කිරීමයි. මෙමඟින් රටට වැදගත් තීරණ ගත හැකි ඉහළ මට්ටම් කරා ළඟා වීමට හැකි වේ. කලා හා සංස්කෘතික, වාණිජ හා කළමනාකරණ පීඨවල සහ ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ සිසුන් ඉලක්ක ලබන්නන් වේ.

සියලුම පීඨවල මෑත කාලීනව සමත් වූ උපාධිධාරීන් සහ අවසන් වසරේ උපාධි අපේක්ෂකයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් 'අථත්‍ය වෘත්තීය ප්‍රදර්ශනය 2022' පවත්වන ලදී. රැකියා සහ සීමාවාසික අවස්ථා ලබා දීම සඳහා බැංකු, උපදේශන, ඇඟලුම්, විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ, නිෂ්පාදනය සහ අලෙවිකරණය, කුකුළු කර්මාන්තය, කෘෂිකර්මය සහ කිරි නිෂ්පාදන යන ක්ෂේත්‍රවල ප්‍රමුඛ පෙළේ සේවා යෝජකයින් 13 දෙනෙකු සහභාගී විය.

2022 දී වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් පවත්වනු ලැබූ වැඩසටහන් සහ වැඩමුළු

ක්‍රියාකාරකමේ නම	ඉලක්කගත කණ්ඩායම
නායකත්ව සංවර්ධනය පිළිබඳ වැඩමුළුව	සෞඛ්‍ය පීඨය (අධ්‍යයන වර්ෂය 2019/2020)
සන්නිවේදන කුසලතා පිළිබඳ කෙටි පාඨමාලාව - මාර්ගගත පාඨමාලාව මාතෘකාව : ඵලදායී රැස්වීමක් පැවැත්වීම මාතෘකාව : මුහුණට මුහුණ සන්නිවේදනය මාතෘකාව : ලිවීම හරහා සන්නිවේදනය මාතෘකාව : ඵලදායී ඉදිරිපත් කිරීමක් ලබා දීම	කලා පීඨය (අධ්‍යයන වර්ෂය 2019/2020) හා විද්‍යා පීඨය (අධ්‍යයන වර්ෂය 2019/2020)
අන්තර් පුද්ගල කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව - වෙබ් වැඩමුළුව	කෘෂි හා තාක්ෂණ පීඨ (සියලු අධ්‍යයන වර්ෂ)
රැකියා ස්ථානගත කිරීම සහ සීමාවාසික පුහුණුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - වෙබ් වැඩමුළුව	කෘෂි,කලා,වාණිජ,විද්‍යා,තාක්ෂණ පීඨ (සමත් වූ උපාධිධාරීන්, අවසාන වසරේ සහ 3 වන වසරේ සිසුන්)

(ඉදිරියට.) 2022 දී වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය විසින් පවත්වනු ලැබූ වැඩසටහන් සහ වැඩමුළු

ක්‍රියාකාරකමේ නම	ඉලක්කගත කණ්ඩායම
ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන – වෙබ් වැඩමුළුව (ඉංග්‍රීසි මාධ්‍යය)	කෘෂි,කලා,වාණිජ,විද්‍යා,තාක්ෂණ පීඨ (දෙවන, තෙවන සහ අවසන් වසර සිසුන්)
ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - වෙබ් වැඩමුළුව (දෙමළ මාධ්‍යය)	කලා පීඨ (දෙවන, තෙවන සහ අවසන් වසර සිසුන්)
උපාධිධාරීන්ගේ කුසලතා සිතියම්ගත කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීම. (සැසිය 1)	පාර්ශවකරුවන් -රාජ්‍ය පරිපාලනය, අධ්‍යාපනය, බැංකුකරණය, සෞඛ්‍යය, සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන
උපාධිධාරීන්ගේ කුසලතා සිතියම්ගත කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීම. (සැසිය 2)	උපාධිධාරීන්ගෙන් පාර්ශ්වකරුවන්-උපාධිය සමත්,රැකියාවේ නියුතු සහ රැකියා සොයන (සෑම පීඨයෙන්ම 08 බැගින්)
උපාධිධාරීන්ගේ කුසලතා සිතියම්ගත කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීම. (සැසිය 3)	ආයතනික අංශයේ පාර්ශවකරුවන් (මා.ස. විධායකයින්)
උපාධිධාරීන්ගේ කුසලතා සිතියම්ගත කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීම. (සැසිය 4)	පීඨවල අධ්‍යයන වෘත්තීය මාර්ගෝපදේශ උපදේශකයින්ගෙන් පාර්ශවකරුවන්.
වෘත්තීය මාර්ගෝපදේශනය හැඳින්වීම (දිශානති වැඩසටහන)	කෘෂි,කලා,වාණිජ,විද්‍යා (අධ්‍යයන වර්ෂය 2020/2021)
රැකියා නිපුණතා - (බැංකු කුසලතා)– වෙබ් වැඩමුළුව	වාණිජ (අධ්‍යයන වර්ෂය 2018/2019)
වගකීමෙන් අන්තර්ජාලය හැසිරවීම -වෙබ් වැඩමුළුව	කෘෂි,කලා,වාණිජ,විද්‍යා,සෞඛ්‍ය,තාක්ෂණ(සියලු අධ්‍යයන වර්ෂ)
ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සඳහා අදහස් ජනනය (දෙමළ මාධ්‍ය)	කලා (දෙවන, තෙවන සහ අවසන් වසර සිසුන්)
ප්‍රචණ්ඩත්වය අන්තවාදය වැළැක්වීමේ ශිෂ්‍ය කුසලතා වැඩි දියුණු කිරීමේ දිශානති වැඩසටහන (PVE) -වෙබ් වැඩමුළුව	කලා,වාණිජ ,ස්.වි.සෞ.ආ සහ නැ.වි.වි. හා AMCOR අතර අවබෝධතා ගිවිසුම යටතේ PVE සඳහා ලියාපදිංචි සිසුන්.
යෞවනයන් යහපත් පුරවැසියන් ලෙස පරිවර්තනය කිරීම පිළිබඳ නේවාසික පුහුණුව - සැසිය 01 සහ සැසිය 02	කලා,වාණිජ ,ස්.වි.සෞ.ආ සහ නේවාසික පුහුණුව සඳහා තෝරාගත් සිසුන් 01 සිට 10 දක්වා කණ්ඩායම්.
පුද්ගලික මූල්‍ය සාක්ෂරතාවය, හරිත කුසලතා, ව්‍යවසායකත්වය -වෙබ් වැඩමුළුව	කෘෂි,කලා,වාණිජ,විද්‍යා,තාක්ෂණ (සියලු අධ්‍යයන වර්ෂ)
සාර්ථකත්වය සඳහා මෘදු කුසලතා පිළිබඳ වැඩමුළුව - නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ශ්‍රී ලංකා ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කර අනුග්‍රහය දක්වයි.	කලා සහ සියලු අවසන් වසර සිසුන්
PVE හි නිර්මාණාත්මක කලා ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන – වෙබ් වැඩමුළුව	කලා,වාණිජ ,ස්.වි.සෞ.ආ සහ නැ.වි.වි. සහ AMCOR අතර අවබෝධතා ගිවිසුම යටතේ PVE හි යහපත් පුරවැසියන් ලෙස තරුණයින් පරිවර්තනය කිරීම පිළිබඳ නේවාසික පුහුණුව සම්පූර්ණ කළ සිසුන්.

1.3.11.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය (තො.ස.තා.ම)

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය (CICT) 2003 දී ආරම්භ කරන ලදී. සියලුම විශ්වවිද්‍යාල පීඨවල අභ්‍යන්තර හා බාහිර සිසුන් සඳහා, මෙම මධ්‍යස්ථානය විසින් විවිධ පරිගණක විද්‍යා සහ තොරතුරු තාක්ෂණ පාඨමාලා පිරිනමයි. සති අන්තයේ සහ නිවාඩු කාලය තුළ රජයේ සේවකයන් සහ පාසල් හැර යන අය සඳහා සහතික පත්‍ර වැඩසටහන් ද මධ්‍යස්ථානය විසින් පිරිනමයි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයෙහි මූලික කාර්යය වන්නේ තාක්ෂණය නිවැරදිව භාවිතා කිරීම සහතික කිරීම සහ කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට තොරතුරු තාක්ෂණ ආශ්‍රිත සේවාවන් ලබා දීමෙන් නැගෙනහිර විශ්ව විද්‍යාල ප්‍රජාවේ ක්‍රියාකාරකම් සඳහා සහාය සහ නඩත්තු කිරීමයි. එය පිරිනමන සේවාවන් අතර අන්තර්ජාල ප්‍රවේශය, විද්‍යුත් තැපෑල, ගොනු ගබඩා කිරීම, මෘදුකාංග සැකසීම සහ නඩත්තුව, තාක්ෂණික ඇඟයීම සහ උපදෙස්, ජාල නඩත්තුව සහ දෝෂ නිරාකරණය, සහ අනෙකුත් තොරතුරු තාක්ෂණ සම්බන්ධ කාර්යයන් ඇතුළත් වේ.

1.3.11.3 ඉංග්‍රීසි භාෂා කුසලතා

කලා හා සංස්කෘත පීඨයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යනාංශය (DELT),විශ්වවිද්‍යාල සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා අවශ්‍යතා සපුරාලයි. 1981 වර්ෂයේදී, අධ්‍යනාංශය ප්‍රථම වරට ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයක් ලෙස නිර්මාණය කරන ලද අතර, 2020 වර්ෂයේදී එය අධ්‍යනාංශ මට්ටමට උසස් කරන ලදී.

ඉංග්‍රීසි භාෂා පාඨමාලා නිර්මාණය කර ඇත්තේ උපාධි අපේක්ෂකයින්ට අධ්‍යයන හා ප්‍රායෝගික අවස්ථා දෙකේදීම භාෂාව භාවිතා කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා දීම සඳහා ය. ඉංග්‍රීසි අධ්‍යයන අංශය අවට ප්‍රජාවට එහි ඉංග්‍රීසි භාෂා අවශ්‍යතා සමඟ සහාය වීම ද අරමුණු කරයි. පාඨමාලා වල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම අධ්‍යයනයේ නවතම සොයාගැනීම්වලට අනුකූලව අංශය සෑම ක්ෂේත්‍රයකම ශිල්පීය ක්‍රම භාවිතා කරයි.

ඉංග්‍රීසි සමාජ

සෑම පීඨයක් සඳහාම "ඉංග්‍රීසි සමාජය" පිහිටුවා ඇත. මෙහි වැඩසටහන් සැලසුම් කරනු ලබන්නේ කාර්ය මණ්ඩලයේ මගපෙන්වීම යටතේ සිසුන් විසින්ම ය. එය අතථ්‍ය සහ භෞතික යන දෙඅංශයෙන්ම සිදු කර ඇත. පීඨ හයම ඔවුන්ගේ අධ්‍යයන වර්ෂය අනුව ඔවුන්ගේ සමාජ ශාලා ඇත. මෙම සමාජ ශාලාවේ අරමුණ වන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් උපාධි අපේක්ෂකයින්ගේ කුසලතා පෙන්වීම සහ ඔවුන් වි.වි. වෙතින් සමත් වන විට රැකියා ලෝකය ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ මෘදු කුසලතා වර්ධනය කිරීමයි.

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යනාංශයේ කියවීම් මුළුව

මෙය උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ කියවීමේ කුසලතා වර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති අතර අවශ්‍ය ඕනෑම වේලාවක භාවිතා කිරීමට අපේක්ෂා කරන අතර ඕනෑම සහායක් සඳහා කාර්ය මණ්ඩලයේ සහාය ලබා ගත හැකිය.

ජාත්‍යන්තර ඉංග්‍රීසි භාෂා පරීක්ෂණ පද්ධති (IELTS) මුළුව

ජාත්‍යන්තර ඉංග්‍රීසි භාෂා පරීක්ෂණ සඳහා පුහුණු කාමරය අදාළ ලිපි ද්‍රව්‍ය වලින් සමන්විත කර ඇති අතර IELTS සඳහා පෙනී සිටීමට සැලසුම් කර ඇති සිසුන් කාර්ය මණ්ඩලයේ මගපෙන්වීම ඇතිව පුහුණුවීම් සඳහා මෙම ස්ථානයට පැමිණේ.

ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) කාමරය

පරීක්ෂණයට අදාළ පුහුණු අයිතම සඳහා UTEL කාමරයක් සකසා ඇත. UTEL හි සාර්ථක අපේක්ෂකයින්ට ජාතික මට්ටමේ සහතිකයක් ලබාදෙන අතර එය ඔවුන්ගේ අධ්‍යයන සහ වෘත්තීය ජීවිතයට විශේෂයෙන් විදේශ රටවලදී උපකාර වනු ඇත.

CLAPS- පන්තිකාමර වාක්‍ය ඛණ්ඩ සහ වාක්‍ය.

ගුරුවරුන් සහ සිසුන් පන්ති කාමරයේ බහුලව භාවිතා කරන ඉංග්‍රීසි භාෂාවෙන් පන්තිකාමර භාෂාව පිළිබඳ අත්පොතක් සකස් කිරීමට තීරණය කර ඇත. ඒ නිසා සියලුම ගුරුවරුන්ට ඔවුන් උගන්වන විෂයයන් නොසලකා සිසුන්ට මෙන්ම පන්ති කාමරයේ එය භාවිතා කළ හැකිය. උදාහරණයක් ලෙස: කරුණාකර පිටු අංක 20 පෙරළන්න (ගුරුවරයා ශිෂ්‍යයාට), කළු ලෑල්ල පැහැදිලි නැත (ශිෂ්‍යයා ගුරුවරයාට).

මේ සම්බන්ධයෙන් පාසල් මට්ටමින් භාවිත වන පන්තිකාමර භාෂාව එකතු කිරීම සඳහා ගුරුවරුන්ට සහ සිසුන්ට කාර්ය පත්‍රිකා කට්ටලයක් ලබා දෙන ලදී. දත්ත එකතු කිරීම සිදු කළ පසු, එකතු කරන ලද ප්‍රතිචාර ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරනු ලැබේ.

1.3.11.4 පුස්තකාල සේවා

ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පුස්තකාල ජාලය කෘෂිකර්ම, කලා හා සංස්කෘතික, වාණිජ හා කළමනාකරණ, විද්‍යා, තාක්ෂණ යන පීඨ සඳහා පහසුකම් සපයන ප්‍රධාන පුස්තකාලයෙන් සහ මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ ශාඛා පුස්තකාලයකින් සමන්විත වේ.

විශ්වවිද්‍යාල පුස්තකාලයේ විවිධ තොරතුරු මූලාශ්‍ර එකතුවක් අඩංගු වේ. විශේෂයෙන්ම ආවරණ ගැඹුර සහ පළල අනුව, පොත් ණය, අන්තර් පුස්තකාල ණය, විමර්ශන සේවා සහ උපදේශන සේවා ඇතුළු පුළුල් පරාසයක සේවා සපයනු ලැබේ. මෙම එකතුව බහු-විනය සහ ස්ථාපිත පීඨවලට සම්බන්ධ පුළුල් පරාසයක මාතෘකා ආවරණය කරයි.

ඉගෙනුම් ක්‍රියාවලියට තොරතුරු සම්පත් වල වැදගත්කම පිළිගන්නා වැදගත් හවුල්කාරිත්වයන් හරහා අපගේ පුස්තකාල ජාලය සක්‍රීයව උපාධි අපේක්ෂක විෂය මාලාවට ඇතුළත් කර ඇත. මෙවැනි අන්තර්ක්‍රියා වල එක් කැපී පෙනෙන අවස්ථාවක් වන්නේ කලා හා සංස්කෘතික පීඨයේ අධ්‍යයන වැඩසටහනේ "පුස්තකාලය සහ තොරතුරු විද්‍යාව පිළිබඳ හැඳින්වීම" යන පාඨමාලාවයි. විශ්ව විද්‍යාලයේ උපාය මාර්ගික දිශානතියට අනුගත වීමේ ප්‍රතිඵලයක් ලෙස, පුස්තකාලවල සම්පත්, සේවා සහ ව්‍යුහය සැලසුම් කර ඇත්තේ ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ අරමුණු සඳහා උපකාර කිරීම සඳහා ය.

1.3.11.5 දේශීය ආයතන සමඟ එළැඹුණු අවබෝධතා ගිවිසුම්

දේශීය ආයතන සමඟ එළැඹුණු අවබෝධතා ගිවිසුම්

ආයතනය	ක්‍රියාකාරිත්වයේ කාර්යභාරය
ප්‍රජා සම්පත් බලමුලු ගැන්වීමේ සංගමය	PVE හි වෙනස් කරන්නන් බවට පත්වීමට විවිධ පසුබිම්වල සිසුන්ගේ අරමුණු පිළිබඳ හැඟීම වැඩි දියුණු කිරීම.
	මඩකලපුවේ බහු ආගමික/වාර්ගික සහ සංස්කෘතික පසුබිම්වල සිසුන් අතර විශ්වාසය සහ අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම.
ශ්‍රී සත්‍ය සායි කරුණා නිලයම් පදනම (SSSKNF)	අධ්‍යාපන හා ඉගැන්වීමේ කුසලතා සහ චරිත සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව, සම්මන්ත්‍රණ, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම.
	උසස් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සංවර්ධනය සහ උසස් අධ්‍යාපනයේ සහ සෞඛ්‍ය සේවයේ විශිෂ්ටත්වය ලුහුබැඳීම සඳහා පොදු සැලකිල්ලක් දැක්වීම සඳහා පීඨය සහ සිසුන් යන දෙඅංශයෙන්ම බෙදාහදා ගැනීම සහ හුවමාරු කර ගැනීම.
	පර්යේෂණ සහ ක්ෂේත්‍ර විශ්ලේෂණය කිරීමට.
	ශිෂ්‍ය වැඩසටහනට සම්පත් දායකයෙකු ලෙස සහභාගී වීමට සහ දායක වීමට පීඨ සාමාජිකයින් දිරිමත් කිරීම.
	ඉතිහාසයේ සුභසාධනය සඳහා SSSKNF සහ නැ.වි. අතර සෞඛ්‍ය හා අධ්‍යාපනික සබඳතා ශක්තිමත් කිරීම.
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය	අධ්‍යාපන වැඩසටහන - කෘෂිකාර්මික හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල රටේ නැගී එන ඉල්ලීම් සපුරාලීම සඳහා නව උපාධි අපේක්ෂක වැඩසටහන්, පශ්චාත් උපාධි වැඩසටහන්, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා සහ විශේෂිත වැඩසටහන් ඒකාබද්ධව සංවර්ධනය කිරීම.
	පර්යේෂණ වැඩසටහන - අන්‍යෝන්‍ය සහයෝගීතාවයන් සහ විශේෂිත ශාස්ත්‍රීය හා තාක්ෂණික හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් සහයෝගී පර්යේෂණ වැඩසටහන් ඒකාබද්ධව සංවර්ධනය කිරීම.
	පර්යේෂණ සහ/හෝ පුහුණු ව්‍යාපෘති - ඔවුන්ගේ අන්‍යෝන්‍ය සහයෝගීතාවයට අනුකූලව පර්යේෂණ සහ හෝ පුහුණු ව්‍යාපෘති ඒකාබද්ධව සැලසුම් කිරීම සහ ඒකාබද්ධව බාහිර අරමුදල් ලබා ගැනීම සහ ඒකාබද්ධව භෞතික හා බුද්ධිමය සම්පත් ලබා ගැනීම සහ බෙදාගැනීම සහ එවැනි ව්‍යාපෘති ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම.
	විශේෂඥ දැනුම - ආයතන දෙක තුළම පවතින පොහොසත් තාක්ෂණික විශේෂඥතාවයන් ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී අරමුණු සඳහා අන්‍යෝන්‍ය වශයෙන් භාවිතා කිරීම (අ) පර්යේෂණ සහ පුහුණු ව්‍යාපෘති නිර්මාණය කිරීම (ආ) එක් එක් පාර්ශ්වයේ පර්යේෂණ කටයුතු කරගෙන යාම (ඇ) ජාතික හෝ ආයතනික උනන්දුවක් දක්වන අභ්‍යාස පිළිබඳ උපදෙස් සහ උපදේශනය

	භෞතික සම්පත් - ඔවුන්ගේ නේවාසික පහසුකම්, පර්යේෂණ පහසුකම්, ඉඩම් සහ අනෙකුත් භෞතික අවකාශයන් මෙන්ම පර්යේෂණ පුහුණුව සහ අධ්‍යාපනික අරමුණු සඳහා නොමිලේ හෝ සැලකිය යුතු සහනදායී මිලකට උපකරණ අන්‍යෝන්‍ය වශයෙන් ලබා දෙයි.
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය	විද්‍යාත්මක, ශාස්ත්‍රීය, අධ්‍යාපන හෝ පුහුණු සාකච්ඡා - සම්මන්ත්‍රණ සම්මන්ත්‍රණ ඒකාබද්ධව සංවිධානය කිරීම,වෙබ් වැඩමුළුව, අන්‍යෝන්‍ය ප්‍රතිලාභ හෝ ජාතික ප්‍රතිලාභ යන මාතෘකා පිළිබඳ සාකච්ඡා පැවැත්වීම.
	උපදේශනය - රාජ්‍ය, පෞද්ගලික සහ පුද්ගල අංශ සඳහා අන්‍යෝන්‍ය අවශ්‍යතා සහ විශේෂඥතාව ඇති අංශවල ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම් ඒකාබද්ධව සැලසුම් කිරීම සහ යෝජනා කිරීම.
	නවෝත්පාදන සහ බුද්ධිමය දේපල - සහයෝගී පර්යේෂණ අභ්‍යාසවල ප්‍රතිඵල ද්‍රව්‍යමය හෝ බුද්ධිමය වශයෙන් ඒකාබද්ධව බෙදා ගන්න.
ශ්‍රී ලංකා ජාතික සාම සභාව	වාර්ගික හා ආගමික දුක්ගැනවිලි අවම කිරීම සහතික කිරීම සඳහා පෙරටුගාමී රාජ්‍ය නිලධාරීන් හරහා බහුත්වවාදය ප්‍රවර්ධනය කිරීම සහ ඇතුළත් සේවා සැපයීම.
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	ගණකාධිකරණය සහ අනෙකුත් අදාළ විෂයයන් පිළිබඳ අධ්‍යයනය වැඩි දියුණු කිරීම.

1.3.12 ජාත්‍යන්තර කටයුතු

විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර කටයුතු අංශය, සම්පත් සහ පහසුකම් සපයන සහ විදේශීය උසස් අධ්‍යාපන ආයතන සමඟ විද්වත් හුවමාරු සඳහා පහසුකම් සපයන අතර, ජාත්‍යන්තර සබඳතා ඉදිරියට ගෙනයාමට, බහුවිධ සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමට සහ කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍ය සාමාජිකයින්ට සහාය වීමට කැපවී සිටී.

1.3.12.1 2022 දී විදේශ ආයතන සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්.

විශ්ව විද්‍යාලය/ ආයතනය	රට	ක්‍රියාකාරිත්වයේ කාර්යභාරය
නෙක්මෙටින් එබාර්කන් විශ්ව විද්‍යාලය	තුර්කිය	ශිෂ්‍ය හුවමාරුව, පර්යේෂණ සහ ශිෂ්‍යත්ව
ගෝවා විශ්වවිද්‍යාලය	ඉන්දියාව	ශිෂ්‍ය හුවමාරුව, පර්යේෂණ
තමිල්නාඩු ගුරු අධ්‍යාපන විශ්වවිද්‍යාලය	ඉන්දියාව	කාර්ය මණ්ඩල හුවමාරුව
ශ්‍රී සත්‍ය සායි කරුණා නිලයම් පදනම	ඉන්දියාව	සිසුන් සහ කාර්ය මණ්ඩල හුවමාරුව සහ පහසුකම්
මානව විශිෂ්ටත්වය සඳහා ශ්‍රී සත්‍ය සායි විශ්වවිද්‍යාලය	ඉන්දියාව	සිසුන් සහ කාර්ය මණ්ඩල හුවමාරුව; සහ පහසුකම්
ටෙස්ටෙනියම් ලිමිටඩ්, ලන්ඩන්.	එක්සත් රාජධානිය	සිසුන් සහ කාර්ය මණ්ඩල හුවමාරුව, පර්යේෂණ ව්‍යාපෘති; සහ පුහුණුවීම්
විවෘත සිතියම්කරණ මධ්‍යස්ථානය, ආසියා හා පැසිෆික් මධ්‍යස්ථානය	පිලිපීනය	ශිෂ්‍ය හුවමාරුව, පර්යේෂණ; සහ පුහුණුවීම්
ජීව විද්‍යා සම්පත් හා ආහාර ඉංජිනේරු විද්‍යාලය, කුයිජිං නෝමල් විශ්වවිද්‍යාලය	චීනය	සිසුන් සහ කාර්ය මණ්ඩල හුවමාරුව, පර්යේෂණ ව්‍යාපෘති, පුහුණු කිරීම්; සහ ශිෂ්‍යත්ව
බටහිර නෝර්වේ ව්‍යවහාරික විද්‍යා විශ්වවිද්‍යාලය	නෝර්වේ	ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරුව, පර්යේෂණ ව්‍යාපෘති, පුහුණුවීම්, ශිෂ්‍යත්ව; සහ ව්‍යාපෘති, සඳහා අරමුදල්

1.3.12.2 2022 තුළ ජාත්‍යන්තර නියෝජිත සංචාර

2022 වර්ෂය තුළ ජාත්‍යන්තර නියෝජිත සංචාර පහක් (5) සිදු විය. නැ.වි.වි. හි කාර්ය මණ්ඩලය සහ සිසුන් යන දෙඅංශයෙන්ම මෙම චාරිකාවලින් ප්‍රතිලාභ ලැබූ අතර, තවද, කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය හුවමාරු මෙන්ම ජාත්‍යන්තර සහයෝගිතා ශක්තිමත් විය.

දිනය	පැමිණි ආයතනය	අරමුණ
26.05.2022	Qi Zhenhong, මහජන චීන සමූහාණ්ඩුවේ තානාපතිතුමන්	ජාත්‍යන්තර කටයුතු අංශය විවෘත කිරීමේ උත්සවය සහ නැ.වි.වි හි ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම.
06.09.2022	Qi Zhenhong, මහජන චීන සමූහාණ්ඩුවේ තානාපතිතුමන්	චීන තානාපතිවරයාගේ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ උත්සවය. මෙම ශිෂ්‍යත්වය සිසුන් 100 දෙනෙකුට ප්‍රදානය කරන ලදී.
01.10.2022	ඉන්දීය තානාපතිතුමන්	නැ.වි.වි යේ උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වීම සහ නැ.වි.වි සමඟ සහයෝගිතාවය වැඩි දියුණු කිරීම සඳහා.
01.11.2022	ටෙස්ටෙනියම් ලිමිටඩ්, එක්සත් රාජධානිය.	මෙටා කම්පියුටින් සංකල්පය හඳුන්වාදීමේ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ උත්සවය සඳහා.
23.11.2022	බටහිර නෝර්වේ ව්‍යවහාරික විද්‍යා විශ්වවිද්‍යාලය (HVL)	ගෝලීය අධ්‍යයන සහයෝගිතා (NORPART) ව්‍යාපෘතිය සඳහා නෝර්වීජියානු හවුල්කාරිත්ව වැඩසටහනේ ව්‍යාපෘති ගිවිසුම් උත්සවය සඳහා.

1.3.12.3 2022 දී පවත්වන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ

"පුනරුදය දෙසට දෘෂ්ටිවාදය" යන තේමාව යටතේ 2022 නොවැම්බර් 09 සිට 12 දක්වා ත්‍රිකුණාමල මණ්ඩපයේදී පැවැත්වුණු 5 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (TRInCo-2022).

1.3.13 ශිෂ්‍ය සුභසාධනය

1.3.13.1 සිසුන් සඳහා නේවාසික පහසුකම්

ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලය සියලුම අභ්‍යන්තර සිසුන්ට නේවාසික පහසුකම් පිරිනමයි. දැනට නේවාසිකාගාර 25ක් පවතින අතර, මඩකලපුවේ ස්ථාන විස්සක් (20) සහ ත්‍රිකුණාමලය මණ්ඩපයේ පහක් (5) සමඟින් සිසුන් 5,334කට වැඩි පිරිසකට එහි නවාතැන් ලබා දිය හැකිය.

2022 දී පිල්ලෙයාරඩි කාන්තා නව නේවාසිකාගාරය සිසුන්ගේ භාවිතය සඳහා විවෘත කර ඇත. 2022 වසරේ ත්‍රිකුණාමල මණ්ඩපය කුලියට ගත් නේවාසිකාගාරයේ සිසුවියන් 141ක් පමණ නවාතැන් ගෙන සිටියහ.

සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් – 2022


නේවාසිකාගාරයේ නම	ස්ථාපිත වර්ෂය	නවාතැන් පහසුකම් ඇති සිසුන් සංඛ්‍යාව (ධාරිතාවය)		31.12.2022 වන විට නවාතැන් ගෙන ඇති සංඛ්‍යාව
		පුරුෂ	ස්ත්‍රී	
A වින්ග් නේවාසිකාගාරය	1987	88	-	48
B වින්ග් නේවාසිකාගාරය	1987	96	-	42
C වින්ග් නේවාසිකාගාරය	1987	100	-	89
නිව් වින්ග් නේවාසිකාගාරය	2012	250	-	100
සුනාමි වින්ග් නේවාසිකාගාරය	2014	195	-	156
සෙමි වින්ග් නේවාසිකාගාරය	2014	100	-	53
පිල්ලයාරඩි පිරිමි නේවාසිකාගාරය	2015	190	-	111

(ඉදිරියට.) සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් – **2022**

නේවාසිකාගාරයේ නම	ස්ථාපිත වර්ෂය	නවාතැන් පහසුකම් ඇති සිසුන් සංඛ්‍යාව (ධාරිතාවය)		31.12.2022 වන විට නවාතැන් ගෙන ඇති සංඛ්‍යාව
		පුරුෂ	ස්ත්‍රී	
පිල්ලයාරඩි නව පිරිමි නේවාසිකාගාරය	2022	100	-	33
A වින්ග් නේවාසිකාගාරය	1987	-	69	-
B වින්ග් නේවාසිකාගාරය	1987	-	57	-
C වින්ග් නේවාසිකාගාර	1987	-	76	48
නව වින්ග් නේවාසිකාගාරය	2012	-	150	98
සෙමී වින්ග් නේවාසිකාගාරය	2014	-	88	-
සරසවි මැදුර නේවාසිකාගාරය	2015	-	372	133
අයිසිසි (A) වින්ග් නේවාසිකාගාරය	2014	-	384	343
අයිසිසි (B) වින්ග් නේවාසිකාගාරය	2014	-	384	315
සරසවි මැදුර නේවාසිකාගාරය 5	2018	-	384	199
සරසවි මැදුර නේවාසිකාගාරය 6	2018	-	384	211
පිල්ලයාරඩි නව කාන්තා නේවාසිකාගාරය	2016	-	272	175
පිල්ලයාරඩි නව කාන්තා නේවාසිකාගාරය	2022	-	98	94
සරසවි මැදුර නේවාසිකාගාරය II (D කොටස),ත්‍රි.ම.	2017	485	-	451
සරසවි මැදුර නේවාසිකාගාරය I (B කොටස), ත්‍රි.ම.	2015	-	396	451
මාබල් නේවාසිකාගාරය (A කොටස),ත්‍රි.ම.	2015	-	98	144
නිලාවෙලි නේවාසිකාගාරය I (C කොටස), ත්‍රි.ම.	2015	122	-	121
සරසවි මැදුර නේවාසිකාගාරය III (E කොටස),ත්‍රි.ම.	2018	-	396	388
කුලී නේවාසිකාගාර, ත්‍රි.ම.	2022	-	141	141

සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම්

වර්ෂය	2018	2019	2020	2021	2022
නේවාසිකාගාර පහසුකම් ලද සිසුන් සංඛ්‍යාව	4144	4932	4973	4135	6252



1.3.13.2 ශාරීරික අධ්‍යාපන ඒකකය

ශාරීරික අධ්‍යාපන ඒකකය (PEU), ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ක්‍රීඩා පාලන ආයතනය වන අතර, ජීවිත කාලය පුරාම ක්‍රීඩාවේ යෙදීම ස්වයං-වර්ධනය ගවේෂණයට සහ වඩා හොඳ සනීපාරක්ෂාවක් සහ සෞඛ්‍යය කෙරෙහි ඇති ද්විතීයික බලපෑම් සඳහා උපකාරී වේ යන මතය තරුණයින් තුළ අවදි කිරීම අරමුණු කරයි. යොවුන් වියේ අධ්‍යාපනයේ යෙදෙන්නේ මනස සහ ශරීරය පමණක් නොව මෙම කොටස් දෙක සමාන ප්‍රමාණවලින් බව අධ්‍යාපනයේ සලකා බලන මතයයි. මෙම උනන්දුව මනසේ තබාගෙන, විශ්ව විද්‍යාලයට සහ මුළු රටටම වඩා හොඳ සේවාවක් ලබා දීමට ශාරීරික අධ්‍යාපන ඒකකය දැඩි උත්සාහයක් දරයි.

2022 දී ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම්
පීඨවල අනාගත නවකයන් සඳහා දිශානති වැඩසටහනක් පැවැත්වීම.
ජාතික මට්ටමින් තෝරාගත් පාසල්වල සිසුන් සඳහා ශාරීරික ක්‍රියාකාරකම්, ශක්තිය සහ යෝග්‍යතාවය සහ ක්‍රීඩා මනෝවිද්‍යාව පිළිබඳව වැඩමුළුවක් පවත්වන ලදී.
දේශීය තරඟාවලි පැවැත්වීම.
පීඨ අතර අන්තර් පීඨ සුහද තරඟාවලි පැවැත්වීම.
අන්තර් විශ්වවිද්‍යාල බර ඉසිලීමේ ශූරතාවලිය ජනවාරි 8 වැනිදා නැගෙනහිර විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි.

1.3.14 තෘප්තිමත් සමීක්ෂණය

උපාය මාර්ගික සැලසුම් සහ සංඛ්‍යාලේඛන ඒකකයේ කාර්යාලය විසින් වාර්ෂිකව 2016 වසරේ සිට එක් එක් උපාධි ප්‍රදානෝත්සවය පිළිබඳ උපාධිධාරීන්ගේ තෘප්තිමත් සමීක්ෂණය පවත්වන ලදී. මෙම සමීක්ෂණය සියලුම පීඨවල උපාධිධාරීන්ගේ ප්‍රතිචාර මත පදනම්ව සකස් කරන ලදී. නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සේවාවන් සහ පහසුකම්වල තෘප්තිමත් මට්ටම, සිසුන් අතරේ සොයා බැලීම සඳහා එය පවත්වන ලදී. උපාධිධාරී සංගණනයට පීඨ හයක් සහ ත්‍රිකුණාමල මණ්ඩපය ඇතුළත් විය.

තෘප්තිමත් සමීක්ෂණ වාර්තාව **2022**

		තෘප්තිමත් අනුපාතය				
කාණ්ඩය	පීඨ	ඉතා සතුටුදායකයි	සාමාන්‍යයට සතුටුදායකයි	ඉහළින්	සාමාන්‍යයයි	අසතුටුදායකයි
පීඨ/ අධ්‍යනාංශ	කෘෂි	52.55%	33.80%	8.56%	3.01%	2.08%
	කලා	50.63%	34.73%	10.81%	3.49%	0.35%
	වාණිජ	25.62%	56.92%	11.85%	4.99%	0.62%
	සෞඛ්‍ය	18.95%	52.71%	16.62%	8.44%	3.27%
	විද්‍යා	20.92%	44.97%	17.71%	12.67%	3.73%
	තාක්ෂණ	14.63%	62.78%	17.04%	5.56%	0.00%
	ව්‍ය.වි. , ත්‍රි.ම.	20.80%	51.57%	16.90%	6.36%	4.37%
	සන්නි, ත්‍රි.ම.	18.82%	54.33%	19.14%	5.85%	1.86%
පුස්තකාල	කෘෂි	65.42%	21.67%	5.42%	5.42%	2.08%
	කලා	55.83%	32.67%	7.21%	3.06%	1.23%
	වාණිජ	33.06%	51.84%	11.84%	2.76%	0.51%
	සෞඛ්‍ය	30.23%	40.62%	12.25%	11.16%	5.74%
	විද්‍යා	36.09%	40.00%	14.06%	7.19%	2.66%
	තාක්ෂණ	35.33%	44.67%	15.00%	3.33%	1.67%
	ව්‍ය.වි. , ත්‍රි.ම.	22.74%	47.86%	13.50%	11.28%	4.62%
	සන්නි, ත්‍රි.ම.	18.76%	43.73%	20.96%	12.34%	4.21%
ආහාර සේවා සහ ආපනශාලා	කෘෂි	15.63%	23.96%	28.65%	21.88%	9.90%
	කලා	22.21%	47.36%	15.36%	11.15%	3.91%
	වාණිජ	6.25%	35.46%	28.32%	21.43%	8.55%
	සෞඛ්‍ය	4.07%	36.24%	23.06%	25.00%	11.63%
	විද්‍යා	12.11%	31.05%	21.29%	20.31%	15.23%
	තාක්ෂණ	7.08%	30.42%	23.75%	27.92%	10.83%

	ව්‍ය.වි. , ත්‍රි.ම.	13.46%	30.13%	20.09%	22.86%	13.46%
	සන්නි, ත්‍රි.ම.	9.69%	40.07%	18.06%	26.79%	5.38%
සෞඛ්‍ය සේවා	කෘෂි	19.44%	52.78%	12.50%	9.03%	6.25%
	කලා	30.71%	45.55%	8.99%	12.10%	2.65%
	වාණිජ	14.12%	42.86%	15.48%	23.13%	4.42%
	සෞඛ්‍ය	9.82%	39.02%	14.99%	28.17%	8.01%
	විද්‍යා	22.66%	34.90%	15.63%	15.89%	10.94%
	තාක්ෂණ	7.78%	53.33%	27.22%	10.56%	1.11%
	ව්‍ය.වි. , ත්‍රි.ම.	26.21%	48.43%	12.54%	8.55%	4.27%
	සන්නි, ත්‍රි.ම.	19.14%	45.14%	20.73%	12.28%	2.71%
නේවාසිකාගාර පහසුකම්	කෘෂි	24.15%	48.30%	12.59%	10.88%	4.08%
	කලා	40.75%	38.75%	12.84%	6.38%	1.28%
	වාණිජ	11.34%	51.89%	24.05%	10.08%	2.63%
	සෞඛ්‍ය	30.24%	42.60%	15.96%	7.72%	3.47%
	විද්‍යා	14.55%	39.15%	21.03%	19.31%	5.95%
	තාක්ෂණ	17.73%	40.39%	24.88%	14.78%	2.22%
	ව්‍ය.වි. , ත්‍රි.ම.	13.15%	35.64%	18.53%	19.66%	13.01%
	සන්නි, ත්‍රි.ම.	19.15%	46.24%	21.28%	10.38%	2.95%
ක්‍රීඩා සහ යෝග්‍යතා පහසුකම්	කෘෂි	11.48%	40.37%	21.85%	21.11%	5.19%
	කලා	30.57%	50.79%	9.15%	7.38%	2.11%
	වාණිජ	7.44%	48.83%	30.28%	10.19%	3.26%
	සෞඛ්‍ය	6.25%	39.76%	23.26%	15.28%	15.45%
	විද්‍යා	15.17%	35.89%	20.87%	18.77%	9.31%
	තාක්ෂණ	11.11%	45.08%	28.89%	13.65%	1.27%
	ව්‍ය.වි. , ත්‍රි.ම.	9.31%	45.42%	24.44%	12.64%	8.19%
	සන්නි, ත්‍රි.ම.	14.52%	43.91%	23.49%	13.99%	4.08%

1.3.15 නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ශදුඅත (SWOT) විශ්ලේෂණය

ශක්තීන්

i. නැගෙනහිර විශ්වවිද්‍යාලය යනු වසර 42 ක පළපුරුද්දක් සහිත පූර්ණ රාජ්‍ය විශ්ව විද්‍යාලයකි.
ii. බොහෝ අධ්‍යයන ක්ෂේත්‍රවල ඉහළ මට්ටමේ පර්යේෂණ සහිත උනන්දුවක් දක්වන කාර්ය මණ්ඩලයක්.
iii. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් පිළිගත් සුවිශත සහරාව Scopus, Web of Science හි ප්‍රකාශන
iv. නැගෙනහිර විශ්වවිද්‍යාලය මණ්ඩපයකින් හා ආයතනයකින් සමන්විතය.
v. නැගෙනහිර විශ්වවිද්‍යාලය සතුව ස්වභාවික විද්‍යාවේ සිට සෞන්දර්ය අධ්‍යයනය දක්වා විවිධත්වයෙන් යුතු අධ්‍යයන ක්ෂේත්‍ර ඇත.
vi. නැගෙනහිර විශ්වවිද්‍යාලය ස්ථාන තුනකින් ස්ථාපිත කර ඇති බැවින් එය විශාල ප්‍රදේශයක් ආවරණය කරන අතර පරිමිතිය විශාල වේ.
11	අධ්‍යයන උපදේශන වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	13.09.2022	පීඨාධිපතිවරුන්, අධ්‍යනාංශ ප්‍රධානීන්, මහාචාර්යවරුන් සහ උනන්දුවක් දක්වන සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්	ආචාර්ය වයි. දීපානි සිරිවර්ධන, ප්‍රධානියා, පරපෝෂිත විද්‍යා අධ්‍යනාංශය, වෛද්‍ය පීඨය, කොා.වි.වි. සහ ආචාර්ය සංජීවනී ෆොන්සේකා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඖෂධවේදය අධ්‍යනාංශය, වෛද්‍ය පීඨය, ජේ.වි.වි.
12	විවෘත හා දුරස්ථ ඉගෙනීම පිළිබඳ වැඩමුළුව	23.09.2022	බාහිර උපාධි පිරිනමන පීඨ වල පීඨාධිපතිවරුන්, සම්බන්ධීකාරකවරුන්, වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් සහ විද්වතුන් (සන්නිවේදන පීඨය ඇතුළුව පීඨ 6)	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ඒ. අරියදුරෙයි, හිටපු උපකුලපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
13	ප්‍රතිපත්ති සම්පාදනය සඳහා විද්වතුන් විසින් පර්යේෂණ සහ ඇගයීම් සොයාගැනීම් භාවිතය පිළිබඳ උපදේශන සැසිය පිළිබඳ වැඩමුළුව	14.10.2022	සියලුම අධ්‍යනාංශ ප්‍රධානීන්	එම්. තිලගරාජා මහතා, ව්‍යාපෘති කළමනාකරු සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ කණ්ඩායම
14	විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව	27.10.2022	නැ.වි.වි. හි සියලුම පරිපාලන සාමාජිකයින් සහ තෝරාගත් අනධ්‍යයන කාර්ය මණ්ඩලය	එස්.ෂන්මුගන් මහතා, මොා.වි.වි. සහ කොා.වි.වි. සඳහා පාලක සභා සාමාජික සහ විශ්‍රාමික ලේඛකාධිකාරී.
15	වත්මන් තොරතුරු තාක්ෂණ විශේෂාංග වැඩිදියුණු කිරීම පිළිබඳ වැඩමුළුව	02.11.2022	නැ.වි.වි. හි සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය	ආචාර්ය අරස් අරසිලංගෝ, අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, ටෙස්ටෙනියම් ලිමිටඩ්, ලන්ඩන්.
16	විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව - සැසිය 2	15.11.2022	නැ.වි.වි. හි සියලුම පරිපාලන සාමාජිකයින් සහ තෝරාගත් අනධ්‍යයන කාර්ය මණ්ඩලය	ආචාර්ය ඒ.එල්. ජවුෆර් සාදික්, පාලක සභා සාමාජික සහ විශ්‍රාමික විශ්වවිද්‍යාල ලේඛකාධිකාරී
17	උපදේශන වැඩසටහන සඳහා ආරම්භක සැසිය	18.11.2022	ඉන්දියාවේ මනෝන්මනියම් සුන්දරනර් විශ්ව විද්‍යාලයේ "උපදේශනය" පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගී වූ කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා නැ. වි.වි. යේ ශිෂ්‍ය උපදේශකයින්	ආචාර්ය පූඩි රමේෂ් ජෙයකුමාර්, මනෝ වෛද්‍ය, මූලික රෝහල, වාලච්චේන
18	MS Excel පිළිබඳ වැඩමුළුව	14.12.2022	අනධ්‍යයන කාර්ය මණ්ඩලය, ත්‍රිකුණාමලය මණ්ඩපය	බී ක්‍රිස්ටෝපෝල් මහතා, තොරතුරු තාක්ෂණ උපදේශක, පරිගණක විද්‍යා අධ්‍යයනාංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ත්‍රිකුණාමල මණ්ඩපය.

(ඉදිරියට.) 2022 දී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන වැඩසටහන්

අංකය	වැඩසටහනේ නම	දිනය	ඉලක්කගත කණ්ඩායම	සම්පත් දායකයින්
19	ලිපි ලිවීමේ කුසලතා වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩමුළුව	15.12.2022	ත්‍රිකුණාමලය මණ්ඩපයේ තොරතුරු තාක්ෂණ උපදේශක	ආචාර්ය ජේ.එස්.ආර්.. සවරිමුත්තු, භාෂා පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා සහ සන්නිවේදන අධ්‍යයන අධ්‍යයනාංශය, ත්‍රිකුණාමල මණ්ඩපය
20	සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් සඳහා ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ වැඩමුළුව	22.12.2022	ත්‍රිකුණාමලය මණ්ඩපයේ පරිගණක විද්‍යා අධ්‍යනාංශයේ සියලුම කාර්ය මණ්ඩලය	ආචාර්ය එස්.උෂාකාන්තන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සිද්ධ වෛද්‍ය ඒකකය ව්‍යවහාරික විද්‍යා පීඨය, ත්‍රිකුණාමල මණ්ඩපය.

3 විශ්වවිද්‍යාලයේ පීඨයන්

3.1 කෘෂිකර්ම පීඨය



පීඨාධිපතිනි– මහාචාර්ය පී. ප්‍රේමානන්දරාජා මහත්මිය.

හැඳින්වීම

කෘෂිකර්ම පීඨය ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පුරෝගාමී පීඨවලින් එකකි. පීඨය 1986 දී වන්දාරුමූලේදී ආරම්භ කරන ලද අතර 2020 දී එහි වර්තමාන ස්ථානය වන පලාච්චෝලෙයි වෙත මාරු කරන ලදී. පීඨයේ මෙහෙවර වන්නේ " ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව වෙනුවෙන් තාක්ෂණය වැඩිදියුණු කිරීම, දැනුම හා කුසලතාවයන් බෙදා ගැනීම සහ තිරසාර ලෙස සම්බන්ධ වීම සඳහා දායක වන ඉහළම ගුණාත්මක මට්ටමේ පිරිමින් සහ කාන්තාවන් බිහි කිරීමයි". පීඨය අධ්‍යයන අංශ හයක් සහ තිරසාර කෘෂිකර්ම හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයකින් (CENSARM) සමන්විත වේ.

අධ්‍යයන අංශ

කෘෂි ජීව විද්‍යාව
කෘෂි රසායන විද්‍යාව
කෘෂි ආර්ථික විද්‍යාව
කෘෂි ඉංජිනේරු
කෘෂි සත්ව විද්‍යාව
භෝග විද්‍යාව

අධ්‍යයන පාඨමාලා

කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී ගෞරව
කෘෂිකර්මය පිළිබඳ ශාස්ත්‍රපති
දර්ශනපති
දර්ශන ආචාර්ය

ගොවිතැන් පිළිවෙත්, ආහාර සහ පෝෂණය, භෝග සහ පශු සම්පත් කළමනාකරණය, ගොවිපල යන්ත්‍රෝපකරණ භාවිතය, පාංශු සෞඛ්‍ය කළමනාකරණය, තිරසාර බව, පාරිසරික කළමනාකරණය සහ ගොවිපල ව්‍යාප්තිය ඇතුළු තාක්ෂණික කුසලතා සහ දැනුම වර්ධනය කිරීමට පීඨය සිසුන්ට උපකාර කරයි.

ජයග්‍රහණ

අධ්‍යයන ජයග්‍රහණ

- උපාධි පාඨමාලාවන්හි විෂයමාලා සංශෝධනය සිදු වෙමින් පවතින අතර විෂයමාලා සංවර්ධන කමිටුව විසින් නොනවත්වා නිසි කලට සිදු කරනු ලැබේ.
- පීඨ විෂයමාලා සංවර්ධන කමිටුවේ සහ පීඨ තත්ත්ව ආරක්ෂණ සෛලයේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.
- 2020/2021 ප්‍රවේශය සඳහා ශිෂ්‍ය අත්පොත ප්‍රකාශයට පත් කිරීම.
- සියලුම ශිෂ්‍ය කණ්ඩායම් සඳහා අධ්‍යයන සැසි පැවැත්වීම.
- 2015/2016 ශිෂ්‍ය කණ්ඩායම සඳහා උපාධි පාඨමාලාව සාර්ථකව නිම කිරීම.
- කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව නැවත ආරම්භ කිරීම.
- 2020/2021 කණ්ඩායමේ නවක සිසුන් සඳහා දිශානති වැඩසටහන පැවැත්වීම.

කාර්ය මණ්ඩල ජයග්‍රහණ

<u>උසස්වීම්</u>

ආචාර්ය එම්. භක්තිනාදන් කෘෂි සත්ව විද්‍යා අංශයේ මහාචාර්යවරයෙකු ලෙස උසස්වීම් ලබන ලදී.

<u>ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම්.</u>

- ආචාර්ය භවදාරණි රවීන්ද්‍රකුමාරන් මහත්මිය නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලයේ කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් සම්පූර්ණ කළාය.
- ආචාර්ය කේ ප්‍රසන්නාත් ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත විශ්ව විද්‍යාලයේ ශාක ව්‍යාධි විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් සම්පූර්ණ කළේය.
- ආචාර්ය එම්.එස්.එම්.නෆීස් මැලේසියාවේ පුට්‍රා විශ්ව විද්‍යාලයේ ජලජීවී වගා පෝෂණය පිළිබඳ ආචාර්ය උපාධියක් සම්පූර්ණ කළේය.

<u>කෘෂිකාර්මික දිනය</u>

'නිසි අධ්‍යාපනය තුළින් තිරසාර කෘෂිකර්මාන්තයක්' යන තේමාව යටතේ කෘෂිකාර්මික දිනයක් සංවිධානය කරන ලදී. පීඨයේ අධ්‍යයන අංශ හයම සහ ගොවිපළවල් දෙක එක්ව සමගාමීව කෘෂිකර්ම දිනය පවත්වන ලදී.

ශිෂ්‍යත්ව, ත්‍යාග පිරිනැමීම

- බ්‍රින්දා කරුණාරත්න මහත්මිය විසින් ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා USQ ජාත්‍යන්තර පර්යේෂණ දීමනාව සහ සම්පූර්ණ පාඨමාලා ශාස්තූ ශිෂ්‍යත්වය දිනා ගන්නා ලදී.

- ආචාර්ය ටී ගිරිදරන් සහ ආචාර්ය කේ ප්‍රසන්නාත් 2021 වර්ෂය සඳහා හොඳම නිමැවුම් පාදක පර්යේෂණ සඳහා උපකුලපති සම්මානය- 2022 දිනා ගන්නා ලදී.

පීඨ ජයග්‍රහණ

- හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

- කෘෂිකර්මය පිළිබඳ පස්වන ජාතික සම්මන්ත්‍රණය [NSA] 2022දී සාර්ථකව පවත්වන ලදී.

- උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ප්‍රතිපාදනය හරහා විවිධ රසායනාගාර උපකරණ සහ ගෘහ භාණ්ඩ ප්‍රසම්පාදනය කර ගන්නා ලදී.

- උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ප්‍රතිපාදනය හරහා ප්‍රසම්පාදනය කරන ලදුව, පීඨ පරිශ්‍රයේ කාලගුණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී.

සම්මන්ත්‍රණ/ වැඩමුළු සහ පුහුණු වැඩසටහන්

2022 දෙසැම්බර් 19 සිට 28 දක්වා පැවති චීන-දකුණු ආසියානු රටවල දරිද්‍රතා තුරන් කිරීම සහ සහයෝගීතා මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද දකුණු ආසියානික රටවල් සඳහා දරිද්‍රතාවය පිටුදැකීම සහ සහයෝගීතා සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණයකට කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යනාංශයේ ආචාර්ය දිවාහරී ගිරිදරන් මහත්මිය සහභාගී වූවාය.

2022 ඔක්තෝම්බර් 13 වන දින පවත්වන ලද "ආහාර පරිභෝජනය සඳහා පවතින දේශගුණික බලපෑම් අවම කිරීම සඳහා පාරිභෝගික හැසිරීම් සහ ප්‍රතිපත්ති ලේඛනගත කිරීම" හදිසි වෛද්‍ය විද්‍යාව සඳහා අප්‍රිකානු සම්මේලනය (AFEM) මඟින් සංවිධානය කළ මාර්ගගත සම්මන්ත්‍රණයට සහ එක්සත් රාජධානියේ කෘෂිකර්ම විදුහල,ප්‍රතිපත්ති සහ සංවර්ධනය, කියවීමේ විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද "කාබන් අඩු කිරීමේ ප්‍රතිපත්ති ඇතුළත් කිරීම තුළින් ආහාර හා සම්බන්ධ සෞඛ්‍යය වැඩිදියුණු කිරීම" පිළිබඳ 2022 නොවැම්බර් 17 දින පවත්වන ලද සම්මන්ත්‍රණයට කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යනාංශයේ ක්‍රිෂ්නාල් තිරුමාර්පන් මහත්මිය සහභාගී වූවාය.

කෘෂි සත්ව විද්‍යා අධ්‍යනාංශයේ එස්.ටී.ඩී. ද සිල්වා මහතා 2022 නොවැම්බර් 14 සිට 18 දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ ආයතනයේ පැවති "ජාන ක්ලෝනකරණය සහ ප්‍රතිසංයෝජක ප්‍රෝටීන ප්‍රකාශනය" පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගී විය.

කෘෂි ජීව විද්‍යා අධ්‍යනාංශයේ විශේෂඥ දැනුම ඇති තුන්වන වසර දෙවන අධ්‍යයන සමාසිකයේ (2016/2017) සිසුන් ආර්ථික භෝග සඳහා අභිජනන ක්‍රමෝපායන් පිළිබඳ පුහුණුව ලබා ගැනීම සඳහා 2022 ජනවාරි 10 - 11 යන දිනවල කිලිනොච්චි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත රැගෙන ගොස් ඇත.

ලාභදායි අයිස්ක්‍රීම් සෑදීම පිළිබඳ පුහුණු වැඩසටහන 2022 දෙසැම්බර් 9 වන දින සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ තිරසාර කෘෂිකර්ම හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය (CENSARM) සමඟ සමගාමීව කෘෂිකර්ම පීඨයේදී පවත්වන ලදී.

අසාර්ථකත්වයන් සහ සාධාරණීකරණයන්

2022 සඳහා සැලසුම් කරන ලද බොහෝ යටිතල පහසුකම් සංවර්ධනයන් විශ්වවිද්‍යාල පද්ධතියේ මූල්‍ය බාධාවන් හේතුවෙන් සිදු නොකරන ලදී, උදා. පීඨ ගොඩනැගිලි සංකීර්ණයේ දෙවන හා තෙවන අදියර..

අනාගත සැලැස්මන්

- නව පෝෂණ හා ආහාර විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා අනුමැතිය ලබා ගැනීම.

- කෘෂිකර්ම හා තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාව සඳහා අනුමැතිය ලබා ගැනීම.

- කෘෂිකර්මය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

- 2021/2022 කණ්ඩායම සඳහා සිසුන්ගේ අත්පොත සම්පූර්ණ කර ප්‍රකාශයට පත් කිරීම.

- පීඨය අනුව කළමනාකරණ තොරතුරු පද්ධතිය සම්පූර්ණ කර ක්‍රියාවට නැංවීම..

- පීඨය හා අධ්‍යනාංශ තුළ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ප්‍රතිපාදනය යටතේ යෝජිත විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම.

- විදේශ සහයෝගීතාවන් ආරම්භ කිරීම.

- ගොඩනැගීමේ අදියර.

- ගොවිපල සංවර්ධනය

3.2 කලා හා සංස්කෘත පීඨය



පීඨාධිපති - ආචාර්ය වී. ගුණබාලසිංහම්

හැඳින්වීම

1986 දී පිහිටුවන ලද කලා හා සංස්කෘත පීඨය (FAC) වන්දාරුමූලෙයි, චෙන්කලඩි හි පිහිටා ඇති අතර එය මඩකලපුව දිස්ත්‍රික්කයේ සංස්කෘතික වශයෙන් මෙන්ම ආර්ථික වශයෙන් සැලකිය යුතු මධ්‍යස්ථානයක් වන අතර එහි බලපෑම අම්පාර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලට ද විහිදේ.

අධ්‍යයන අංශ සහ ප්‍රභේද

අරාබි
සංසන්දනාත්මක ආගම්
අධ්‍යාපනය සහ ළමා ආරක්ෂණය
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම
ලලිත කලා
භූගෝල විද්‍යාව
හින්දු ශිෂ්ටාචාරය
ඉතිහාසය
තොරතුරු තාක්ෂණය
ඉස්ලාමීය අධ්‍යයනය
භාෂා
දර්ශනය සහ වටිනාකම් අධ්‍යයනය
සමාජ විද්‍යාව
දෙමළ අධ්‍යයනය
ක්‍රිස්තියානි ප්‍රභේදය
ආර්ථික විද්‍යා ප්‍රභේදය

අධ්‍යයන පාඨමාලා

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)
අධ්‍යාපන ශාස්ත්‍රවේදී
අරාබි භාෂා ශාස්ත්‍රවේදී (ගෞරව)
සංසන්දනාත්මක ආගම් පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව).
නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව).
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව).
ලලිත කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව).
භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව).
හින්දු ශිෂ්ටාචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව).
ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව).
දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව)
දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව)
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව)
දෙමළ භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව)
පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව).
ශාස්ත්‍රපති
දර්ශනපති සහ දර්ශන ආචාර්ය

කලා හා සංස්කෘත පීඨය කලාපය තුළ ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ජනතාව සඳහා සමාජ, සංස්කෘතික,ආර්ථික ප්‍රමිතීන් පොහොසත් කිරීම උදෙසා ගතික කාර්යභාරයක් ඉටු කරයි..

ජයග්‍රහණ

නව අධ්‍යයන අංශය

2022 දී පීඨය තුළ වෙනම දෙමළ අධ්‍යයනය සඳහා අධ්‍යයන අංශයක් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශයක් ස්ථාපිත කර ඇත.

හින්දු කලාගාරය සහ කෞතුකාගාරය පිහිටුවීම

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ හින්දු කලාගාරය සහ කෞතුකාගාරය 2022.08.10 දින ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ අනෙකුත් රාජ්‍ය විශ්ව විද්‍යාල අතර පිහිටුවන ලද හින්දු සහ කලා පුරාවිද්‍යාත්මක සොයාගැනීම් සඳහා වූ පළමු කෞතුකාගාරය මෙය වේ.

අධ්‍යයන ජයග්‍රහණ

- 2021/ 2022 කාණ්ඩය සඳහා කලා හා සංස්කෘතික පීඨයේ විෂයමාලාව තුළ පසු බැසීමේ (Fall back) විකල්පය හඳුන්වා දීම.
- පාඨමාලාවන්හි තත්ත්ව ආරක්ෂණය සඳහා විභාග ඇගයීම් සාරාංශ පත්‍රය 2022 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාවට නංවන ලදී.
- කොවිඩ් 19 වසංගත අර්බුදයෙන් පසුව, පීඨයේ විද්වතුන් 2022 වසරේ පළමු වසර සහ දෙවන වසර සිසුන් සඳහා අතථ්‍ය ආකාරයෙන් ඔවුන්ගේ දේශන පවත්වාගෙන යනු ලැබේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද ප්‍රකාශන

- ඒ. ඒ. නවරත්නම් පියතුමා (ජේ.කථී.II ශ්‍රේ.කතෝලික), සහ එන්. චෙන්දූරන් මහත්මිය (ජේ.කථී.II ශ්‍රේ. ඉතිහාසය) විසින් “මඩකලපුව: ලන්දේසි බලකොටුවේ වසර 400 සැමරීම” නමින් පොතක් 2022 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලදී. මෙය මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද අතර විදේශ කටයුතු සහ වෙළඳ කටයුතු දෙපාර්තමේන්තුව හරහා ඕස්ට්‍රේලියානු රජය විසින් අරමුදල් සපයන ලදී.

- 2022 නොවැම්බර් 1 වැනි දින පවත්වන ලද කලා හා සංස්කෘත පීඨයේ වාර්ෂික පර්යේෂණ සැසියේදී පර්යේෂණ පත්‍රිකා 49ක් ඉදිරිපත් කරන ලදී.
- නෛතාල් (NEITHAL), කලා හා සංස්කෘතික පීඨයේ සහරාව, වෙළුම. 11 (i) සහ (ii) 2022 දී ප්‍රකාශයට පත් කරන ලදී.

දිනාගත් සම්මාන

- ආචාර්ය කේ. රාජෙන්ද්‍රම් විසින් සාක්ෂරතා සඳහා ජනාධිපති සම්මානය (ශ්‍රී ලංකා අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රදානය කරන ලදී.)
- 2022 මාර්තු මාසයේ මැලේසියාවේ තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පවත්වන ලද සමුළුවේදී UTM තරුණ විද්වතුන් සඳහා වන ප්‍රතිපාදනය එස්. මදන්රාජා මහතා විසින් දිනා ගන්නා ලදී.

විදේශ සහයෝගීතා

වෙනත් රාජ්‍ය විශ්වවිද්‍යාල, රාජ්‍ය සංවිධාන සහ මානුෂීය විවෘත වීදි සිතියම් කණ්ඩායම සමඟ ශ්‍රී ලංකාවේ වීදි සිතියම් ක්‍රියාකාරකම් සඳහා ආසියා පැසිෆික් විවෘත සිතියම් මධ්‍යස්ථානය විසින් ඇමෙරිකානු ඩොලර් 25,000 ක මුදලක් ප්‍රදානය කරන ලදී.

ශිෂ්‍ය ජයග්‍රහණ

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ සිසුන් වන එස්. සජීවිනි, එස්. සින්තුජා, ආර්. කීර්තනා යන ශිෂ්‍යාවන් 2023 තරුණ නායකත්ව සාමාජික සමුළුවට සහභාගී වීමට තෝරාගෙන ඇත. මෙම සමුළුව 2023 ජනවාරි මස ජැමෙයිකාවේදී පැවැත්වේ. මෙම ශිෂ්‍යාවන්, රටවල් 26 ක් නියෝජනය කරන අධ්‍යයන ආයතන 49 ක් හරහා සහභාගී වූ සිසුන් 67 දෙනෙකු අතරින් තේරී පත් වූවන් වේ. ශ්‍රී ලංකාව නියෝජනය කරන එකම ආයතනය නැගෙනහිර විශ්වවිද්‍යාලය වේ..
- ආර්. කීර්තනා (පිලිපීනය, රුවන්ඩාව, නයිජීරියාව), වී. කෞසියා (පිලිපීනය), එන්.සාරන්‍යා (පිලිපීනය), ලොව පුරා විවිධ රටවල විවෘත සිතියම්කරණ වැඩසටහන් සම්බන්ධ සැසියේදී විවිධ මාතෘකා යටතේ තම දැනුම බෙදා ගත්හ.
- සිසුන් 396 දෙනෙක් 2022 වර්ෂයේදී කලා හා සංස්කෘතික පීඨයේ කාර්මික සහ බුද්ධිමය සම්බන්ධ සීමාවාසික වැඩසටහන සම්පූර්ණ කරන ලදී.

අසාර්ථකත්වයන් සහ සාධාරණීකරණයන්

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පීඨයට නියමිත වේලාවට විභාග නිම කිරීමට නොහැකි වූ අතර නියමිතව තිබූ විභාග 2022 දී අඩු වැඩි වශයෙන් අවසන් විය. කෙසේ වෙතත්, පීඨයේ දින දර්ශනය දීර්ඝ කිරීමේ ගැටලුවට කොවිඩ් 19 වසංගතය දැඩි ලෙස බලපෑවේය. මෙම අධ්‍යයන වර්ෂය දීර්ඝ කිරීම පීඨයේ මෙන්ම විශ්වවිද්‍යාලයේ අනෙකුත් වැඩසටහන් හා ක්‍රියාකාරකම්වලට දැඩි ලෙස බලපෑවේය.

අනාගත සැලැස්මන්

- කලා හා සංස්කෘතික පීඨය සඳහා ස්මාර්ට් පන්ති කාමරයක් ඉදිකිරීම..
- කලා හා සංස්කෘතික පීඨයේ II අදියරේ සඳහා ගොඩනැගිලි ඉදි කිරීම සඳහා යෝජනාව සම්පූර්ණ කිරීම.
- කලමනාකරණ තොරතුරු පද්ධතියේ (MIS) කලා හා සංස්කෘතියට අදාළ පොරොත්තු වැඩ සාර්ථකව නිම කිරීම.
- හින්දු ශිෂ්ටාචාරය පීඨය පිහිටුවීම
- ඉදිරි වර්ෂවලදී මානව සම්පත් (කලා හා සංස්කෘතික පීඨයේ අධ්‍යයන හා අනධ්‍යයන සේවක සංඛ්‍යාව) වැඩි කිරීම.
- 2023 අගෝස්තු මාසයේදී "ශ්‍රී ලාංකේය දෙමළ සාහිත්‍යයේ සාහිත්‍ය විචාරය" යන මාතෘකාව යටතේ ජාතික සමුළුවක් සංවිධානය කිරීම.
- ආපදා කළමනාකරණය සඳහා විවෘත භූගෝලීය මූලාශ්‍ර තොරතුරු පද්ධතිය පිළිබඳ සහතික / ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වා දීම.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- බහු ආගමික සහ සමාජ සංහිඳියා ඒකකයක් පිහිටුවීම

3.3 වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය



පීඨාධිපති - ආචාර්ය එස්. ජෙයරාජා

හැඳින්වීම

වාණිජ හා කළමනාකරණ පීඨය (FCM) ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ප්‍රමුඛ පීඨයක් වන අතර, “නවෝත්පාදන ක්‍රම හරහා සමාජයේ ගතිකත්වයට සම්පත් කළමනාකරණය කිරීමේ විශිෂ්ටත්වය නිර්මාණය කිරීමේ මංපෙත්කරු වීම” යන දිශානතිය ඇතිව ක්‍රියා කරයි. ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ තුන්වන පීඨය ලෙස 1988 දී ආරම්භ කරන ලද පීඨය අධ්‍යයන අංශ තුනකින් සමන්විත වේ.

අධ්‍යයන අංශ

වාණිජ්‍යය
ආර්ථික විද්‍යාව
කළමනාකරණ

අධ්‍යයන පාඨමාලා

වාණිජ හා කළමනාකරණ පීඨය විවිධ විෂය පථයන් සඳහා උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් ඉදිරිපත් කරයි. වර්තමානයේ, පීඨය පහත සඳහන් උපාධි පාඨමාලා ඉදිරිපත් කරනු ලබයි..

ව්‍යාපාර පරිපාලනවේදී - (ගෞරව)
මානව සම්පත් කළමනාකරණවේදී (ගෞරව)
අලෙවි කළමනාකරණවේදී (ගෞරව)
වාණිජවේදී (ගෞරව)
ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ වාණිජවේදී(ගෞරව)
ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ වාණිජවේදී(ගෞරව)
ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ වාණිජවේදී (ගෞරව)
කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ව්‍යාපාර පරිපාලනපති
සංවර්ධන ආර්ථික විද්‍යාපති
දර්ශනපති
දර්ශන ආචාර්ය

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකින්ම විවිධ ජනවාර්ගික ප්‍රජාවන්ට අයත් සිසුන් 1200 කට ආසන්න සංඛ්‍යාවක් මෙම අධ්‍යයන වැඩසටහන් සඳහා ලියාපදිංචි වී ඇත. වාණිජ්‍යය හා කළමනාකරණ පීඨයට ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් විශ්වවිද්‍යාල සහ ආයතන කිහිපයක් සමඟ සම්බන්ධතා පවතී.

පීඨ ප්‍රකාශන

ජ’නලයන්

- උපදේශක -ව්‍යාපාර කළමනාකරණ සඟරාව - ද්විවාර්ෂික තීරක මාර්ගගත ජ’නලයකි.
- වනිගා විද්‍යාම් - ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයන ද්විවාර්ෂික තීරක මාර්ගගත ජ’නලයකි..

සඟරා

- කූර්මෛ(**Coormai**) - ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන මාර්ගගත සඟරාවකි..

පුවත් ලිපිය

- නායකයා - කළමනාකරණ අධ්‍යයන අංශය.
- තෙඩල්(**Thedal**) - වාණිජ්‍යය අධ්‍යයන අංශය.

ජයග්‍රහණ

ශාස්ත්‍රීය ජයග්‍රහණ

- නැගෙනහිර විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- නැගෙනහිර විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ වරලත් ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- පීඨය විසින් අවසන් වසර සිසුන් සඳහා ප්‍රජා සත්කාර වැඩසටහන් හඳුන්වා දී ඇත.
- දර්ශනපති සහ දර්ශන ආචාර්ය වැඩසටහන් ආරම්භ කරන ලදී.

පර්යේෂණ ජයග්‍රහණ

- 2022 අගෝස්තු 03 වැනි දින පීඨයේ වාර්ෂික පර්යේෂණ සැසිය සාර්ථකව නිම කරන ලදී.
- පීඨය විසින් 11 වැනි ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සමුළුව (SLERC 2022) සාර්ථකව පවත්වන ලදී.

සම්මන්ත්‍රණ/ වැඩමුළු සහ පුහුණු වැඩසටහන්

අංක	වැඩසටහන	සංවිධානය කරන ලද්දේ	වැඩසටහන් ගණන
01	වෙබ් වැඩමුළුව මාලාව	ආර්ථික විද්‍යා අංශය,	20
02	ශිෂ්‍ය සම්මන්ත්‍රණය/ වැඩමුළුව	වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය,නැ.වි.වි.	35
03	ශිෂ්‍ය සම්මන්ත්‍රණය	පීඨව්‍යාපාර සබඳතා සෛලය	01

විදේශ සහයෝගීතා

මෙම පීඨය ඉන්දියාවේ තමිල්නාඩු අන්නාමලෙයි විශ්ව විද්‍යාලය සහ ඉන්දියාවේ තමිල්නාඩු ශ්‍රී සයිරාම් ඉංජිනේරු හා කළමනාකරණ ආයතනය සමඟ සහයෝගීතාවයන් පවත්වයි .

අසාර්ථකත්වයන් සහ සාධාරණීකරණයන්

- කොවිඩ් -19 වසංගතය සහ රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් අධ්‍යයන සැසි සහ විභාග ප්‍රමාද විය.
- උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ප්‍රතිපාදනය යටතේ ප්‍රසම්පාදනයන් ප්‍රමාද වීම.

අනාගත සැලැස්මන්

- නව උපාධි පාඨමාලා

පාඨමාලා	මට්ටම	වත්මන් තත්ත්වය
ව්‍යවහාරික ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)	උපාධි අපේක්ෂක	යෝජනාව කොමිෂන් සභාව වෙත යවා ඇත
සංචාරක ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)	උපාධි අපේක්ෂක	පාලක සභාව අනුමත කර ඇත.
ගිණුම්කරණය සහ මූල්‍යපති	පශ්චාත් උපාධි	සංශෝධන සිදු වෙමින් පවතී

- නව අධ්‍යයන අංශ පිහිටුවීම

  ගිණුම්කරණ හා මුදල් අධ්‍යයන අංශය පිහිටුවීම සඳහා පීඨය විසින් යෝජනාවක් සකස් කර ඇත. එම යෝජනාව පාලක සභාවේ 318 වැනි රැස්වීමේදී අනුමත කර ඇති අතර එය කොමිෂන් සභාව වෙත යවා ඇත.

- පීඨ විගණන පුහුණු ඒකකයක් පිහිටුවීම.

- ඩිප්ලෝමා සහ කෙටි පාඨමාලා ආරම්භ කිරීම (ව්‍යාපාර පුහුණු ඩිප්ලෝමාව, ආර්ථික විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව).

3.4 සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය



පීඨාධිපති - ආචාර්ය ටී. සදානන්දන්

හැඳින්වීම

සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැඩ කිරීමට සහ/හෝ වෛද්‍ය හා හෙද විෂය ධාරාව යටතේ උසස් අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂා කරන අයට ප්‍රවේශ පථයක් සපයයි. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය මඩකලපුව පිල්ලෙයාරඩි හි පිහිටා ඇත. එය වන්තාරුමුලෙයි හි පිහිටි එහි මව් ආයතනයට කිලෝමීටර් 12 ක් පමණ දුරින් පිහිටා ඇත. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සුවිශේෂී වන්නේ එය ප්‍රජාවගේ අනාගත සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා සෞඛ්‍ය වෘත්තීන්ගේ අධ්‍යාපනයේ වර්තමාන නව්‍ය ප්‍රවණතා ඇතුළත් කර තිබීමයි.

2005 නොවැම්බර් 23 වැනි දින ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ගැසට් නිවේදනයකින් පසු ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය ආරම්භ කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ 7 වන වෛද්‍ය විද්‍යාලය වේ. අත්‍යවශ්‍ය සෞඛ්‍ය විද්‍යා විෂයයන් අධ්‍යයන අංශයන් හයකට ඒකාබද්ධ කර ඇත..

අධ්‍යයන අංශයන්

සායනික විද්‍යාව
මානව ජීව විද්‍යාව
වෛද්‍ය අධ්‍යාපනය සහ පර්යේෂණ
ව්‍යාධි කායික විද්‍යාව
ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ සේවා
පරිපූරක සෞඛ්‍ය විද්‍යාව

අධ්‍යයන පාඨමාලා

සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය මේ වන විට උපාධි පාඨමාලා දෙකක් ඉදිරිපත් කරයි.

වෛද්‍යවේදී සහ ශල්‍යවේදී- (MBBS)
හෙද විද්‍යාවේදී

වෛද්‍යවේදී උපාධිය පස් අවුරුදු උපාධි පාඨමාලාවක් වන අතර හෙද විද්‍යාවේදී උපාධිය වසර හතරක උපාධි වැඩසටහනකි. වෛද්‍ය විද්‍යාව සඳහා පළමු සිසුන් කණ්ඩායම සඳහා පාඨමලාව 2006 ජූනි මස ආරම්භ වූ අතර හෙද විද්‍යාව සඳහා සේවයට බඳවා ගන්නා ලද්දේ 2008 වර්ෂයේදීය. විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීම වැඩි කිරීමේ රජයේ ප්‍රතිපත්තියට අනුව 2020/21 අධ්‍යයන වර්ෂය සඳහා සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයට සිසුන් 161ක් ඇතුළත් කර ගැනීමට නියමිතව තිබේ.

ජයග්‍රහණ

ශාස්ත්‍රීය ජයග්‍රහණ

- අධ්‍යයන අංශ සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.

- ඵලදායී අධ්‍යයන හා පරිපාලන ක්‍රියාකාරිත්වය සඳහා පීඨය විසින් උප කමිටු සහ මධ්‍යස්ථාන කිහිපයක් පිහිටුවා ඇත: පීඨයේ උසස් උපාධි කමිටුව (FHDC), විෂයමාලා සංවර්ධන සහ ඇගයීම් කමිටුව (CDEC), පීඨ පර්යේෂණ කමිටුව (FRC), ආචාර ධර්ම සමාලෝචන කමිටුව (ERC), ක්‍රියාකාරිත්වය. සැලසුම් කමිටුව (APC), සාකල්‍ය සත්කාර මධ්‍යස්ථානය, තොරතුරු තාක්ෂණ සෛලය (පීඨ මට්ටම), පීඨ තත්ත්ව ආරක්ෂණ සෛලය (FQAC), පීඨ වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන සෛලය(FCGC) සහ පීඨ ජීඊඊ සෛලය (FGEE) ආදියට අමතරව, පීඨය අධ්‍යයන පාඨමාලවන්හි වැඩිදුර තත්ත්ව සහතික කිරීම සඳහා විශ්ව විද්‍යාලය, සනාතන සභාව සහ පාලක සභාව සමඟ සමීපව කටයුතු කරයි.

ප්‍රධාන අධ්‍යයන ජයග්‍රහණ

- වෛද්‍ය සහ හෙද වැඩසටහන සඳහා නවීන සහ අංගසම්පූර්ණ රසායනාගාරයක් ස්ථාපිත කරන ලදී.
.

- පීඨය අර්බුදකාරී කාල වකවානුවේදී අධ්‍යයන ඉගැන්වීම් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සාර්ථකව භාවිතා කළ අතර තවමත් එය මිශ්‍ර ඉගෙනුම් ක්‍රමයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

- පීඨය විසින් ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කරන ලදී: ශිෂ්‍ය උපදේශන වැඩසටහන, වැඩ ප්‍රමාණය සහ වැඩ ප්‍රමිති, විශේෂ හැකියා ඇති සිසුන්ට

මාර්ගෝපදේශන, විශය මාලා සම්බන්ධව, පීඨ සම්මානය සහ පීඨාධිපති සම්මානය.

- නිත්‍ය ප්‍රතිපෝෂණ ලබා ගැනීමට පීඨය අඛණ්ඩව කටයුතු කරයි: පාඨමාලා ඇගයීම (ප්‍රායෝගික/න්‍යාය/ක්ෂේත්‍ර සංචාරය), උපාධි අපේක්ෂක තෘප්තිමත් සමීක්ෂණය, කාර්ය මණ්ඩල තෘප්තිමත් සමීක්ෂණය, කාර්ය මණ්ඩල සම-සමාලෝචනය සහ ආදි ශිෂ්‍ය සමීක්ෂණය.

පශ්චාත් උපාධි වැඩසටහන

- අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පස් දෙනෙකු විදේශයන්හි (හොංකොං, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව) සහ ශ්‍රී ලංකාව තුළ ආචාර්ය උපාධිය සඳහා සූදානම් වේ. අධ්‍යයන කාර්ය මණ්ඩලය හතර දෙනෙක් එක්සත් රාජධානියේ සහ ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ වෛද්‍ය දර්ශනපති උපාධි අධ්‍යයන කටයුතු අනුගමනය කරති. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙක් ශ්‍රී ලංකාවේ දර්ශනපති උපාධිය අනුගමනය කරති. එක් කාර්ය මණ්ඩලයක් චීනයේ හෙද විද්‍යාපති අනුගමනය කරයි..

සම්මන්ත්‍රණ/වැඩමුළු සහ පුහුණුව

- අලුතින් බඳවා ගත් කාර්ය මණ්ඩලය කා.ම.ස.ම. විසින් සංවිධානය කරන ලද අධ්‍යයන ප්‍රේරක වැඩසටහන අනුගමනය කරයි..

- අධ්‍යයන හා අනෙකුත් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ අනෙකුත් අදාළ වැඩසටහන් සඳහා සහභාගී වේ.

විදේශ සහයෝගීතාව

ශ්‍රී සත්‍ය සායි කරුණා නිලයම් පදනම සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් 2022.09.21 දින ඉන්දියාවේ රායිපූර් හි ශ්‍රී සත්‍ය සායි මානව විශිෂ්ටතා විශ්වවිද්‍යාලයේදී අත්සන් කරන ලදී.

මෙම යෝජිත සහයෝගීතාවය මත දෙපාර්ශවයම ඒකාබද්ධව ගිවිසුම් ගත වූ අරමුණු:

1. කලාපය තුළ සමාජ සත්කාර මුලපිරීම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම..

2. පදනමේ කාර්ය මණ්ඩලය සහ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා අධ්‍යයන හා පර්යේෂණ අවස්ථා වැඩි දියුණු කිරීම.

3. මාතෘ සහ ළමා සෞඛ්‍යය, බෝ නොවන රෝග, ඒකාබද්ධ වෛද්‍ය විද්‍යාව කෙරෙහි අවධානය යොමු කරමින්, ප්‍රාදේශීය සෞඛ්‍ය දර්ශක වැඩිදියුණු කිරීම අරමුණු කරගත් මහජන සෞඛ්‍ය සහ පෝෂණ වැඩසටහන් සංවර්ධනය කිරීම.

4. මඩකලපුව කිරාන්කුලම්, ශ්‍රී සත්‍ය සායි සංජීවනී අති විශේෂ රෝහල සමඟ අදාළ විශේෂතා වල රෝග නිවාරණය, ප්‍රතිකාරය සහ අධ්‍යාපනික සත්කාර සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම.

සිසුන්ගේ ජයග්‍රහණ

- වෛද්‍ය උපාධියෙහි 10 වන කණ්ඩායම (2014/15) සහ හෙද සිසුන්ගේ 10 වන කණ්ඩායම (2016/17) සිය උපාධිය සම්පූර්ණ කරන ලදී. වෛද්‍ය සිසුන්ගේ 11 වන කණ්ඩායම උපාධිය සම්පූර්ණ කිරීම සඳහා අවසාන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ආසන්න අතර අවසාන වසර විභාගය 2023 පෙබරවාරි මාසයේදී පැවැත්වේ.

- පීඨ සිසුන් ක්‍රීඩා, නාට්‍ය සමාජ ක්‍රියාකාරකම්, ඉංග්‍රීසි දින වැඩසටහන, ප්‍රජා සත්කාරක ක්‍රියාකාරකම් සහ අනෙකුත් පීඨ ඉසව් සඳහා ක්‍රියාකාරීව සහභාගී වන ලදී.

අනාගත සැලැස්මන්

- ඖෂධවේදී උපාධිය (B.Pharm) වැඩසටහන, මහජන සෞඛ්‍ය පිළිබඳ උපාධිය (BPH) වැඩසටහන සහ හෘද වාහිනී තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ..

- ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨ අතර සහයෝගීතාව කාර්ය මණ්ඩලය/ශිෂ්‍ය පුහුණුව, පර්යේෂණ, පර්යේෂණ සැසි සංවිධානය කිරීම, සම්මාන අගයන් හුවමාරුව ආදිය මගින් වර්ධනය කිරීමට සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.

- අදාළ විදේශීය හා දේශීය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීමට සැලසුම් කිරීම.

3.5 විද්‍යා පීඨය



පීඨාධිපති – ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.විනෝබාබා

හැඳින්වීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 2 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 1986 සැප්තැම්බර් 26 දිනැති විශ්වවිද්‍යාල නියෝගයක් මගින් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය පිහිටුවන ලදී. විශ්වවිද්‍යාලයට පෙරාතුව 1986 ඔක්තෝබර් 1 වැනි දින පිහිටුවන ලදී. විශ්වවිද්‍යාලයට පෙරාතුව මඩකලපුව විශ්වවිද්‍යාල ශාස්ත්‍රාලය පිහිටුවන ලද්දේ 1981 අගෝස්තු 1 වැනිදාය. මඩකලපුව විශ්වවිද්‍යාල ශාස්ත්‍රාලය විද්‍යා පීඨය සහ කෘෂිකර්ම පීඨය ලෙස පීඨ දෙකකින් ආරම්භ විය. විද්‍යා පීඨය, මඩකලපුව විශ්වවිද්‍යාල ශාස්ත්‍රාලය ආරම්භ කළ දින සිටම ක්‍රියාත්මක වේ. විද්‍යා පීඨය අධ්‍යනාශ හයකින් සමන්විත වේ.

පීඨයේ දැක්ම, කලාපීය, ජාතික සහ ගෝලීය තත්වයන්ගේ ගතිකත්වයට ප්‍රතිචාර දක්වන තරඟකාරී වාසියක් සහිත උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා විශිෂ්ට ජාතික මධ්‍යස්ථානයක් බවට පත්වීමේ අරමුණ වන අතර මෙහෙවර ඉගැන්වීමේ හා පර්යේෂණවල විශිෂ්ටයින් සඳහා ජාතික මධ්‍යස්ථානයක් වීමයි.
අපගේ ඉගැන්වීම් සහ පර්යේෂණ කලාපීය සහ ජාතික අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඇත. මඩකලපුව දිස්ත්‍රික්කය මානව සම්පත් සහ ස්වභාවික සම්පත් වලින් පරිපූර්ණ වේ. විෂය මාලාව ලෝකයේ නවීන අවශ්‍යතාවලට ගැලපෙන අධ්‍යාපනය සහ පුහුණුව සඳහා සකස් කර ඇති අතර එමඟින් කලාපයේ සහ ජනතාවගේ සමාජ-ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කිරීම අරමුණු කරයි.මෙම ඉලක්කය වෙනුවෙන් වැඩ කිරීමට ආචාර්ය මණ්ඩලය කැපවී සිටී.

අධ්‍යයන අංශයන්

උද්භිද විද්‍යාව
රසායන විද්‍යාව
පරිගණනය
ගණිතය
භෞතික විද්‍යාව
සත්ත්ව විද්‍යාව

ඉගෙනුම වඩා ඵලදායී සහ අර්ථවත් කිරීම සඳහා උද්භිද විද්‍යා අධ්‍යයන අංශය සහ සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය සතුව දේශීයව ලබා ගත හැකි සහ ආනයනය කරන ලද හොඳ එකතුවකින් සමන්විත ශාකාගාරයක් (උද්භිද විද්‍යාව) සහ කෞතුකාගාරයක් (සත්ව විද්‍යාව) සතුව පවතී. පීඨය උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, පිරිසිදු ගණිතය, පරිගණක විද්‍යාව, භෞතික විද්‍යාව සහ සත්ව විද්‍යාව යන විෂයයන් පිරිනමයි..

අධ්‍යයන පාඨමාලාවන්

පීඨය පහත සඳහන් උපාධි පාඨමාලාවන් ඉදිරිපත් කරයි:

විද්‍යාවේදී උපාධිය (භෞතික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය)
විද්‍යාවේදී උපාධිය (ජීව විද්‍යාව පිළිබඳ සාමාන්‍ය)
උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)
රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)
ගණිතය පිළිබඳ විද්‍යාවේදී(ගෞරව)
භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී(ගෞරව)
සත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී(ගෞරව)
විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති
පරිසර විද්‍යාව පිළිබඳ විද්‍යාපති.
දර්ශනපති සහ දර්ශන ආචාර්ය උපාධි පාඨමාලා

පශ්චාත් උපාධි ඉගැන්වීම් සහ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. උසස් උපකරණ සහ සම්පත් සමඟ, පීඨය මූලික හා ව්‍යවහාරික විද්‍යාවන්හි උසස් තත්ත්වයේ පර්යේෂණ පවත්වයි. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් රටේ සංවර්ධනයට දායක වෙමින් කීර්තිමත් සම්මාන සහ දර්ශක ප්‍රකාශන රාශියක් ලබාගෙන ඇත.

ජයග්‍රහණ

මානව සම්පත් සංවර්ධනය

2022 වර්ෂය තුළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, තහවුරු නොකළ කථිකාචාර්යවරුන් සහ පරිවාස කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට පීඨයට හැකි විය. සමහර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් මහාචාර්ය ලෙසද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණියට සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් කරන ලදී. ශාස්ත්‍රීය සාමාජිකයින් කිහිප දෙනෙකු ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු විදේශීය විශ්ව විද්‍යාලවල සම්පූර්ණ කරමින් සිටිති. මේ අතර, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකුටද තනතුරු කිහිපයකම උසස්වීම් ලැබිණි. එමෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලය වැඩමුළු කිහිපයක් මගින් පුහුණු කරන ලදී..

සම්මාන සහ පර්යේෂණ ප්‍රකාශන

2022 වර්ෂය තුළ, පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සුවිගත සඟරාවල සහ සුවිගත නොකළ සඟරාවල පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත් කරන ලදී.

සම්මන්ත්‍රණ සහ ප්‍රවේශ වැඩසටහන්

පීඨය විසින් 2022 වසරේ "පීඨ දිනය" සාර්ථකව සංවිධානය කරන ලදී. පීඨ දිනය සැමරීම සඳහා මඩකලපුවේ සහ ත්‍රිකුණාමලයේ සියලුම අ.පෙ.ස (උසස් පෙළ) සිසුන්ට ආරාධනා කර ප්‍රායෝගික පුහුණුවීම් ප්‍රමාණවත් තරම් ලබා දෙන ලදී. තවද, විද්‍යා පාසල් සිසුන් සඳහා පීඨය විසින් ප්‍රශ්නාවලි සහ රචනා තරඟ පවත්වන ලදී.

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකු අධ්‍යක්ෂවරුන්, සභාපතිවරුන් සහ කණ්ඩායම් නායකයින් ලෙස තම සේවාවන් දිවයිනේ අනෙකුත් මධ්‍යස්ථාන, ජාතික ආයතන වෙත අඛණ්ඩව ලබා දුන් අතර තවත් කිහිප දෙනෙකු ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති සඳහා සම්බන්ධ වූහ.

යටිතල පහසුකම් සංවර්ධනය

පීඨය උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ප්‍රතිපාදන ව්‍යාපෘතිය හරහා ඉංග්‍රීසි ඉගෙනුම් විද්‍යාගාරය, ස්මාර්ට් දේශන ශාලාව, පරිගණක මධ්‍යස්ථානය සහ පරිගණක විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය කර ප්‍රතිනිර්මාණය කරන ලදී..

වෙනත් සංවර්ධනයන්

විද්‍යා පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහනේ ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යයන වැඩසටහන් සමාලෝචනය සඳහා විද්‍යා පීඨය සූදානම් වන ලදී.

තවද විද්‍යා පීඨයේ සිසුන්ගේ භාෂා ප්‍රවීණතාවය, මෘදු කුසලතා සහ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් සහ පාඨමාලා කිහිපයක් ද පවත්වන ලදී එමෙන්ම, විද්‍යුත් ඉගෙනුම්, ගූගල් පන්තිකාමර, ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS), Google Office යනාදිය සඳහා පීඨය වැඩි අවස්ථා නිර්මාණය කරන ලදී.

සේවා සැපයීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා විභාග ප්‍රතිඵල ඇතුළු සියලුම සිසුන්ගේ කටයුතු පවත්වාගෙන යාමට කළමනාකරණ තොරතුරු පද්ධතිය හඳුන්වා දී ක්‍රියාවට නවන ලදී.

අසාර්ථකත්වයන් සහ සාධාරණීකරණයන්

පීඨ පරිපාලනය විසින් අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ අඩුපාඩු හඳුනාගෙන පීඨයේ රසායනාගාර සහ පොදු කාමරය ප්‍රතිසංස්කරණය කරන ලදී. භෞතික විද්‍යා හා උද්භිද විද්‍යා අධ්‍යයනාංශ සඳහා නව ගොඩනැගිලි වැඩි දියුණු කිරීමට සහ ස්ථාපිත කිරීමට යෝජනා ඉදිරිපත් කරන ලදී. පීඨයේ පැරණි ගොඩනැගිලි (මාණ්ඩලික කාමර, විද්‍යාගාර සහ දේශන ශාලා) ප්‍රතිසංස්කරණය කිරීම මූල්‍යමය සීමාවන් හේතුවෙන් සාක්ෂාත් කරගත නොහැකි විය.

අනාගත සංවර්ධනයන්

විද්‍යා පීඨය පහත සඳහන් නව අධ්‍යයන පාඨමාලාවන් සහ අධ්‍යයනාංශ ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.

- පරිගණක විද්‍යා අධ්‍යයනාංශය පිහිටුවීම
- පරිගණක පද්ධති විද්‍යාවේදී උපාධිය (BCSS)
- තොරතුරු හා සන්නිවේදන පද්ධති පිළිබඳ උපාධිය (BICS)
- පරිසර විද්‍යාව පිළිබඳ විද්‍යාපති
- විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති
- රසායනාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව සහ උසස් ඩිප්ලෝමාව
- ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී.

3.6 තාක්ෂණික පීඨය



පීඨාධිපති - ආචාර්ය ටී. මදිවේන්දන්

හැඳින්වීම

තාක්ෂණ පීඨය කර්මාන්තයේ වැඩ කිරීමට සහ/හෝ තාක්ෂණ විෂය ධාරාව යටතේ උසස් අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂා කරන අයට ප්‍රවේශ පථයක් සපයයි. සාම්ප්‍රදායික දැනුම් පද්ධතිවල සීමාවෙන් ඔබ්බට ගොස් රටේ තාක්ෂණික අවශ්‍යතාවලට වඩාත් ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් ගොඩනඟමින් තාක්ෂණ පීඨය විශ්වවිද්‍යාලයේ මෙහෙවර ඉටු කළ යුතුය.

තාක්ෂණ පීඨය (FOT) යනු ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ලාබාලතම පීඨය වන අතර එය 2017 වසරේ ස්ථාපනය කරන ලදී. මෙය මුලින් ආරම්භ කරන ලද්දේ 2014 වසරේදීය. පීඨය මේ වන විට අධ්‍යයන අංශ දෙකකින් සමන්විත වේ.

අධ්‍යයන අංශ

ජෛව පද්ධති තාක්ෂණ අංශය
බහුවිධ අධ්‍යයන අංශය

අධ්‍යයන පාඨමාලා

පීඨය දැනට වසර හතරක උපාධි පාඨමාලාවක් වන කෘෂිකාර්මික තාක්ෂණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණ ගෞරව උපාධි (BBST) පාඨමාලාව පිරිනමයි. වත්මන වන විට 2016/17, 2017/18, 2018/19, 2019/20 සහ 2020/21 කණ්ඩායම වලින් ජෛව පද්ධති තාක්ෂණ පාඨමාලාව සඳහා සිසුන් 400 කට වැඩි පිරිසක් බඳවාගෙන ඇත.. 2021/2022 කණ්ඩායමේ සිසුන් 2023 අප්‍රේල් මාසයේදී බඳවා ගැනීමට පීඨය සැලසුම් කරයි. විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීම වැඩි කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව 2020/21 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 123ක් ඇතුළත් කර ගැනීමට තාක්ෂණ පීඨය එකඟ වී ඇත.

ජයග්‍රහණ

ශාස්ත්‍රීය ජයග්‍රහණ

- ජෛව පද්ධති තාක්ෂණය සහ බහුවිධ අධ්‍යයන අධ්‍යනාංශ සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගන්නා ලදී.
- ඵලදායී අධ්‍යයන හා පරිපාලන ක්‍රියාකාරිත්වය සඳහා පීඨය විසින් උප කමිටු කිහිපයක් පිහිටුවා ඇත: පීඨ GEE සෛලය, පීඨ ව්‍යාපාර සම්බන්ධක සෛලය, විෂයමාලා සංවර්ධන කමිටුව, පීඨ වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන සෛලය, පීඨ පර්යේෂණ කමිටුව, පීඨ තත්ත්ව ආරක්ෂණ කිරීමේ සෛලය යනාදිය සහ ඊට අමතරව, පීඨය අධ්‍යයන පාඨමාලාවන්හි වැඩිදුර තත්ත්ව සහතික කිරීම සඳහා විශ්ව විද්‍යාලය, සනාතන සභාව සහ පාලක සභාව සමඟ සමීපව කටයුතු කරයි.

  ප්‍රධාන අධ්‍යයන ජයග්‍රහණ:
- කෘෂිකාර්මික තාක්ෂණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණ පාඨමාලාව සඳහා නවීන සහ අංගසම්පූර්ණ රසායනාගාරයක් ස්ථාපිත කරන ලදී.
- පීඨය අර්බුදකාරී කාල වකවානුවේදී අධ්‍යයන ඉගැන්වීම් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සාර්ථකව භාවිතා කළ අතර තවමත් එය මිශ්‍ර ඉගෙනුම් ක්‍රමයක් ලෙස පවත්වාගෙන යනු ලබයි.
- පීඨය විසින් යෝජනා කළ නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය (DICT) තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් නිර්දේශ කරන ලදී. ඒ අතරම, නව උපාධි වැඩසටහනක් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගෞරව උපාධිය , බහුමාධ්‍ය නිර්මාණ ශිල්පීය ක්‍රම සහ මෘදුකාංග සංවර්ධන ක්‍රම යන විශේෂතා දෙකකින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර එයද තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් නිර්දේශ කරන ලදී.
- පීඨය විසින් පාඨමාලා විශේෂීකරණයන් හතරක් හඳුන්වාදීමත් සමඟ ජෛව පද්ධති තාක්ෂණ පාඨමාලාව සඳහා විෂය මාලාව සංශෝධනය කරමින් පවතී.
- පීඨය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ: ශිෂ්‍ය උපදේශන වැඩසටහන, වැඩ ප්‍රමාණය සහ වැඩ ප්‍රමිතීන්, විශේෂ හැකියා ඇති සිසුන් සඳහා මාර්ගෝපදේශන, විෂයමාලා සංවර්ධනය සහ පීඨ සම්මානය සහ පීඨාධිපති සම්මානය.
- නිත්‍ය ප්‍රතිපෝෂණ ලබා ගැනීම සඳහා අඛණ්ඩව සම්බන්ධ වන පීඨය: පාඨමාලා ඇගයීම (ප්‍රායෝගික/න්‍යාය/ක්ෂේත්‍ර සංචාරය), උපාධි අපේක්ෂක තෘප්තිමත් සමීක්ෂණය, කාර්ය මණ්ඩල තෘප්තිමත් සමීක්ෂණය, කාර්ය මණ්ඩල සම-සමාලෝචනය සහ ආදී ශිෂ්‍ය සමීක්ෂණය.
- පීඨය විසින් උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ප්‍රතිපාදනය අදියර-I (මිලියන 60) හි 100%

උපකරණ ප්‍රසම්පාදනයට භාවිතා කළ අතර II අදියරේදී (මිලියන 40) 87% ක් භාවිතා කරන ලදී.

පශ්චාත් උපාධි වැඩසටහන

- අධ්‍යයන කාර්ය මණ්ඩලය හතර දෙනෙක් විදේශයන්හි ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු අනුගමනය කරති: ඕස්ට්‍රේලියාවේ, නවසීලන්තයේ, උස්බෙකිස්ථානයේ ආචාර්ය උපාධි 3ක් සහ කැනඩාවේ එක් විද්‍යාපති උපාධියක්.
- කාර්ය මණ්ඩලයේ එක් සාමාජිකයෙක් ආචාර්ය උපාධිය ලබා ගන්නා ලදී - නෝර්වේ.

සම්මන්ත්‍රණ/වැඩමුළු සහ පුහුණුව

- පීඨය විසින් 2022 ඔක්තෝබර් 6 වන දින තිරසාර සංවර්ධනය සඳහා තාක්ෂණික පරිවර්තනය යන තේමාව යටතේ 1 වන වාර්ෂික පර්යේෂණ සැසිය සංවිධානය කරන ලදී.
- අලුතින් බඳවා ගත් කාර්ය මණ්ඩලය කායී මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද අධ්‍යයන ප්‍රේරක වැඩසටහන අනුගමනය කරති.
- කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ තවත් අදාළ වැඩසටහන් වලට සහභාගී වූහ.

විදේශ සහයෝගීතාව

තාක්ෂණ පීඨය චීනයේ යුනාන් ප්‍රාන්තයේ ජීව විද්‍යාත්මක සම්පත් ආරක්ෂණ හා උපයෝගිතා මධ්‍යස්ථානය, ජීව විද්‍යා සම්පත් හා ආහාර ඉංජිනේරු විද්‍යාලය, නෝමල් විශ්ව විද්‍යාලය සමඟ, කාර්ය මණ්ඩල/ශිෂ්‍ය හුවමාරුව, පර්යේෂණ සහ සංවර්ධන සහ පුහුණුව සඳහා විදේශීය සහයෝගීතාවයක් ඇති කර ගන්නා ලදී.

ශිෂ්‍ය ප්‍රවේශය

- පළමු ශිෂ්‍ය කණ්ඩායමට (2015/2016) කෘෂිකාර්මික තාක්ෂණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණ ගෞරව උපාධිය ප්‍රදානය කරන ලදී - වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය- 2022.
- දෙවන කණ්ඩායම උපාධිය සම්පූර්ණ කිරීම සඳහා අවසාන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ආසන්නය
- සිසුන් විසින් පළමු වරට වාර්ෂිකව "ටෙක්නෝ ඊස්ට්"(Techno East) යන නමින් සඟරාවක් ප්‍රකාශයට පත් කරන ලදී. එය වාර්ෂික ප්‍රකාශනයකි.
- සිසුන් ක්‍රීඩා, ඉංග්‍රීසි දින වැඩසටහන, ප්‍රජා සත්කාරක ක්‍රියාකාරකම් සහ අනෙකුත් පීඨ ඉසව් සඳහා ක්‍රියාකාරීව සහභාගී වෙති.

අභාර්ථකත්වයන් සහ සාධාරණීකරණයන්

- කොවිඩ් වසංගතය, මූල්‍ය අර්බුදය හේතුවෙන් විශ්වවිද්‍යාලය වරින් වර වසා දැමීම හේතුවෙන් නියමිත පරිදි අධ්‍යයන වැඩසටහන සම්පූර්ණ කිරීමට නොහැකි විය.
- අරමුදල් හිඟකම සහ මූල්‍ය සීමා කිරීම් හේතුවෙන් යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය.
- දිගුකාලීන ප්‍රසම්පාදන ක්‍රියාවලිය, රසායනික ද්‍රව්‍ය සහ උපකරණ නොමැතිකම, ශ්‍රී ලංකාවේ ආනයන සීමා කිරීම් සහ අනෙකුත් අදාළ ගැටළු හේතුවෙන් බලාපොරොත්තු වූ දිනට අනුව උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘති ප්‍රදානය යටතේ උපකරණ මිලදී ගැනීම සම්පූර්ණ කිරීමට නොහැකි විය.

අනාගත සැලැස්මන්

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව ආරම්භ කිරීමට සැලසුම් කිරීම.
- ඉංජිනේරු තාක්ෂණ අධ්‍යනාංශය ලෙස තවත් එක් අධ්‍යනාංශයක් පිහිටුවීමට පීඨය කටයුතු කරමින් සිටී.
- ජාතික ජෛව තාක්ෂණ කර්මාන්ත සංගමය (NBIA) අවශ්‍යතා අනුව ජෛව පද්ධති තාක්ෂණ පාඨමාලාවට ප්‍රතිඵලය ලබා ගැනීම.
- පීඨ සඟරාව ලෙස තාක්ෂණ විද්‍යා සඟරාව (JTS) ප්‍රකාශයට පත් කිරීම)
- ජෛව පද්ධති තාක්ෂණ පාඨමාලාව සඳහා තවත් රසායනාගාරයක් සැපයීමට සැලසුම් කිරීම.
- 2023 අගෝස්තු/සැප්තැම්බරයේ ජාත්‍යන්තර සමුළුවක් සංවිධානය කිරීමට සැලසුම් කිරීම.
- ශ්‍රී ලංකාවේ තාකෂණ පීඨ අතර සහයෝගීතාව කාර්ය මණ්ඩලය/ශිෂ්‍ය පුහුණුව, පර්යේෂණ, පර්යේෂණ සැසි සංවිධානය කිරීම, සම්මාන අගයන් හුවමාරුව ආදිය මගින් වර්ධනය කිරීමට සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- ජෛව පද්ධති තාක්ෂණ පාඨමාලාව සඳහා පාඨමාලා සමාලෝචනය සඳහා සූදානම් වීම.
- තොරතුරු තාක්ෂණ සහ ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශ සඳහා අවශ්‍ය උපකරණ සහ රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීමට සහ අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපිත කිරීම සඳහා මූල්‍ය ආධාර ලබා ගැනීම.
- අදාළ විදේශීය හා දේශීය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීමට සැලසුම් කිරීම.

3.7 ව්‍යවහාරික විද්‍යා පීඨය, ත්‍රිකුණාමලය මණ්ඩපය



පීඨාධිපති - එස්. තඩ්වනමූර්ති මහතා

හැඳින්වීම

ත්‍රිකුණාමලය මණ්ඩපයේ ව්‍යවහාරික විද්‍යා පීඨය පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව සහ භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව සහ සිද්ධ වෛද්‍ය අංශය යන දෙපාර්තමේන්තු දෙකකින් සමන්විත වන අතර එය සිදුහත් වෛද්‍ය පීඨයක් බවට පත්වන තුරු තාවකාලිකව අනුයුක්ත කර ඇත.

ව්‍යවහාරික විද්‍යා පීඨය (FAS) 2001 වසරේ රජයේ ගැසට් නිවේදනයෙන් හඳුන්වා දී ඇත. ව්‍යවහාරික විද්‍යා පීඨය යනු ත්‍රිකුණාමල මණ්ඩපයේ ඉතා තරුණ පීඨයකි.

අධ්‍යයන අංශයන්

පරිගණක විද්‍යාව
භෞතික විද්‍යාව
සිද්ධ වෛද්‍ය ඒකකය

අධ්‍යයන පාඨමාලාවන්

පරිගණක විද්‍යාවේදී
ව්‍යවහාරික භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රොනික් පිළිබඳ විද්‍යාවේදී
සිද්ධ වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී

වසර තුනක අධ්‍යයන කාලයට අමතරව, පරිගණක විද්‍යාවේදී උපාධි පාඨමාලාවට මාස හයක කාලයක් සඳහා තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ අනිවාර්ය සීමාවාසික පුහුණුවක් ඇත. ක්ෂේත්‍රවල නව දැනුමට ඉඩ සැලසීම සඳහා සෑම වසර තුනකට හෝ හතරකට වරක් ප්‍රථම උපාධියේ පවතින විෂය මාලාව කාලානුරූපව සංශෝධනය කෙරේ.

සිද්ධ වෛද්‍ය ඒකකය විසින් වසර පහක අධ්‍යයන කාලයක් සඳහාත් වසරක සීමාවාසික පුහුණුවක් සඳහාත් දේශීය රෝහල්වල උපාධි වැඩසටහන පවත්වයි.

2008 ඔක්තෝම්බර් මාසයේදී සිසුන් 10 දෙනෙකුගෙන් යුත් ප්‍රථම කණ්ඩායම (2007/2008) පීඨයට ලැබී ඇත.

මුලදී සිටියේ පරිවාස කථිකාචාර්යවරුන් දෙදෙනකු සහ පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශකවරුන් දෙදෙනකු පමණි. යටිතල පහසුකම් සහ මානව සම්පත් නිහකම හේතුවෙන් කොමිෂන් සභාව විසින් 2013/2014 අධ්‍යයනවර්ෂයට අයත් ඊළඟ කණ්ඩායම 20 ක ප්‍රමාණයකින් දෙපාර්තමේන්තු දෙකටම යවා ඇත. 2014 මාර්තු මාසයේ සිසුන්. පසුගිය වසර පහේ සිට, වසරකට සිසුන් 150 ක් පමණ (2016/2017 සිට) බඳවා ගැනීමේ හදිසි වැඩිවීමක් සිදුවී ඇත.

පසුගිය වසර 10 ක කාලය තුළ ව්‍යවහාරික විද්‍යා පීඨය මහල් 4 කින් සමන්විත නව ගොඩනැගිලි සංකීර්ණයක් සහ නිලාවේලි වෙරළ තීරයේ පිහිටි පරෙවි දූපත මනාව පෙනෙන පරිදි ගොඩනැගිල්ලේ මුදුනේ ස්මාර්ට් දේශන ශාලාවක් සහිතව සංවර්ධනය කර ඇත. පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව පළමු මහලේ ක්‍රියාත්මක වන අතර දෙවන මහල භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගනු ලබයි. තුන්වන මහල සිද්ධ වෛද්‍ය ඒකකයට ලබාදී ඇත.

අධ්‍යයන අංශයන් දෙකම කණ්ඩායම් වශයෙන් සිසුන්ට නවාතැන් ගැනීමට විද්‍යාගාර සංවර්ධනය කර ඇත. රටේ ආර්ථික තත්ත්වය පහත වැටී ඇති බැවින් බොහෝ රසායනාගාර උපකරණ සහ පරිගණක මිලදී ගෙන නොමැත.

බඳවා ගන්නා ලද බොහෝ ආචාර්යවරුන් තම උසස් උපාධි (දර්ශනපති සහ දර්ශන ආචාර්ය වැඩසටහන්) සම්පූර්ණ කිරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා ඇත. එබැවින්, පීඨය තුළ ප්‍රමාණවත් තරම් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් නොමැත. මෙම කාල සීමාව තුළ අපගේ උපාධි පාඨමාලා වැඩසටහන් සමාලෝචනයක් සඳහා යමින් තිබුණි. ඉගැන්වීම් සහ රැකියා අවස්ථා තෘප්තිමත් වුවද විවිධ හේතු නිසා අධ්‍යයන අංශයන් ද්විත්වයෙහිම පාඨමාලා සඳහා සතුටුදායක ශ්‍රේණි ලබා දී නොමැත. පීඨයට ඊළඟ චක්‍රය තුළ, ගුණාත්මක අංශවල සියලුම අවශ්‍යතා සපුරාලීමට හැකි වනු ඇත.

ජයග්‍රහණ

මානව සම්පත් සංවර්ධනය

පසුගිය වසර පහක කාලය තුළ පීඨය අධ්‍යයන අංශයන් දෙකටම තරුණ කථිකාචාර්යවරුන් බඳවාගෙන ඇත. එක් කථිකාචාර්යවරයෙක් සිය ආචාර්ය උපාධි කෘති සම්පූර්ණ කර නිබන්ධනය ලියා ඇති අතර අනෙක් කථිකාචාර්යවරිය එක්සත් රාජධානියේ ග්ලාස්ගෝ විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය සඳහා සූදානම් වෙමින් සිටී.

එක් කථිකාචාර්යවරයෙක් අයර්ලන්තයේ ඩබ්ලින් විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය සඳහා සූදානම් වෙමින් සිටී.

වත්මන අධ්‍යයන අංශ දෙකටම එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් බැගින් සිටී. කෙසේ වෙතත්, සිද්ධ වෛද්‍ය ඒකකයට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් 8 දෙනෙකු සපයනු ලබන අතර තවත් ආචාර්යවරුන් දෙදෙනෙකු සිය උසස් උපාධි අධ්‍යයන කටයුතු සඳහා අධ්‍යයන නිවාඩු ලබා ගෙන ඇත.

පර්යේෂණ ප්‍රකාශන

2022 දී, පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් පර්යේෂණ පත්‍රිකා 10 කට වැඩි ප්‍රමාණයක්, සහරා 10 ක් සහ සාරාංශ 05 ක් ප්‍රකාශයට පත් කළහ.

සමුළු, සම්මන්ත්‍රණ, වැඩමුළු, ක්‍රීඩා සහ ප්‍රවේශ වැඩසටහන

- UICL යටතේ, පාසල් ලීවරයන් සහ උසස් පෙළ සිසුන් සඳහා කාර්ය මණ්ඩලය විසින් වැඩමුළු දෙකක් සංවිධානය කර ඇත.

- එක් අවසන් වසරේ සිසුවෙක් "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ජාතික පැසිපන්දු කණ්ඩායම-2022" සඳහා සහභාගී විය. තවත් අවසන් වසරේ සිසුවෙක් IEEE නවෝත්පාදන ජාතිය ශ්‍රී ලංකාව, නැගෙනහිර පළාත් තරගයේ අවසන් වටයට තේරී ඇත.

- තවද, පරිගණක විද්‍යා සිසුන් බොහෝ දෙනෙක්, “අන්තර් විශ්වවිද්‍යාල ශූරතාව”, “අන්තර් පීඨ නවකයන්ගේ හමුව”, “CyberZec 22”, “ICTA ආලෝක ඩිජිටල් තරුණ ඇරඹුම් කඳවුර”, “අන්තර් විශ්වවිද්‍යාල කේතීකරණ තරගය” සඳහා සහභාගී වී ත්‍යාග දිනා ගත්හ. අන්තර් විශ්ව විද්‍යාල ක්‍රීඩා සංවර්ධන හැකටන්", "බිට්කෝඩ් V3.0", Pixel Eye v3.0", සහ "AthenaHack hackathone".

- සිද්ධ වෛද්‍ය ඒකකය 2022 දී “පියයුරු පිළිකා දියවැඩියා සායනික උපදේශනය මහජනතාවට” යන මාතෘකාව යටතේ වැඩමුළුවක් පවත්වන ලදී.

- අවසාන වසරේ සිසුන්ගේ අභිවෘද්ධිය සඳහා පීඨයේ වාහක මාර්ගෝපදේශක උපදේශක විසින් සංවිධානය කරන ලද වාහක මාර්ගෝපදේශ සම්මන්ත්‍රණ සහ වැඩමුළු රාශියක් ඇත.

යටිතල පහසුකම් සංවර්ධනය

- 2021/2022 දී පරිගණක 100 කින් සමන්විත පරිගණක රසායනාගාරයක් සංවර්ධනය කර ඇත.

- සිද්ධ වෛද්‍ය ඒකකය විසින් ඉදිරිපත් කරන ලද පීඨ යෝජනාවක් ප්‍රධාන වශයෙන් කොමිසම විසින් අනුමත කර ඇත.

අභාර්ථකත්වයන් සහ සාධාරණීකරණයන්

රටේ තත්වය හේතුවෙන් එනම්: කොවිඩ් වල බලපෑම, ආර්ථික අර්බුද, ඉන්ධන අර්බුදය සහ අනෙකුත් ගැටළු දැනට පවතින අධ්‍යයන වැඩසටහන් වලට දැඩි ලෙස බලපෑවේය. උසස් තාක්ෂණ භාවිතය හේතුවෙන් සිසුන්ට විශාලන වේදිකාව හරහා ඉගැන්වූ අතර න්‍යාය-නැඹුරු විෂයයන් සඳහා විශාලන සහ LMS වේදිකා හරහා විභාග ද පවත්වන ලදී. නමුත් නේවාසිකාගාර තුළ නවාතැන් සැපයීමෙන් පසු ප්‍රායෝගික සහ සායනික නැඹුරු සැසි සලකා බලන ලදී.

අනාගත සැලැස්ම

- සිද්ධ වෛද්‍ය ඒකකය CCIM (ඉන්දියාව) සමඟ සහයෝගයෙන් ඔවුන්ගේ සිද්ධ වෛද්‍යවේදී විෂය මාලාව සඳහා ප්‍රතීතනය ලබා ගැනීමට අදහස් කර ඇත, නිලාවෙලි, කොනේසපුරි, සිද්ධ වෛද්‍ය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකයක් සඳහා වාරණ ප්‍රදානය සහ සිද්ධ වෛද්‍ය පීඨය සඳහා කැබිනට් අනුමැතිය.

- පීඨය 2021/2022 සිට පරිගණක විද්‍යා අධ්‍යයන අංශය සහ භෞතික විද්‍යා අධ්‍යයන අංශය ගෞරව උපාධි වැඩසටහන් හඳුන්වා දීමට අදහස් කරයි.

- පීඨයට පුරප්පාඩු වූ සියලුම සේවක තනතුරු වහාම බඳවා ගැනීමට අවශ්‍ය විය. පවතින ආර්ථික අර්බුද හේතුවෙන් දැනට එය කරගෙන යාමට නොහැකි වී තිබේ.

- අංග සම්පූර්ණ භෞතික විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාගාර පිහිටුවීමට ද අපේක්ෂා කෙරේ.

- දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට ද අදහසක් පවතී.

3.8 සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය, ත්‍රිකුණාමලය මණ්ඩපය



පීඨාධිපති - ටී. බාස්කර් මහතා

හැඳින්වීම

සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය 2001 දී ත්‍රිකුණාමල මණ්ඩපයේ ආරම්භ කරන ලද අතර එය 1993 දී දෙපාර්තමේන්තු දෙකක් ඇති අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යාලයක් ලෙස ආරම්භ කරන ලදී.

අධ්‍යයන අංශයන්

ව්‍යාපාර සහ කළමනාකරණ අධ්‍යයන අංශය
භාෂා සහ සන්නිවේදන අධ්‍යයන අංශය
තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය

ව්‍යාපාර සහ කළමනාකරණ අධ්‍යයන අංශය:

ව්‍යාපාර සහ කළමනාකරණ අධ්‍යයන අංශය සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨයේ වඩාත් ගතික සහ නව්‍ය දෙපාර්තමේන්තු වලින් එකකි. ව්‍යාපාර සහ කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව සාමාන්‍ය උපාධි වැඩසටහනක් ඇතුළු වැඩසටහන් හයක් ලබා දෙන බැවින් අවශ්‍ය කළමනාකාරිත්වය, අලෙවිකරණය, මානව සම්පත්, ගිණුම්කරණය සහ මූල්‍ය සහ තොරතුරු කළමනාකරණ කුසලතා ඇති උපාධිධාරීන් බිහි කරයි. සහ ගෞරව උපාධි වැඩසටහන් පහක්, එනම් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව, අලෙවි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී ගෞරව, සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව.

ව්‍යාපාර සහ කළමනාකරණ අධ්‍යයන අංශය සිසුන්ගේ සහ සේවා යෝජකයන්ගේ අපේක්ෂාවන්ට වඩා ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ව සතුටු කිරීමට පැහැදී බලා සිටී. මෙම සමකාලීන ව්‍යාපාරික ලෝකයේ වාෂ්පශීලී, අවිනිශ්චිත, සංකීර්ණ සහ අපැහැදිලි ස්වභාවයක් ඇති ඕනෑම ප්‍රශ්නයක් හසුරුවා ගත හැකි ඔවුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රවල අංගසම්පූර්ණ වෘත්තිකයන් බිහි කිරීමට එයට හැකි වනු ඇතැයි විශ්වාස කරමින් ව්‍යාපාර සහ කළමනාකරණ අධ්‍යයන අංශය යනු සිසුන් 900ක් පමණ සහ ස්ථිර ගුරු පීඨ සාමාජිකයින් දහනව දෙනෙකුගෙන් යුත් වසර 20ක් පැරණි අධ්‍යයන අංශයකි. නිරන්තරයෙන් වෙනස් වන ව්‍යාපාරික ලෝකය සඳහා උපාධි අපේක්ෂකයින් වඩාත් හොඳින් සූදානම් කිරීම සඳහා, විවිධ අඛණ්ඩ ඇගයීම් සහ ව්‍යාපෘති සහ අධ්‍යනාංශ දීමනා හරහා සිසුන්ට රැකියා ස්ථානයේ සාර්ථක වීමට අවශ්‍ය අධ්‍යයන පසුබිම සහ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා පාඨමාලා ද්‍රව්‍ය නිතිපතා සංශෝධනය කර යාවත්කාලීන කරනු ලැබේ:

අධ්‍යයන වැඩසටහන්

කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය)

ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)

මානව සම්පත් කළමනාකරණ පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)

තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)

අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)

කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)

අධ්‍යයන මූල පිරිම්:

- ව්‍යාපාර කළමනාකරණ පීඨය ලෙස දැනට පවතින පීඨය ද්විඛණ්ඩනය කිරීමේ යෝජනාව වි.වි.ප්‍ර.කොෂ. වෙත ඉදිරිපත් කෙරේ.
- නව පීඨය යටතේ යෝජිත නව අධ්‍යයන අංශ ස්ථාපනය කිරීමේ යෝජනා:

✓ ගිණුම්කරණ සහ මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය - ඉදිරිපත් කර ඇත .
✓ අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය.
✓ මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය
✓ ව්‍යාපාර කළමනාකරණ සහ තොරතුරු පද්ධති අධ්‍යයන අංශය- ඉදිරිපත් කර ඇත.
✓ සංචාරක හා විවේක කළමනාකරණ අධ්‍යයන අංශය.

- සංචාරක හා විවේක කළමනාකරණ පිළිබඳ විද්‍යාවේදී පාඨමාලාවට සංශෝධිත විෂය මාලාව සකස් කර ඇත.

- කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී(බාහිර උපාධි) පාඨමාලාවට සංශෝධිත විෂය මාලාව සකස් කර ඇත.

භාෂා සහ සන්නිවේදන අධ්‍යයන අංශය

භාෂා සහ සන්නිවේදන අධ්‍යයන අංශය විසින් 520 කට ආසන්න උපාධි අපේක්ෂකයින් සඳහා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය 13 දෙනෙකුගෙන් යුත් අධ්‍යයන සේවක සංඛ්‍යාව 12 ක් සමඟින් උපාධි පාඨමාලා දෙකක වැඩසටහන් පවත්වනු ලබන අතර එය පහත වැඩසටහන් ඉදිරිපත් කරයි:

<u>අධ්‍යයන වැඩසටහන්</u>

භාෂා පිළිබඳ ශාස්ත්‍රපති (ගෞරව)

භාෂා පිළිබඳ ශාස්ත්‍රපති (සාමාන්‍ය)

සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති (ගෞරව)

සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති (සාමාන්‍ය)

ජයග්‍රහණ

ශාස්ත්‍රීය ජයග්‍රහණ

- ආචාර්ය ජී.ඒ.පී.කේ ගනේගොඩ මහත්මිය වෙත ආචාර්ය උපාධිය පිරිනමන ලදී.
- සුමිත් ධනංජය මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ එම්.ඒ.උපාධිය සම්පූර්ණ කරන ලදී.
- ආචාර්ය එන්. එස්. ජයසුන්දර විසින් ටයිම්ස් කාන්තා ඇසුරේ කාන්තා අයිකනය විසින් 2022 වසරේ විශිෂ්ට ශාස්ත්‍රාලිකයා ලෙස සම්මාන ලැබීය.
- කාන්තා අයිකනය - 2022 මඟින් ඩී.එන් ජයරත්න මෙනෙවිය විසින් තරුණ ජීවිත කාල සාමාර්ථ සම්මානය දිනාගන්නා ලදි.

පර්යේෂණ ජයග්‍රහණ

- ආචාර්ය එන්.එස්. ජයසුන්දර ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන සරල වාක්‍යවල වාක්‍ය අනුපිළිවෙල - පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම (පොත් පරිච්ඡේදය).
- ආචාර්ය ජේ.එස් රොහාන් සවරිමුත්තු: Rene Girard සඟරා ප්‍රකාශනය හරහා සාහිත්‍ය කියවීම සඳහා අන්තර් අංශ වලංගු කිරීම.

සම්මන්ත්‍රණ / වැඩමුළු සහ පුහුණු වැඩසටහන්

- කේ.ජී.එල්.ඒ.එන්.එස් ජයවර්ධන මෙනවිය විසින් "ශාස්ත්‍රීය ලේඛන" (ඉහත ව්‍යාපෘතිය යටතේ) පිළිබඳ වෙබ් වැඩමුළුවක් පවත්වන ලදී. ත්‍රිකුණාමලය මණ්ඩපයේ භාෂා හා සන්නිවේදන අධ්‍යයන අංශයේ 3 වන වසරේ සහ 4 වන වසර සිසුන් සඳහා මෙම වැඩමුළුව 2022 ජූලි 14 වන දින පවත්වන ලදී. සහ "LSRW" ක්‍රියාකාරකම් පිළිබඳ වෙබ් වැඩමුළුවක් (උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ). ත්‍රිකුණාමලය මණ්ඩපයේ භාෂා හා සන්නිවේදන අධ්‍යයන අංශයේ පළමු වසරේ (2020/2021 අධ්‍යයන වර්ෂය) සිසුන් සඳහා මෙම වැඩමුළුව 2022 ඔක්තෝම්බර් මාසයේදී පැවැත්විණි

- ආචාර්ය ජී.ඒ.පී.කේ. ගනේගොඩ 2022 ජූලි 11 වන දින උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරන ලද 'පර්යේෂණ ක්‍රමවේදය' පිළිබඳ වැඩමුළුවේ සම්පත් දායකයෙකු ලෙස කටයුතු කරන ලද අතර, 2022 ජූලි 20 වැනි දින ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදීන්ගේ සංසදය සමඟ එක්ව පැවති මාධ්‍ය සාක්ෂරතා සමුළුවේදී මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරන ලදී.

විදේශ සහයෝගිතා

කොළඹ පිහිටි ස්වාමී විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ අධ්‍යාපන පිළිබඳ ප්‍රථම ලේකම්වරයා මණ්ඩපය වෙත පැමිණීම. කේ.ජී.එල්.ඒ.එන්.එස් ජයවර්ධන මෙනවිය විසින් මහාචාර්ය අංකුරන් දත්තාගේ ආරාධිත දේශනයක් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සමඟ අන්තර් ක්‍රියාකාරී සැසියක් සංවිධානය කරන ලදී.

අනාගත සැලසුම්

නව පීඨ ගොඩනැගිල්ල පිහිටුවීම අවසන් අදියරේ පවතී.

4 පර්යේෂණ, ප්‍රකාශන සහ සම්මාන

4.1 පේටන්ට් බලපත්‍ර

පීඨය	අධ්‍යයන අංශය	පේටන්ට් බලපත්‍රයේ නම	නිෂ්පාදන	පේටන්ට් වර්ගය	තත්ත්වය
විද්‍යා පීඨය	ගණිතය	කොන්ක්‍රීට් තාක්ෂණය සඳහා දේශීය හා නැනෝ අමුද්‍රව්‍ය ගවේෂණය	කොන්ක්‍රීට් මිශ්‍රණය	අන්තර්ජාතික	පේටන්ට් බලපත්‍රය ගොනු කිරීම සඳහා අයදුම් කර ඇත.

4.2 අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව

විද්වතුන්ගේ ප්‍රකාශන

	ප්‍රකාශන කාණ්ඩය		අංකය	
			ප්‍රකාශිත දේශීය	ප්‍රකාශිත විදේශ
නැ.වි.වි.	විද්‍යුත් සහරා ඇතුළුව නිර්දේශිත සුවිගත ජර්නලවල ප්‍රකාශන ගණන		2	92
	විද්‍යුත් සහරා ඇතුළුව නිර්දේශිත සුවිගත නොවන සහරාවල ප්‍රකාශන ගණන		30	13
	සමුළු වාර්තාවන්	සම්පූර්ණ පත්‍රිකා ලෙස ප්‍රකාශිත පත්‍රිකා ගණන	14	4
		වියුක්ත ප්‍රකාශන සංඛ්‍යාව	51	5
	ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන		3	11
	ප්‍රවීණතා ක්ෂේත්‍රයේ ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	ප්‍රකාශකයෙකු විසින්	-	-
		කතුවරයකු විසින්	1	1
ත්‍රිකුණාමල මණ්ඩපය	විද්‍යුත් සහරා ඇතුළුව නිර්දේශිත සුවිගත ජර්නලවල ප්‍රකාශන ගණන		-	64
	විද්‍යුත් සහරා ඇතුළුව නිර්දේශිත සුවිගත නොවන සහරාවල ප්‍රකාශන ගණන		1	2
	සමුළු වාර්තාවන්	සම්පූර්ණ පත්‍රිකා ලෙස ප්‍රකාශිත පත්‍රිකා ගණන	5	0
		වියුක්ත ප්‍රකාශන සංඛ්‍යාව	3	1
	ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන			-
	ප්‍රවීණතා ක්ෂේත්‍රයේ ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	ප්‍රකාශකයෙකු විසින්	-	-
		කතුවරයකු විසින්	-	-

පීඨ අනුව විද්වතුන්ගේ ප්‍රකාශන

පීඨය	දේශීය/ විදේශීය	නිර්දේශිත සුවිගත සහරා	නිර්දේශිත සුවිගත නොවන සහරා	සමුළු වාර්තාවන්		පොත් පරිච්ඡේද	පොත	
				සම්පූර්ණ පත්‍රිකා ලෙස	වියුක්ත ප්‍රකාශන		ප්‍රකාශක	ලේඛක
කෘෂි	දේශීය	-	8	2	31	1	-	-
	විදේශීය	14	1	-	1	2	-	-
කලා	දේශීය	-	7	-	4	-	-	1
	විදේශීය	15	4	-	-	1	-	-
වාණිජ	දේශීය	-	11	3	1	1	-	-
	විදේශීය	11	-	-	-	5	-	-
සෞඛ්‍යය	දේශීය	-	-	3	6	-	-	-

	විදේශීය	30	2	-	1	-	-	-
විද්‍යා	දේශීය	-	2	-	5	-	-	-
	විදේශීය	17	2	1	2	3	-	1
තාක්ෂණ	දේශීය	1	1	6	1	1	-	-
	විදේශීය	4	1	3	-	-	-	-
ව්‍යවහාරික	දේශීය	-	-	-	-	-	-	-
ත්‍රි.ම.	විදේශීය	56	1	-	1	-	-	-
සන්නිවේදන	දේශීය	-	1	5	3	-	-	-
ත්‍රි.ම.	විදේශීය	8	1	-	-	-	-	-
එකතුව		**156**	**42**	**23**	**56**	**14**	**0**	**2**

4.3 පර්යේෂණ ප්‍රතිපාදන සහ වියදම්

පර්යේෂණ කටයුතු සඳහා වූ පර්යේෂණ ප්‍රතිපාදන විස්තර **2020-2022**

පීඨය	ව්‍යාපෘතියේ/පර්යේෂණයේ නම	ප්‍රදානය කළ වර්ෂය	අනුමත ප්‍රතිපාදන(රු.)	තත්ත්වය
කලා හා සංස්කෘත	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ බ්‍රිතාන්‍ය පරිපාලනයේ යටත් විජිත බලපෑම්	2020	300,000	පර්යේෂණ සිදුවෙමින් පවතී
	ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ දෙමළ ජනයාගේ සංස්කෘතික අනන්‍යතා.	2020	300,000	පර්යේෂණ සිදුවෙමින් පවතී
	ශ්‍රී ලංකාවේ මඩකලපු කලපුවේ කලපු ප්‍රදේශයේ කඩොලාන වැවීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය	2022	250,000	යෝජනාව සමාලෝචකයින් විසින් සමාලෝචනය කරන ලද අතර සංශෝධිත අනුවාදය පර්යේෂකයාගෙන් බලාපොරොත්තු වේ.
සෞඛ්‍යය ආරක්ෂණ විද්‍යා	*Thevetia peruviana* (කනේරු) සහ *Cerbera manghas* (මුහුදු අඹ) යන දැඩි විෂ සහිත බීජ ස්වයං-ආග්‍රහණය කිරීම හේතුවෙන් රෝගීන්ගේ රුධිර ද්‍රව්‍ය තුළ නයිට්‍රික් ඔක්සයිඩ් මට්ටම් සහ රක්තපාත පරාමිතීන් ඇගයීම.	2022	750,000	පර්යේෂණ ප්‍රතිදාන පිරිනමන ලදී
	ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ අනාගත මාර්ග භාවිතා කරන්නන් අතර මාර්ග රථවාහන නීති (RTR) සහ මාර්ග ආශ්‍රිත ක්‍රියාකාරකම් (RRA) පිළිබඳ දැනුවත් කිරීම	2022	750,000	පර්යේෂණ ප්‍රතිපාදන පිරිනමන ලදී
	දෙවන වර්ගයේ දියවැඩියා රෝගීන් අතර මස් බැද්ද (*Gymnema sylvestre*) පත්‍ර නිස්සාරණයේ හයිපොග්ලයිසීමික් ක්‍රියාව පිළිබඳ ඇගයීම	2022	280,500	සමාලෝචකයින් විසින් යෝජනාව සමාලෝචනය කර නිර්දේශ කරන ලද අතර පර්යේෂණ සභාවේ නිර්දේශය බලාපොරොත්තුවෙන් සිටී.
	Thevetia peruviana (කනේරු) සහ *Cerbera manghas* (මුහුදු අඹ) යන දැඩි විෂ සහිත බීජ ස්වයං-ආග්‍රහණය කිරීම හේතුවෙන් රෝගීන්ගේ රුධිර ද්‍රව්‍ය තුළ නයිට්‍රික් ඔක්සයිඩ් මට්ටම් සහ රක්තපාත පරාමිතීන් ඇගයීම.	2022	395,000	යෝජනාව සමාලෝචකයින් විසින් සමාලෝචනය කරන ලද අතර සංශෝධිත අනුවාදය පර්යේෂකයාගෙන් බලාපොරොත්තුව සිටී.

විද්‍යා	මඩකලපුව දිස්ත්‍රික්කයේ වැඩි වශයෙන් පරිභෝජනය කරන මිරිදිය මත්ස්‍යයන්ගේ පෝෂණ හා බැර ලෝහ විශ්ලේෂණය	2020	250,000	පර්යේෂණය අවසන් කර ඇත.
	ශ්‍රී ලංකාවේ ශාක පත්‍ර ඇන්ත්‍රැක්නෝස් රෝගයෙන් *Colletotrichum* යන දිලීර විශේෂ හුදකලා කිරීම සහ හඳුනා ගැනීම	2021	300,000	පර්යේෂණ යෝජනාව සමාලෝචනය වෙමින් පවතී
	ශ්‍රී ලංකාවේ නැගෙනහිර මාගලවටවන් ආරූ ගංගා ද්‍රෝණියේ පාංශු සහ ජල තත්ත්ව පරාමිතීන් භූගෝලීය සිතියම්ගත කිරීම.	2022	620,000	යෝජනාව සමාලෝචකයින් විසින් සමාලෝචනය කරන ලද අතර සංශෝධිත අනුවාදය පර්යේෂකයා විසින් ඉදිරිපත් කර පර්යේෂණ සභාවේ නිර්දේශය සඳහා බලාපොරොත්තුව සිටී.

4.4 මහජනතාවට දැනුම බෙදා හැරීමේ වැඩසටහන් – 2022

	වර්ගය	වැඩසටහනේ මාතෘකාව	ඉලක්කගත කණ්ඩායම
නැ.වි.වි.	පුහුණු වැඩසටහන්/ ක්ෂේත්‍ර ආදර්ශන පැවැත්වීම	2022 කෘෂිකර්ම දිනය සඳහා රසායනාගාර සහ ක්ෂේත්‍ර ආදර්ශන	පාසල් සිසුන් සහ ගුරුවරුන්
		පාසල් උද්‍යානය දිරිගැන්වීම සඳහා ක්ෂේත්‍ර ආදර්ශනය	පාසල් සිසුන් සහ ගුරුවරුන්
		ලාභ ලබන අයිස්ක්‍රීම් සෑදීම පිළිබඳ පුහුණුව	පාසල් සිසුන්
	වැඩමුළු පැවැත්වීම	ආහාර සැකසීම සහ ගොවිතැන් කටයුතු දිරිගැන්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව	ගොවීන්
		නිවසේ ගොවිතැන් කටයුතු දිරිගැන්වීමේ වැඩමුළුව සහ බීජ බෙදා හැරීම	පොදු මහජනතාව
		ප්‍රජාවට එළවලු පැළ බෙදා දීම	පොදු මහජනතාව
		මඩකලපුව දිස්ත්‍රික්කයේ සියලුම කොටයාශවල ගොවි නියෝජිතයන් සමඟ කළ සාකච්ඡාව	ගොවීන්

	වර්ගය	වැඩසටහනේ මාතෘකාව	ඉලක්කගත කණ්ඩායම
ත්‍රිකුණාමලය මණ්ඩලය	වැඩමුළු පැවැත්වීම	ත්‍රිකුණාමලය අධ්‍යාපන කලාපයේ පාසල් එකොළහක පාසල් සිසුන් සහ ගුරුවරුන් සඳහා ක්ෂුද්‍ර පාලක පිළිබඳ තෙදින වැඩමුළුවක් පවත්වන ලදී.	පාසල් සිසුන් සහ ගුරුවරුන්
		දැනුම බෙදාගැනීමේ වැඩසටහනක්	පාසල් සිසුන් හා පාසල් හැර ගිය සිසුන්

4.5 2022 දී ප්‍රකාශිත සඟරා

පීඨය	සඟරාවේ නම	ISSN අංකය	වර්ෂය	වෙළුම	කලාපය
කෘෂිකර්ම	AGRIEAST: කෘෂි විද්‍යා සඟරාව	1391 - 5886	2022	16	1
කෘෂිකර්ම	AGRIEAST: කෘෂි විද්‍යා සඟරාව	1391 - 5886	2022	16	2
කලා සහ සංස්කෘතික	නෙයිතාල්: කලා සහ සංස්කෘතික පීඨයේ ජර්නලය	-	2022	11	1
කලා සහ සංස්කෘතික	නෙයිතාල්: කලා සහ සංස්කෘතික පීඨයේ සඟරාව	-	2022	11	2

වාණිජ්‍යය හා කළමනාකරණය	උපදේශක: ව්‍යාපාර අධ්‍යයන සඟරාව	1800 - 1548	2022	6	1
වාණිජ්‍යය හා කළමනාකරණය	උපදේශක: ව්‍යාපාර අධ්‍යයන සඟරාව	1800 - 1548	2022	6	2
විද්‍යා	JSc: විද්‍යා සඟරාව	1391 - 586X	2022	13	1
විද්‍යා	JSc: විද්‍යා සඟරාව	1391 - 586X	2022	13	2

4.6 වාර්ෂික පර්යේෂණ සැසි

නැ.වි.වි. හි වාර්ෂික පර්යේෂණ සැසිවල ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත්තේ කලාපයට, පරිසරයට සහ ප්‍රාදේශීය ප්‍රජාවට වැදගත් වන ගැටළු පිළිබඳව උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීම කෙරෙහි ය. එබැවින්, ප්‍රධාන බාහිර රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමටත්, කලාපීය ගැටළු පිළිබඳ ගෞරව උපාධි පර්යේෂණ ව්‍යාපෘති ඒකාබද්ධ කිරීමටත්, එමගින් සොයාගැනීම් ප්‍රචාරය කිරීමටත් පීඨ දිරිමත් කරනු ලැබේ. විශ්ව විද්‍යාලය 2022 වර්ෂයේදී පහත සඳහන් පර්යේෂණ සම්මන්ත්‍රණ / සම්මන්ත්‍රණ පවත්වා ඇත:

පීඨය	සමුළුව/ සම්මන්ත්‍රණ නාමය	සමුළුව/ සම්මන්ත්‍රණ තේමාව
කෘෂිකර්ම පීඨය	කෘෂිකර්මය පිළිබඳ 5 වන ජාතික සම්මන්ත්‍රණය - 2022	ස්මාර්ට් කෘෂිකර්මය තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම
කලා හා සංස්කෘතික පීඨය	වාර්ෂික පර්යේෂණ සැසිය-2022	සමකාලීන ශ්‍රී ලාංකීය ගැටළු ගවේෂණය කිරීම සහ අනාගතය ප්‍රතිනිර්මාණය කිරීම
වාණිජ හා කළමනාකරණ පීඨය	වාර්ෂික පර්යේෂණ සැසිය-2022	අතීතයට ගරු කිරීම, වර්තමානය නිධන් කිරීම සහ අනාගතය හැඩගස්වා ගැනීම
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය	වාර්ෂික පර්යේෂණ සැසිය-2022	නව සාමාන්‍ය යුගයේ සෞඛ්‍ය වෘත්තිකයන්
විද්‍යා පීඨය	වාර්ෂික පර්යේෂණ සැසිය-2022	තිරසාර සංවර්ධනය සඳහා ස්වභාවධර්මය සම්බන්ධ විද්‍යාත්මක නියැලීම
තාක්ෂණ පීඨය	1 වන වාර්ෂික පර්යේෂණ සැසිය	තිරසාර සංවර්ධනය සඳහා තාක්ෂණික පරිවර්තනය
ත්‍රිකුණාමල මණ්ඩපය	5 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (TRINCo-2022)	පුනරුදය දෙසට මතවාදය

5 නැ. වි.වි. හි ක්‍රියාත්මක කරන ලද තිරසාර සංවර්ධන වැඩසටහන්

5.1 අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු (ENACT) ව්‍යාපෘතිය හරහා තිරසාර සැලසුම්

නැගෙනහිර විශ්වවිද්‍යාලය තුළ ව්‍යාපෘතියේ අදාළත්වය

නැ.වි.වි.හි අධ්‍යක්ෂවරයෙකුගේ මහපෙන්වීම යටතේ හොඳින් ස්ථාපිත කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයක් (SDC) ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථානයෙහි ප්‍රධාන ඉලක්කය වන්නේ නැගෙ. වි.වි. හි අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැනුම, වෘත්තීය නිපුණතාවය සහ කුසලතා වැඩි දියුණු කිරීමයි.

කෙසේ වෙතත්, මෙම මධ්‍යස්ථානය වැඩි වශයෙන් අවධානය යොමු කරන්නේ අධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුව, එනම් ප්‍රේරක වැඩසටහන්, විෂයමාලා සංවර්ධනය සඳහා පුහුණු / වැඩමුළු, පර්යේෂණ ක්‍රමවේදය, යෝජනා ලිවීම යනාදියයි.

අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුහුණු වැඩසටහන්;

- කෙටි කාලීන පදනම (දින එකක් හෝ දෙකක් හෝ උපරිම සතියක්)
- සීමිත පරිමාණය, විෂය පථය සහ මතුපිට මට්ටම
- අසමාන ආකාරය

මෙම තත්ත්වය අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන කාර්යයන්හි අපේක්ෂිත මට්ටමේ නිපුණතාවය සහ ගුණාත්මකභාවය සහ ඔවුන්ගේ කාර්යයේ සැබෑ ප්‍රතිදානය අතර පරතරයක් ඇති කරයි. එම තත්ත්වය තුළ විශ්ව විද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තිරසාර පුහුණු වේදිකාවක් නිර්මාණය කිරීමට ENACT ව්‍යාපෘතියෙන් ප්‍රතිපාදන ලැබීම මහඟු අවස්ථාවකි. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු පාලනය, ඉහළ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් (අධ්‍යයන, පරිපාලන සහ අනෙකුත් අනධ්‍යයන) වැනි පාර්ශ්වකරුවන් දැනුවත් වූ අතර අනධ්‍යයන කාර්ය මණ්ඩලය සංවිධානාත්මකව සහ තිරසාර ලෙස පුහුණු කිරීමේ වැදගත්කම පිළිගෙන ඇත.

තවද, විශ්වවිද්‍යාලය විසින් 2022.07.30 දින මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය යටතේ අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුව සඳහා මාණ්ඩලික සංවර්ධන සෛලයක් ස්ථාපිත කරන ලද අතර එය ENACT ව්‍යාපෘතියේ සන්ධිස්ථානයක් වේ. මෙම පුහුණු කුටිය පිහිටුවීමත් සමඟ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තිරසාර පුහුණු සැලැස්මක් SDC හි ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලෙස කළමනාකාරිත්වයට නිර්දේශ කර ඇත. අනධ්‍යයන ආයතන අංශයේ සහය ඇතිව අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වාර්ෂික කාර්ය සාධන ඇගයීම්/වර්ධක තක්සේරු කිරීම මගින් මාණ්ඩලික සංවර්ධන සෛලය වාර්ෂිකව පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම සිදු කරනු ඇත.

නැගෙ. වි.වි. හි තිරසාරභාවය සහ උපයෝජනයේ සැලසුම්	
ENACT ප්‍රතිඵල නැ.වි.වි. හි කාර්ය මණ්ඩල සංවර්ධනය මධ්‍යස්ථානය (කා.ම.ස.ම.) තුළ ඒකාබද්ධ කරනා ආකාරය.	
1. ENACT ප්‍රතිඵල විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා ඒකාබද්ධ කිරීමට සැලසුම් කර ඇති ආකාරය පුළුල් ලෙස ඉදිරිපත් කිරීම.	ENACT ව්‍යාපෘතියේ WP 2 සම්පූර්ණ කිරීමෙන් පසු, වර්තමාන ප්‍රවණතාවලට වඩාත් අදාළ වන ව්‍යාපෘතියේ නියමිත ක්ෂේත්‍ර/මාතෘකා තුළ පුහුණුකරුවන් 13 දෙනෙකු නැ.වි.වි. සතුවේ. අනධ්‍යයන ආයතන අංශයේ සහය ඇතිව අනධ්‍යයන පුහුණු කුටිය හරහා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුහුණුව පිළිබඳ අඛණ්ඩ/වාර්ෂික අවශ්‍යතා ඇගයීම/අවශ්‍යතා විශ්ලේෂණය සිදුකිරීමට විශ්ව විද්‍යාලය සැලසුම් කර ඇත. නැ.වි.වි.හි ප්‍රමුඛතාවයන් සහ ප්‍රතිපත්ති වලට මූලිකත්වය දෙමින්, සේවකයින්ගේ හඳුනාගත් පුහුණු අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ENACT ව්‍යාපෘතිය යටතේ පුහුණුව සඳහා සකස් කරන ලද මොඩියුල / විෂයමාලා ඇතුළත් කරමින් පුහුණු විෂය මාලාව යාවත්කාලීන කෙරේ. මෙම පුහුණු පැකේජ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉලක්කගත කණ්ඩායම් වෙත ලබා දෙනු ඇත. මෙය නැ.වි.වි.හි උපායමාර්ගික සැලැස්මට ඇතුළත් වනු ඇත.

2. අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පාඨමාලා කීයක් සංවර්ධනය කිරීම/ඉදිරිපත් කරනවාද සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් කී දෙනෙකු වෙත වැය ළඟා කිරීමට අපේක්ෂා කරන්නේද?	මොඩියුලයන්/විෂය මාලා ඇතුළත් කළ පසු කාර්ය මණ්ඩලය බඳවා ගෙනවසරක් ඇතුළත ප්‍රේරක පුහුණුව පැවැත්වීමට සැලසුම් කර ඇත. අවශ්‍යතා තක්සේරු කිරීමෙන් පසු, දෙවන පුහුණුව වසර තුනක් ඇතුළත ලබා දෙනු ඇත, එය හිඩැස් පිරවීමේ ක්‍රියාවලියක් සහ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීමක් වනු ඇත. සේවකයින් තම තුන්වන වසර අවසන් වන විට තම තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතිය ලබා ගත යුතු අතර දැනට සිටින සේවකයන්ට ENACT ව්‍යාපෘතිය යටතේ පුහුණුව ලබා ඇති පුහුණුකරුවන් සහ දැනට සිටින අනෙකුත් පුහුණුකරුවන් විසින් ඔවුන්ගේ රැකියා විස්තරය අනුව පියවරෙන් පියවර පුහුණුව ලබා දෙනු ඇත.
3. පාඨමාලා සැලසුම් කරන්නේ කෙසේද? නිර්මාණයට සහභාගී වන්නේ කවුද?	උසස් අධ්‍යාපනයේ වර්තමාන අවශ්‍යතා සහ ප්‍රවණතා සහ සේවකයින්ගේ හඳුනාගත් පුහුණු අවශ්‍යතා පිළිබඳව පාර්ශ්වකරුවන්ගේ (ශිෂ්‍යයින්, කාර්ය මණ්ඩලය සහ කළමනාකාරිත්වය) තක්සේරුව මත පදනම්ව, ENACT ව්‍යාපෘතියේ WP1 යටතේ සකස් කරන ලද පුහුණු විෂය මාලාව ඇතුළත් කර පාඨමාලා සැලසුම් කෙරේ. ENACT ව්‍යාපෘතිය යටතේ පුහුණුව ලබන පුහුණුකරුවන් සහ **කා.ම.ස.ම** යටතේ දැනට සිටින අනෙකුත් පුහුණුකරුවන් (ජ්‍යෙෂ්ඨ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය) පාඨමාලා සැලසුම් කිරීම සඳහා කමිටුවක් ලෙස පිහිටුවනු ලැබේ.
4. ඔබේ ආයතනයේ පාඨමාලා ලබා දෙන්නේ කෙසේද? ඉගැන්වීමේ වගකීම සහ පරිපාලනය සඳහා වගකිව යුත්තේ කවුද?	මුහුණට මුහුණ පුහුණු වැඩසටහන්, වැඩමුළු, කණ්ඩායම් සාකච්ඡාව සහ ප්‍රශ්නෝත්තර සැසි සුදුසු පරිදි පවත්වනු ලැබේ. පුහුණුකරුවන් විසින් සපයනු ලබන ඉගැන්වීම/පුහුණුව අධීක්ෂණය කරන ඉගැන්වීම සඳහා **කා.ම.ස.ම** හි අධ්‍යක්ෂවරයා වගකිව යුතුය. **කා.ම.ස.ම** අධ්‍යක්ෂගේ අධීක්ෂණය යටතේ **කා.ම.ස.ම** හි වැඩසටහන් කළමනාකරු පරිපාලනය භාරව කටයුතු කරනු ඇත.
5. කරුණාකර ඔබගේ ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධන කුටියක් සංවර්ධනය කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කරන්න (ENACT ව්‍යාපෘතියේ සැලසුම් කර ඇති පරිදි) (1) උපකරණ මිලදී ගැනීම, (2) තෝරාගත් ස්ථානය පිළිබඳ විස්තරය, ස්ථානය සකස් කිරීම (ගෘහ භාණ්ඩ, අතිරේක උපකරණ, ආදිය), (3) විශ්වවිද්‍යාල ව්‍යුහය තුළ සෛලයේ වගවීම/කළමනාකරණය සහ තත්ත්වය, (4) සෛලයේ ක්‍රියාකාරිත්වයට අදාළව අනුවර්තනය කිරීමට/හඳුන්වා දීමට අවශ්‍ය	මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය යටතේ අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වන මාණ්ඩලික සංවර්ධන සෛලය **2022.07.30** දින විශ්වවිද්‍යාල පාලක සභාවට (විශ්වවිද්‍යාල පාලන මණ්ඩලයට) ලියවිල්ලක් සභාගත කිරීමෙන් පසු ආරම්භ කරන ලදී. (1) මිලදී ගත් උපකරණ පිළිබඳ විස්තර; • ලැප්ටොප් පරිගණක (Dell) – 06 • වීඩියෝ කැමරා -01 • උසස් තත්ත්වයේ වෙබ් කැමරා - 02 • ලේසර් මුද්‍රණ යන්ත්‍රය - 02 • බහුකාර්ය මුද්‍රණ යන්ත්‍ර - මුද්‍රණ විභේදනය 600 x 600 DPI - 01 • බහුමාධ්‍ය – 01 ** කඩදාසි සමඟ පෙරළන පැඩය- මිලදී ගැනීම සිදු වෙමින් පවතී. (2) ස්ථානය: **කා.ම.ස.ම** හි කොටසක් අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පරිවර්තනය කරනු ලැබේ. අමතර ගෘහ භාණ්ඩ සහ උපකරණ **කා.ම.ස.ම** විසින් සපයනු ලැබේ. (3) මාණ්ඩලික සංවර්ධන සෛලයේ වගවීමේ රේඛා 

කිසියම් විශ්වවිද්‍යාල රෙගුලාසි හෝ ප්‍රතිපත්ති?	(4) සම්මත කළ යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති; විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු යෝජිත පුහුණු ප්‍රතිපත්තිය **කා.ම.ස.ම** හි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වේ.
6. ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධන කුටිය මූල්‍යමය වශයෙන් පවත්වාගෙන යන්නේ කෙසේද? මෙහෙයුම් වියදම් සහ කාර්ය මණ්ඩල පිරිවැය ආවරණය කරන්නේ කෙසේද?	**කා.ම.ස.ම** හි ක්‍රියාකාරී සැලැස්මට පුහුණු ප්‍රතිපත්තිය ඇතුළත් කිරීමෙන් පසු, අධ්‍යයන නොවන කාර්‍ය මණ්ඩල පුහුණුව සඳහා වන පිරිවැය/අයවැය **කා.ම.ස.ම** විසින් වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලින් වෙන් කරනු ලැබේ. **කා.ම.ස.ම** වෙත අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය ඔවුන්ගේ සේවය ලබා දෙනු ඇත. ENACT ව්‍යාපෘති කණ්ඩායමේ සාමාජිකයින් ව්‍යාපෘතිය පුරාවටම පුහුණු ක්‍රියාවලියට සහ අධීක්ෂණයට සහයෝගය ලබා දෙන අතර, එකඟ වූ පරිදි ව්‍යාපෘතිය අවසන් වී වසර 3කට පසුවද සේවය ලබා දෙනු ඇත.
7. තිරසාර මූලෝපායට සහ විශේෂයෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධන කුටියේ ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වන කාර්ය මණ්ඩලය විස්තර කරන්න (අවම වශයෙන්, සැලසුම් කළ තනතුරු සහ ඊට සම්බන්ධ කාර්ය මණ්ඩල සංඛ්‍යාව ඉදිරිපත් කරන්න.)	- ඉගැන්වීමට සම්බන්ධ අධ්‍යයන කාර්ය මණ්ඩලය **ENACT** ව්‍යාපෘතිය යටතේ පුහුණු කරනු ලබන පුහුණුකරුවන්: **13** දෙනා සහ අනෙකුත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණුකරුවන් ලෙස - පවතින සංඛ්‍යා අතරින් තීරණය කිරීමට නියමිතය. - කළමනාකරණය/ පරිපාලනය සම්බන්ධ අනධ්‍යයන කාර්ය මණ්ඩලය වැඩසටහන් කළමනාකරු/ **කා.ම.ස.ම** - එක් අයෙකු - සහාය හෝ තාක්ෂණික කාර්ය මණ්ඩලය - **කා.ම.ස.ම** වෙත අනුයුක්ත කළ දෙදෙනෙක්
8. ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළ ඔබේ විශ්වවිද්‍යාලය තුළ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධන සෛලය සහ ENACT ප්‍රතිඵල පිළිබඳ තොරතුරු බෙදා හැරීමට ඔබ සැලසුම් කරන්නේ කෙසේද?	විශ්වවිද්‍යාල පුවත් පත්‍රිකාවේ ව්‍යාපෘතියේ සිදුවීම් සහ ප්‍රතිදානයන් ප්‍රකාශයට පත් කිරීම. ENACT ව්‍යාපෘති වෙබ් අඩවියේ තොරතුරු යාවත්කාලීන කිරීම. එක් එක් අනධ්‍යන නොවන පුහුණු වැඩසටහන ආරම්භයේදීම ව්‍යාපෘතිය යටතේ අනධ්‍යයන පුහුණු කුටිය පිහිටුවීම පිළිබඳ කෙටි හැඳින්වීමේ සැසියක් ඇතුළත් කිරීම. පාලක සභාවේ (පාලන මණ්ඩලයේ) න්‍යාය පත්‍රයට ENACT ව්‍යාපෘතිය ඇතුළත් කර ව්‍යාපෘතියේ ක්‍රියා සහ ප්‍රතිදානයන් පිළිබඳව පාලක මණ්ඩලය දැනුවත් කිරීම. සෑම පුහුණු පත්‍රිකාවකම Erasmus+ සහ ENACT ලාංඡන ඇතුළත් කිරීම. අනධ්‍යයන පුහුණු කුටියේ නාම පුවරුවේ Erasmus+ සහ ENACT ලාංඡන ප්‍රදර්ශනය කිරීම.
9. අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධන කුටිය සහ ENACT ප්‍රතිඵල පිළිබඳ තොරතුරු ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළ ඔබේ විශ්වවිද්‍යාලයෙන් පිටත බෙදා හැරීමට ඔබ සැලසුම් කරන්නේ කෙසේද? විශේෂයෙන්ම, රටේ රාජ්‍ය ආයතන සහ අනෙකුත් විශ්වවිද්‍යාල වෙත ළඟා වීමට ඔබ සැලසුම් කරන්නේ කෙසේද?	මෙම ව්‍යාපෘතිය යටතේ පුහුණුව ලබන පුහුණුකරුවන් විසින් සෙසු රාජ්‍ය විශ්වවිද්‍යාලවලට (12) පුහුණුකරුවන්ගේ පුහුණුව ලබාදීමට සැලසුම් කර ඇත. මෙය ශ්‍රී ලංකා හවුල්කරුවන් විසින් ඒකාබද්ධ වැඩසටහනක් ලෙස පවත්වනු ලැබේ. නැ.වි.වි. හි කර්මාන්ත ප්‍රජා සම්බන්ධතා මධ්‍යස්ථානය (CICL) යටතේ ‘සවුක්කඩි’ ආදර්ශ ගම්මානයේ කාන්තා සමාජයට සහ තරුණ සමාජයට සුදුසු පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන/ සවිබල ගැන්වීමේ වැඩසටහන් විශ්ව විද්‍යාලය විසින් පුළුල් කළ යුතුය. කාර්ය මණ්ඩල සංවර්ධන කුටිය මෙම වැඩසටහනට සහාය වනු ඇත. විද්‍යා පීඨ, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ කාර්මික විද්‍යාලය වැනි අනෙකුත් රාජ්‍ය ආයතනවල අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සුදුසු පුහුණුවීම්/වැඩමුළු පවත්වා ව්‍යාපෘතියේ සාර්ථකත්වය ප්‍රචාරය කළ යුතුය.

5.2 නැගෙනහිර විශ්වවිද්‍යාලයේ තිරසාර සැලසුම්

ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලය විසින් පරිසරය ආරක්ෂා කිරීම සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා පරිසරය සහ ආපදා බලපෑම් තක්සේරු විශ්ලේෂණය පිළිබඳ පහත සඳහන් තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත.

සැමට දැරිය හැකි, විශ්වසනීය, තිරසාර සහ නවීන බලශක්ති ප්‍රවේශය සහතික කිරීම:	• සූර්ය ජාල පද්ධතිය සනාතන ගොඩනැගිල්ලේ ස්ථාපනය කර ඇත. (අවුරුදු හයකින් පිරිවැය පියවනු ඇත). •.සමස්ත පරිභෝජනයෙන් 50%කට වඩා වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සහ ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා සූර්ය ජාල පද්ධතිය ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබේ.
කසළ කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම:	•නේවාසිකාගාරය සහ නිල නිවාස පරිශ්‍රය තුළ කසළ කළමනාකරණය ක්‍රියාත්මක කර ඇත. •ජෛව අපද්‍රව්‍ය කෘෂිකාර්මික ගොවිපළට පොහොරක් ලෙස භාවිතා කළ හැක. •
රසායනික හා ඝායනික අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම සහතික කිරීම:	•අන්තරායකර රසායන ද්‍රව්‍ය සහ ඝායනික අපද්‍රව්‍ය ප්‍රධාන වශයෙන්ම ජනනය කරනු ලබන්නේ විද්‍යා පීඨය සහ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය මගිනි. එම අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සෞඛ්‍ය සම්පන්න පාරිසරික ක්‍රම පිළිබඳව සාකච්ඡා සිදු වෙමින් පවතී.
අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා 3R සංකල්පය හඳුන්වා දී ඇත.	•මුළු විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ඇති අපද්‍රව්‍ය 3 R සංකල්පයකට ලක් කිරීමට සැලසුම් කර ඇත. •අඩු කිරීම •නැවත භාවිතය •ප්‍රතිචක්‍රීකරණය
විශ්ව විද්‍යාලය සඳහා පිරිසිදු හා හරිත සංකල්පය හඳුන්වාදීම:	•විශ්වවිද්‍යාලයේ පිරිසිදු හා හරිත සංකල්පයට වඩා හොඳ ප්‍රවේශයක් වෙනුවෙන් අදහස් ලබා ගැනීම සඳහා විවිධ පාර්ශවකරුවන් අතර "හරිත සංවාද" පැවැත්වීම. •විශ්වවිද්‍යාල පරිශ්‍රයේ රුක් රෝපණ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. විශේෂයෙන් සෙවණැලි ගස් සහ ඉහළ ඖෂධීය වටිනාකමක් ඇති කොහොඹ ගස් සිටුවා ඇත.
බලශක්ති සංරක්ෂණය:	•ඉහළ යන විදුලියට සහ ඉන්ධන මිලට විසඳුමක් ලෙස කාර්යාල, නේවාසිකාගාර සහ නිල නිවාසවල බලශක්ති සංරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කර ඇත.

6 පස් අවුරුදු ප්‍රධාන සංඛ්‍යා ලේඛන


		2018	2019	2020	2021	2022
පීඨය අනුව අභ්‍යන්තර සිසුන් සංඛ්‍යාව	***මුළු***	***5299***	***6186***	***7326***	***7859***	***8211***
	කෘෂිකර්ම	275	250	262	308	309
	කලා සහ සංස්කෘතික	2305	2828	3149	2863	2765
	වාණිජ්‍යය හා කළමනාකරණය	681	682	730	844	975
	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාව	511	522	686	655	679
	විද්‍යාව	481	510	544	778	826
	තාක්ෂණික	144	221	289	396	418
	ව්‍යවහාරික විද්‍යාව, ත්‍රි.ම.	398	536	743	908	882
	සන්නිවේදනය හා ව්‍යාපාර අධ්‍යයනය, ත්‍රි.ම.	504	637	923	1107	1357
කලාපය අනුව සිසුන් සංඛ්‍යාව	***මුළු***	***5299***	***6186***	***7326***	***7859***	***8211***
	දේශීය	5290	6176	7318	7851	8205
	අන්තර්ජාතික	9	10	8	8	6
උපාධි අපේක්ෂක සිසුන්	***මුළු***	***5711***	***6662***	***8083***	***8415***	***8859***
	අභ්‍යන්තර	5299	6186	7326	7859	8211
	බාහිර	412	476	757	556	648
පශ්චාත් උපාධි සිසුන්	***මුළු***	186	227	266	382	269
කාර්ය මණ්ඩල සංඛ්‍යාව	***මුළු***	***729***	***676***	***718***	***749***	***774***
	අධ්‍යයන	244	205	262	274	302
	අධ්‍යයන සහාය	24	26	26	26	25
	පරිපාලන	39	41	39	41	39
	අනධ්‍යයන	422	404	391	408	408
ගුරු මණ්ඩලය	***මුළු***	***237***	***246***	***255***	***267***	***295***
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	2	3	2	2	2
	මහාචාර්ය	8	7	10	15	22
	ආශ්‍රිත මහාචාර්ය	-	-	1	3	1
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය	61	69	78	81	84
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	85	80	78	67	65
	කථිකාචාර්ය	81	87	86	99	121
සම්මාන	ජනාධිපති සම්මාන (පර්යේෂණ)	2	3	2	-	-
අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්	විදේශීය	1	1	-	-	9

7 මූල්‍ය වාර්තාව

7.1 මූල්‍ය ප්‍රකාශනය විශ්ලේෂණය

මි.2,247 මෙහෙයුම් ආදායම්	මි.2,629 මෙහෙයුම් වියදම්	මි.(382) මෙහෙයුම් ප්‍රතිඵල
මි.5,444 ජංගම නොවන වත්කම්	මි.1,376 ජංගම වත්කම්	මි.6,820 මුළු වත්කම්
මි.1,712 ජංගම නොවන වගවීම්	මි.219 ජංගම වගවීම්	මි.1,931 මුළු වගවීම්

7.2 පසුගිය වසර පහ තුළ මුළු ආදායම සහ වියදම්



සටහන: *ඉහත ප්‍රස්ථාරවල ලා වර්ණය ආදායම් සඳහා වන අගයන් නියෝජනය කරයි*

අඳුරු වර්ණය වියදම් සඳහා අගයන් නියෝජනය කරයි.

සියලු ආදායම් වියදම් වටිනාකම රුපියල් මිලියන ගණනින් දක්වා ඇත.

7.3 දස වසරක මූල්‍ය විශේෂ අවස්ථා

පහත වගුවේ දැක්වෙන්නේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වත්මන් සහ පෙර වාර්තාකරණ කාල පරිච්ඡේද නවය සඳහා ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයකි. අවශ්‍ය වූ විට, ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමේ සිට ස්ථාවර ගිණුම්කරණ ප්‍රතිකාර සහතික කිරීම සඳහා ප්‍රමාණ ප්‍රතිනිර්මාණය කර ඇත.

ආදායම් ප්‍රකාශය

	2022 රු.'000	2021 රු.'000	2020 රු.'000	2019 රු.'000	2018 රු.'000	2017 රු.'000	2016 රු.'000	**2015 Rs.'000**	**2014 Rs.'000**	**2013 Rs.'000**
රජයේ ප්‍රදාන	1,999,800	1,901,900	1,949,750	1,758,959	1,477,100	1,193,688	1,165,927	960,030	777,087	621,470
වෙනත් ආදායම්	125,961	54,634	44,432	50,993	21,931	45,223	40,694	27,728	25,628	15,815
මුළු	**2,125,761**	**1,956,534**	**1,994,182**	**1,809,952**	**1,499,031**	**1,238,911**	**1,206,621**	**987,758**	**802,715**	**637,285**
වියදම	2,629,478	2,200,572	2,285,626	2,385,232	1,844,622	1,573,958	1,313,881	1,145,260	888,973	781,221
ආදායමට වඩා වියදම් අධික වීම	**(503,717)**	**(244,038)**	**(291,444)**	**(575,280)**	**(345,591)**	**(335,047)**	**(107,260)**	**(157,502)**	**(86,258)**	**(143,936)**

	2022 රු.'000	2021 රු.'000	2020 රු.'000	2019 රු.'000	2018 රු.'000	2017 රු.'000	2016 රු.'000	**2015 Rs.'000**	**2014 Rs.'000**	**2013 Rs.'000**
ජංගම වත්කම්	1,375,815	1,486,404	1,259,560	1,276,828	1,089,470	928,022	1,174,718	2,840,551	977,693	648,385
ජංගම නොවන වත්කම්	5,443,646	5,316,293	5,414,849	5,382,997	5,149,363	4,810,106	3,767,373	1,066,846	2,217,782	1,610,042
මුළු වත්කම්	**6,819,461**	**6,802,697**	**6,674,409**	**6,659,825**	**6,238,833**	**5,738,128**	**4,942,091**	**3,907,397**	**3,195,475**	**2,258,427**
ජංගම වගකීම්	218,543	141,679	132,674	302,426	299,570	341,448	340,062	296,852	259,244	241,924
ජංගම නොවන වගකීම්	1,712,050	1,367,012	1,360,143	1,522,154	1,217,782	1,035,600	580,081	506,851	469,295	438,222
මුළු වගකීම්	**1,930,593**	**1,508,690**	**1,492,817**	**1,824,580**	**1,517,352**	**1,377,048**	**920,143**	**803,703**	**728,539**	**680,146**
මුළු හිමිකම්	**4,888,868**	**5,294,007**	**5,181,592**	**4,835,245**	**4,721,481**	**4,361,080**	**4,021,948**	**3,103,694**	**2,466,936**	**1,578,281**

7.4 විගණන කමිටුවේ සභාපතිවරයාගේ වාර්තාව

විගණන කමිටුව යනු ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනු කමිටුවලින් එකකි. පංච පුද්ගල කමිටුව නිතිපතා රැස්වන අතර විශ්වවිද්‍යාලයේ මූල්‍ය, මානව සහ පරිපාලනමය අංශ පිළිබඳව සාකච්ඡා කරයි. විගණන කමිටුවේ සාමාජිකත්වය, නිල කාලය, වගකීම්, බලතල සහ මැතිවරණ ක්‍රියා පටිපාටි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කවුන්සිලය හරහා ශ්‍රී ලංකා භාණ්ඩාගාරය විසින් පාලනය කරනු ලබයි.

විගණන කමිටුව සඳහා ගිවිසුමෙහි නියමයන්

i. අභ්‍යන්තර විගණන අංශයේ වගකීම් නිර්ණය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම.

ii. විශ්ව විද්‍යාලයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය සහ ඇගයීම.

iii. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද වැඩ වැඩසටහන පෙරදසුන් කර නිර්දේශ කිරීම.

iv. පිරිවැය ඵලදායිතාවය සහ නාස්තිකාර වියදම් ඉවත් කිරීම සඳහා නියමිත කාල පරාසයන් තුළ කාර්ය සාධනය සමාලෝචනය කිරීම.

v. බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වීම සහ විගණකාධිපතිගේ/ බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපි පිළිබඳ පසු විපරම් කිරීම.

vi. කළමනාකරණ ක්‍රියාවලියේදී පවතින ප්‍රඥප්ති, රෙගුලාසි, නීති රීති සහ චක්‍රලේඛ අනුකූලද යන්න තහවුරු කර ගැනීම.

vii. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.

viii. ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණන/ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම.

ix. පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ නිර්දේශ/විධාන ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

x. වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයාගැනීම් පිළිබඳ වාර්තාවක් සකස් කරනු ලැබේ.

විගණන කමිටුවේ සංයුතිය

සාමාජිකයාගේ නම	තනතුර
පාලක සභාවෙන් පත්කළ සාමාජිකයන්	
ප්‍රේමිනාත් මහතා (සභාපති)	නීතීඥ
වෛද්‍ය ජී. සුකුනන් (සාමාජික)	ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, කල්මුණේ
එස්.ජේ.එම්.එස්. සමරකෝන් මහත්මිය	පීඨාධිපති, මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාලය
නිල සාමාජිකයන්	
ඒ. බහිරදන් මහතා	ලේඛකාධිකාරි, නැ.වි.වි.
එස්. තිරුවරුඩ්වෙල්වන් මහතා (11.5.2022 දක්වා)	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක, නැ.වි.වි.
පී.එම්.ජී.ජී.ටී.බී.වීරකෝන් මහත්මිය(1.6.2022 සිට)	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක වෙනුවට, නැ.වි.වි.
නිරීක්ෂකයින්	
එම්.එච්.එම් අරඟත් මහතා	විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය, මඩකලපුව
එම්.එම්.ජේ.ආර්.බෝගමුව මහතා	අභ්‍යන්තර විගණක, වි.වි.ප්‍ර.කොා.ස.
ආරාධිතයින්	
එම්.එම්.එම්.ෆාරිස් මහතා	මූල්‍යාධිකාරි,නැ.වි.වි.

රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවට තුන් වතාවක් රැස්විය හැකිය. කමිටුවේ නිර්දේශ එහි අනුමැතිය සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා විශ්වවිද්‍යාල කවුන්සිලයට ලබා දෙන ලදී. රැස්වීම් පිළිබඳ විස්තර පහත දැක්වේ;

රැස්වීම අංක.	රැස්වීමේ දිනය
70 වන රැස්වීම	31.01.2022
71 වන රැස්වීම	23.06.2022

2022 වර්ෂය තුළ ක්‍රියාකාරකම්:

අ. අභ්‍යන්තර විගණනය:

අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වැඩසටහන නිර්දේශ කිරීම සහ අධීක්ෂණය කිරීම:
කමිටුව *2022* වාර්ෂික විගණන සැලැස්ම සහ වැඩසටහන නිර්දේශ කරන ලදී.

අභ්‍යන්තර විගණන කාර්යයන් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම:
කමිටුව අභ්‍යන්තර විගණක වාර්තා, විමර්ශන සටහන් සහ විමසුම් සමාලෝචනය කර එහි පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීම සඳහා පරිපාලනය සඳහා අවශ්‍ය උපදෙස් සහ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ආ. වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්:

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සැකසීමේ ප්‍රගතිය කමිටුව විසින් අධීක්ෂණය කරන ලද අතර නියමිත වේලාවට ඉදිරිපත් කිරීම සහතික කරන ලදී. තවද, විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පසු විපරම් කරන ලදී.

ඇ. බාහිර විගණනය:

සමාලෝචිත වර්ෂය සඳහා අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම පිළිබඳව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සහ වාර්ෂික වාර්තාව කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. ලැබුණු සහ පිළිතුරු දුන් විගණන විමසුම්වල විස්තර පහත දැක්වේ;

විස්තරය	2022
ලැබුණු විමසුම් ගණන	13
පිළිතුරු දුන් විමසුම් ගණන	08
පිළිතුරු නොදුන් විමසුම් ගණන	05

ඈ. අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම:

- *වාර්ෂික සත්‍යාපනය සහ ස්ථාවර වන්කම් ලේඛනය:*
  කමිටුව විසින් විශ්වවිද්‍යාල වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය කාලානුරූපව නිම කිරීමේ ප්‍රගතිය අඛණ්ඩව සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී.

- *රසායනාගාර උපකරණ උෆෙන උපයෝගි කර ගැනීම - බංකු-ඉහළ ආහාර කැලොරිමීටරය සහ දියුණු වායු විශ්ලේෂකය. (අභ්‍යන්තර විගණන වාර්තා අංක:* EUSL/01/2019):

  මෙම කරුණ විමසීම සඳහා කොමිෂන් සභා නියෝජිතයෙකු, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු සහ තාක්ෂණික විශේෂඥයෙකුගෙන් සමන්විත 03-පුද්ගල කමිටුවක් පත් කිරීමට විගණන කමිටුව නිර්දේශ කර ඇති අතර අවාසනාවකට එම කමිටුවට කොමිෂන් සභා නියෝජිතයෙකු ඇතුළත් කර ගැනීමට නොහැකි විය. තවද, එම කමිටුව විසින් කරුණු සෙවීමේ වාර්තාව ඉදිරිපත් කළ බවත් ලෝක බැංකුවෙන් ලබාදුන් අරමුදල් සුරක්ෂිත කිරීම සඳහා එම උපකරණ කඩිනමින් මිලදී ගත් බවත් දැන් ඒවා අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා සම්පූර්ණයෙන්ම යොදාගෙන ඇති බවත් වාර්තා වන ලදී.

- *රු. 198,274.19 ක් වටිනා භාණ්ඩ අහිමි වීම (අභ්‍යන්තර විගණන වාර්තා සටහන් අංක: (EUSL/IARN/01/2019):*

  ආයතන නීති සංග්‍රහය සහ මූල්‍ය රෙගුලාසිවලට අනුව වගකිව යුතු කාර්ය මණ්ඩලයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසටත් ප්‍රතිස්ථාපන පිරිවැය සහ ඇවර කළ හානිවලින් 25% අයකර ගැනීමටත් විගණන කමිටුව විශ්ව විද්‍යාලයට උපදෙස් දෙන ලදී.

- *විභාග පිළිතුරු පත්‍ර ඇගැයීම් සඳහා දිගු කාලීනව සිදු නොකළ ගෙවීම් - කලා හා සංස්කෘතික පීඨය:*

  ආයතන චක්‍රලේඛ 2015/15 අනුව එකී විභාග ප්‍රථිඵල නිකුත් කිරීම වෙනුවෙන් හිමි ගෙවීම් සියල්ල අනිවාර්යයෙන් ගෙවා නිම කළ යුතු බවටත්, තවද විභාගය පැවැත්වූ දිනය, ප්‍රතිඵල නිකුත් කළ දිනය ආදිය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් කර නොමැති බැවින් විභාග හිමිකම් වවුචරය ප්‍රතිනිර්මාණය කළ යුතු බව කමිටුව නිර්දේශ කරන ලදී.

- *පුද්ගලික ගොනු පවත්වාගෙන යාමේ පවතින අඩුපාඩු:*

  කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය හරහා කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලෙස කමිටුව ලේඛකාධිවරයාගෙන් ඉල්ලා සිටින ලදී. එහි ප්‍රගතිය නිරීක්ෂණය කර වාර්තා කරන ලෙස ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක වෙතින් කමිටුව තවදුරටත් ඉල්ලා සිටින ලදී.

- *ප්‍රධාන ගබඩාවේ තොග සත්‍යාපනය:*

  මූල්‍ය රෙගුලාසිවලට අනුව භාවිත කළ නොහැකි භාණ්ඩ බැහැර කරන ලෙස කමිටුව සේවා අංශයෙන් ඉල්ලා සිටින ලදී.

ඌ. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සැලැස්ම

ඉඩම් සහ ගොඩනැගිලි - නැ.වි.වි. වන්දාරුමූලෙයි පරිශ්‍රය:

විශ්වවිද්‍යාලයේ ස්ථාන 11ක හෙක්ටයාර් 210ක පමණ භූමි ප්‍රමාණයක් අයිතිය තහවුරු කිරීමට නොහැකියාව හේතුවෙන් නිරවුල් කිරීමට නොහැකි වී ඇති බව කමිටුව සඳහන් කළේය. එම ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීම සඳහා රජයේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ කාර්යක්ෂමව සහයෝගයෙන් කටයුතු කරන ලෙස සභාපතිවරයා උපදෙස් දුන්නේය.

එ. බැඳීම් සහ ගිවිසුම් කඩ කිරීම:

කමිටුව විසින් බැඳුම්කර අයකර ගැනීමේ සමාලෝචන සභාව අඛණ්ඩව සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී. තවද මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නීති නිලධාරියෙකුද පත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සමහර බැඳුම්කර කඩකරන්නන්ගෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබිණි. ඇපකරුවන් වෙත ඉල්ලීම් ලිපිය යැවීමට නීතිමය කටයුතු ද මේ වන විට ආරම්භ කර තිබුණි.

ඒ. අයවැය පාලනය:

කමිටුව නිසි මූල්‍ය පාලනයක් සහ විසර්ජනයක් සහතික කිරීම සඳහා අයවැය ප්‍රතිපාදනවලට එරෙහිව සත්‍ය කාර්ය සාධනය නිරීක්ෂණය කර අධීක්ෂණය කරන ලදී.

නිගමනය:

විශ්වවිද්‍යාල යහපාලනය සඳහා කමිටු සාමාජිකයින්ගේ සක්‍රීය සහභාගීත්වය සහ ඔවුන්ගේ කැපවීම පිළිබඳව විගණන කමිටුව සෑහීමකට පත් වන ලදී. වැඩබලන ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයා කමිටුවේ ලේකම්වරයා ලෙස ඔහුගේ කාර්යභාරය ඉටු කරන ආකාරය පිළිබඳව කමිටුව සෑහීමකට පත් වේ. කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති පසු විපරම් ක්‍රියාමාර්ග සහ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත්වන අතරම, යහපාලනය, විනිවිදභාවය, නිසි මූල්‍ය, පරිපාලන සහ අධ්‍යයන කාර්ය සාධනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව කමිටුව තවදුරටත් අවධාරණය කරන ලදී.

සභාපති,
විගණන කමිටුව,
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය.

7.5 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද අරමුදල පිළිබඳ තත්ව වාර්තාව

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

විස්තර	වෙන් කළ ප්‍රමාණය	නිර්දේශ කළ ප්‍රමාණය	නිදහස් කළ ප්‍රමාණය රුපියල්
පුනරාවර්තන ප්‍රදාන			
පුද්ගලික වේතන	1,510,000	1,510,000	1,473,400
අනෙකුත් පුනරාවර්තන	200,000	200,000	152,000
මුළු පුනරාවර්තන ප්‍රදාන	1,710,000	1,710,000	1,625,400
ප්‍රාග්ධන ප්‍රදාන			
පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම	30,000	30,000	-
වත්කම් අත්පත් කර ගැනීම	35,000	35,000	-
කෙරීගෙන යන කොන්ත්‍රාත් වැඩ	65,000	65,000	-
නව ව්‍යාපෘති ඉදිකිරීම්	-	-	-
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති	-	-	-
පර්යේෂණ ශක්තිමත් කිරීම	-	-	-
මුළු ප්‍රාග්ධන ප්‍රදාන	130,000	130,000	-
මුළු ප්‍රදාන	**1,840,000**	**1,840,000**	**1,625,400**

ත්‍රිකුණාමල මණ්ඩපය

විස්තර	වෙන් කළ ප්‍රමාණය	නිර්දේශ කළ ප්‍රමාණය	නිදහස් කළ ප්‍රමාණය රුපියල්
පුනරාවර්තන ප්‍රදාන			
පුද්ගලික වේතන	347,000	322,450	322,450
අනෙකුත් පුනරාවර්තන	80,000	80,000	51,950
මුළු පුනරාවර්තන ප්‍රදාන	427,000	402,450	374,400
ප්‍රාග්ධන ප්‍රදාන			
පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම	2,775	2,775	2,775
වත්කම් අත්පත් කර ගැනීම	6,225	6,225	6,225
කෙරීගෙන යන කොන්ත්‍රාත් වැඩ	91,000	91,000	61,000
නව ව්‍යාපෘති ඉදිකිරීම්			
මුළු ප්‍රාග්ධන ප්‍රදාන	100,000	100,000	70,000
මුළු ප්‍රදාන	**527,000**	**502,450**	**444,400**

7.6 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

කාරණාව	2021 රු.	2022 රු.
පුද්ගලික වේතන	1,308,847,689	1,420,897,464
ගමන් වියදම්	160,235	350,417
සැපයුම්	24,351,059	66,450,294
අලුත්වැඩියා වියදම්	19,589,711	27,651,601
කොන්ත්‍රාත් සේවා	151,059,588	181,737,734
වෙනත්	30,191,009	78,302,388
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	197,146,862	274,106,649
එකතුව	**1,731,346,153**	**2,049,496,547**

ත්‍රිකුණාමල මණ්ඩපය

කාරණාව	2021 රු.	2022 රු.
පුද්ගලික වේතන	290,302,198	322,728,017
ගමන් වියදම්	107,286	126,414
සැපයුම්	6,093,896	17,207,793
අලුත්වැඩියා වියදම්	5,648,905	10,769,586
කොන්ත්‍රාත් සේවා	48,400,486	88,400,829
වෙනත්	4,837,094	13,426,327
එකතුව	**355,389,865**	**452,658,966**

7.7 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

කාරණාව	2021 Rs.	2022 Rs.
පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම	27,335,433.94	12,546,330.77
වත්කම් අත්පත් කර ගැනීම	39,434,146.64	90,058,146.83
ඉදිකිරීම් ව්‍යාපෘති	25,893,625.78	26,376,621.29
දැනුම වැඩි දියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය	2,062,210.38	6,313,870.03
පර්යේෂණ සහ සංවර්ධන	314,257.00	707,360
එකතුව	**95,039,673.74**	**136,002,328.92**

ත්‍රිකුණාමල මණ්ඩපය

කාරණාව	2021 Rs.	2022 Rs.
ස්ථාවර වත්කම් නඩත්තුව සහ පුනරුත්ථාපනය කිරීම	2,168,279	5,335,515
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	21,328,267	6,798,104
ඉදිකිරීම් ව්‍යාපෘති	160,954,318	91,130,656
පර්යේෂණ හා සංවර්ධන	-	457,840
එකතුව	**184,450,864**	**103,722,115**

7.8 ව්‍යාපෘති විස්තර (දේශීය/ විදේශීය අරමුදල්)

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

නම සහ විස්තරය	ණය/ ප්‍රදාන	අරමුදල් නියෝජිතායතනය	TCE (රු.මි.)	RFA (රු.මි.)	DF (රු.මි)
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීමේ ව්‍යාපෘතිය.	ණය	කුවේට්	6,617.5	-	-
එකතුව			6,617.5	-	-

ත්‍රිකුණාමල මණ්ඩපය

නම සහ විස්තරය	ණය/ ප්‍රදාන	අරමුදල් නියෝජිතායතනය	TCE (රු.මි.)	RFA (රු.මි.)	DF (රු.මි.)
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය සඳහා තට්ටු පහක ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ විවෘත කිරීම.	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	821.40	-	-
බහුකාර්ය ශ්‍රවණාගාරය සඳහා දෙමහල් ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ විවෘත කිරීම	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	784.80	-	-
මණ්ඩපය තුළ අභ්‍යන්තර මාර්ග ඉදි කිරීම	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	145.00	-	-
එකතුව			**1,751.20**		

7.9 ව්‍යාපෘති වියදම් විස්තර (දේශීය/ විදේශීය අරමුදල්)

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

නම	ඇස්ත. (රු.මි.)	2021දී වියදම (රු.මි.)	2022දී වියදම් (රු.මි.)	31.12.2022 ට සමුච්චිත වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීමේ ව්‍යාපෘතිය.	6,617.5	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙහෙයවයි			100%
එකතුව	6,617.5				

ත්‍රිකුණාමල මණ්ඩපය

නම	ඇ.වි.(රු.මි)	2021 දී වියදම (රු. මි)	2022 දී වියදම (රු. මි)	31.12.2022 ට සමුච්චිත වියදම (රු. මි)	භෞතික ප්‍රගතිය
කාර්ය මණ්ඩල නිල නිවාස ඉදිකිරීම අදියර-I	40.00	8.41	0.06	39.84	100%
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය සඳහා තට්ටු පහක ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ විවෘත කිරීම.	821.40	120.45	74.11	667.55	90%
බහුකාර්ය ශ්‍රවණාගාරය සඳහා දෙමහල් ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ විවෘත කිරීම	784.80	23.94	16.96	80.89	9%
මණ්ඩපය තුළ අභ්‍යන්තර මාර්ග ඉදි කිරීම	145.00	8.15	-	31.56	48%
එකතුව	**1,791.2**	**160.95**	**91.13**	**819.84**	

7.10 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

කාරණය	2022 දී වෙන් කිරීම් (මි.)	DTO වෙතින් ලැබුණු ප්‍රදාන (මි)	2022 දී වියදම් (මි.)	ඉතිරි කිරීම්/ අතිරික්තය (මි.)
ව්‍යාපෘති හැර පුනරාවර්තන	1,710.00	1,625.40	2,049.00	(423.60)
ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධන	130.00	-	136.00	(136.00)
එකතුව	**1,840.00**	**1,625.40**	**2,185.00**	**(559.60)**

ත්‍රිකුණාමල මණ්ඩපය

කාරණය	2022 දී වෙන් කිරීම් (මි.)	DTO වෙතින් ලැබුණු ප්‍රදාන (මි)	2022 දී වියදම් (මි.)	ඉතිරි කිරීම් / අතිරික්තය (මි.)
ව්‍යාපෘතිය හැර පුනරාවර්තන	427.00	374.40	452.66	(25.66)
ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධන	100.00	70.00	103.72	(3.72)
එකතුව	**527.00**	**444.40**	**556.38**	**(29.38)**

7.11 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ජනනය කරන ලද ආදායම)

අභ්‍යන්තර ආදායම පමණයි

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

ආදායම් මූලාශ්‍රය	2022 තුළ ප්‍රතිපාදන (රු.)	2022 තුළ එකතුව (රු.)	හිඟය / අතිරික්තය (රු.)
උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි	-	29,503,119	29,503,119
වෙනත් ආදායම්	15,000,000	89,764,662	74,764,662
එකතුව	**15,000,000**	**119,267,781**	**104,267,781**

ත්‍රිකුණාමල මණ්ඩපය

ආදායම් මූලාශ්‍රය	2022 තුළ ප්‍රතිපාදන (.රු)	2022 තුළ එකතුව (.රු)	හිඟය අතිරික්තය / (.රු)
උපාධි අපේක්ෂක	7,300,000	3,642,181	(3,657,819)
වෙනත් ආදායම්	2,700,000	2,548,680	(151,320)
එකතුව	**10,000,000**	**6,190,861**	**(3,809,139)**

7.12 මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය - 2022

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

කාරණාව	සූත්‍රය	එක් සිසුවෙකු සඳහා වියදම (රු)
එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම් (RE)	පුනරාවර්තන වියදම් / සිසුන් සංඛ්‍යාව	361,335.78
එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම් (CE)	ප්‍රාග්ධන වියදම් / සිසුන් සංඛ්‍යාව	23,977.84
එකතුව		**385,313.62**

ත්‍රිකුණාමල මණ්ඩපය

කාරණාව	සූත්‍රය	එක් සිසුවෙකු සඳහා වියදම (රු)
එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම් (RE)	පුනරාවර්තන වියදම් / සිසුන් සංඛ්‍යාව	202,170.15
එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම් (CE)	ප්‍රාග්ධන වියදම් / සිසුන් සංඛ්‍යාව	46,325.20
එකතුව		**248,495.35**

7.13 යටිතල පහසුකම් පිළිබඳ විස්තර (2022 දී ලද)

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

යටිතල පහසුකම් විස්තර	වියදම (රු.)	භෞතික ප්‍රගතිය
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ මහාචාර්ය ඒකකය සඳහා ගොඩනැගිලි සංකීර්ණයේ ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම	111,119,192.50	40.11%
සේවාදායක කාමරය / තො.තා.ස.ම. සහ කෘෂිකර්ම පීඨය සහ තාක්ෂණ පීඨය අතර ෆයිබර් කොඳු නාරටිය සැපයීම, ස්ථාපනය කිරීම, ආරම්භ කිරීම සහ දිගු කිරීම	17,010,732.00	100%
එකතුව		

7.14 මූල්‍ය ප්‍රකාශන – 2022

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ගිණුම් නිලධාරියාගේ සහතිකය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ත්‍රිකුණාමල මණ්ඩපය ඇතුළු ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් 2003 දෙසැම්බර් 19 නිකුත් කළ චක්‍රලේඛ අංක PED/19 මගින් දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව ඉතා සූක්ෂම ලෙස සකස් කර ඇත. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (i) සහ 107 (ii) (ආ) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිවලට අනුව 2004 ජනවාරි 25 දිනැති අංක 2/2004 දරන මුදල් චක්‍රලේඛයෙන් මෙම මාර්ගෝපදේශ පසුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්මත කරන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විස්තර කරන ලද මූල්‍ය නීති රීති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව ගනුදෙනුවල යෝග්‍යතාවය සහ වියදම්වල කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා පාලන ක්‍රමය 2022 වර්ෂයේදී සම්මත කර ඇත. මාගේ දැනුවත් භාවයට අනුව 2022 වර්ෂයට අදාළ ප්‍රකාශන සතුටුදායක ලෙස සකස් කර ඇති අතර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ප්‍රකාශ කරයි.

2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ආදායම සහ වියදම් පිළිවෙලින් රුපියල් **2,125,576,182** සහ රුපියල් **2,629,018,603** විය. ආදායමට වඩා වියදම රු. **(504,542,991)** ආදායමට වඩා වියදම් අතිරික්තය **2021** වර්ෂය හා සසඳන විට එය රු.**(244,038,580)** විය.

සමාලෝචිත වර්ෂය සඳහා සහ ඊට පෙර වර්ෂය සඳහා වන ආදායම සහ වියදම් පහත සාරාංශගත කර ඇත (ශිෂ්‍යයින්ට ලබා දුන් මූල්‍ය ආධාර හැර).

අයිතමය	දෙසැම්බර් 31 වන විට	
	2022	2021
	රුපියල්.	රුපියල්.
රජයේ ප්‍රදාන	1,999,800,000	1,901,900,000
වෙනත් ආදායම්	125,960,677	54,633,500
එකතුව	**2,125,760,677**	**1,956,533,500**
මුළු වියදම	2,629,477,657	2,200,572,080
ආදායමට වඩා වියදම් අධික වීම	**(503,716,980)**	**(244,038,580)**

2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් පිළිගෙන ඇති අතර 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 109 වැනි වගන්තිය ප්‍රකාරව 2023 ජනවාරි 20 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කර ඇත.



මහාචාර්‍ය වී. කනගසිංහම්,
ගිණුම් නිලධාරී,
උප කුලපති,
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය - (ඒකාබද්ධ)

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

	සටහන	2022	2021
මෙහෙයුම් ආදායම		රු.	රු.
පුනරාවර්තන ප්‍රදාන	4	1,999,800,000	1,901,900,000
වෙනත් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ ආදායම / (අලාභය).	5	30,005,153	10,218,525
වෙනත් ආදායම්	6	95,955,524	44,414,974
		2,125,760,677	1,956,533,500
සිසුන් සඳහා මූල්‍ය අනුග්‍රහය	7	120,800,900	90,920,200
		2,246,561,577	**2,047,453,700**
මෙහෙයුම් වියදම්			
පුද්ගලික වේතන	8	1,743,625,481	1,599,149,887
ගමන් වියදම්	9	476,831	267,520
සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	10	83,658,087	30,444,955
සුළු අලුත්වැඩියා සහ නඩත්තු	11	38,421,186	25,238,616
කොන්ත්‍රාත් සේවා	12	270,138,563	199,460,074
පර්යේෂණ හා සංවර්ධන	13	96,715	117,763
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	14	401,293,722	311,070,968
වෙනත් මෙහෙයුම් වියදම්	15	91,632,000	34,910,340
මුළු මෙහෙයුම් වියදම්		**2,629,342,584**	**2,200,660,123**
සිසුන් සඳහා මූල්‍යාධාර	16	120,800,900	90,920,200
වර්ෂය සඳහා සම්පූර්ණ ක්‍රියාකාරකම් වලින් ඌනතාවය		**(503,581,908)**	**(244,126,624)**
(කපා හරින ලද සහ අනෙකුත් ගැලපීම්)		(135,073)	88,044
වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය පොදු සංචිතයට මාරු කරන ලදී		**(503,716,980)**	(244.038,580)

නිවැරදි බව සහතික කිරීම



මහාචාර්‍ය වී. කනගසිංහම්,
ගිණුම් නිලධාරි,
උප කුලපති.



ඒ. බහිරදන් මහතා
සහකාර ගිණුම් නිළධාරි
ලේඛකාධිකාරි



එම්.එම්.එම්. ෆාරිස් මහතා
මූල්‍යාධිකාරි

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - (ඒකාබද්ධ) දෙසැම්බර් **31** වන දිනට

වත්කම්	සටහන	2022	2021
ජංගම නොවන වත්කම්		රු.	රු.
දේපළ, පිරියත හා උපකරණ	17	4,664,747,564	4,453,805,992
අස්පෘෂ්‍ය වත්කම්	18	27,540,140	24,644,397
ආයෝජන (දිගු කාලීන)	19	7,853,884	7,853,884
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	20	743,504,396	829,988,651
මුළු ජංගම නොවන වත්කම්		5,443,645,983	5,316,292,924
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛනය / තොග	21	10,832,965	9,499,140
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	22	455,463,867	423,554,641
ආයෝජන (කෙටි කාලීන)	23	304,202,634	101,027,621
මුදල් හා මුදල් සමාන දෑ	24	605,315,555	952,322,332
මුළු ජංගම වත්කම්		1,375,815,021	1,486,403,733
මුළු වත්කම්		6,819,461,004	6,802,696,657
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	25	127,996,314	112,665,299
උපචිත වියදම්	26	90,546,826	27,663,188
කෙටි කාලීන කල් බදු බැඳීම්	27	-	1,350,077
		218,543,140	141,678,564
ජංගම නොවන වගකීම්			
ගෙවිය යුතු දෑ	28	12,121,681	9,701,181
පාරිතෝෂික වෙන් කිරීම්	29	587,280,252	554,584,020
සීමිත අරමුදල්	30	334,711,947	254,775,815
පරිත්‍යාග සහ ප්‍රදාන	31	384,875	507,257
අනෙකුත් ප්‍රදාන	32	777,551,295	564,404,389
		1,712,050,049	1,367,011,662
මුළු ජංගම නොවන වගකීම්		1,930,593,189	1,492,817,322
සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන ප්‍රදාන)	33	7,863,077,358	7,793,070,841
ඇප බැඳීම් සංචිත	34	246,508,431	177,384,718
පොදු සංචිත	35	(3,575,661,039)	(3,069,944,880)
ප්‍රාග්ධන සංචිත	36	354,943,066	376,534,718
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්		4,888,867,815	5,277,045,396
මුළු වගකීම් / හිමිකම (යෙදවූ මුළු අරමුදල්)		6,819,461,004	6,802,696,657

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සහ **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **106** (i) සහ **107** (ii) (ආ) වගන්තිය හා **1971** අංක **38** දරන මුදල් පනතේ **13 (6)** වගන්තිය ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කර ඇත.

එම්.එම්.එම්.ෆාරිස් මහතා

මූල්‍යාධිකාරී

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීමේ වගකීම දරන අතර පාලක සභාව වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

මහාචාර්ය වී.කනගසිංහම්,
ගිණුම් නිලධාරී,
උප කුලපති.

පී. වී. ඒ. හසාන් මහතා
පාලක සභා සාමාජික

ඒ. බහිරදන් මහතා,
සහකාර ගිණුම් නිලධාරී,
ලේඛකාධිකාරී.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය - (නැගෙනහිර විශ්වවිද්‍යාලය සහ ත්‍රිකුණාමල මණ්ඩපය)

	දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා		
	ප්‍රධාන මධ්‍යස්ථානය	ත්‍රිකුණාමල මණ්ඩපය	එකතුව
මෙහෙයුම් ආදායම	රු.	රු.	රු.
පුනරාවර්තන ප්‍රදාන	1,625,400,000	374,400,000	1,999,800,000
වෙනත් ක්‍රියාකරකම් වලින් ලද ශුද්ධ ආදායම / අලාභය	29,503,119	502,034	30,005,153
වෙනත් ආදායම්	89,764,662	6,190,861	95,955,524
මුළු මෙහෙයුම් ආදායම	1,744,667,781	381,092,896	2,125,760,677
ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහය	94,704,900	26,096,000	120,800,900
	1,839,372,681	**407,188,896**	**2,246,561,577**
මෙහෙයුම් වියදම්			
පුද්ගලික වේතන	1,420,897,464	322,728,017	1,743,625,481
ගමන් වියදම්	350,417	126,414	476,831
සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය	66,450,294	17,207,793	83,658,087
සුළු අලුත්වැඩියා සහ නඩත්තු	27,651,601	10,769,586	38,421,186
කොන්ත්‍රාත් සේවා	181,737,734	88,400,829	270,138,563
පර්යේෂණ හා සංවර්ධන	96,715	-	96,715
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	274,106,649	127,187,073	401,293,722
වෙනත් මෙහෙයුම් වියදම්	78,205,673	13,426,327	91,632,000
මුළු මෙහෙයුම් වියදම්	**2,049,496,547**	**579,846,038**	**2,629,342,584**
ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහය	94,704,900	26,096,000	120,800,900
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ඌනතාවය	**(304,828,765)**	**(198,753,142)**	**(503,581,908)**
අති විශේෂ අයිතම			
(කපා හරින ලද සහ අනෙකුත් ගැලපීම්)	(135,073)	-	(135,073)
වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය පොදු සංචිතයට මාරු කරන ලදී	**(304,963,838)**	**(198,753,142)**	**(503,716,980)**

නිවැරදි බව සහතික කිරීම

මහාචාර්‍ය වී. කනගසිංහම්,	ඒ. බහිරදන් මහතා	එම්.එම්.එම්. ෆාරිස් මහතා
ගිණුම් නිලධාරි,	සහකාර ගිණුම් නිළධාරි	මූල්‍යාධිකාරි
උප කුලපති.	ලේඛකාධිකාරි	

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - (නැගෙනහිර විශ්වවිද්‍යාලය සහ ත්‍රිකුණාමල මණ්ඩපය)

දෙසැම්බර් **31** වන දිනට

	ප්‍රධාන මධ්‍යස්ථානය	ත්‍රිකුණාමල මණ්ඩපය	එකතුව
වත්කම්	රු.	රු.	රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	2,938,461,883	1,726,285,680	4,664,747,563
අස්පෘෂ්‍ය වත්කම්	25,958,636	1,581,504	27,540,140
ආයෝජන (දිගු කාලීන)	7,853,884	-	7,853,884
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	29,693,509	713,810,887	743,504,396
මුළු ජංගම නොවන වත්කම්	**3,001,967,912**	**2,441,678,072**	**5,443,645,982**
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛනය / තොග	7,571,722	3,261,243	**10,832,965**
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	333,259,622	122,204,245	**455,463,867**
ආයෝජන (කෙටි කාලීන)	304,202,634	-	**304,202,634**
මුදල් හා මුදල් සමාන දෑ	537,235,593	68,079,962	**605,315,555**
මුළු ජංගම වත්කම්	**1,182,269,571**	**193,545,450**	**1,375,815,021**
මුළු වත්කම්	**4,184,237,483**	**2,635,223,521**	**6,819,461,003**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	66,717,279	61,279,036	127,996,314
උපචිත වියදම්	65,504,762	25,042,063	90,546,826
මුළු ජංගම වගකීම්	**132,222,041**	**86,321,099**	**218,543,140**
ජංගම නොවන වගකීම්			
ගෙවිය යුතු දෑ	11,635,812	485,869	12,121,681
පාරිතෝෂික වෙන් කිරීම්	513,790,136	73,490,115	587,280,252
සීමිත අරමුදල්	325,643,473	9,068,474	334,711,947
පරිත්‍යාග හා ප්‍රදාන	162,504	222,371	384,875
වෙනත් ප්‍රදාන	330,838,740	446,712,554	777,551,295
මුළු ජංගම නොවන වගකීම්	**1,182,070,665**	**529,979,383**	**1,712,050,049**
මුළු වගකීම්	**1,314,292,707**	**616,300,482**	**1,930,593,189**

මුළු ශුද්ධ වත්කම්	2,869,944,775	2,018,923,039	4,888,867,814
සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන ප්‍රදාන)	5,017,148,081	2,845,929,276	7,863,077,358
ඇප බැඳීම් සංචිත	235,895,962	10,612,469	246,508,431
පොදු සංචිත	(2,716,925,510)	(858,735,530)	(3,575,661,039)
ප්‍රාග්ධන සංචිත	333,826,243	21,116,823	354,943,066
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්	2,869,944,777	2,018,923,039	4,888,867,815
මුළු වගකීම් / හිමිකම් (යෙදවූ මුළු අරමුදල්)	4,184,237,483	2,635,223,521	6,819,461,004

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (i) සහ 107 (ii) (ආ) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කර ඇත.

එම්.එම්.එම්.ෆාරිස් මහතා
මූල්‍යාධිකාරී

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීමේ වගකීම දරන අතර පාලක සභාව වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

මහාචාර්ය වී.කනගසිංහම්
ගිණුම් නිලධාරී,
උප කුලපති.

පී.ටී.ඒ. හසාන්
පාලක සභා සාමාජික

ඒ. බහිරදන් මහතා,
සහකාර ගිණුම් නිලධාරී,
ලේඛකාධිකාරී.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය - නැගෙනහිර විශ්වවිද්‍යාලය , ප්‍රධාන මධ්‍යස්ථානය

දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා

	සටහන	2022	2021
මෙහෙයුම් ආදායම		රු.	රු.
පුනරාවර්තන ප්‍රදාන	4	1,625,400,000	1,513,500,000
වෙනත් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ ආදායම / (අලාභය).	5	29,503,119	7,719,875
වෙනත් ආදායම්	6	89,764,662	38,174,399
මුළු මෙහෙයුම් ආදායම		1,744,667,781	1,559,394,274
සිසුන් සඳහා මූල්‍ය අනුග්‍රහය	7	94,704,900	64,816,200
		1,839,372,681	**1,624,210,474**
මෙහෙයුම් වියදම්			
පුද්ගලික වේතන	8	1,420,897,464	1,308,847,689
ගමන් වියදම්	9	350,417	160,235
සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	10	66,450,294	24,351,059
සුළු අලුත්වැඩියා සහ නඩත්තු	11	27,651,601	19,589,711
කොන්ත්‍රාත් සේවා	12	181,737,734	151,059,588
පර්යේෂණ හා සංවර්ධන	13	96,715	117,763
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	14	274,106,649	197,146,862
වෙනත් මෙහෙයුම් වියදම්	15	78,205,673	30,073,246
මුළු මෙහෙයුම් වියදම්		**2,049,496,547**	**1,731,346,153**
සිසුන් සඳහා මූල්‍ය අනුග්‍රහය	16	94,704,900	64,816,200
වර්ෂය සඳහා සම්පූර්ණ ක්‍රියාකාරකම් වලින් ඌනතාවය		**(304,828,765)**	**(171,951,879)**
(කපා හරින ලද සහ අනෙකුත් ගැලපීම්)		(135,073)	88,044
වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය පොදු සංචිතයට මාරු කරන ලදී.		**(304,963,838)**	**(171,863,836)**

නිවැරදි බව සහතික කිරීම.

මහාචාර්‍ය වී. කනගසිංහම්,	ඒ. බණිරදන් මහතා	එම්.එම්.එම්. ෆාරිස් මහතා
ගිණුම් නිලධාරි,	සහකාර ගිණුම් නිළධාරි	මූල්‍යාධිකාරි
උප කුලපති.	ලේඛකාධිකාරි	

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - නැගෙනහිර විශ්වවිද්‍යාලය , ප්‍රධාන මධ්‍යස්ථානය

		දෙසැම්බර් **31** වන දිනට	
	සටහන	2022	2021
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	17	2,938,461,883	2,655,525,156
අස්පෘෂ්‍ය වත්කම්	18	25,958,636	21,534,223
ආයෝජන (දිගු කාලීන)	19	7,853,884	7,853,884
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	20	29,693,509	227,586,401
මුළු ජංගම නොවන වත්කම්		**3,001,967,912**	**2,912,499,664**
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛනය / තොග	21	7,571,722	8,024,429
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	22	333,259,622	289,501,562
ආයෝජන (කෙටි කාලීන)	23	304,202,634	101,027,621
මුදල් හා මුදල් සමාන දෑ	24	537,235,593	795,972,068
මුළු ජංගම වත්කම්		**1,182,269,571**	**1,194,525,680**
මුළු වත්කම්		**4,184,237,483**	**4,107,025,345**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	25	66,717,279	64,309,480
උපචිත වියදම්	26	65,504,762	24,258,084
කෙටි කාලීන කල්බදු බැඳීම්	27	-	1,350,077
මුළු ජංගම වගකීම්		**132,222,041**	**89,917,641**
ජංගම නොවන වගකීම්			
ගෙවිය යුතු දෑ	28	11,635,812	9,215,312
පාරිතෝෂික වෙන් කිරීම්	29	513,790,136	495,821,068
සීමිත අරමුදල්	30	325,643,473	246,322,785
පරිත්‍යාග හා ප්‍රදාන	31	162,504	284,886
වෙනත් ප්‍රදාන	32	330,838,740	136,692,112

මුළු ජංගම නොවන වගකීම්		1,182,070,665	888,336,163
මුළු වගකීම්		1,314,292,707	978,253,804
මුළු ශුද්ධ වත්කම්		2,869,944,775	3,128,771,541
සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන ප්‍රදාන)	33	5,017,148,081	5,017,141,564
ඇප බැඳීම් සංචිත	34	235,895,962	166,772,249
පොදු සංචිත	35	(2,716,925,510)	(2,410,560,167)
ප්‍රාග්ධන සංචිත	36	333,826,243	355,417,895
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්		2,869,944,777	3,128,771,540
මුළු වගකීම් / හිමිකම් (යෙදවූ මුළු අරමුදල්)		4,184,237,483	4,107,025,344

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (i) සහ 107 (ii) (ආ) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කර ඇත.

එම්.එම්.එම්.ෆාරිස් මහතා
මූල්‍යාධිකාරී

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීමේ වගකීම දරන අතර පාලක සභාව වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

මහාචාර්ය වී.කනගසිංහම්
ගිණුම් නිලධාරි,
උප කුලපති.

ඒ. බහිරදන් මහතා,
සහකාර ගිණුම් නිලධාරි,
ලේඛකාධිකාරී.

පී.ටී.ඒ. හසාන්
පාලක සභා සාමාජික

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය - ත්‍රිකුණාමල මණ්ඩපය

		දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා	
	සටහන	2022	2021
		රු.	රු.
මෙහෙයුම් ආදායම			
පුනරාවර්තන ප්‍රදාන	4	374,400,000	388,400,000
වෙනත් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ ආදායම / (අලාභය).	5	502,034	2,498,650
වෙනත් ආදායම්	6	6,190,861	6,240,575
මුළු මෙහෙයුම් ආදායම		381,092,896	397,139,225
සිසුන් සඳහා මූල්‍ය අනුග්‍රහය	7	26,096,000	26,104,000
		407,188,896	**423,243,225**
මෙහෙයුම් වියදම්			
පුද්ගලික චේතන	8	322,728,017	290,302,198
ගමන් වියදම්	9	126,414	107,286
සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	10	17,207,793	6,093,896
සුළු අලුත්වැඩියා සහ නඩත්තු	11	10,769,586	5,648,905
කොන්ත්‍රාත් සේවා	12	88,400,829	48,400,486
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	13	127,187,073	113,924,106
වෙනත් මෙහෙයුම් වියදම්	14	13,426,327	4,837,094
මුළු මෙහෙයුම් වියදම්		**579,846,038**	**469,313,970**
සිසුන් සඳහා මූල්‍ය අනුග්‍රහය	**15**	26,096,000	26,104,000
වර්ෂය සඳහා සම්පූර්ණ ක්‍රියාකාරකම් වලින් ඌනතාවය		**(198,753,142)**	**(72,174,745)**
වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය පොදු සංචිතයට මාරු කරන ලදී.		**(198,753,142)**	**(72,174,745)**

නිවැරදි බව සහතික කිරීම

මහාචාර්‍ය වී. කනගසිංහම්,	ඒ. බහිරදන් මහතා	එම්.එම්.එම්. ෆාරිස් මහතා
ගිණුම් නිලධාරි,	සහකාර ගිණුම් නිළධාරි	මූල්‍යාධිකාරි
උප කුලපති.	ලේඛකාධිකාරි	

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ත්‍රිකුණාමල මණ්ඩපය

		දෙසැම්බර් 31 වන දිනට	
වත්කම්	සටහන	2022	2021
ජංගම නොවන වත්කම්		Rs.	Rs.
දේපළ, පිරියත හා උපකරණ	17	1,726,285,680	1,798,280,836
අස්පෘෂ්‍ය වත්කම්	18	1,581,504	3,110,174
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	20	713,810,887	602,402,249
මුළු ජංගම නොවන වත්කම්		**2,441,678,072**	**2,403,793,259**
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛනය / තොග	21	3,261,243	1,474,711
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	22	122,204,245	134,053,078
මුදල් හා මුදල් සමාන දෑ	24	68,079,962	156,350,263
මුළු ජංගම වත්කම්		**193,545,450**	**291,878,053**
මුළු වත්කම්		**2,635,223,521**	**2,695,671,312**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	25	61,279,036	48,355,820
උපචිත වියදම්	26	25,042,063	3,405,103
මුළු ජංගම වගකීම්		**86,321,099**	**51,760,923**
ජංගම නොවන වගකීම්			
ගෙවිය යුතු දෑ	28	485,869	485,869
පාරිතෝෂික වෙන් කිරීම්	29	73,490,115	58,762,952
සීමිත අරමුදල්	30	9,068,474	8,453,066
පරිත්‍යාග හා ප්‍රදාන	31	222,371	222,371
වෙනත් ප්‍රදාන	32	446,712,554	427,712,277
මුළු ජංගම නොවන වගකීම්		**529,979,383**	**495,636,534**
මුළු වගකීම්		**616,300,482**	**547,397,457**

මුළු ශුද්ධ වත්කම් / හිමිකම්		2,018,923,039	2,148,273,855
සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන ප්‍රදාන)	33	2,845,929,276	2,775,929,276
ඇප බැඳීම් සංචිත	34	10,612,469	10,612,469
පොදු සංචිත	35	(858,735,530)	(659,384,713)
ප්‍රාග්ධන සංචිත	36	21,116,823	21,116,823
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්		2,018,923,039	2,148,273,855
මුළු වගකීම් / හිමිකම්		2,635,223,521	2,695,671,312

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (i) සහ 107 (ii) (ආ) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කර ඇත.

එම්.එම්.එම්.ෆාරිස් මහතා

මූල්‍යාධිකාරි

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීමේ වගකීම දරන අතර පාලක සභාව වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

මහාචාර්ය වී.කනගසිංහම්
ගිණුම් නිලධාරි,
උප කුලපති.

ඒ. බහිරදන් මහතා,
සහකාර ගිණුම් නිලධාරි,
ලේඛකාධිකාරි.

පී.ටී.ඒ. හසාන්
පාලක සභා සාමාජික

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය (ඒකාබද්ධ)

	දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	
	2022	2021
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් අතිරික්තය / (ඌනතාවය)	(503,716,980)	(244,038,580)
මූල්‍ය නොවන ප්‍රවාහයන්		
ක්ෂය	377,448,360	404,266,241
ක්‍රමක්ෂය	(46,066,404)	(121,844,042)
පූර්ව වර්ෂ ගැලපීම	28,005,974	(15,203,936)
පාරිතෝෂික වෙන් කිරීම	71,104,045	51,982,829
කල්බදු වාහන මත මූල්‍ය පිරිවැය	262,799	963,882
පොලී ආදායම්	(1,392,560)	(1,937,935)
තොග වැඩි වීම් / අඩු වීම්	(1,333,825)	(1,477,744)
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වල වැඩි වීම් / අඩු වීම්	(31,909,226)	17,976,804
ගෙවිය යුතු දෑ වල වැඩි වීම් / අඩු වීම්	15,331,015	2,360,296
උපචිත වියදම් වල වැඩි වීම් / අඩු වීම්	62,883,638	6,648,265
ගෙවූ පාරිතෝෂික.	(38,407,813)	(23,334,060)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ලැබීම්	(67,790,977)	76,362,021
ආයෝජන ක්‍රියාකාරකම් වල මුදල් ප්‍රවාහය		
දේපළ , පිරියත හා උපකරණ මිලදී ගැනීම්	(588,389,931)	(124,011,655)
කෙරිගෙන යන වැඩ	86,484,255	(169,292,648)
අස්පෘශ්‍ය වත්කම්	(9,334,698)	(1,972,076)
ලද පොළී	1,392,560	1,937,935
ආයෝජන	(203,175,013)	(4,793,065)
ආයෝජන ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය	(713,022,827)	(298,131,509)
මූල්‍ය ක්‍රියාකාරකම් වල මුදල් ප්‍රවාහය		
සීමිත අරමුදල් හා ප්‍රදාන	432,999,404	451,148,620
ශුද්ධ දිගු කාලීන බැඳීම්	2,420,500	10,134,441
කල්බදු වාහන මත මූල්‍ය පිරිවැය	(1,612,876)	(963,882)
මූල්‍ය ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය	433,807,028	460,319,179
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම / අඩු වීම	(347,006,776)	238,549,690
කාල පරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	952,322,332	713,772,644
කාල පරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	605,315,556	952,322,334

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

විස්තරය	සමුච්චිත අරමුදල	ඇප බැඳීම් සංචිතය	පොදු සංචිතය	වෙනත් සංචිත	එකතුව
2020 දෙසැම්බර් වලට ශේෂය	7,472,445,758	167,635,871	(2,833,640,149)	375,149,928	5,181,591,409
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)	-	-	(244,038,580)	-	(244,038,540)
වෙනත් ගැලපීම්	-	-	17,952,374	-	17,952,374
සංචිත වල වැඩිවීම් / අඩු වීම්	-	9,748,847	(10,218,525)	1,384,790	915,112
අතිරේක දායකත්වය	337,586,118	-	-	-	337,586,118
2021 දෙසැම්බර් වනවිට ශේෂය	**7,810,031,876**	**177,384,718**	**(3,069,944,880)**	**376,534,718**	**5,294,006,433**
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)	-	-	(503,716,980)	-	(503,716,980)
වෙනත් ගැලපීම්	-	-	27,503,940	-	27,503,940
සංචිත වල වැඩිවීම් / අඩු වීම්	-	69,123,714	(29,503,119)	(21,591,652)	18,028,943
අතිරේක දායකත්වය	53,045,481	-	-	-	53,045,481
2022 දෙසැම්බර් වනවිට ශේෂය	**7,863,077,358**	**246,508,432**	**(3,575,661,039)**	**354,943,066**	**4,888,867,817**

7.14.1 මූල්‍ය සටහන්

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. <u>ආයතනික තොරතුරු</u>

1.1. පිහිටීම හා නෛතික තත්වය

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය,1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ 1986 ඔක්තෝම්බර් 01 දින සිට සංස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර එය මඩකලපුවේ වන්දාරුමූලෙහි පිහිටා ඇත.මෙම විශ්වවිද්‍යාලය 1981 අගෝස්තු 01 දින ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාල විද්‍යායතනය තව දුරටත් ඉදිරියට ගෙන යාමකි.

1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කාර්යයන් වන්නේ උසස් ඉගෙනුම් හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම යන ජාතික ප්‍රතිපත්තිය අනුව ගමන් කිරීම සඳහා සිසුන්ට අවශ්‍ය උසස් ඉගෙනුම් පහසුකම් සපයා දීම වේ.

1.3. ත්‍රිකුණාමල මණ්ඩපය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් 1993 අප්‍රේල් මස 1993 අංක 1 දරන ආඥාපනත යටතේ පිහිටුවන ලද ත්‍රිකුණාමලය අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යාලය (AUC) 2001.06.15 දින සිට බලපැවැත්වෙන පරිදි 2001.06.06 දිනැති ගැසට් නිවේදනය මගින් නැගෙනහිර විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ කරන ලදී. ත්‍රිකුණාමල මණ්ඩපයේ මූල්‍ය කළමනාකාරිත්වය නැගෙනහිර විශ්වවිද්‍යාලය යටතේ පවතී. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් සෘජුවම ත්‍රිකුණාමල මණ්ඩපයට නිකුත් කරනු ලබයි. ත්‍රිකුණාමල මණ්ඩපයේ මූල්‍ය ගනුදෙනු ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ගිණුම්වලට ඇතුළත් කර ඇත.

1.4. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2022 දෙසැම්බර් 31 දින අවසන් වන වර්ෂය සඳහා එදිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රධාන විශ්ව විද්‍යාලය හා ත්‍රිකුණාමල මණ්ඩපය යන දෙකෙන්ම සමන්විත වේ.

1.5. නිකුත් කිරීම සඳහා අවසරය ලබා දුන් දිනය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ලබා දීම සඳහා අවශ්‍ය අනුමැතිය 2023 මාර්තු 25 දින පැවති 332 වන පාලක සභා රැස්වීම මගින් ලබා දී ඇත.

1.6. මූල්‍ය කාලපරිච්ඡේදය

විශ්ව විද්‍යාලයේ මූල්‍ය කාල පරිච්ඡේදය මාස 12 කින් සමන්විත වන අතර එය 2022 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා වේ.

1.7. මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනවලට 2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැය එදිරිව සත්‍ය ප්‍රමාණය හා සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් ඇතුළත් වේ.

2. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

2.1. අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට **(SLPSAS)** අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, සාධාරණ ඉදිරිපත් කිරීමක් සහතික කිරීම සඳහා පොදු ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති අවස්ථාවලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් **(LKAS)** සම්මත කර ඇත.

2.1.1. අගය කිරීමේ පදනම

ඓතිහාසික පිරිවැය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.1.2. සංඝන්දනාත්මක තොරතුරු

මෙම කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන තේරුම් ගැනීම හා සංඝන්දනය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණාත්මක , සාරාංශගත හා විස්තරාත්මක තොරතුරු ඇතුලත්ව පෙර වර්ෂ වලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියළුම වටිනාකම් සඳහා සංඝන්දනාත්මක වටිනාකම් හෙලිදරව් කර ඇත. අවශ්‍ය අවස්ථාවන්හිදී මෙම වර්ෂයේ ඉදිරිපත් කිරීම් සඳහා අනුකූල වන පරිදි සංඝන්දනාත්මක වටිනාකම් නැවත ඉදිරිපත් කර ඇත.

2.1.3. මෙහෙයුම් හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

විශ්ව විද්‍යාලය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මෙහෙයුම් හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (රු) වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. වෙනත් අයුරකින් සඳහන් කර ඇති අවස්ථාවලදී හැර ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියළුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට ඉදිරිපත් කර ඇත.

2.1.4. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු පරිවර්තනය කිරීම

ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් ව්‍යවහාර මුදලින් සිදු කරනු ලබන ගනුදෙනු , ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති සත්‍ය විනිමය අනුපාතිකය මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ. වාර්තා කරන දිනට විදේශ ව්‍යවහාර මුදලින් පෙන්නුම් කරන ලබන මූල්‍ය වත්කම් (සුරැකුම් පත්ද ඇතුළුව) හා වගකීම් එදිනට පවත්නා විනිමය ඝුවමාරු අනුපාතය මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් ඓතිහාසික පිරිවැයට පෙන්නුම් කරනු ලබන මූල්‍ය නොවන වත්කම් හා වගකීම් ගනුදෙනුව සිදුවූ දිනට පැවති විදේශ ව්‍යවහාර විනිමය මුදල් ඝුවමාරු අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. උප ලබ්ධි වූ හා උපලබ්ධි නොවූ විනිමය වෙනස මූල්‍ය කාර්‍ය සාධන ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ.

2.1.5. අඛණ්ඩභාවය

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින් විශ්ව විද්‍යාලය පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇති අතර, එහි මෙහෙයුම් දිගටම කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් විශ්වවිද්‍යාලය සතු බවට වගකීම් සහගත අපේක්ෂාවක් ඇත.
අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින් මෙහෙයුම් දියකර හැරීම හෝ නැවැත්වීම සඳහා කවුන්සිලය අපේක්ෂා නොකරයි. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින් සිදු කෙරෙමින් පවතින මෙහෙයුම් ඇවර කිරීම හෝ නැවැත්වීම සඳහා පාලක සභාව අපේක්ෂා නොකරයි. එබැවින්, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී විශ්ව විද්‍යාලය අඛණ්ඩභාවය පිළිබඳ සැලකිල්ලක් දක්වයි.

2.1.6. ජංගම හා ජංගම නොවන වර්ගීකරණය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට **(SLPAS)** අනුව ජංගම / ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරයි.

2.1.7. භෞතිකමය හා ඒක රාශි කිරීම

සමාන අයිතමවල සෑම ද්‍රව්‍යමය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ශ්‍රිතයක අයිතම හෝ ඒවා ද්‍රව්‍යමය නොවන නම් හැර වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

2.1.8. හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට **(SLPSAS)** අනුව අවශ්‍ය හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් පියවා නැත.

3. සම්මත ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

3.1. සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ SLPSAS අනුව අනුවර්තනය

ශ්‍රී ලංකාවේ ගෞරවනීය වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉතා සූක්ෂම ලෙස සකස් කර ඇත. SLPSAS කිසිදු ප්‍රමිතියක් ලබා නොදෙන අවස්ථා වලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/SLFRSs) සහ ජාත්‍යන්තර රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (IPSASs) වලට අනුකූලව නීති රීති පිළිපැද ඇත. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2003 දෙසැම්බර් 19 වැනි දින චක්‍රලේඛ අංක: PED/19 හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘතිවලින් හා පසුව අවශ්‍ය පරිදි වෙනස්කම් සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මුදල් චක්‍රලේඛ අංක: 2004 ජනවාරි 23 දින 2/2004 ඉදිරිපත් කර ඇති ආකෘතිවලට අනුව පිළියෙළ කර ඇත.

3.2. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදාගත් ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම පරිච්ඡේද සඳහා අඛණ්ඩව යෙදී ඇත.

3.3. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරීත්වය විසින් මුදල් වර්ෂය අවසානයේ දී ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ අවිනිශ්චිත වත්කම්, අවිනිශ්චිත වගකීම් පිළිබඳ හෙළිදරව් කිරීම්වලට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ.

3.4. වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

3.4.1. දේපළ පිරියත හා උපකරණ

i. හඳුනා ගැනීම හා තක්සේරුව

සියළුම දේපළ පිරියත හා උපකරණ ආරම්භයේදී ඒවා පිරිවැයෙන්, සමුච්චිත ක්ෂය හා අපහායන පාඩු අඩු කළ වටිනාකමට පෙන්නුම් කරනු ලැබේ. වත්කම් වල ප්‍රධාන උපාංග වෙන වෙනම හඳුනාගෙන ක්ෂය කිරීමට කටයුතු කර ඇත. දේපළ, පිරියත හා උපකරණ වල සැලකිය යුතු උපාංග ප්‍රතිෂ්ඨාපනය කරන උපාංගයෙන් වටිනාකම හඳුනාගෙන එහි ඵලදායී ජීව කාලය සැලකිල්ලට ගෙන ක්ෂය කිරීම් කරනු ලැබේ.

ii. පිරිවැය

දේපළ පිරියත හා උපකරණ , එහි ගැනුම් මිල හා අදාළ වත්කම අපේක්ෂිත කාර්යය සඳහා ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම දක්වා දැරූ සෘජු පිරිවැයෙන් සමන්විත වේ.
දේපළ, පිරියත හා උපකරණ එහි දෛනික සේවා පිරිවැය හැර ඒවායේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත අපහායන පිරිවැය අඩු කළ පිරිවැයට පෙන්නුම් කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල කොටසක් ප්‍රතිෂ්ඨාපනය කරන අවස්ථාවන්හිදී අදාළ කොටස් වල පිරිවැය, පිරිවැය හඳුනා ගැනීමේ නිර්ණායක සමඟ එකඟ වේ නම් අදාළ පිරිවැය දැනුම් අවස්ථාවේදීම වත්කමේ පිරිවැය හඳුනා ගනු ලැබේ.

iii. එකතු කිරීම්

අයිතමය හා බැඳුනු ආර්ථික ප්‍රතිඵල අනාගතයේදී විශ්ව විද්‍යාලය තුළට ගලා ඒමේ භව්‍යතාවයක් තිබේ නම් සහ එම පිරිවැය විශ්වාසදායීව මැනිය හැකි නම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක පිරිවැය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. බොහෝ අවස්ථාවන්හිදී දේපළ, පිරියත හා උපකරණ එහි පිරිවැයට හඳුනා ගනු ලැබේ. කිසියම් වත්කමක් පරිත්‍යාගයක් ලෙස ලැබුණේ නම් අදාළ වත්කම අත්පත් කර ගත් දිනයට පැවති සාධාරණ අගයට හඳුනා ගනු ලැබේ.

iv. ඉවත් කිරීම

අපහරනය කිරීම තුළින් ලද ශුද්ධ ලැබීම් , වත්කමේ ධාරණ අගය සමඟ සංසන්දනය කර අපහරණය කිරීම තුළින් ලද ලාභ හෝ අලාභ නිර්ණය කරනු ලබන අතර එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ.

v. පසුව දරන පිරිවැය

අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්ව විද්‍යාලයට ගලා ඒමේ හෝ අයිතමයේ සේවා සැපයීමේ ධාරිතාවය වැඩි වීමේ සම්භාවිතාවයක් පවතී නම් සහ අයිතමයේ පිරිවැය නිවැරදි ලෙස මැනිය හැකි නම් වත්කම් අත්පත් කර ගැනීමේදී දරන පිරිවැයට පසුව දරන පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණවල උපාංගයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා දරන පිරිවැය ඒවායේ මූලික පරීක්ෂා කිරීමේ වියදම් හා අලුත්වැඩියා කිරීමේ වියදම්ද ඇතුළත්ව ප්‍රාග්ධනිත කෙරේ. අනෙකුත් පසුව දරනු ලබන වියදම් අදාළ උපාංගය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්ව විද්‍යාලය තුළට ගලා ඒමේ හැකියාවක් පවතී නම් හා එම පිරිවැය විශ්වාසදායීව මැනිය හැකි නම් ප්‍රාග්ධනිත කරනු ලැබේ.

vi. දේපළ, පිරියත හා උපකරණවල ක්ෂය කිරීම්

ඉඩම් හැර අනෙකුත් දේපළ, පිරියත හා උපකරණවල මාර්ග ක්‍රමය යටතේ එහි ඒලදායී ජීවිත කාලය තුළ ක්ෂය කරනු ලැබේ. **1995** ඔක්තෝම්බර් **05** දිනැති අංක **649** දරන් ව්.ව්.ප්‍ර. කොා.ස. චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් ඒවායේ පිරිවැය මත පහත අනුපාත යටතේ ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

ගොඩනැගිලි	**5%**
කාර්යාල ලී බඩු	**10%**
යන්ත්‍ර හා පිරියත	**10%**
කාර්යාල උපකරණ	**20%**
පොත් හා වාර සඟරා	**20%**
වාහන	**20%**
උපාධි ලෝගු	**20%**
දුරකථන	**20%**
පරිගණක උපකරණ/උපාංග	**20%**
පරිගණක මෘදුකාංග	**20%**
උත්පාදක සහ බල සැපයුම් පද්ධතිය	**10%**
ක්‍රීඩා උපකරණ/ ආම්පන්න	**25%**

විශ්ව විද්‍යාලයේ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියට අනුව, වත්කම් ක්ෂය කිරීම ආරම්භ වන්නේ කිසියම් වත්කමක් අදාල අපේක්ෂිත කාර්යයට සුදුසු තත්වයට පත්වූ පසුව වේ. එනම් අදාල වත්කම කළමනාකරණය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියාත්මක කිරීමේ තත්වයට සහ ස්ථානයට පත් කිරීම දක්වා වේ. වත්කමක් ඉවත් කරන අවස්ථාවේදී අදාළ වත්කම ක්ෂය කිරීම අවසන් කරනු ලැබේ.

vii. ඉවත් කිරීම

වත්කමක් ඉවත් කිරීමේදී හෝ අදාල වත්කම භාවිතයෙන් හෝ අපහරණය කිරීමෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන අවස්ථාවලදී අදාල වත්කම හඳුනා ගනු නොලැබේ. වත්කමක් ඉවත් කිරීමෙන් ලැබෙන ශුද්ධ ලැබීම් හා වත්කමේ ධාරණ අගය අතර වෙනස ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය ලෙස හඳනා ගන්නා අතර එම ලාභය හෝ අලාභය වත්කම ඉවත් කිරීම සිදුවූ වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්නුම් කරයි.

3.4.2. කෙරීගෙන යන වැඩ

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැයෙන් කිසියම් අපහායන පාඩුවක් වෙතොත් එය අඩුකර පෙන්නුම් කරනු ලැබේ. මේවා ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වන අතර දේපළ, පිරියත හා උපකරණ ඉදි කිරීම් වෙනුවෙන් සෘජුවම දරනු ලබන අතර ප්‍රාග්ධනිත කිරීම සඳහා අපේක්ෂාවෙන් පවතින ඒවායේ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ වත්කම් කාණ්ඩය සඳහා ඒවා භාවිතයට යෝග්‍ය අවස්ථාවට පත්වන විට මාරු කරනු ලැබේ. එනම් අදාළ වත්කම් විශ්ව විද්‍යාලය ක්‍රියාත්මක වීමට අපේක්ෂිත තත්වයට හා ස්ථානයට ළඟා වූ විට වේ.

3.4.3. අස්පෘශ්‍ය වත්කම්

i. හඳුනා ගැනීම හා මිනුම්කරණය

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒ නම් හා වත්කමේ පිරිවැය විශ්වාසදායීව මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනු ලැබේ. වෙන වෙනම අත්පත් කරගනු ලබන මුල් අවස්ථාවේදී පිරිවැයට හඳනා ගනු ලැබේ.
මුල් හඳුනාගැනීමෙන් පසුව , පිරිවැය ආකෘතිය අනුගමනය කරන අවස්ථාවලදී, වත්කම් ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත අපහායන පාඩු අඩු කල වටිනාකාමට පවත්වාගෙන යනු ලැබේ.

ii. ක්‍රමක්ෂය

නිශ්චිත ජීවකාලයකින් යුතු සියළුම අස්පෘශ්‍ය වත්කම් සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් එහි පිරිවැය මත අදාල අනුපාතයට හෝ ඵලදායී ජීවිත කාලයට ක්ෂය කරනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම් පහත පරිදි පදනම් යටතේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

- ස්ථාවර වත්කම්, මෘදුකාංග සරල මාර්ග ක්‍රමයට වර්ෂ පහක කාලයක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.
- පරිගණක මෘදුකාංග සහ අනෙකුත් අස්පෘශ වත්කම් සරලා මාර්ග ක්‍රමය යටතේ වර්ෂ පහක කාලයක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

iii. ඉවත් කිරීම

අස්පෘශ්‍ය වත්කම් ඉවත්කිරීමට අදාල ලාභ හෝ පාඩු අදාල වත්කම ඉවත්කිරීම තුළින් ලද ශුද්ධ ලැබීම් හා අදාළ වත්කමේ ධාරණ අගය අතර වෙනස මගින් ගණනය කරන අතර එය වත්කම් ඉවත් කරන අවස්ථාවේදී මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලබයි.

3.4.4. තොග

මූලික හඳුනා ගැනීමේදී තොග පිරිවැයට අගය කරනු ලැබේ. මුදල් හුවමාරු නොවන ගනුදෙනුවක් තුළින් තොග ලැබෙන අවස්ථාවක, තොගයේ පිරිවැය වනුයේ අත්පත් කර ගත් දිනට තොගයේ සාධරණ වටිනාකම වේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, තොග ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (ප්‍ර.ලැ.ප්‍ර.නි) ක්‍රමය යටතේ ගණනය කරනු ලබන අතර අධ්‍යයන / පරිපාලන අංශවල ඉතිරි වී ඇති තොගය තොග ගණනයේදී සැලකිල්ලට ගනු නොලැබේ.

තොග පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 21 හි දක්වා ඇත.

3.4.5. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ ලෙස අතැති මුදල් , බැංකුවේ ඇති මුදල් , ඇමතුම මත තැන්පතු සහ මාස 03 ක් හෝ හෝ ඊට වඩා අඩු කල්පිරීමේ කාලයක් සහිත ඉතා ඉහළ ද්‍රවශීල ආයෝජන යනාදියෙන් සමන්විත වන අතර මේවා පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි අතරම වටිනාකම වෙනස්වීමේ සුළු අවදානමක් පමණක් හැකි අතර වටිනාකම වෙනස්වීමේ සුළු අවදානමක් පමණක් පවතී.

වක්‍ර ක්‍රමය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී බැංකු අයිරාව , මුදල් හා මුදල් සමාන දෑ වල කොටසක් ලෙස ඇතුලත් කරනු ලැබේ.

3.4.6. වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති SLPSAS 1 අනුව ඇස්තමේන්තුගත මුදලෙහි දක්වා ඇති පරිදි වාර්තා කළ දිනට පසු මාස දොළහක් ඇතුළත ලැබිය යුතු වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු අයහපත් සහ සැක සහිත ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සපයා නොමැත.

3.5. වගකීම් සහ වෙන්කිරීම්

3.5.1. වගකීම්

ඉල්ලන ඕනෑම අවස්ථාවක ගෙවිය යුතු හෝ වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් ඇතුළත ගෙවා නිදහස් කලයුතු ශේෂයන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ ජංගම නොවන වගකීම් වනුයේ වාර්තා කරන දිනයේ සිට වර්ෂයක කාලයකට පසුව ගෙවිය යුතු ශේෂයන් වේ. දන්නා සියලු වගකීම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගිණුම් ගත කර ඇත.

3.5.2. වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට දෙනිකව හෝ සම්මුතිකව බැඳීමක් පවතින විට එම බැඳීම නිරාකරණය කිරීමේදී ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් පිටතට ගලා යෑමේ භාවිතාවක් පවතීනම් බැඳීමේ ප්‍රමාණය විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ හැකිනම් ප්‍රතිපාදනයක් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. අනාගත මෙහෙයුම් අලාභ සඳහා වෙන් කිරීම් සිදු කරනු නොලැබේ. ප්‍රතිපාදන ලෙස පෙන්නුම් කර ඇති සමහර මෙහෙයුම් හිමිකම් සඳහා ඒවායේ ස්වභාවය සහ අවිනිශ්චිතතාවය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවේ.

අ). සේවක ප්‍රතිලාභ

i. පාරිතෝෂික වෙන් කිරීම

සුදුසුකම් ලත් සියලුම සේවකයින් සඳහා පාරිතෝෂික වෙන් කිරීම **1983** අංක **12** දරණ පාරිතෝෂික පනත ට අනුව සිදුකරනු ලබයි. බාහිර ආයෝජනයන් සිදු කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් මුදල් වෙන් නොකරන බැවින් පාරිතෝෂික වෙන් කිරීමට අදාල ආයෝජනයක් පවත්වාගෙන යනු නොලැබේ.
සාමාන්‍යයෙන් වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතින, විශ්‍රාම යාමේදී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ඇස්තමේන්තු කරයි.

ii. නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත්- සේවා සැලැස්මක් වන අතර මේ යටතේ අස්ථිත්වයක් කිසියම් ස්ථාවර දායකත්වයක් වෙනත් අස්ථිත්වයක් සඳහා ගෙවනු ලබන අතර මීට අමතරව වෙනත් කිසිදු මුදලක් ගෙවීම සඳහා නෛතික හෝ සම්මුතික බැඳීමක් නොපවතී.
නිශ්චිත දායකත්ව සැලැස්මක් සඳහා දායකත්වය බැඳීම ඒවා ගෙවිය යුතු කාල පරිච්ඡේදයට අදාළ ව ල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්නුම් කරනු ලැබේ.

- විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල

  විශ්ව විද්‍යාල සේවකයින්ගේ මාසික වැටුපෙන් **10%** ක දායකත්වයක් විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලට දායක කළ යුතු අතර විශ්වවිද්‍යාලය විසින් මූලික වැටුපෙන් **8%** කට සමාන මුදලක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට හා **7%** කට සමාන මුදලක් විශ්වවිද්‍යාල සාධක අරමුදලට දායක කරනු ලබයි..

- සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල

  විශ්වවිද්‍යාලය විසින් සියලුම සේවකයන්ගේ මාසික වැටුපෙන් **3%** ක මුදලක් සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක කරනු ලැබේ.

3.5.3. අසම්භාව්‍ය වගකීම්

සම්පත් හා බැඳුණු ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාම හෝ සේවා විභවය දුරස්ථ වෙනම් හැර විශ්වවිද්‍යාලය අසම්භාව්‍ය වගකීමක් හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වල කිසියම් අසම්භාව්‍ය වගකීමක් වේ නම් එය හෙළිදරව් කරනු ලැබේ.

3.5.4. අසම්භාව්‍ය වත්කම්

විශ්වවිද්‍යාලය අසම්භාව්‍ය වත්කම් හඳුනා නොගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ පාලනයෙන් තොර අනාගත සිදුවීමක් හෝ සිදුවීම් ඇතිවීම හෝ ඇති නොවීම මත ඇති විය හැකි වත්කම් සම්බන්ධයෙන් වන තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් යටතේ අනාවරණය කරනු ලැබේ.

3.6. අරමුදල් ප්‍රධාන හා සංචිත සඳහා ලැබී හා උපයෝජනය සඳහා ගිණුම්කරණය

3.6.1. සීමිත අරමුදල්

කිසියම් හඳුනාගත් ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකමක් සඳහා ප්‍රදාන /පරිත්‍යාග ලැබුණ විට ඒවා සීමිත අරමුදල් ගිණුම්වල පවත්වාගෙන යනු ලැබේ. උපයෝජනය කර නොගත් අරමුදල් හා ඒවා අවශ්‍ය වන තෙක් අදාළ අරමුදල් ගිණුම්වල පවත්වාගෙන යන අතර ඒවා සමුච්චිත අරමුදල හෝ සංචිත ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශය පෙන්නුම් කරනු ලැබේ.

විශ්වවිද්‍යාලය පහත සඳහන් අරමුදල් හා ප්‍රධාන ගිණුම් ගත කර ඇත.

අ). පර්යේෂණ ප්‍රදාන

ප්‍රධාන මධ්‍යස්ථානය- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

- පර්යේෂණ ප්‍රදාන - සාමාන්‍ය
- පර්යේෂණ ප්‍රදාන - ආධුනික හා ජ්‍යෙෂ්ඨ අධ්‍යයන ශ්‍රේණිය සඳහා දේශීයව ආචාර්ය උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා
- උසස් අධ්‍යාපනය සඳහා ජාතික මධ්‍යස්ථානය - පර්යේෂණ ප්‍රදාන

මූල්‍ය උත්පාදිත වැඩසටහන්

ප්‍රධාන මධ්‍යස්ථානය - ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

බාහිර අධ්‍යයනය - ශාස්ත්‍රවේදී

බාහිර අධ්‍යයනය - ව්‍යාපාර පරිපාලනවේදී

බාහිර අධ්‍යයනය – ව්‍යාපාර කලමනාකරණවේදී

බාහිර අධ්‍යයනය - කෘෂිකර්ම විද්‍යාවේදී

බාහිර අධ්‍යයනය - විද්‍යාවේදී

බාහිර අධ්‍යයනය - හෙද විද්‍යාවේදී

පශ්චාත් උපාධි වැඩසටහන් - කලා හා සංස්කෘත (ශාස්ත්‍රපති, දර්ශනපති, අධ්‍යාපනපති)

පශ්චාත් උපාධි වැඩසටහන් - විද්‍යා (දර්ශනපති, විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති)

පශ්චාත් උපාධි අධ්‍යයන වාණිජ්‍යය හා කළමනාකරණ – සංවර්ධන ආර්ථික විද්‍යාපති

පශ්චාත් උපාධි අධ්‍යයන වාණිජ්‍යය හා කළමනාකරණ – ව්‍යාපාර පරිපාලනවේදී

තිරසාර කෘෂිකර්මය හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය (CENSARM)

තිරසාර කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

ත්‍රිකුණාමල මණ්ඩපය

සීමිත අරමුදල්

3.6.2. වෙනත් ප්‍රදාන

ප්‍රධාන මධ්‍යස්ථානය - ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

- පුස්තකාලය තුළ වෙන් කිරීම හා සංරක්ෂණය කිරීමේ ඒකක පිහිටුවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රදාන
- පරිගණක සංවර්ධන අරමුදල
- ස්වාමී විපුලානන්ද අනුස්මරණ දේශන අරමුදල ආයෝජනය කිරීමෙන් ලද පොලිය
- පරිත්‍යාග අරමුදල් ආයෝජනය කිරීමෙන් ලද පොලිය
- කෙටි කාලීන ආයෝජන තුළින් ලද පොලිය
- පරිත්‍යාග අරමුදල් ගිණුම
- උපකුලපති අරමුදල
- ස්වාමී විපුලානන්ද අනුස්මරණ දේශනා මුදල
- ශිෂ්‍යත්ව ආධාරකරුවන්ගේ පරිත්‍යාග
- ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ගෘහ කර්මාන්ත පදනම සඳහා වි.වි.ප්‍ර.කොා.ස. ප්‍රදාන (ව්‍යවසායකත්ව හැකියාවන් සංවර්ධනය)
- ශිෂ්‍ය සුබසාධන අරමුදල
- සුනාමී ශිෂ්‍යත්ව ප්‍රදාන 2012
- පුනරුත්ථාපන ප්‍රදාන
- පුස්තකාල ස්වයංක්‍රීයකරණය සඳහා තොරතුරු තාක්ෂණ අරමුදල
- තිරසාර කෘෂිකර්මය හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය
- ශ්‍රී ලංකා ක්‍රීඩා සංගමයේ අරමුදල් ප්‍රදාන
- මාර්ගගත ඉගැන්වීම් සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රදාන
- ආසියා පදනම
- ශ්‍රී ලංකා වෛද්‍ය සහ දන්ත වෛද්‍ය සංගමය
- මඩකලපුව පාරිසරික හරිතකරණය බලපෑම තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය
- ENACT ව්‍යාපෘති අරමුදල
- IncEdu ව්‍යාපෘති අරමුදල
- ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම
- SEDRIC @ ශ්‍රී ලංකා ව්‍යාපෘති පදනම
- පර්යේෂණ යෝජනා ලිවීම සහ පර්යේෂණ ආචාර ධර්ම පිළිබඳ වැඩමුළුව සඳහා අරමුදල සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨය
- NTNU සම්බන්ධ ව්‍යාපෘතිය අරමුදල (NUFU අරමුදල)
- NUFU සම්බන්ධ ව්‍යාපෘතිය අරමුදල, NUFU අරමුදල -(පොදුකාර්ය වියදම් සඳහා අයකිරීම 10%)

ත්‍රිකුණාමල මණ්ඩපය

- ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය
- වාහන සඳහා ප්‍රදාන
- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලද තොරතුරු තාක්ෂණ ප්‍රදාන
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

3.7. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.7.1. පුනරාවර්තන ප්‍රධාන

පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රධාන වලින් පුනරාවර්තන ප්‍රධාන සමන්විතවේ.

3.7.2. වෙනත් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ ආදායම පාඩුව

විශ්ව විද්‍යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලා සහ වැඩසටහන් මගින් ශුද්ධ ආදායම/ පාඩුව හඳුනා ගනු ලැබේ. ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සඳහා පවත්වනු ලබන ස්වයං මූල්‍ය උත්පාදිත පාඨමාලාවල ආදායම් සහ වියදම් මුදල් පදනම මත හඳුනාගැනේ. මෙම කටයුතු වලට අදාල ශුද්ධ ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්නුම් කරන අතර පසුව පොදු සංචිතයට ගැලපීම සිදු කෙරේ. එසේම ශුද්ධ ආදායම/ ඌනතාවය අදාල ගිණුම් වල ආරම්භක ශේෂයට ගළපා ජංගම වගකීම යටතේ සීමිත අරමුදලට ගලපා පෙන්නුම් කෙරේ.

පහත පාඨමාලාවලින් සහ වැඩසටහන් වලින් ලද ආදායම / ලාභය විශ්වවිද්‍යාලය විසින් ගිණුම් ගත කරනු ලැබේ.

I. බාහිර අධ්‍යයන පාඨමාලා
II. පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා – වාණිජ්‍යය හා කළමනාකරණය
III. පශ්චාත් උපාධි පාඨමාලා - කලා හා සංස්කෘත
IV. පශ්චාත් උපාධි පාඨමාලා - කෘෂිකර්මය
V. පශ්චාත් උපාධි පාඨමාලා - විද්‍යා
VI. ඩිප්ලෝමා – කෘෂිකර්මය
VII. බාහිර අධ්‍යයන වලින් ලද ආදායම - ත්‍රිකුණාමල මණ්ඩපය

3.7.3. ශිෂ්‍ය ගාස්තු ගිණුම්ගත කිරීම

විශ්ව විද්‍යාලය ආරම්භයේ සිටම අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය වන ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු පාඨමාලා ගාස්තු සහ වෛද්‍ය ගාස්තු මුදල් පදනම මතත් එමෙන්ම වෙනත් ආදායම් ලැබිය යුතු පදනම මතත් ගිණුම් ගත කරයි.

3.7.4. වියදම් හඳුනාගැනීම

විශ්ව විද්‍යාලය විසින් ව්‍යාපෘති පවත්වාගෙන යාම සහ අනෙකුත් ක්‍රියාකාරකම් වෙනුවෙන් දරනු ලබන වියදම් එම වියදම් දරනු ලබන කාලසීමාව සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. විශ්වවිද්‍යාලය පරිපාලනය කිරීම හා පවත්වාගෙන යාම වෙනුවෙන් දරනු ලබන වියදම් සහ අපේක්ෂිත මට්ටමින් ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම වෙනුවෙන් දේපල පිරියත හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය කිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් දරනු ලබන පිරිවැය උපත පදනමට ගිණුම් ගත කරන අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගැලපීම සිදු කෙරේ.

3.7.5. මූල්‍ය වියදම්

ගෙවීම් සිදු කළ අවස්ථාවේ හෝ වගකීම් ඇතිවූ අවස්ථාවේදී මූල්‍ය පිරිවැය හඳුනා ගනු ලැබේ.

3.8. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක **2** ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත. "වක්‍ර ක්‍රමය" භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත. ලැබුණු ප්‍රාග්ධන ආධාර මුදල් මූල්‍ය ප්‍රවාහ ලෙස වර්ග කර ඇත.

3.9. වාර්තාකරන දිනට පසුව ඇතිවූ සිදුවීම්

වාර්තාකරන දිනට පසුව ඇතිවූ සිදුවීම් අතුරින් ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්ථාවන්හි දී අදාළ ගැළපීම් ගිණුම් වල සිදු කර ඇත.

3.10. වෙනත් හෙළිදරව් කිරීම්

3.10.1. මහපොළ හා ශිෂ්‍යාධාර සඳහා ප්‍රදාන

ශිෂ්‍යාධාර සඳහා ලැබෙන ප්‍රදාන පුනරාවර්තන ප්‍රදාන යටතේ ආදායමක් ලෙසින් පෙන්වන අතර ශිෂ්‍යාධාර ගෙවීම් **1987- 10-14** දිනැති යූජීසී/ෆ්/බී.යූ.ආර් **/ 87** දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපිය මගින් උපදෙස් ලබා දී ඇති පරිදි සුබසාධන සේවා ලෙසින් **4.3.7.1705** යටතේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහයන් ලෙස වෙනම අයිතමයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

3.10.2. විසි වන සියවස සඳහා උසස් අධ්‍යාපනය (එච්.ඊ.ටී.සී.) ව්‍යාපෘතිය (HETC)

ලෝක බැංකුව විසින් පී.පී.ඩී.යූ. හරහා අරමුදල් සම්පාදිත එච්.ඊ.ටී.සී. ව්‍යාපෘතිය විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. මේ සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යන අතර අදාළ ගිණුම් පී.පී.ඩී.යූ. වෙත වරින් වර ඉදිරිපත් කරනු ලැබේ. ව්‍යාපෘතිය මගින් මිලදී ගනු ලබන වත්කම් විශ්ව විද්‍යාලයේ දේපළ ලෙස සලකන අතර ව්‍යාපෘතිය අවසානයේදී ගිණුම් ගත කරනු ලැබේ.

7.15 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තියට අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

උපකුලපතිතුමා,

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ (“විශ්වවිද්‍යාලය”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම්වල වෙනස්වීම් ප්‍රකාශය සහ එම වර්ෂ අවසානයට මුදල් ප්‍රවාහය ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් සාරාංශගත ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය හා 107(5) උප වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන ප්‍රකාරව විශ්වවිද්‍යාල වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු බවට මා විසින් අදහස් කරනු ලබන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණය මෙම වාර්තාවේ ඇතුළත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වාර්තාව ඉදිරියේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ මතය අනුව, තත්ත්වාගණනය කිරීම සඳහා පදනම ලෙස දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ මතයක් ප්‍රකාශ කරන අතර එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පිළියෙල කර ඇති බව මා විසින් දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

a) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 07 හි 69 වන ඡේදයට අනුව, වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනය සඳහා පවතින විටදීය.කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව, වත්කම් එය අත්පත් කරගත් වර්ෂයේ දී ක්ෂය නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා ක්ෂයවීම් රු.4,338,024 ක් ලෙස හඳුනා ගෙන තිබුණි.

b) රුපියල් 121,038,191 ක් වන අනෙකුත් වත්කම් සහ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියෙන් ලැබුණු රුපියල් 197,318,037 ක වත්කම් ශ්‍රී ලංකා පොදු අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 07 හි 50 වැනි ඡේදයට අනුව ආයතනයක ක්‍රියාකාරකම්වල සමාන ස්වභාවයක් හෝ ක්‍රියාකාරීත්වයක් ඇති වත්කම් වර්ගීකරණයකින් තොරව දේපල, යන්ත්‍ර හා උපකරණ යටතේ පිරිවැයක් දක්වා ඇත.

c) 2019 සිට 2022 වසර දක්වා උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියෙන් ලැබුණු ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් ගණනය කර නොතිබුණද, එහි ප්‍රතිඵලයක් වශයෙන්, ස්ථාවර වත්කම් සහ සාමාන්‍ය සංචිතය පිළිවෙලින් රුපියල් 78,206,842 සහ රුපියල් 39,880,387 කින් වැඩිපුර සඳහන් කර ඇති අතර ක්ෂයවීම් රුපියල් 38,326,454 කින් අඩුවෙන් දක්වා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස වසරේ හිඟය රුපියල් 38,326,454 කින් අවතක්සේරු කර ඇත.

d) දෙසැම්බර් 31 වන විට රුපියල් 1,079,954,567 ක් වූ ස්ථාවර වත්කම් සහ රුපියල් 6,247,846 ක අස්පෘශ්‍ය වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියේ 65 වැනි ඡේදය සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියේ 103 වැනි ඡේදය සහ 20 වැනි ඡේදය අනුව ජංගම නොවන වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබූ අතර ඒවා තවදුරටත් භාවිත කරමින් පවතී. ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 3 හි ඇස්තමේන්තුගත දෝෂය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

e) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 18 මගින් නියම කර ඇති පරිදි, රුපියල් 4,646,464 ක් වටිනා පශු සම්පත් ජංගම නොවන වත්කම් යටතේ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වෙන වෙනම පෙන්වා දීම වෙනුවට දේපල, යන්ත්‍ර සහ උපකරණ යටතේ වැරදි ලෙස අනාවරණය කර ඇත.

f) සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු ප්‍රාග්ධන විශාලත්වය සහ පරිත්‍යාග රුපියල් 288,849,301 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 11 අනුව ආදායම ලෙස හඳුනාගෙන නොතිබුණි.

g) විශ්වවිද්‍යාලයේ ස්ථාන 15ක පිහිටි හෙක්ටයාර 241.2ක භූමි ප්‍රමාණයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

h) 2020 අගෝස්තු මස රුපියල් 224,269,514ක් වැය කර ඉදිකළ තෙමහල් ගොඩනැඟිල්ලක් විශ්වවිද්‍යාලයට භාර දී තිබුණද ක්ෂයවීම් ගණන් බලා නොතිබුණි. එම දිනය සිට මේ දක්වා සංචිතය පිළිවෙලින් රුපියල් 14,951,301කින් සහ රුපියල් 26,164,777කින් වැඩිපුර සඳහන් කර ඇති අතර වර්ෂය සඳහා ක්ෂයවීම රුපියල් 11,213,476කින් අවතක්සේරු කර තිබීම හේතුවෙන් වසරේ හිඟයේ හිඟය රුපියල් 11,213,476කින් අවතක්සේරු කර තිබුණි.

i) උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියෙන් ත්‍රිකුණාමල මණ්ඩපය වෙත ලබාදුන් රුපියල් 22,025,463 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂය තුළ දෙවතාවක් ප්‍රාග්ධනීකරණය කර ඇත. එම නිසා දේපළ, යන්ත්‍ර සහ උපකරණ මෙන්ම ප්‍රදාන ද එම ප්‍රමාණයෙන් වැඩිපුර සඳහන් කර ඇත.

j) විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල හරහා සිදු කරන ලද රුපියල් 3,885,562ක විනෝදාස්වාද දීමනාව සඳහා ගෙවීම ආදායම ලෙස සලකනු වෙනුවට විනෝදාස්වාද දීමනා වියදම් ගිණුමට වැරදි ලෙස බැර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචනයට භාජනය වූ වසරේ ආදායම සහ වියදම රුපියල් 3,885,562 කින් අඩු කර දක්වා ඇත.

k) සීමා කරන ලද අරමුදල, ත්‍යාග, පරිත්‍යාග, සහ අනෙකුත් ආධර මුළු රුපියල් 1,112,648,116 කොටස්වල කොටසක් ලෙස නොපෙන්වා, 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් ලෙස වැරදි ලෙස ඇතුළත් කර ඇත.

l) උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියෙන් රුපියල් 65,105,980 ක් වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර නොතිබුණි.

m) 2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශේෂය සහ පාරිතෝෂික ප්‍රතිපාදන සම්බන්ධයෙන් වූ ලේඛනය අනුව රු.21,121,365 ක වෙනස නිරීක්ෂණය විය.

n) බැංකු ගිණුමක ඍජු හර කිරීම රුපියල් 3,925,059 ක් සහ බැංකු ගිණුම් 2 ක තැන්පතු එකතුව රුපියල් 1,604,146 ක්, වසර 12 කට වැඩි කාලයක් වියදම් සහ ආදායම ලෙස හඳුනා නොගෙන, හඳුනා නොගත් හර සහ සාක්ෂාත් කර නොගත් තැන්පතු ලෙස බැංකු සැසඳීමෙහි පිළිවෙලින් පෙන්වා දී ඇත.
මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAUSS) අනුකූලව සිදු කෙළෙමි. මෙම ප්‍රමිතීන්ට අනුව මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන විගණකගේ වගකීම යන කොටසේ වැඩි දුරටත් විස්තර කර ඇත. තත්ත්වාගණනය කළ විගණන මතයක් ඉදිරිපත් කිරීම සඳහා මා විසින් ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍ය පදනමක් සැපයන බව මගේ විශ්වාසයයි.

1.3. විශ්ව විද්‍යාලයේ **2022** වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

විශ්ව විද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු වලින් වෙනත් තොරතුරු සමන්විත වන අතර,එහි මෙම විගණන වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රථම මා විසින් ලබාගත් මූල්‍ය ප්‍රකාශන සහ මගේ විගණක වාර්තාව ඇතුළත් කර නොමැති අතර අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වගකීම වෙනත් තොරතුරු ආවරණය නොකරන අතර මා ඒ පිළිබඳ කිසිදු ආකාරයක වගකීමක් දරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්, මාගේ වගකීම ඉහත තොරතුරු කියවීම වන අතර එහිදී එම වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී මා විසින් ලබාගත් දැනුම සමඟ හෝ වෙනත් ආකරයකින් ප්‍රමාණාත්මකව වෙනස් ලෙස සටහන් කර තිබේද යන්න සලකා බැලීම සිදු කෙරේ.

විශ්ව විද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මා නිගමනය කළ හොත්, එම කාරණය නිවැරදි කිරීම සඳහා පාලන අධිකාරිය වෙත සන්නිවේදනය කළ යුතුවේ. තව දුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම්,ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු අත.

1.4. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී , විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර,කළමනාකාරිත්වය විසින් විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාල මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම පාලනයට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තියට අනුව, විශ්ව විද්‍යාලය විසින් වාර්ෂික හා කාලානුරූපී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සියල්ල පිළිබඳ නිසිපරිදි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5. මූල්‍ය ප්‍රකාශයන් විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සඳහා මගේ මතය ඇතුළත් විගණක වාර්තාවක් නිකුත් කිරීම මගේ අරමුණයි. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකය වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනයේ කොටසක් ලෙස, මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ල්දි. මා විසින් තවදුරටත්:

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථානෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන ඇතිවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුශ්සන්දානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විතව මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- විශ්වවිද්‍යාල අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොව, අවස්ථානෝචිත උචිත විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදි**.**

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකාරිත්වය විසින් සිදු කරන ලද හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණාවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට අවධානය යොමු කළ යුතු වූ අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය.කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් මත විශ්ව විද්‍යාලයේ අඛණ්ඩව පැවැත්ම අවසන් විය හැක.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මා විසින් වෙනත් කරුණු අතුරින් මාගේ විගණනය තුලදී හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ ප්‍රධාන දුර්වලතාවයන් ඇතුලත්ව ප්‍රධාන විගණන සොයාගැනීම් ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශ්වය සමඟ සන්නිවේදනය කළෙමි.

2. වෙනත් නෛතික සහ රෙගුලාසිමය අවශ්‍යතා

2.1. **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතා සඳහා විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ**.**

2.1.1. මාගේ පරීක්ෂණයන්ට අනුව අවශ්‍ය යැයි හැඟුණු සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගත් අතර විගණන මතය සඳහා පදනම් කරගත් ඡේදයේ සඳහන් කරුණුවලින් මතුවන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තිය අනුව අවශ්‍ය කරන නියමිත ගිණුම් වාර්තා විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන ගොස් ඇත.

2.1.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අ) (III) වගන්තියේ අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂය සමඟ ඒකාකාරීව ඉදිරිපත් කර ඇත.

2.1.3. මෙම වාර්තාවේ 1.2(ආ),1.2(ඇ),1.2(ඉ) සහ (ඵ) ඡේද හැර 2018 අංක 19 ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තිය ප්‍රකාරව මා විසින් පෙර වර්ෂයේදී සිදු කරනු ලැබූ සියලුම නිර්දේශයන්, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇත.

2.2. සිදු කරන ලද විගණන ක්‍රියාවලි හා ලබාගත් සාක්ෂි ප්‍රමාණාත්මක කරුණුවලට පමණක් සීමා වූ අතර, එවැනි කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව සාමාන්‍ය ක්‍රියාවලිය තුලදී විශ්ව විද්‍යාලයේ පාලක සභාවේ කිසියම් සාමාජිකයෙකු සෘජුව හෝ වක්‍රව විශ්වවිද්‍යාලය විසින් එළඹෙන ලද ගිවිසුමකට සම්බන්ධ වී ඇත්නම් ඒ බව සඳහන් කිරීම.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව පහත කරුණු හැර විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නිකුත් කරන ලද කිසියම් අදාළ ලිඛිත නීතියක්, සාමාන්‍ය සහ විශේෂ මහපෙන්වීම් පිළිබඳව අනුගත නොවී ඇත්නම් ඒ පිළිබඳව සඳහන් කිරීම.

නීති/මහ පෙන්වීම් සඳහා යොමුව	විස්තරය
a) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 571 වන මුදල් රෙගුලාසිය	වසර 03 සිට වසර 07 ක කාල සීමාවකට අයත් රුපියල් 15,940,456 ක් වූ රඳවා ගැනීමේ මුදලක් සහ රුපියල් 6,916,081ක් වූ මුදලක් ආපසු ගෙවිය හැකි තැන්පතු මුදලක් පියවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු නොකර ගිණුම් වල රැඳී තිබුණි.
b) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහය. i) පරිච්ඡේදය IV හි 1.1 වගන්තිය	ත්‍රිකුණාමල මණ්ඩපයේ පරිගණක විද්‍යා අංශයට මුලින් පත් කරන ලද I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු, රෙගුලාසි වලට පටහැනිව නැගෙනහිර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ බහුවිධ අධ්‍යයන අංශයට මාරු කරන ලදී. එම කථිකාචාර්යවරයා 2020 නොවැම්බර් 19 සිට 2022 සැප්තැම්බර් 1 දක්වා කාලය තුළ තාක්ෂණ පීඨයේ දේශන පැය 45 ක් පමණක් හෝ අපේක්ෂිත වැඩ ප්‍රතිමාන වලින් සියයට 7 ක් පමණක් පවත්වා තිබුණි.
ii) පරිච්ඡේදය III හි උප වගන්තිය 20.8 හා ඡේදය IV හි උප වගන්තිය 4.1	පාලක සභාව විසින් 2018 පෙබරවාරි 24 වැනි දින ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයකුගේ සහ 2020 අගෝස්තු 29 වැනි දින උද්භිද විද්‍යා අධ්‍යයන අංශයට අනුයුක්තව සේවය කළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකුගේ ඉල්ලා අස්වීම පිළිගෙන ඇත. ඉන්පසු ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයා සහ කථිකාචාර්යවරිය 2018 මැයි 17 සහ 2020 සැප්තැම්බර් 02 දින සිට පිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ගේ පෙර තනතුරු වලටම නැවත සේවයේ පිහිටුවා තිබුණි.

	කෙසේ වෙතත් රෙගුලාසියට පටහැනිව වැටුප් තලයන් හි පිහිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නැවත සේවයේ පිහිටවූ දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා එම නිලධාරීන් දෙදෙනාටම රුපියල් 4,965,152 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.
iii) පරිච්ඡේදය III හි උප වගන්තිය 26.7.2	පුවත්පත් දැන්වීමක් පළ කිරීමකින් තොරව බාහිර කථිකාචාර්යවරුන් බඳවාගෙන තිබුණි.
iv) පරිච්ඡේදය XX හි 3.1 උප වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම තහවුරු නොකර සමාලෝචිත වර්ෂයේදී රුපියල් 978,942,951 වැටුප් හා දීමනා ගෙවා තිබුණි.
v) 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛය මගින් සංශෝධිත පරිච්ඡේදයේ XXVI 3 වගන්තිය.	සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය පවත්වා එහි වාර්තාව 2023 මාර්තු 17 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2023 ජූලි 07 වන දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2020 වර්ෂයට හා 2021 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මත අඛලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. 2020 වසර සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව විශ්වවිද්‍යාලයේඅංශ 18 කට අයත් භාණ්ඩ 579 ක් අස්ථානගත වූ බවට වාර්තා වී ඇත. කෙසේ වෙතත්, මූල්‍ය රෙගුලාසි 103(1) අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
c) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව i) 2018 ඔක්තෝබර් 12 දිනැති ලිපිය	මාසිකව ප්‍රතිපූරණය කළ යුතුව තිබූ මහපොළ භාරකාර අරමුදල රුපියල් 2,305,000 ක් වූ අතර, එය ප්‍රතිපූරණය නොකර වසර තුනකට වැඩි කාලයක් ආපසු අයකරගත හැකි ලෙස දක්වා තිබුණි.
ii) 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛය.	2022 වර්ෂයේ කලා හා සංස්කෘතික පීඨයේ පවත්වන ලද විභාගයන් හි විෂයයන් 215 න් විෂයයන් 31 ක ප්‍රතිඵල මාස 01 සිට මාස 05 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. එසේම, 2022 වර්ෂයේ විද්‍යා පීඨයේ පවත්වන ලද විභාගයන්හි විෂයයන් 42 න් විෂයයන් 24 ක ප්‍රතිඵල මාස 01 සිට 07 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.
iii) 2022 ජනවාරි 03 දිනැති අංක 1/2022 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4 වැනි ඡේදය.	2022 දෙසැම්බර් 31 දිනට රුපියල් 130,298,076 ක පුස්තකාල පොත් සහ වාර සඟරාවල පිරිවැය සත්‍යාපනය කර නොතිබුණි.
iv) 2022 පෙබරවාරි 23 දිනැති අංක 03/2022 දරන මූල්‍ය චක්‍රලේඛ ලිපිය	2022 වර්ෂය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් සඳහා මාසික ඉන්ධන සීමාව ලීටර් 145 කට සීමා කර ඇත. කෙසේ වෙතත්, 2022 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ අනුමත සීමාවට පටහැනිව රුපියල් 1,012,079 ක් වටිනා ඉන්ධන ලීටර් 2,983 ක් වැඩිපුර ලබා ගෙන තිබුණි.
d) 2015 ඔක්තෝබර් 03 දින පැවති 257 වැනි රැස්වීමට අනුව විශ්වවිද්‍යාලයේ නිසි බලධාරියාගේ 2015 ඔක්තෝබර් 12 දිනැති EUSL/EST/06/2015 අංක දරන ලිපිය	2023 පෙබරවාරි 27 වන දින දක්වාත් වෛද්‍ය නිලධාරියා විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සේවයට වාර්තා කිරීම සම්බන්ධව උපදෙස් අනුගමනය කර නොමැති අතර 2015 ඔක්තෝබර් සිට 2023 පෙබරවාරි දක්වා වැටුප් හා දීමනා වශයෙන් රුපියල් 9,277,829 ක මුදලක් ගෙවා ඇත.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ජී) වගන්තියේ අවශ්‍යතාවයට අනුව විශ්වවිද්‍යාලය එහි බලය, ක්‍රියාකාරිත්වය සහ රාජකාරි ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.2.4. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(එච්) වගන්තියේ අවශ්‍යතාවයට අනුව විශ්ව විද්‍යාලය එහි සම්පත්, සපයා ගැනීම සහ භාවිතා කිරීම අදාළ නීතිවලට අනුකූලව සහ නියමිත කාල රාමුව තුල ආර්ථික වශයෙන්, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සිදුකර නොමැති නොමැති බව ප්‍රකාශ කිරීම.

2.3. වෙනත් කරුණු

---

a) 2022 දෙසැම්බර් 31 දිනට, ලැබිය යුතු රු. 455,463,867 මුළු ශේෂවලින් රු. 238,964,922 හෝ සියයට 52 ට සමාන මුදලක් වසර 03 සිට වසර 40 දක්වා කාලයක් තුල අය කර ගෙන නොතිබුණි. එයින් වසර 10 සිට වසර 40 දක්වා කාලයක් තුල බැඳී ඇති ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් 70 දෙනෙකුගෙන් රුපියල් 150,320,855 ක බැඳුම් වටිනාකම අයකර ගැනීමට නොහැකිව තිබුණි.

b) 2022 දෙසැම්බර් 31 වන විට හිඟ ජීවන වියදම් දීමනා, අධික ලෙස අයකරගත් ණය සහ අත්තිකාරම්, විවිධ ණය හිමියන් සහ විගණන ගාස්තු ලෙස ගෙවිය යුතු රුපියල් 3,973,526 ක් නිරවුල් කිරීම පිණිස වසර 03 සිට වසර 18 දක්වා කාලයක් තුල නිසි ක්‍රියාමාර්ගයක් නොගෙන තිබුණි.

c) 2020 මැයි මාසයේදී පර්යේෂණ අවසන් කිරීමට යටත්ව, මහාචාර්යවරයෙකු වෙත පර්යේෂණ ප්‍රදාන වශයෙන් රුපියල් 7,500,000 ක මුදලක් 2015 වර්ෂයේදී අනුමත කර ඇත. කෙසේ වෙතත්, එම ප්‍රතිපාදනයෙන් රුපියල් 4,500,000 ක මුදලක් වැය කර ඇතත්, 2023 මැයි 04 දක්වාම පර්යේෂණය අවසන් කර නොතිබුණි.

d) එක්සත් රාජධානියේ ආචාර්ය උපාධියක් හැදෑරීම සඳහා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ කථිකාචාර්යවරයෙක් වෙත, රුපියල් 14,258,446 ක බැඳුම්කරයක් අත්සන් කර, අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යයන නිවාඩුව ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස විශ්වවිද්‍යාලය ඉල්ලීමක් කර තිබුණි. ඒ හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් රුපියල් 3,601,837 ක අමතර මුදලක් ගෙවා තිබුණද, වගකිවයුතු නිලධාරියාට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

e) මෝටර් රථ දෙකක්, වෑන් රථයක් සහ ලොරි රථයක් ඇතුළුව රුපියල් 6,006,875ක් වටිනා වාහන හතරක් (04) 2021 ජුනි මාසයේ සිට මේ දක්වා අපේක්ෂිත කාර්යයන් සඳහා යොදාගෙන නොමැති බව වත්කම් පිළිබඳ භෞතික සත්‍යාපනයකදී අනාවරණය වී තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් නිසි පියවරක් ගෙන තිබුණේ නැත.

f) මුළු මුදල රු.3,495,497 ක් වටිනා අරමුදල් වසර 02 සිට වසර 05 දක්වා කාලසීමාවක් තුල ඒවායේ අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණි.

g) විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව 2014 වසරේ සිට රජයේ බැංකු ශාඛා දෙකක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMS) දෙකක් සඳහා විශ්වවිද්‍යාලය පහසුකම් සපයා ඇති අතර, මෙම ආයතනවලින් මේ දක්වා කිසිදු කුලියක් අයකරගෙන නොමැත.

h) ශිෂ්‍ය අත්පොතට අනුව, ත්‍රිකුණාමල මණ්ඩපයේ සිද්ධ වෛද්‍යවේදී උපාධි පාඨමාලාව (BSMS) , අධ්‍යයන වර්ෂ 05ක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය. කෙසේ වෙතත්, 2016 වර්ෂයේදී සිසුන් 46ක් 2014/2015 අධ්‍යයන වර්ෂයේ මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ අතර, පාඨමාලාව සම්පූර්ණ කිරීමට වසර 7ක් ගතවී තිබුණි.මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට ප්‍රමාද වීම සිසුන්ගේ වෘත්තීය සහ රැකියා අවස්ථා කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය. මීට අමතරව, පිළිවෙළින් 2014 සහ 2015 වසරවලදී, 2012/2013 සහ 2013/2014 අධ්‍යයන වර්ෂ සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයන්හටද අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට වසර 07 ක කාල රාමුවක් ඉක්මවා ගොස් තිබුණි.

i) 2013 වසරේ සිට 2015 වසර දක්වා කාලය තුළ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට රුපියල් 6,247,846 ක මුදලක් ගෙවා තිබුණද, ලේඛනය ක්‍රමානුකූලව යාවත්කාලීන කර නොතිබූ අතර සමහර ගනුදෙනු 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඇතුළත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛනය සකස් කිරීමේ වියදම් ඵල රහිත වී තිබුණි.

j) සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගෘහ භාණ්ඩ, වෛද්‍ය තාක්ෂණික උපකරණ සහ අන්තර්ජාල සේවා සැපයීම සඳහා කුවේට් අරමුදල යටතේ රුපියල් 263,374,811 ක මුදලක් වැය කර ඇත. කෙසේ වෙතත්, වායු සමීකරණ, විද්‍යාගාර ගෘහභාණ්ඩ සහ අල්මාරි, යටිතල පහසුකම් නොමැති වීම සහ අරමුදල් සීමාවීම හේතුවෙන් රුපියල් 145,574,057 ක් වටිනා රැස්වීම් කාමර පද්ධතිය සහ වෛද්‍ය උපකරණ වර්ග 70ක් පමණ වසර 01 සිට වසර 02 දක්වා කාලසීමාවක් තුළ භාවිතයට ගෙන නොතිබුණි.

k) උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය මගින් 2020 සිට 2022 දක්වා කාලය තුළ පීඨ පහක් (05) වෙත ලබා දුන් රුපියල් 41,121,595 ක් වටිනා ගෘහ භාණ්ඩ සහ උපකරණ මාස 05 සිට වසර 03 දක්වා කාලසීමාවක් තුළ ඒවායේ අපේක්ෂිත අරමුණු සඳහා භාවිත කර නොතිබුණි.

l) ත්‍රිකුණාමල මණ්ඩපයේ බහුකාර්ය ශ්‍රවණාගාරයක් සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 09 වන දින රුපියල් 674,470,220 ක මුදලකට ප්‍රදානය කරන ලදී. ගිවිසුමට අනුව 2021 පෙබරවාරි 08 වන දිනට එම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, එහි භෞතික ප්‍රගතිය 2023 මැයි 23 වන විටත් සියයට 09 ක් පමණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති

7.16 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තියට අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය

යොමු අංකය	විගණන ඡේදය	කළමනාකරණයේ හේතු දැක්වීම
1	මූල්‍ය ප්‍රකාශන	
1.2	මතය සඳහා පදනම	
(a)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 07 හි 69 වන ඡේදයට අනුව, වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනය සඳහා පවතින විටදීය.කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව, වත්කම් එය අත්පත් කරගත් වර්ෂයේ දී ක්ෂය නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා ක්ෂයවීම් රු.4,338,024 ක් ලෙස හඳුනා ගෙන තිබුණි	ක්ෂයවීම් පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව මූල්‍ය හා විගණන කමිටු වලදී පරිපූර්ණ විශ්ලේෂණයක් සිදු කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා ගැඹුරින් කරුණු සමාලෝචනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ.
(b)	රුපියල් 121,038,191 ක් වන අනෙකුත් වත්කම් සහ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියෙන් ලැබුණු රුපියල් 197,318,037 ක වත්කම් ශ්‍රී ලංකා පොදු අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 07 හි 50 වැනි ඡේදයට අනුව ආයතනයක ක්‍රියාකාරකම්වල සමාන ස්වභාවයක් හෝ ක්‍රියාකාරීත්වයක් ඇති වත්කම් වර්ගීකරණයකින් තොරව දේපල, යන්ත්‍ර හා උපකරණ යටතේ පිරිවැයක් දක්වා ඇත.	2023 මූල්‍ය ප්‍රකාශනයේ සිට සමාන ස්වභාවයක් ඇති වත්කම් වෙනත් වත්කම් යටතේ කාණ්ඩ කිරීමට පියවර ගෙන ඇති අතර ක්ෂයවීම් අනුපාතය හෙළිදරව් කිරීමට බලාපොරොත්තු වේ.
(c)	2019 සිට 2022 වසර දක්වා උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියෙන් ලැබුණු ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් ගණනය කර නොතිබුණද, එහි ප්‍රතිඵලයක් වශයෙන්, ස්ථාවර වත්කම් සහ සාමාන්‍ය සංචිතය පිළිවෙලින් රුපියල් 78,206,842 සහ රුපියල් 39,880,387 කින් වැඩිපුර සඳහන් කර ඇති අතර ක්ෂයවීම් රුපියල් 38,326,454 කින් අඩුවෙන් දක්වා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස වසරේ හිඟය රුපියල් 38,326,454 කින් අවතක්සේරු කර ඇත.	2023 දී ඒ'නලය සංශෝධනය කරමින් ගැටලුව නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
(d)	දෙසැම්බර් 31 වන විට රුපියල් 1,079,954,567 ක් වූ ස්ථාවර වත්කම් සහ රුපියල් 6,247,846 ක අස්පෘශ්‍ය වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියේ 65 වැනි ඡේදය සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියේ 103 වැනි ඡේදය සහ 20 වැනි ඡේදය අනුව ජංගම නොවන වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබූ අතර ඒවා තවදුරටත් භාවිත කරමින් පවතී. ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 3 හි ඇස්තමේන්තුගත දෝෂය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	යාවත්කාලීන කළ අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම සඳහා වත්කම් නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට නියමිතව ඇත.

(e)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 18 මගින් නියම කර ඇති පරිදි, රුපියල් 4,646,464 ක් වටිනා පශු සම්පත් ජංගම නොවන වත්කම් යටතේ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වෙන වෙනම පෙන්වා දීම වෙනුවට දේපල, යන්ත්‍ර සහ උපකරණ යටතේ වැරදි ලෙස අනාවරණය කර ඇත.	අදාළ වත්කම් නිවැරදි කාණ්ඩය යටතේ ඉදිරියේදී අනාවරණය කරනු ඇත.
(f)	fසමාලෝචිත වර්ෂය තුළ ලැබුණු ප්‍රාග්ධන විශාලත්වය සහ පරිත්‍යාග රුපියල් 288,849,301 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 11 අනුව ආදායම ලෙස හඳුනාගෙන නොතිබුණි.	පාලන අධිකාරියේ අනුමැතියට යටත්ව ඉහත සඳහන් මුදල ඉතා සූක්ෂම ලෙස ක්‍රමක්ෂ කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත.
(g)	විශ්වවිද්‍යාලයේ ස්ථාන 15ක පිහිටි හෙක්ටයාර 241.2ක භූමි ප්‍රමාණයේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.	අදාළ ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. හිමිකාරිත්වය පැවරීම අවසන් වූ වහාම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක **07** ලෙස හඳුන්වන ගිණුම්කරණ ප්‍රමිතියට දැඩි ලෙස අනුකූලව කඩිනම් සහ කඩිසර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට නියමිතය.
(h)	2020 අගෝස්තු මස රුපියල් 224,269,514ක් වැය කර ඉදිකළ තෙමහල් ගොඩනැඟිල්ලක් විශ්වවිද්‍යාලයට භාර දී තිබුණද ක්ෂයවීම් ගණන් බලා නොතිබුණි. එම දිනය සිට මේ දක්වා සංචිතය පිළිවෙලින් රුපියල් 14,951,301කින් සහ රුපියල් 26,164,777කින් වැඩිපුර සඳහන් කර ඇති අතර වර්ෂය සඳහා ක්ෂයවීම රුපියල් 11,213,476කින් අවතක්සේරු කර තිබීම හේතුවෙන් වසරේ හිඟයේ හිඟය රුපියල් 11,213,476කින් අවතක්සේරු කර තිබුණි.	භාරදීමේ ආධාරක ලියකියවිලි 2020 දී පැහැදිලිව සඳහන් කර තිබුණද, සමහර ප්‍රාග්ධනීකරණය සම්බන්ධ ගැටළු මතු වූ අතර 2022 දී විසඳා ගැනීමට අවශ්‍ය විය.
(i)	උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියෙන් ත්‍රිකුණාමල මණ්ඩපය වෙත ලබාදුන් රුපියල් 22,025,463 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂය තුළ දෙවතාවක් ප්‍රාග්ධනීකරණය කර ඇත. එම නිසා දේපළ, යන්ත්‍ර සහ උපකරණ මෙන්ම ප්‍රදාන ද එම ප්‍රමාණයෙන් වැඩිපුර සඳහන් කර ඇත.	එය 2023 මූල්‍ය ප්‍රකාශනයේ ජ'නලයෙහි නිවැරදි කර දක්වා ඇත.
(j)	විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල හරහා සිදු කරන ලද රුපියල් 3,885,562ක විනෝදාස්වාද දීමනාව සඳහා ගෙවීම ආදායම ලෙස සලකනු වෙනුවට විනෝදාස්වාද දීමනා වියදම් ගිණුමට වැරදි ලෙස බැර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචනයට භාජනය වූ වසරේ ආදායම සහ වියදම රුපියල් 3,885,562 කින් අඩු කර දක්වා ඇත.	ස්වයං ජනනය කරන ලද අරමුදලින් විනෝදාස්වාද දීමනාව ගෙවා ඇත.
(k)	සීමා කරන ලද අරමුදල, ත්‍යාග, පරිත්‍යාග, සහ අනෙකුත් ආධර මුළු රුපියල් 1,112,648,116 කොටස්වල කොටසක් ලෙස නොපෙන්වා, 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් ලෙස වැරදි ලෙස ඇතුළත් කර ඇත.	මූල්‍ය ප්‍රකාශන ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධව පවතින පොදු ව්‍යවසාය චක්‍රලේඛය දෝෂ රහිතව අනුගමනය කර ඇත.

(l)	උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියෙන් රුපියල් 65,105,980 ක් වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර නොතිබුණි.	වත්කම් නිසි පරිදි ප්‍රාග්ධනීකරණය කර ඇති අතර, උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය විසින් සපයන ලද ලැයිස්තුවට අනුකූලව, 2022 අප්‍රේල් 30 වන දින දක්වා වන වත්කම් ඇතුළත් වේ. පසුව, ඉදිරි වත්කම් ලැයිස්තුව ලැබීමෙන් පසු ඉතිරි වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු ඇත.
(m)	2022 දෙසැම්බර් 31 වන දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශේෂය සහ පාරිතෝෂික ප්‍රතිපාදන සම්බන්ධයෙන් වූ ලේඛනය අනුව රු.21,121,365 ක වෙනස නිරීක්ෂණය විය.	එය 2023 මූල්‍ය ප්‍රකාශනයේ ජ'නලයෙහි නිවැරදි කර දක්වා ඇත.
(n)	බැංකු ගිණුමක ඍජු හර කිරීම රුපියල් 3,925,059 ක් සහ බැංකු ගිණුම් 2 ක තැන්පතු එකතුව රුපියල් 1,604,146 ක්, වසර 12 කට වැඩි කාලයක් වියදම් සහ ආදායම ලෙස හඳුනා නොගෙන, හඳුනා නොගත් හර සහ සාක්ෂාත් කර නොගත් තැන්පතු ලෙස බැංකු සැසඳීමෙහි පිළිවෙලින් පෙන්වා දී ඇත.	පාලක සභාව විසින් 2009 ට පෙර දිවෙන ලියකියවිලි සොයා ගැනීමේ නොහැකියාව ප්‍රකාශ කර ඇති අතර එම කාලසීමාව තුළ නොදන්නා අඩුපාඩු සපුරාලීමට කටයුතු ආරම්භ කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාලක සභාවේ තීරණයට අනුව අවශ්‍ය කපා හැරීම් දැනටමත් සිදු කර ඇත. පාලක සභාව විසින් 2009 ට පෙර දිවෙන ලියකියවිලි සොයා ගැනීමේ නොහැකියාව ප්‍රකාශ කර ඇති අතර එම කාලසීමාව තුළ නොදන්නා අඩුපාඩු සපුරාලීමට කටයුතු ආරම්භ කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාලක සභාවේ තීරණයට අනුව අවශ්‍ය කපා හැරීම් දැනටමත් සිදු කර ඇත. පළමුව, වැඩබලන මූල්‍යාධිකාරි විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ (MOHE) CAO-ලේකම්වරයා විසින් විමර්ශන මණ්ඩලයක් පත් කරන ලදී. මෙම කමිටුව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය: එස්. නේසරාජා මහතා, ප්‍රධාන ගණකාධිකාරී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (සභාපති), ඒ. බහිරදන් මහතා, වැඩබලන ලේඛකාධිකාරි, නැගෙනහිර විශ්වවිද්‍යාලය (සාමාජික), එස්. කේ. ජයවර්ධන මහතා, වැඩ බලන මූල්‍යාධිකාරි, නැගෙනහිර විශ්වවිද්‍යාලය (ස (සාමාජික), කේ.වී. එස් සිල්වා මහත්මිය, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක (සාමාජික), උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ගණකාධිකාරී ඩී.කේ.ජී. ලක්මාලි මෙනවිය (සාමාජික). කෙසේ වෙතත්, අමාත්‍යාංශය විසින් පත් කළ කමිටුව රැස් නොවීම හේතුවෙන් රේඛීය අමාත්‍යාංශය විසින් නව කමිටුවක් පත් කරන ලදී. අවසානාවකට මෙන්, මෙම කමිටුවට ද සියලු සාමාජිකයන් එකවර රැස්

			කිරීමේ අභියෝගවලට මුහුණ දීමට සිදු වූ අතර, එනයින් එය තවදුරටත් ප්‍රමාද වීමට හේතු විය. දිගුකාලීන ප්‍රමාදයන් සැලකිල්ලට ගනිමින්, කාරණය නැගෙනහිර විශ්ව විද්‍යාලයේ විගණන කමිටුව ඉදිරියට ගෙන එන ලදී. පවතින තත්ත්වයන් සැලකිල්ලට ගෙන පුළුල් අධ්‍යයනයක් කර සුදුසු විසඳුමක් නිර්දේශ කිරීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කරන ලෙස විගණන කමිටුව ලේඛකාධිකාරිවරයාගෙන් ඉල්ලා සිටින ලදී. ලේඛකාධිකාරි විසින් පත් කරන ලද කමිටුව 2021 පෙබරවාරි 25 වැනි දින පැවති 68 වැනි විගණන කමිටුවට සිය නිර්දේශ ඉදිරිපත් කරමින් ගිණුම් නිලධාරියාගේ සීමාව තුළ ශේෂයන් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමටත්, මෙම සීමාව ඉක්මවන ශේෂයන් සඳහා ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමටත් යෝජනා කරන ලදී. පසුව, 68 වැනි විගණන කමිටුව විසින් 2021 මාර්තු 27 වැනි දින පැවති 314 වැනි කවුන්සිලයට මෙම ක්‍රියාමාර්ග නිර්දේශ කරන ලද අතර, එම නිර්දේශ නිසි පරිදි අනුමත කරන ලදී. අනුමත නිර්දේශයන්ට අනුව, උපකුලපතිවරයාගේ අනුමත සීමාව තුළ බැංකු ගිණුම් තුනක් දැනටමත් කපා හැර ඇත.
2	වෙනත් නෛතික සහ රෙගුලාසිමය අවශ්‍යතා පිළිබඳ වාර්තා කිරීම		
2.2.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තිය අනුව පහත කරුණු ගෙනහැර විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් නිකුත් කරන ලද කිසියම් අදාළ නීතියක්, සාමාන්‍ය හා විශේෂ මග පෙන්වීම් පිළිබඳව අනුගත නොවී ඇත්නම් ඒ පිළිබඳව සඳහන් කිරීම.		
	නීතියට/ මග පෙන්වීමට යොමුව	විස්තරය	කළමනාකරණයේ හේතු දැක්වීම
(a)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 571 වන මුදල් රෙගුලාසිය	වසර 03 සිට වසර 07 ක කාල සීමාවකට අයත් රුපියල් 15,940,456 ක් වූ රඳවා ගැනීමේ මුදලක් සහ රුපියල් 6,916,081ක් වූ මුදලක් ආපසු ගෙවිය හැකි තැන්පතු මුදලක් පියවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු නොකර ගිණුම් වල රැඳී තිබුණි.	දෝෂ සහිත වගකීම් කාලය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරුවන්ගේ හෝ සැපයුම්කරුවන්ගේ ප්‍රකාශිත ඉල්ලීම මත රඳවා තබා ගැනීමේ අරමුදල් නිදහස් කරනු ලැබේ. නියමිත කාල සීමාවන් සම්පූර්ණ කිරීමෙන් පසුව, අදාළ පුද්ගලයාගෙන් හෝ ආයතනයෙන් විධිමත් ඉල්ලීමක් ලැබීමෙන් පසු ආපසු ගෙවිය හැකි තැන්පතු පියවනු ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ආපසු ගෙවිය හැකි තැන්පතු අපගේ වාර්තාවල වත්මන් නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ඉහත ක්‍රියා පටිපාටියට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(b)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහය.		
(i)	පරිච්ඡේදය IV හි 1.1 වගන්තිය	ත්‍රිකුණාමල මණ්ඩපයේ පරිගණක විද්‍යා අංශයට මුලින් පත් කරන ලද I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු, රෙගුලාසි වලට පටහැනිව නැගෙනහිර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ බහුවිධ අධ්‍යයන අංශයට මාරු කරන ලදී. එම කථිකාචාර්යවරයා 2020 නොවැම්බර් 19 සිට 2022 සැප්තැම්බර් 1 දක්වා කාලය තුළ තාක්ෂණ පීඨයේ දේශන පැය 45 ක් පමණක් හෝ අපේක්ෂිත වැඩ ප්‍රතිමාන වලින් සියයට 7 ක් පමණක් පවත්වා තිබුණි.	දුක්ගැනවිලි කමිටුව විසින් කරුණු අනාවරණය කර එම නිර්දේශය සභාවට ඉදිරිපත් කරන ලදී. පාලක සභාව 2020.10.31 දින පැවති 309 වැනි රැස්වීමේදී දුක්ගැනවිලි කමිටු නිර්දේශය මත පදනම්ව සහ ගැටලු සාමකාමීව විසඳා ගැනීම සඳහා 2009.11.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහුව තාක්ෂණික පීඨයේ බහු විනය අධ්‍යයන අංශය, වෙත මාරු කරන ලදී.
(ii)	පරිච්ඡේදය III හි උප වගන්තිය 20.8 හා ඡේදය IV හි උප වගන්තිය 4.1	පාලක සභාව විසින් 2018 පෙබරවාරි 24 වැනි දින ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයකුගේ සහ 2020 අගෝස්තු 29 වැනි දින උද්භිද විද්‍යා අධ්‍යයන අංශයට අනුයුක්තව සේවය කළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකගේ ඉල්ලා අස්වීම පිළිගෙන ඇත. ඉන්පසු ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයා සහ කථිකාචාර්යවරිය 2018 මැයි 17 සහ 2020 සැප්තැම්බර් 02 දින සිට පිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ගේ පෙර තනතුරු වලටම නැවත සේවයේ පිහිටුවා තිබුණි. කෙසේ වෙතත් රෙගුලාසියට පටහැනිව වැටුප් තලයන් හි පිහිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නැවත සේවයේ පිහිටවූ දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා එම නිලධාරීන් දෙදෙනාටම රුපියල් 4,965,152 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.	පාලක සභාව 29.08.2020 දින පැවති 307 වැනි රැස්වීමේදී ආචාර්ය සී.මහේන්ද්‍රනාදන් මහත්මියගේ ඉල්ලීම මත ඇයව පෙර තනතුරටම නැවත සේවයට බඳවා ගැනීම සඳහා කළ ඉල්ලීම සම්බන්ධයෙන් තීරණය කිරීමට උපකුලපතිවරයාට බලය ලබාදී තිබුණි. එබැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස ආයතන සංග්‍රහයේ පහත සඳහන් විධිවිධාන සලකා බලමින් උද්භිද විද්‍යාව පිළිබඳ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් ලෙස ඇය ඉල්ලා අස්වීමට පෙර ඇය ලබා ගනිමින් සිටි වැටුප් ලක්ෂ්‍යයේම ඇයව පිහිටුවා නැවත බඳවා ගන්නා ලදී. 1. XVII පරිච්ඡේදයේ 2.2 සහ 2.3 වගන්තිය "උසස් අධ්‍යාපන ආයතනය විසින් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයෙන් පිටත ඔහු/ඇය නැවත සේවයේ පිහිටුවිය හැක " 2. III පරිච්ඡේදයේ 20 වැනි වගන්තිය “ඇය ඉල්ලා අස්වීමට පෙර ඇය පිහිටා සිටි වැටුප් ලක්ෂ්‍යයේම තබන්න.
(iii)	පරිච්ඡේදය III හි උප වගන්තිය 26.7.2	පුවත්පත් දැන්වීමක් පළ කිරීමකින් තොරව බාහිර කථිකාචාර්යවරුන් බඳවාගෙන තිබුණි.	ඉදිරියේදී එම ක්‍රියාමාර්ග විධිමත් කිරීමට කටයුතු කරනු ඇත.

(iv)	පරිච්ඡේදය XX හි 3.1 උප වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම තහවුරු නොකර සමාලෝචිත වර්ෂයේදී රුපියල් 978,942,951 වැටුප් හා දීමනා ගෙවා තිබුණි.	සම්ප්‍රදායිකව අධ්‍යයන කාර්ය මණ්ඩලය අනෙකුත් සියලුම විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වන පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම සටහන් නොකරයි. කෙසේ වෙතත්, සියලුම අධ්‍යයන අංශ පාහේ ඔවුන්ගේ පැමිණීම සටහන් කිරීම සඳහා පැමිණීමේ පොත් තබා ඇත. බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා සඳහා මධ්‍යස්ථානය (CEDEC) 2022.12.05 දින එහි නව ස්ථානයට ගෙන යන ලදී. 2022.11.17 දක්වා CEDEC කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම එම කාලසීමාව තුළ ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් තහවුරු කර ඇත. 2022.10.07 වන දින CEDEC විසින් ඇඟිලි සලකුණු ස්කෑන් යන්ත්‍රය නව ස්ථානයේ සවි කරන ලෙස කරන ලද ඉල්ලීමට අනුව නව යන්ත්‍රයක් මිලදී ගැනීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.
(v)	2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛය මගින් සංශෝධිත පරිච්ඡේදයේ XXVI 3 වගන්තිය.	සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය පවත්වා එහි වාර්තාව 2023 මාර්තු 17 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2023 ජූලි 07 වන දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2020 වර්ෂයට හා 2021 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මත අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. 2020 වසර සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව විශ්වවිද්‍යාලයේඅංශ 18 කට අයත් භාණ්ඩ 579 ක් අස්ථානගත වූ බවට වාර්තා වී ඇත. කෙසේ වෙතත්, මූල්‍ය රෙගුලාසි 103(1) අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සමීක්ෂණ මණ්ඩලය වාර්තාව කාලෝචිත ලෙස ඉදිරිපත් කිරීම සහතික කරන ලෙස අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට උපදෙස් දුන් අතර, 2019 වර්ෂය සඳහා භාවිතා නොකළ භාණ්ඩ බැහැර කිරීමේ වෙන්දේසිය 2023 අප්‍රේල් මාසයේදී සාර්ථකව පවත්වන ලදී. තවද, 2020 සහ 2021 වසර සඳහා ඉවත දැමිය හැකි භාණ්ඩ වෙන්දේසි කිරීමට සූදානම් වන අතර එය මෙම දින දර්ශන වර්ෂය තුළ සිදු කෙරේ.
(c)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව		
(i)	2018 ඔක්තෝබර් 12 දිනැති ලිපිය	මාසිකව ප්‍රතිපූරණය කළ යුතුව තිබූ මහපොළ භාරකාර අරමුදල රුපියල් 2,305,000 ක් වූ අතර, එය ප්‍රතිපූරණය නොකර වසර තුනකට වැඩි කාලයක් ආපසු අයකරගත හැකි ලෙස දක්වා තිබුණි.	ශිෂ්‍යාධාර අරමුදල් ප්‍රතිපූරණය කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ නිරන්තර සන්නිවේදනය සහ දැඩි පසු විපරමක් පවත්වයි.

(ii)	2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛය.	2022 වර්ෂයේ කලා හා සංස්කෘතික පීඨයේ පවත්වන ලද විභාගයන් හි විෂයයන් 215 න් විෂයයන් 31 ක ප්‍රතිඵල මාස 01 සිට මාස 05 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. එසේම, 2022 වර්ෂයේ විද්‍යා පීඨයේ පවත්වන ලද විභාගයන්හි විෂයයන් 42 න් විෂයයන් 24 ක ප්‍රතිඵල මාස 01 සිට 07 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.	ආයතන චක්‍රලේඛ අංක 15/2015 අනුව විභාග ප්‍රතිඵල නියමිත වේලාවට නිකුත් කිරීමට කටයුතු කර ඇත.
(iii)	2022 ජනවාරි 03 දිනැති අංක 1/2022 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4 වැනි ඡේදය.	2022 දෙසැම්බර් 31 දිනට රුපියල් 130,298,076 ක පුස්තකාල පොත් සහ වාර සඟරාවල පිරිවැය සත්‍යාපනය කර නොතිබුණි.	පුස්තකාලය එහි සියලුම පොත්වල ඩිජිටල් භාණ්ඩ ලේඛනය සම්පූර්ණ කර ඇති අතර සමීක්ෂණ මණ්ඩලය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.
(iv)	2022 පෙබරවාරි 23 දිනැති අංක 03/2022 දරන මූල්‍ය චක්‍රලේඛ ලිපිය	2022 වර්ෂය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් සඳහා මාසික ඉන්ධන සීමාව ලීටර් 145 කට සීමා කර ඇත. කෙසේ වෙතත්, 2022 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ අනුමත සීමාවට පටහැනිව රුපියල් 1,012,079 ක් වටිනා ඉන්ධන ලීටර් 2,983 ක් වැඩිපුර ලබා ගෙන තිබුණි.	පසුගිය කාලයේ අනෙකුත් විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වූ පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා පාලක සභාවේ නිර්දේශයක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත.
(d)	2015 ඔක්තෝබර් 03 දින පැවති 257 වැනි රැස්වීමට අනුව විශ්වවිද්‍යාලයේ නිසි බලධාරියාගේ 2015 ඔක්තෝබර් 12 දිනැති EUSL/EST/06/2015 අංක දරන ලිපිය	2023 පෙබරවාරි 27 වන දින දක්වාත් වෛද්‍ය නිලධාරියා විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සේවයට වාර්තා කිරීම සම්බන්ධව උපදෙස් අනුගමනය කර නොමැති අතර 2015 ඔක්තෝබර් සිට 2023 පෙබරවාරි දක්වා වැටුප් හා දීමනා වශයෙන් රුපියල් 9,277,829 ක මුදලක් ගෙවා ඇත.	2015 ඔක්තොම්බර් 12 දිනැති අංක EUSL/EST/06/2015 ලිපියට අමතරව, විශ්වවිද්‍යාල පරිපාලනය විසින් "සාම්ප්‍රදායිකව සියලුම විශ්වවිද්‍යාලවල මෙන්ම අනෙකුත් රටවල පවා වෛද්‍ය නිලධාරීන් ඔවුන්ගේ පැමිණීම සටහන් නොකරන" බැවින් එලෙස තීරණයක් ගන්නා ලදී. එසේ වුවද, නැගෙනහිර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය නිලධාරියා දෛනික පැමිණීම සඳහා වාර්තා පොතක් පවත්වාගෙන යන අතර එය ලේඛකාධිකාරී විසින් මාසිකව අධීක්ෂණය කර සහතික කර ඇත.

2.3	වෙනත් කරුණු	
(a)	2022 දෙසැම්බර් 31 දිනට, ලැබිය යුතු රු. 455,463,867 මුළු ශේෂවලින් රු. 238,964,922 හෝ සියයට 52 ට සමාන මුදලක් වසර 03 සිට වසර 40 දක්වා කාලයක් තුල අය කර ගෙන නොතිබුණි. එයින් වසර 10 සිට වසර 40 දක්වා කාලයක් තුල බැඳී ඇති ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් 70 දෙනෙකුගෙන් රුපියල් 150,320,855 ක බැඳුම් වටිනාකම අයකර ගැනීමට නොහැකිව තිබුණි.	වසර 15කට වැඩි මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වන අත්තිකාරම් සම්බන්ධයෙන් සලකා බලන ලදී. අවාසනාවකට, වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය වන ලේඛන දැනට සොයා ගත නොහැකිව පවතින අතර, ඒ සම්බන්ධ සියලු පාර්ශ්වයන් සම්බන්ධීකරණය කරමින් උත්සාහ කළද, අදාළ ලේඛන ස්ථානගත කර නොමැත. මෙම ලේඛන නොමැතිකම සහ ඒවා සොයා ගැනීමට ඇති නොහැකියාව සැලකිල්ලට ගනිමින්, කපා හැරීමේ විකල්පය සලකා බලන ලදී. පහත සඳහන් ක්‍රියාමාර්ග හරහා හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාශීලීව ක්‍රියා කරමින් පවතී. • සේවයෙන් පහ කරන ලද නිලධාරීන්: ඉහත සඳහන් කළ පුද්ගලයින්ට ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) ශේෂයන් සඳහා තවමත් හිමිකම් පෑමට නොහැකි වී ඇත. ආපසු ගෙවීම සඳහා ඔවුන්ගේ ඉල්ලුම්පත්‍රය මත, නොවිසඳුණු ණය සහ වැටුප් අත්තිකාරම් ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂයෙන් අයකර ගැනීමට පියවර ගනිමින් සිටී. • පරිවාස උල්ලංඝනය කිරීම සහ බැඳුම්කර පැහැර හැරීම්: නීතිපතිවරයා සමඟ සාකච්ඡා කර, එකී සේවකයන්ගෙන් හිඟ මුදල් පියවීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියා මාර්ග මේ වන විටත් ගැනෙමින් පවතී. ගෙවිය යුතු ණය මුදල් ද ඔවුන්ගේ බැඳුම්කර මුදල් පියවීමේදී නිසි පරිදි අයකර ගනු ඇත. • විශ්‍රාමික කාර්ය මණ්ඩලය: විශ්‍රාමික කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් හිඟ ණය සහ වැටුප් අත්තිකාරම් අයකර ගැනීම සඳහා ලිපි හුවමාරු කිරීම ආරම්භ කර ඇත. ඊට සමගාමීව "නොකියාගැනීමේ" සහතික ලබාදීමට අපොහොසත් වූ වගකිවයුතු නිලධාරීන් හඳුනාගැනීම සඳහා පරීක්ෂණයක් ද ක්‍රියාත්මකයි. පසුව ඔවුන්ගෙන් එම මුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. •වෙනත්විශ්වවිද්‍යාල/රාජ්‍ය දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු කර ඇති නිලධාරීන්: ස්ථාන මාරු කළ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් නොවිසඳුණු ණය සහ වැටුප් අත්තිකාරම් අයකර ගැනීම සඳහා අදාළ ආයතන සමඟ දැනටමත් උපදේශන සිදු කර ඇත.

		තවද, පාලක සභාව විසින් 2005 ට පෙර ලේඛන සොයා ගැනීමට නොහැකි වූ බවත් 2009 ට පෙර පැවති හඳුනා නොගත් ක්ෂය වීම් හඳුනා ගැනීමට උත්සහ කරන බවත් ප්‍රකාශ කර තිබුණි. පවතින නීති රීති අනුව ඒවා කපා හැරීමට දැනටමත් කටයුතු කෙරෙමින් පවතී. සැලකිය යුතු ප්‍රමාණයක් දශකයකට හෝ දෙකකට පෙර ලබා දී ඇත. එම වසරවල පැවති තත්ත්වයන් තුළ, ඇණවුම් කරන ලද භාණ්ඩ සඳහා කොළඹ පිහිටි සැපයුම්කරුවන් වෙත වහාම එම ස්ථානයේදීම ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඍජු ගෙවීම් සඳහා පහසුකම් සැලසීම සඳහා කල්තියා චෙක්පත් නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, කනගාටුදායක ලෙස, භාණ්ඩ ලැබුණු පසු, මෙම අත්තිකාරම් මුදල් පියවීම නිසි පරිදි සිදු නොවිණි. විශ්ව විද්‍යාලය මෙම ගැටලුව නිවැරදි කිරීමට ක්‍රියාකාරීව නියැලී සිටින අතර, මෙම හිඟ අත්තිකාරම් මුදල් නැවත් පියවා ගැනීම හෝ කපා හැරීම කෙරෙහි අවධානයෙන් කටයුතු කරයි. 2017 නොවැම්බර් මස 22 වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප් කමිටුව) විසින් ලබා දෙන ලද උපදෙස් හා මගපෙන්වීම්, පවත්නා නීතිරීති, රෙගුලාසි වලට දැඩි ලෙස අනුකූල වෙමින් මෙම ලුහුබැඳීම සිදු කෙරේ. පහත වගුවේ දක්වා ඇති පරිදි බලමුලු ගැන්වීමේ අත්තිකාරම් සහ ප්‍රතිසාධන ක්‍රියාවලිය පිළිබඳ සංක්ෂිප්ත දළ විශ්ලේෂණයක් මෙහි ඉදිරිපත් කෙරේ. 2010 ට පෙර ලබා ගත් පැරණි අත්තිකාරම් සම්බන්ධයෙන්, අවශ්‍ය ලියකියවිලි නැවත ලබා ගැනීමෙන් පසුව සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගනු ලැබේ. (ඇමුණුම) සැලකිය යුතු ප්‍රමාණයක් දශකයකට හෝ දෙකකට පෙර ලබා දී ඇත. එම වසරවල පැවති තත්ත්වයන් තුළ, ඇණවුම් කරන ලද භාණ්ඩ සඳහා කොළඹ පිහිටි සැපයුම්කරුවන් වෙත වහාම එම ස්ථානයේදීම ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඍජු ගෙවීම් සඳහා පහසුකම් සැලසීම සඳහා කල්තියා චෙක්පත් නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, කනගාටුදායක ලෙස, භාණ්ඩ ලැබුණු පසු, මෙම අත්තිකාරම් මුදල් පියවීම නිසි පරිදි සිදු නොවිණි. විශ්ව විද්‍යාලය මෙම ගැටලුව නිවැරදි කිරීමට ක්‍රියාකාරීව නියැලී සිටින අතර, මෙම හිඟ අත්තිකාරම් මුදල් නැවත් පියවා ගැනීම හෝ කපා හැරීම කෙරෙහි අවධානයෙන් කටයුතු කරයි. 2017 නොවැම්බර් මස

		22 වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප් කමිටුව) විසින් ලබා දෙන ලද උපදෙස් හා මගපෙන්වීම්, පවත්නා නීතිරීති, රෙගුලාසි වලට දැඩි ලෙස අනුකූල වෙමින් මෙම ලුහුබැඳීම සිදු කෙරේ.
(b)	2022 දෙසැම්බර් 31 වන විට හිඟ ජීවන වියදම් දීමනා, අධික ලෙස අයකරගත් ණය සහ අත්තිකාරම්, විවිධ ණය හිමියන් සහ විගණන ගාස්තු ලෙස ගෙවිය යුතු රුපියල් 3,973,526 ක් නිරවුල් කිරීම පිණිස වසර 03 සිට වසර 18 දක්වා කාලයක් තුල නිසි ක්‍රියාමාර්ගයක් නොගෙන තිබුණි.	මෙම විශේෂිත අරමුදලෙන් ගෙවීම් තවමත් බෙදා හරිනු ලැබේ. 2020 වර්ෂයේදී රුපියල් 2,174,173.66 ක මුදලක් වැය කර ඇති අතර, 2021 දී රුපියල් 215,859.92 ක් සහ 2022 දී රුපියල් 47,362.96 ක් අරමුදලින් ලබා දී ඇත. දැනට ගෙවිය යුතු සියලුම හිඟ මුදල් නියමිත වේලාවට පියවීමට උත්සාහ කරමින් පවතී. ප්‍රශ්නය උද්ගත වී ඇති මුදල ප්‍රමාණය පිළිබඳ සවිස්තරාත්මක බිඳවැටීමක් ලබා දෙන්නේ නම්, එය අපට වඩාත් නිශ්චිත හේතු දැක්වීමකට සහ කාරණය වඩාත් ඵලදායී ලෙස විසඳීමට හැකි වනු ඇත.
(c)	2020 මැයි මාසයේදී පර්යේෂණ අවසන් කිරීමට යටත්ව, මහාචාර්යවරයෙකු වෙත පර්යේෂණ ප්‍රදාන වශයෙන් රුපියල් 7,500,000 ක මුදලක් 2015 වර්ෂයේදී අනුමත කර ඇත. කෙසේ වෙතත්, එම ප්‍රතිපාදනයෙන් රුපියල් 4,500,000 ක මුදලක් වැය කර ඇතත්, 2023 මැයි 04 දක්වාම පර්යේෂණය අවසන් කර නොතිබුණි.	පර්යේෂකයා අවසාන පර්යේෂණය ඉදිරිපත් කළ අතර සමාලෝචකයන්ගේ අදහස් ඇතුළත් කිරීමට බලා සිටී.
(d)	එක්සත් රාජධානියේ ආචාර්ය උපාධියක් හැදෑරීම සඳහා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ කථිකාචාර්යවරයෙක් වෙත, රුපියල් 14,258,446 ක බැඳුම්කරයක් අත්සන් කර, අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යයන නිවාඩුව ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස විශ්වවිද්‍යාලය ඉල්ලීමක් කර තිබුණි. ඒ හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් රුපියල් 3,601,837 ක අමතර මුදලක් ගෙවා තිබුණද, වගකිවයුතු නිලධාරියාට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2016.12.15 දිනැති අංක 18/2016 කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන අනුව අධ්‍යයන කාර්යමණ්ඩලයකට සෘජු ආචාර්ය උපාධිය සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු මාස 39ක් සහ ආචාර්ය උපාධිය සඳහා යොමුවන ශාස්ත්‍රපති උපාධිය සඳහා මාස 45ක නිවාඩු සඳහා හිමිකම් තිබේ. ආචාර්ය උමාශංකර් හට 2011.06.24 දින පැවති 09 වන නිවාඩු සහ සම්මාන කමිටු රැස්වීමේදී ආචාර්ය උපාධිය සඳහා මාස 45ක වැටුප් සහිත අධ්‍යයන නිවාඩුවක් ලබා දෙන ලදී. පසුව, 2014.08.07 දින පැවති 36 වන නිවාඩු සහ සම්මාන කමිටු රැස්වීමේදී අධ්‍යයන නිවාඩුව මාස 39කට වෙනස් කර නැවත සේවයට වාර්තා කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටින ලදී.තවද ඔහු 2015.06.20 දින ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු අතරමගදී නැවත රාජකාරි ආරම්භ කළේය.

		ඔහු උපකුලපතිවරයා වෙනුවට සිටි නිසි බලධාරියාගෙන් මාස 45ක නිවාඩුවක් ඉල්ලා ආයාචනා කළ අතර නිසි බලධාරියා තත්ත්වය අධීක්ෂණය කර මුලදී ගත් තීරණයේ අඩුපාඩු සොයා මාස 45ක අධ්‍යයන නිවාඩු ලබා දෙන ලෙස පාලක සභාවට නිර්දේශ කළ අතර පාලක සභාව 2015.05.29 දින පැවති එහි 253 වන රැස්වීමේදී වැටුප් සහිත මාස 45ක අධ්‍යයන නිවාඩු සඳහා අනුමැතිය ලබා දෙන ලදී. අනාගතයේදී මෙවැනි අතපසු වීමක් සිදු නොවන බවට විශ්ව විද්‍යාලය සහතික වේ.
(e)	මෝටර් රථ දෙකක්, වෑන් රථයක් සහ ලොරි රථයක් ඇතුළුව රුපියල් 6,006,875ක් වටිනා වාහන හතරක් (04) 2021 ජුනි මාසයේ සිට මේ දක්වා අපේක්ෂිත කාර්යයන් සඳහා යොදාගෙන නොමැති බව වත්කම් පිළිබඳ භෞතික සත්‍යාපනයකදී අනාවරණය වී තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් නිසි පියවරක් ගෙන තිබුණේ නැත.	මෙම වාහන, ඒවායේ වයස සහ පුනරාවර්තන බිඳවැටීම් මෙන්ම අධික ඉන්ධන පරිභෝජනය හේතුවෙන් සැලකිය යුතු නඩත්තු වියදම් අවශ්‍ය වේ. එබැවින් ඒවා භාවිතා කරනු ලබන්නේ නොවැළැක්විය හැකි අවස්ථාවන්හිදී පමණි. සහතික වශයෙන්, මෙම වාහන සඳහා කාර්යක්ෂම ලෙස බැහැර කිරීම සහතික කිරීම සහ වඩාත් විශ්වාසදායක ප්‍රවාහන විකල්පයන් සඳහා මග පාදමින් වෙන්දේසි ක්‍රියාවලිය ආරම්භ කිරීමට පියවර ගනිමින් සිටී.
(f)	මුළු මුදල රු.3,495,497 ක් වටිනා අරමුදල් වසර 02 සිට වසර 05 දක්වා කාලසීමාවක් තුල ඒවායේ අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණි.	පහත හෙළිදරව්වට අනුකූලව, ක්‍රමක්ෂය කිරීමක් අවශ්‍ය වුවද, ප්‍රතිදාන නිසි ලෙස භාවිතා කර ඇත. මෙම ප්‍රතිදානවලින් කොටසක් ඔවුන්ගේ මූලික අපේක්ෂිත අරමුණ සඳහා සාර්ථකව වියදම් කර ඇති අතර ඉතිරි කොටස නියම කර ඇති පරිදි, අර්ථ දක්වා ඇති අරමුණු සඳහා විචක්ෂණ ලෙස දිගටම භාවිතා කරනු ඇත.
(g)	විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව 2014 වසරේ සිට රජයේ බැංකු ශාඛා දෙකක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMS) දෙකක් සඳහා විශ්වවිද්‍යාලය පහසුකම් සපයා ඇති අතර, මෙම ආයතනවලින් මේ දක්වා කිසිදු කුලියක් අයකරගෙන නොමැත.	කුලිය ලෙස අයකර ගත හැකි මුදලෙහි වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන බැංකු සමඟ විධිමත් ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කර තිබේ.
(h)	ශිෂ්‍ය අත්පොතට අනුව, ත්‍රිකුණාමල මණ්ඩපයේ සිද්ධ වෛද්‍යවේදී උපාධි පාඨමාලාව (BSMS) , අධ්‍යයන වර්ෂ 05ක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය. කෙසේ වෙතත්, 2016 වර්ෂයේදී සිසුන් 46ක් 2014/2015 අධ්‍යයන වර්ෂයේ මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ අතර, පාඨමාලාව සම්පූර්ණ කිරීමට වසර 7ක් ගතවී තිබුණි.මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට ප්‍රමාද වීම සිසුන්ගේ මෘත්තීය සහ රැකියා අවස්ථා කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය. මීට අමතරව, පිළිවෙළින් 2014 සහ 2015 වසරවලදී, 2012/2013 සහ 2013/2014	සිසුන්ගේ ගැටුම් හේතුවෙන්, 2017.03.20 සිට 2017.08.08 දක්වා මාස හතකට වැඩි කාලයක් - 2016.03.10 සිට මාස 05 කට ආසන්න කාලයක් දෙවතාවක් මණ්ඩපය වසා දමන ලදී. (මාෂල්ගේ කාර්යාලයෙන් ලබාගත් විස්තර) තවද, පාස්කු (2019) ප්‍රහාරය, කොවිඩ්-19 වසංගත ගැටළු සහ 2022 ජුනි සිට අගෝස්තු දක්වා පැවති රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් තවත් ප්‍රමාද විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ හිඟය ද උපාධි පාඨමාලාව ප්‍රමාද වීමට හේතු වූ අතර , මෙම හේතු නිසා උපාධි

	අධ්‍යයන වර්ෂ සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයන්හටද අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට වසර 07 ක කාල රාමුවක් ඉක්මවා ගොස් තිබුණි.	පාඨමාලාවේ කාලසීමාව තවදුරටත් දීර්ඝ කිරීමට සිදු විය. 2013/2014 ශිශ්‍යකාණ්ඩ; ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 47ක් වන නමුත් පාඨමාලාව හැදෑරූ සිසුන් 40කි. ඔවුන්ගෙන් අධ්‍යයන වර්ෂ 05 ම සම්පූර්ණ කර ඇති සිසුන් ගණන 40 ක් වන අතර, සිසුන් 30 දෙනෙක් 2022 දී සහ 2023 දී සිය උපාධි පාඨමාලාව සම්පූර්ණ කරන ලදී. කඩඉම් විභාග අසම්පූර්ණ වීම හේතුවෙන් සිසුන් 10 දෙනෙකුට ඔවුන්ගේ අවසන් වසර විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලැබුණු අතර (සිව්වන වසර පළමු හා දෙවන සාමාසික විභාගයන් කඩඉම් විභාග වේ). මේ වන විට ඔවුනතරින් සිසුන් 03 දෙනෙක් තම කඩඉම් විභාග සමත් වී 2014/2015 කණ්ඩායම් සමඟ තම පස්වන වසර පළමු සාමාසික විභාගයට පෙනී සිටිති. සිසුන් පාඨමාලාවෙන් ඉවත්වීම සිසුන්ගේ කැමැත්ත වේ. පවතින විෂය මාලාවේ ඇති බාධා නිසාද ඉවත් වීම සහ සම්පූර්ණ කිරීමේ අනපේක්ෂිත ප්‍රමාදයන් ඇති කරන ලදී. සංශෝධිත විෂය මාලාව 2021/22 සිට ක්‍රියාත්මක කෙරෙනු ඇත.
(i)	2013 වසරේ සිට 2015 වසර දක්වා කාලය තුළ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට රුපියල් 6,247,846 ක මුදලක් ගෙවා තිබුණද, ලේඛනය ක්‍රමානුකූලව යාවත්කාලීන කර නොතිබූ අතර සමහර ගනුදෙනු 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඇතුළත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛනය සකස් කිරීමේ වියදම් ඵල රහිත වී තිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය පද්ධතියට යාවත්කාලීන කිරීම සියයට අනූවක් සම්පූර්ණ කර ඇති අතර එහි ප්‍රගතිය කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
(j)	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගෘහ භාණ්ඩ, වෛද්‍ය තාක්ෂණික උපකරණ සහ අන්තර්ජාල සේවා සැපයීම සඳහා කුවේට් අරමුදල යටතේ රුපියල් 263,374,811 ක මුදලක් වැය කර ඇත. කෙසේ වෙතත්, වායු සමීකරණ, විද්‍යාගාර ගෘහභාණ්ඩ සහ අල්මාරි, යටිතල පහසුකම් නොමැති වීම සහ අරමුදල් සීමාවීම හේතුවෙන් රුපියල් 145,574,057 ක් වටිනා රැස්වීම් කාමර පද්ධතිය සහ වෛද්‍ය උපකරණ වර්ග 70ක් පමණ වසර 01 සිට වසර 02 දක්වා කාලසීමාවක් තුළ භාවිතයට ගෙන නොතිබුණි.	රජයේ ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන් කුවේට් අරමුදල තාවකාලිකව සීමා කර තිබූ බැවින් සියලුම උපකරණ සහ ගෘහ භාණ්ඩ ප්‍රසම්පාදනය අත්හිටුවා ඇත. කුවේට් අරමුදල නිදහස් කළ පසු අවශ්‍ය පහසුකම් ලබා දෙනු ඇත.

(k)	උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය මගින් 2020 සිට 2022 දක්වා කාලය තුළ පීඨ පහක් (05) වෙත ලබා දුන් රුපියල් 41,121,595 ක් වටිනා ගෘහ භාණ්ඩ සහ උපකරණ මාස 05 සිට වසර 03 දක්වා කාලසීමාවක් තුළ ඒවායේ අපේක්ෂිත අරමුණු සඳහා භාවිත කර නොතිබුණි.	පෙර වත්කම් සත්‍යාපන විගණනය විශ්වවිද්‍යාලය විසින් සිදු කර ඇත. ඒ අනුව එම ගැටලුව නිවැරැදි කිරීමට කටයුතු කර තිබිණි.
(l)	ත්‍රිකුණාමල මණ්ඩපයේ බහුකාර්ය ශ්‍රවණාගාරයක් සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව **2018** අගෝස්තු **09** වන දින රුපියල් **674,470,220** ක මුදලකට ප්‍රදානය කරන ලදී. ගිවිසුමට අනුව **2021** පෙබරවාරි **08** වන දිනට එම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, එහි භෞතික ප්‍රගතිය **2023** මැයි **23** වන විටත් සියයට **09** ක් පමණි.	2018 අගෝස්තු 09 වැනි දින මූලික කටයුතු ආරම්භ කරන ලද අතර කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුමට අනුව වලංගු අත්තිකාරම් ඇපකර බැඳුම්කරයක් ඉදිරිපත් කරමින් මුළු කොන්ත්‍රාත් වටිනාකම වන රුපියල් මිලියන 155න් 20%ක අත්තිකාරම් ගෙවීමක් ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2018 වර්ෂය සඳහා අරමුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉදිරිපත් කරන ලද අත්තිකාරම් ඇපකරයට එරෙහිව රුපියල් මිලියන 25.0 ක වන කොටසක් ගෙවීමක් පමණක් නිකුත් කරන ලදී. කොන්ත්‍රාත්කරු කිසිදු ප්‍රගතියක් නොපෙන්වූ අතර තවමත් ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට ඔවුන්ගේ ඉතිරි අත්තිකාරම් මුදල් ඉල්ලා සිටියි. 2. 2019 මැයි මස 06 වන දින නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවති රැස්වීමේ දී ගත් තීරණය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා 2019 ජුනි 05 වන දින ත්‍රිකුණාමල මණ්ඩපයේ සිදු කළ චාරිකාවෙන් පසු ලබා දුන් උපදෙස් මත පදනම්ව, පාලක සභාව 2019 ජුනි 22 දින පැවති 299 වැනි රැස්වීමේදී දුර්වල ප්‍රගතිය හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට නිර්දේශ කරන ලදී. කොන්ත්‍රාත්කරු ලිපියක් මගින් දැනුම් දී ඇත්තේ පවතින අරමුදල් ප්‍රමාණයට අනුව ව්‍යාපෘතිය කොටස් වලට බෙදමින් ව්‍යාපෘතිය කරගෙන යාමට කැමැත්ත පළ කරන බවත් ව්‍යාපෘතිය අවසන් කළ නොහැකි බවත්ය. 2019 ජූලි 27 වැනි දින පැවති පාලක සභාවේ 300 වැනි රැස්වීමේදී කොන්ත්‍රාත් වගන්ති අංක 14.2 හි කොන්දේසිවලට අනුකූල නොවී, මෙම අදියරේදී ව්‍යාපෘතිය අවසන් කිරීම මඟින් ත්‍රිකුණාමල මණ්ඩපයට, නැගෙනහිර විශ්ව විද්‍යාලය වෙත විශාල පාඩුවක් සිදුවන බව පාලක සභාවේ අවධානයට යොමු වන ලදී. තවද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) 2019 සැප්තැම්බර් **16** වැනි දින සිය ලිපියෙන් දන්වා තිබුණේ මෙම කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුව ව්‍යාපෘතිය නීත්‍යානුකූලව අවසන් කිරීමට විශ්වවිද්‍යාලයට හැකියාවක් නොමැති බවය.

		3. ශ්‍රවණාගාරය, කාර්යාල ගොඩනැගිල්ල සහ ගෘහස්ථ ක්‍රීඩාංගනය ලෙස ව්‍යාපෘතිය අදියර තුනකට බෙදා ඉදිරියට ගෙන යාමට තීරණය කරන ලදී. ඒ අනුව, තවත් රුපියල් මිලියන 15.0 ක කොටසක් පමණක් කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කරන ලද අතර, අමාත්‍යාංශයේ උපදෙස් මත වැඩ කටයුතුවල ප්‍රගතිය පෙන්වීමට යටත්ව ඉතිරි අත්තිකාරම් ගෙවීම සලකා බැලීමට ද තීරණය කරන ලදී. 4. කෙසේ වෙතත්, 2021 මැද භාගය දක්වා රට තුළ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය සහ රටේ මතුවුණු ජාතික ආර්ථික අර්බුදයන් කාර්යයේ ප්‍රගතියට නැවත බලපෑම් ඇති කරන ලද අතර වැඩ කටයුතු තවත් ප්‍රමාද විය.

මහාචාර්ය වී. කනගසිංගම්
උපකුලපති
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය